330 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 330 - இல. 02
Volume 330 - No. 02

2026 ඔක්තෝබර් 07වන බදාදා
2026 ஒக்ரோபர் 07, புதன்கிழமை
Wednesday, 07th October, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 199]
ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 199]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 200]

**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරු 203-220]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 221-246]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
වහල මත සවි කරන සූර්ය පැනල බැටරි පද්ධති සඳහා බදු සහන [තීරුව 247]
සිවරාසා අනෝජන් වෙත සවුදි අරාබියේදී පනවන ලද මරණ දඬුවමට එරෙහි අභියාචනය [තීරුව 263]

**වරප්‍රසාද:**
සමාජ මාධ්‍යවල පළ කරන ලද අපහාසාත්මක වීඩියෝව [තීරුව 271]

**විසර්ජන පනත් කෙටුම්පත, 2027:**
පළමුවන වර කියවන ලදී [තීරුව 272]

**ආගමන පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 273]

**කල්තැබීමේ යෝජනාව:**
වී ගොවීන්ගේ ගැටලු විසඳීම [තීරු 275–381]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 382–398]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 199]
பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 199]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 200]

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்** [ப: 203-220]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 221-246]

**தனி அறிவித்தல் மூல வினா:**
கூரைமீது பொருத்தப்படும் சூரிய படல மின்கல சேமிப்பு முறைமைக்கான வரிச் சலுகை [ப: 247]
சவூதி அரேபியாவில் சிவராசா அனோஜனுக்கு விதிக்கப்பட்ட மரண தண்டனைக்கு எதிரான மேன்முறையீடு [ப: 263]

**சிறப்புரிமை:**
சமூக வலைத்தளங்களில் பகிரப்பட்ட கீழ்த்தரமான காணொளி [ப: 271]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2027:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 272]

**குடிவரவு சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 273]

**ஒத்திவைப்புப் பிரேரணை:**
நெல் விவசாயிகளின் பிரச்சினைகளைத் தீர்த்தல் [ப: 275-381]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 382-398]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 199]
Protection of the State from Terrorism Bill: Petition to the Supreme Court [Col. 199]

AUDITOR-GENERAL'S REPORT [Col. 200]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 203-220]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 221-246]

QUESTION BY PRIVATE NOTICE:
Tax Relief for Battery Energy Storage Systems of Rooftop Solar Panels [Col. 247]
Appeal against Death Sentence Imposed on Sivarasa Anojan in Saudi Arabia [Col. 263]

PRIVILEGE:
Derogatory Video Posted on Social Media [Col. 271]

APPROPRIATION BILL, 2027:
Read the First time [Col. 272]

IMMIGRATION BILL:
Read the First time [Col. 273]

ADJOURNMENT MOTION:
Addressing the Issues of Paddy Farmers [Col. 275-381]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 382-398]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ඔක්තෝබර් 07 වන බදාදා***
*2026 ஒக்ரோபர் 07, புதன்கிழமை*
*Wednesday, 07th October, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform that the Hon. Speaker has endorsed the Certificate on the Bill titled "Promotion of Export Agriculture (Amendment)" on 06th of October, 2026 in terms of Article 79 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

## II

### ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### PROTECTION OF THE STATE FROM TERRORISM BILL: PETITION TO THE SUPREME COURT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform Parliament that the Hon. Speaker has received a copy of a petition filed at the Supreme Court in terms of the Article 121(1) of the Constitution in respect of the Bill titled "Protection of the State from Terrorism."



## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the -

- Ninth Installment - Part XLV of the Report of the Auditor-General for the Financial Year 2019;
- Third Installment - Part XXVIII of the Report of the Auditor-General for the Financial Year 2020;
- Second Installment - Part LXVII of the Report of the Auditor-General for the Financial Year 2021;
- Second Installment - Parts LXXII and LXXIII of the Report of the Auditor-General for the Financial Year 2022;
- Ninth Installment - Part XLIX of the Report of the Auditor-General for the Financial Year 2024; and
- Second Installment - Parts VI and VII, Third Installment - Parts VI and VII and Ninth Installment - Parts II and III of the Report of the Auditor-General for the Financial Year 2025 in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

Hon. Deputy Speaker, I move,

"That the Reports be printed".

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(i) 2025 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018/2019 වර්ෂය සඳහා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 වර්ෂය සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික යොවුන් සේනාංකයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතලේ, තැන්න, මුවගල හන්දිය, අංක 26 යන ලිපිනයෙහි පදිංචි ඒ.ජී. නන්දා සෝමලතා මහත්මිය සහ වෙනත් දෙදෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැල්සිරිපුර, හිරියාල ලේනව, බංඩිපොළ, අංක 16 යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ. ඉන්දික ප්‍රියන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 10ஆம் வட்டாரம், புதுக்குடியிருப்பு, முல்லைத்தீவு எனும் முகவரியில் வசிக்கும் க. கார்வேந்தன் அவர்களிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මා අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

ආයෝජන සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින රාජ්‍ය පරිපාලන හා නියාමන බාධා ඉවත් කරමින් ව්‍යාපාරිකයන්ට කඩිනම් විසඳුම් ලබා දීමට ජනාධිපති කාර්යාලය යටතේ ස්ථාපිත කළ "වියාසා" - "ViYASA" - ජාතික ව්‍යාපාර පහසුකම් මධ්‍යස්ථානය - NBFC - අතිශය කාලීන පියවරකි.

1. ජනාධිපති කාර්යාලය යටතේ ස්ථාපිත කළ "වියාසා" - "ViYASA" - ජාතික ව්‍යාපාර පහසුකම් මධ්‍යස්ථානය - NBFC - මඟින් ආයෝජකයන් මුහුණ දෙන නියාමන බාධා ඉවත් කිරීමට සකසා ඇති යාන්ත්‍රණය කවරේද?
2. මෙම මධ්‍යස්ථානය මඟින් රාජ්‍ය ආයතනවලින් අනුමැතීන් ලබා ගැනීමේ ප්‍රමාද වළක්වා ගැනීමට එහි නිල වෙබ් අඩවිය සහ ඩිජිටල් තාක්ෂණය යොදා ගන්නේ කෙසේද?
3. මෙම මධ්‍යස්ථානය හරහා කර්මාන්ත අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය ආයතන සමඟ එක්ව විසඳීමට හඳුනාගෙන ඇති ප්‍රධාන ගැටලු මොනවාද?
4. මෙම මධ්‍යස්ථානය මඟින් ඉදිරි වසර තුළ මෙරටට ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂිත නව ආයෝජන ප්‍රමාණය සහ උත්පාදනය වන රැකියා සංඛ්‍යාව කොපමණද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. ආයෝජකයින් මුහුණ දෙන පරිපාලනමය හා නියාමන බාධා කඩිනමින් නිරාකරණය කිරීම සඳහා ජනාධිපති කාර්යාලය යටතේ විශේෂ ඒකකයක් ලෙස "වියාසා" ජාතික ව්‍යාපාර පහසුකම් මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. මෙම යාන්ත්‍රණය ප්‍රධාන අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

   <u>පළමු අදියර (දැනට ක්‍රියාත්මක ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීම)</u>

   ව්‍යවසායකයින් විවිධ රාජ්‍ය ආයතන සමඟ කටයුතු කිරීමේදී මුහුණ දෙන්නා වූ විවිධ ගැටලු සඳහා මෙම ආයතනය මැදිහත් වී එම ගැටලු කඩිනමින් විසඳා ගැනීමට පහසුකම් සැලසීම මෙහි පළමු අදියර යටතේ සිදු කරනු ලබයි. ඔවුන්ගේ ගැටලු https:// nbfc.presidentsoffice.gov.lk වෙබ් අඩවිය මඟින් සෘජුවම යොමු කිරීම සිදු වේ.

   එසේ යොමු කරනු ලබන ගැටලුවලට අදාළ වන සියලු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කර ගනිමින්, ඒ සඳහා ඉක්මනින් විසඳුම්/ අනුමැතීන් ලබා දීමට අවශ්‍ය කටයුතු මෙමඟින් ඉටු කරයි. එමෙන්ම එහිදී හඳුනා ගන්නා රාජ්‍ය ආයතන ක්‍රියාවලීන් සඳහා අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම, මෙම ආයතනය යටතේ ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති ජාතික මෙහෙයුම් කමිටුව මඟින් සිදු කරනු ලබයි.

   <u>දෙවන අදියර (නව ආයෝජකයින් සඳහා උපදේශනය මෙන්ම ව්‍යාපාරය ආරම්භ කරන තෙක් අවශ්‍ය සියලු සම්බන්ධීකරණ කටයුතු)</u>

   මෙමඟින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී අවශ්‍ය වන්නා වූ උපදේශනය මෙන්ම ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමේ සිට ව්‍යාපාරය ආරම්භ කිරීම තෙක් රාජ්‍ය ආයතන හරහා සිදු කළ යුතු අනුමැතීන් ලබා ගැනීම, බලපත්‍ර ලබා ගැනීම හා පහසුකම් ලබා ගැනීම සඳහා සියලු සම්බන්ධීකරණ කටයුතු මෙම ආයතනය මඟින් සිදු කිරීමට නියමිතය.

2. මෙම මධ්‍යස්ථානය ඩිජිටල් වේදිකාවක් - digital platform එකක් - හරහා තනි කවුළුව - Single Window - සංකල්පය යටතේ පෞද්ගලික ආයෝජකයින් සහ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

වර්තමානයේ පළමු අදියර ලෙස ව්‍යවසායකයින් රාජ්‍ය යන්ත්‍රණය සමඟ කටයුතු කිරීමේදී ඇති වන ගැටලු https://nbfc.presidentsoffice.gov.lk නිල වෙබ් අඩවිය හරහා පෝරමයක ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇත.

මෙම පද්ධතිය තවදුරටත් සංවර්ධනය කරමින් පවතින අතර එහිදී ගැටලු විසඳීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයේ නිලධාරින් වෙත සෘජුවම සබැඳි මාර්ගයෙන් යොමු වේ. එසේ යොමු වන ගැටලුවලට අදාළ අනුමැතීන්/විසඳුම් සම්බන්ධ යාවත්කාලීන වීම් - updates - ප්‍රශ්නය යොමු කරන පාර්ශ්වයන්ට/ආයතනයට දැන ගැනීමට හැකි වන පරිදි හැඳුනුම් අංකයක් - tracking ID එකක් - ලබා දීම මෙමඟින් සිදු වේ.

එලෙස සිදු වන සියලු කටයුතු පිළිබඳව මෙම මධ්‍යස්ථානය සෘජු සොයා බැලීම් කරනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් සියලු පහසුකම් සපයමින් කටයුතු කරන සෘජු කේන්ද්‍රස්ථානය ලෙසද කටයුතු සිදු කරයි.

3. වර්තමානයේ ආයෝජන සඳහා ප්‍රධාන වශයෙන් විවිධ රජයේ ආයතන අතර විසිරී පවතින අනුමත කිරීමේ ක්‍රියාවලි, එනම් ඉඩම් වෙන් කරවා ගැනීම, පාරිසරික අනුමැතීන් සහ නියාමන බලපත්‍ර ලබා ගැනීම, විදුලිබල සම්බන්ධතා, ජල සම්පාදනය, බැංකු හා මූල්‍යකරණය නිසි සම්බන්ධීකරණයක් නොමැතිව හුදකලාව ක්‍රියාත්මක වීම වැනි ගැටලු.

දේශීය හා විදේශීය ආයෝජකයින්ට තම ව්‍යාපෘතියේ ආරම්භයේ සිට, එනම් ව්‍යාපෘති යෝජනාවේ සිට ව්‍යාපාරයේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය දක්වාත්, ඉන් ඔබ්බටත් නිසි මඟ පෙන්වීමක් හා උපදේශන සහයක් සහිත තනි කේන්ද්‍රීය සම්බන්ධීකරණ ආයතනයක් නොමැති වීම මඟින් ඇති වන ගැටලු.

දේශීය හා විදේශීය ව්‍යවසායකයින්ට රට තුළ පහසුකම් සැපයීම සඳහා දැනට පවතින ආයතන විවිධ වූ ව්‍යවස්ථාපිත සීමාවන්ට යටත් වේ. එම ව්‍යවස්ථාපිත සීමාවන් හා අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන අතර පවතින සම්බන්ධීකරණය හා මෙහෙයුම් බාධක කඩිනමින් විසඳීමට මෙම ආයතනවලට විශාල වෙහෙසක් දැරීමට සිදු වීම හා ඒ හේතුවෙන් සමහර කාරණා නිරාකරණය කළ නොහැකි වීම.

4. මෙම ආයතනයේ පළමු අදියර යටතේ සිදු කරනු ලබන්නේ ව්‍යවසායකයින් රාජ්‍ය ආයතන සමඟ කටයුතු කිරීමේදී ඇති වන්නා වූ ගැටලු නිරාකරණය සඳහා මැදිහත් වීමයි. මෙමඟින් මෙරට තුළ ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම මඟින් ව්‍යාපාර පහසුතා දර්ශකයේ ඉහළ ස්ථානයකට පැමිණීම ප්‍රධාන අරමුණක් වේ.

මෙහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නේ වසරක පමණ කාලයකින් පසුවය. එම දෙවන අදියරේදී ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය උපදේශනය ද, ආරම්භක අවස්ථාවේ සිට ව්‍යාපාරය පිහිටුවන තෙක් අවශ්‍ය අනුමැතීන් හා පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය මධ්‍යගත සම්බන්ධීකරණයද සිදු කිරීමට ද බලාපොරොත්තු වේ.

මෙම අදියර ද්විත්වය මඟින් මෙරට ආයෝජන ප්‍රමාණය හා රැකියා උත්පාදනය ඉහළ නැංවීම සහ 2030 වර්ෂය වන විට අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 36ක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම ප්‍රධාන අරමුණු අතර වේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Oshani Umanga, do you have any questions to get clarified?

**ගරු ඕෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප රටේ පවතින ආර්ථික ස්ථාවරත්වය සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි පවතින විශ්වාසය නිසා ජාත්‍යන්තර ආයෝජකයින් ආකර්ෂණය කරගන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ අනුව BoI එක හරහා, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හරහා අපේ රටට ආයෝජන අවස්ථා ළඟාවෙමින් පවතිනවා. ඇත්තටම ඒක අප ලැබූ ජයග්‍රහණයක්කොට සලකන්න ඕනෑ. ඒ වාගේම ආයෝජකයින්ට විශ්වාසයක් ගොඩනැඟිලා තිබෙනවා, තමන් ගෙනෙන සම්පූර්ණ ආයෝජන ප්‍රමාණයම තමන්ගේ ව්‍යාපෘතියට යොදවන්න පුළුවන් කියලා. ඒ කියන්නේ අපේ ආණ්ඩුවේ කොමිස් කාක්කෝ නැහැයි කියන පණිවුඩය ආයෝජකයින්ට ගිහිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර අනුමැතීන් සහ ඉඩම්වලට අනුමැතීන් ලබා ගැනීමේදී රාජ්‍ය ආයතන අතර පවතින මතභේදමය කාරණා නිරාකරණය කර ගැනීමටත් මෙම ආයතනයට නෛතික බලතල තිබෙනවාද කියලා ගරු අගමැතිතුමියගෙන් මම අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමියත් මතු කරපු ආකාරයට, අමාත්‍යාංශ අතර තිබෙන මතභේදාත්මක කාරණා නිරාකරණය කරගැනීමට මැදිහත් වීම තමයි මේකේ අරමුණ වන්නේ. එක් ස්ථානයක් තුළින් මේ සියල්ලම සම්බන්ධීකරණය කරලා මේ ක්‍රියාවලිය ටිකක් කාර්යක්ෂම කරන්න, මේ සඳහා ගතවන කාලය අවම කරගන්න සහ ආයෝජකයාට පහසු වන විධියට එක තැනකට ඇවිල්ලා මේ ප්‍රශ්න විසඳාගන්න පුළුවන් විධියට මේ ප්‍රශ්න නිරාකරණය කරන්න තමයි අප බලාපොරොත්තු වන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Oshani Umanga, if you have a second Supplementary Question, you may ask now.

**ගරු ඕෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වනකොට සෑම දිස්ත්‍රික්කයකම කර්මාන්ත අනුකමිටු පිහිටුවා, ඒ අනුකමිටු හරහා කර්මාන්ත හා ව්‍යවසායකත්වය සම්බන්ධව එන සියලු ගැටලුවලට විසඳුම් ලබා දෙමින් සිටිනවා. අපට දිස්ත්‍රික්කය තුළ විසඳා ගත නොහැකි ගැටලු තිබෙනවා නම්, මෙම ආයතනය හරහා ඒ ගැටලු විසඳාගත හැකි තත්ත්වයක් තිබෙනවාද?

මොකද, අපි දැනටමත් දිස්ත්‍රික්ක මට්ටමින් පහළට ගිහිල්ලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා ප්‍රාදේශීය කර්මාන්ත අනුකමිටුත් පිහිටුවමින් තිබෙනවා. සමහර තැන්වල ඒ කමිටු පිහිටුවා අවසන් වෙලාත් තිබෙනවා. එතකොට අර ප්‍රාදේශීය මට්ටමින් ඇතිවන ගැටලු විසඳා ගැනීමටත් මෙම මධ්‍යස්ථානය හරහා link එකක් සකස් කරලා තිබෙනවාද කියලා ගරු අගමැතිතුමියගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනිවාර්යයෙන්ම ඒක කරන්න පුළුවන්. අර මම කියපු websites හරහාත් ඒ link එක හදලා තිබෙනවා. එහෙම නැත්නම් සෘජුවම ව්‍යවසායකයින් සමඟ සම්බන්ධ වෙලා link එකක් හදාගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 2 to be asked by the Hon. S.M. Marikkar.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කරන ප්‍රශ්නය මෙයයි.

ආර්ථිකයට සෘජු බලපෑමක් එල්ල කරන තෙල් ආනයන ක්‍රියාවලිය හා සම්බන්ධ පහත ප්‍රශ්න සඳහා මම ඔබතුමියගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

(1) (අ) 2026 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් මෙරටට ආනයනය කරන ලද තෙල් තොග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ) එහි සම්පූර්ණ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ඇ) වෙළෙඳ පොළ මුදලට වඩා premium ගෙවපු මුදල වෙන් වෙන් වශයෙන් (නැවකින් නැවකට) කොපමණද?

(2) (අ) මෙම වසර තුළ මේ දක්වා රජය සහනාධාර වශයෙන් ආනයනය කළ තෙල් සඳහා කොපමණ මුදලක් වැය කොට තිබේද?

(ආ) එම තෙල් සහනාධාරය සමාගම් වශයෙන් බෙදී ගිය ආකාරය වෙන් වෙන් වශයෙන් කොපමණද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(1) (අ) 2026 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් මෙරටට ආනයනය කරන ලද මුළු තෙල් තොග ප්‍රමාණය බැරල් 18,687,305.29යි.

එම තෙල් තොග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 1 මඟින් දැක්වේ. ඇමුණුම 1 **සභාගත*** කරමි.

**සභාමේසය මත තබන ලද ඇමුණුම 1:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு 1:*
*Annex 1 tabled:*

| නිෂ්පාදිතය | ප්‍රමාණය (බැරල්) |
|---|---|
| බොර තෙල් | 9,402,513.78 |
| පෙට්‍රල් 92 | 3,464,930.49 |
| පෙට්‍රල් 95 | 232,978.09 |
| ඔටෝ ඩීසල් | 3,483,955.75 |
| සුපර් ඩීසල් | 184,489.00 |
| ගුවන්යානා ඉන්ධන (JET A-1) | 1,512,722.18 |
| දැවි තෙල් | 405,716.00 |
| මුළු එකතුව | 18,687,305.29 |

(ආ) සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 2,240,443,464.72යි.

සම්පූර්ණ වටිනාකම වෙන් වෙන් වශයෙන් ඇමුණුම 2 මඟින් දැක්වේ. ඇමුණුම 2 **සභාගත*** කරමි.

**සභාමේසය මත තබන ලද ඇමුණුම 2:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு 2:*
*Annex 2 tabled:*

| නිෂ්පාදිතය | ප්‍රමාණය (ඇමෙරිකානු ඩොලර්) |
|---|---|
| බොර තෙල් | 842,134,492.28 |
| පෙට්‍රල් 92 | 402,899,404.09 |
| පෙට්‍රල් 95 | 29,214,072.39 |
| ඔටෝ ඩීසල් | 634,793,190.84 |
| සුපර් ඩීසල් | 26,104,320.14 |
| ගුවන්යානා ඉන්ධන (JET A-1) | 259,443,609.19 |
| දැවි තෙල් | 45,818,375.79 |
| මුළු එකතුව | 2,240,443,464.72 |

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු අගමැතිතුමියනි, total premium එක කොච්චර ගෙවලා තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

US Dollars 2,240,443,464.72.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

Premium එක?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Total premium එකද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඔව්, ප්‍රශ්නයේ (ඇ) කොටසට පිළිතුර?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
උත්තරය දෙන්නම්. Follow-up question එක හැටියට ඒකේ details කියන්නම්.

(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙළෙඳ පොළ premium මුදලට වඩා වැඩි මුදලක් කිසිදු නැව් තොගයක් සඳහා ගෙවා නොමැත.

(2) (අ) රුපියල් 56,579,700,348.00යි.

ඒ, ආනයනය කළ තෙල් සඳහා සහනාධාර වශයෙන් දීපු මුදලයි.

(ආ) පිළිතුර ඇමුණුම 3 ලෙස **සභාගත*** කරමි.

***සභාමේසය මත තබන ලද ඇමුණුම 3:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு 3:*
*Annex 3 tabled:*

ඉන්ධන සහනාධාර සාරාංශය - 2026 අප්‍රේල්, මැයි, ජුනි

| මාසය | ආයතනය | සහනාධාර මුදල (රුපියල්) |
|---|---|---|
| අප්‍රේල් | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 15,031,506,076.00 |
| | ලංකා ඉන්දියානු තෙල් සමාගම | 2,340,383,740.00 |
| | Sinopec Energy Lanka (Pvt.) Ltd. | 1,501,104,000.00 |
| | RM Parks | 1,666,104,000.00 |
| මැයි | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 14,130,286,456.00 |
| | ලංකා ඉන්දියානු තෙල් සමාගම | 2,137,608,000.00 |
| | Sinopec Energy Lanka (Pvt.) Ltd. | 1,111,756,800.00 |
| | RM Parks | 1,577,268,000.00 |
| ජුනි | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 11,810,558,760.00 |
| | ලංකා ඉන්දියානු තෙල් සමාගම | 2,391,816,438.00 |
| | Sinopec Energy Lanka (Pvt.) Ltd. | 1,345,485,372.00 |
| | RM Parks | 1,535,822,706.00 |
| එකතුව | | 56,579,700,348.00 |

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය ඇමුණුම් සභාගත කළ නිසා මට ඒවාත් අදාළ කරගෙන ප්‍රශ්න අහන්න ටිකක් අමාරුයි. මොකද, උත්තරය මගේ අතේ නැහැ නේ. කමක් නැහැ, ඒවායේ තිබෙන්නේ දිගු විස්තරයක් නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු අගමැතිතුමියනි, කැබිනට් මණ්ඩලය එළඹෙන මාස තුනට - ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් - සහනාධාර වශයෙන් රුපියල් බිලියන 41ක් අනුමත කර තිබෙනවා. මම දැක්කා, ඊයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිතුමා කිව්වා, ලෝක වෙළෙඳ පොළේ විශාල ප්‍රශ්නයක් වුණේ නැත්නම් තෙල් මිල වැඩි කිරීමේ අවශ්‍යතාවක් නැහැ කියලා. හැබැයි, දැනට තැන් 62ක තෙල් හිඟයක් තිබෙනවා. මම දන්නේ නැහැ, පෞද්ගලික සමාගම් එහෙම කරන්නේ බලහත්කාරයෙන්ද, හිතාමතාද කියලා. මිල වැඩි නොකර අඛණ්ඩව තෙල් සංචිත පවත්වා ගෙන යාමේදී පෞද්ගලික සමාගම්වලින් ගැටලුවක් එනවා නම් ඒ සඳහා රජය ගන්නා වූ පියවර කුමක්ද කියා මා අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා ඒ සඳහා පිළිතුර ලබා දෙනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව අපි ඊයේ දිනයේදීත් සාකච්ඡා කළා. ලෝක වෙළෙඳ පොළේ වැඩි වුණු මිලට සාපේක්ෂව දේශීය වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ දමන්න කටයුතු නොකළ නිසා සමාගම්වලට ඇති වන පාඩුව හේතු කොටගෙන තමයි මේ ගැටලුව පැන නැඟී තිබෙන්නේ. එම සමාගම් ඉල්ලා සිටිනවා, ලෝක වෙළෙඳ පොළේ මිලට සාපේක්ෂව දේශීය වෙළෙඳ පොළේත් මිල ඉහළ නංවන්න කියලා. නමුත් අපිට ඒක කරන්න බැරි නිසා අපි ඉදිරි මාස තුන සඳහා ඩීසල් ලීටරයකට රුපියල් 70ක සහනාධාරයක් ලබා දීම සඳහා කටයුතු කර තිබෙනවා. හැබැයි, ඒ තත්ත්වය මත එම සමාගම් තවදුරටත් පාඩු ලබන නිසා වෙළෙඳ පොළට තෙල් නිකුත් කිරීම පැත්තෙන් ඔවුන් යම් යම් සීමා කිරීම් කරලා තිබෙනවා. නමුත් අපි ඒ අයත් එක්ක අත්සන් කර තිබෙන ගිවිසුම් අනුව අපට හැකියාව තිබෙන්නේ ලංකාව තුළ අවම තෙල් තොග පවත්වාගෙන යාම සඳහා වන නියෝග නිකුත් කිරීමට පමණයි. නමුත්, "මෙන්න මෙවැනි තොග ප්‍රමාණයක් නිකුත් කරන්න" කියලා එක් එක් ඉන්ධනහල් වෙත නියෝග ලබා දීමේ හැකියාවක් අමාත්‍යාංශය හැටියට අපට නැහැ. මෙන්න මේ ප්‍රශ්නය නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැටියට අපට කරන්න පුළුවන් වෙන්නේ, වෙළෙඳ පොළ තුළ ඇති වී තිබෙන මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් වෙනදාට සාපේක්ෂව වැඩි වශයෙන් තෙල් තොග නිකුත් කරමින් වෙළෙඳ පොළේ ඇති වී තිබෙන ගැටලුව යම් ප්‍රමාණයකට සමනය කිරීමයි. සාමාන්‍යයෙන් මෙම ගැටලුව ආරම්භ වූ අවස්ථාවේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව market share එක විදියට ගත්තේ සියයට 55ක පමණ ප්‍රමාණයක්. නමුත්, මේ වනවිට එය සියයට 77, සියයට 80 දක්වා වැඩි වෙලා තිබෙනවා.

ඒ වාගේම, අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට අදාළ සමාගම්වලට නියෝග නිකුත් කිරීමේ හැකියාවක් නොමැති වුණත්, වෙළෙඳ පොළ තුළ ගැටලුවක් පැන නොනඟින විධියට තෙල් නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස අපි දැනටමත් ඒ අයට දැනුම් දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you may pose your second Supplementary Question now.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, රජය තමයි regulator. අපි ඒ කාරණය පැත්තකින් තියමුකෝ. ඒගොල්ලන් දැන් තෙල් ආනයනය කිරීම සීමා කර තිබෙනවා නම් ඒක එක ප්‍රශ්නයක්. නමුත්, ඒ අදාළ පෙට්‍රල් ෂෙඩ්වලට තෙල් ලබා නොදීම වෙනම ප්‍රශ්නයක්. ඊළඟට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ market share එක සියයට 77 දක්වා වැඩි වුණු බව ඇත්ත. හැබැයි, ඒ particular පෙට්‍රල් ෂෙඩ් එක, උදාහරණයක් වශයෙන් ගත්තොත් LIOC නම්, ඒකට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් තෙල් දෙන්න බැහැ නේ. එතකොට දැන් මේ සමාගම් හිතාමතාම මේක කරනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒගොල්ලන් එහෙම හිතාමතාම මේක කරනවා නම් regulator විධියට එතැනින් එහාට යන්න බැරිද කියන ගැටලුව මතු වෙනවා. අපි හැමෝම දන්නවා, තෙල්වලට තිබෙන ප්‍රමුඛතාව මොකක්ද කියලා. රටේ සමස්ත ආර්ථිකයට වේවා, ග්‍රාමීය ආර්ථිකයට වේවා, ඕනෑම ක්ෂේත්‍රයකට එහි සුවිශේෂී වැදගත්කමක් තිබෙනවා. තෙල් ගෙන්වන්නේ නැති එක වෙනම ප්‍රශ්නයක්. එහෙම ගැටලුවක් තිබෙනවා නම් - හිතාමතාම තෙල් බෙදන්නේ නැතිව ඉන්නවා නම් - ඒ ගිවිසුම් වෙනස් කරන්න ආණ්ඩුව පෙලඹෙන්නේ නැද්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ලංකාවට තෙල් ගෙන්වීම සීමා කරනවා නම් තිබෙන ගිවිසුම් අනුව අපට එතැනදී ඒ වෙනුවෙන් මැදිහත්වීම සඳහා අවකාශය තිබෙනවා. ඒ, ලංකාව තුළ තෙල් තොග පවත්වාගෙන යෑම සම්බන්ධයෙන්. හැබැයි, එක් එක් ඉන්ධනහල්වලට තෙල් බෙදා හැරීම සම්බන්ධයෙන් මැදිහත් වෙන්න තමයි අපට අවකාශයක් නැත්තේ. Regulator වුණාට, අත්සන් කරලා තිබෙන ගිවිසුම් අනුව එහෙම මැදිහත්වීමක් සඳහා අපට අවකාශයක් නැහැ. 2022 වර්ෂයේදී තමයි අවසානයට ගිවිසුම් අත්සන් කරලා තිබෙන්නේ. ගිවිසුම් හතරක් පිළිබඳව කථා කරන්න පුළුවන්. හැබැයි, එක් එක් ප්‍රදේශයේ ඉන්ධනහල් සඳහා කිසියම් සමාගමක් තෙල් බෙදා හැරියේ නැති වුණොත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කොහොමද කියන කාරණය ඒ කිසිම ගිවිසුමක කිසිම ආකාරයකින් සඳහන් කරලා නැහැ. ඒක නිසා අපට තිබෙන්නේ සීමිත අවස්ථාවක්. දැන් අපට කරන්න පුළුවන්කම තිබෙන්නේ මෙයයි. ඒගොල්ලන් ඉල්ලන ප්‍රමාණයට මිල වැඩි කරන්නත් අපට බැහැ. ඒ වාගේම අපි ඒ අයට කියලා නැහැ, මෙන්න මේ ප්‍රමාණයට, මේ ගණනට තෙල් විකුණන්න කියලා. පවතින ගිවිසුම් අනුව ඒ සමාගම්වලට තමන් කැමති මිලකට, මිල සූත්‍රයට අනුව ඉන්ධන විකුණන්න අවකාශය තිබෙනවා. නමුත් ඒ අය එහෙම කරන්නේත් නැහැ. CPC එක විසින් තමයි තමන්ගේ මිල තීරණය කරලා අමාත්‍යාංශය මඟින් ප්‍රකාශයට පත් කරන්නේ. ඒගොල්ලන් කරන්නේ CPC එකේ මිලට ළංවන මිලක් තීරණය කිරීමයි. හැබැයි, ඒකෙන් ඇතිවෙන අතිරේක වගකීම රජයට භාරගන්න බැහැ. මොකද, ඒගොල්ලන් ඉල්ලන ප්‍රමාණයට වැඩි කරන්නත් බැහැ; ඒ වාගේම සහනාධාර ලබා දෙන්නත් බැහැ. එම නිසා අපට කරන්න පුළුවන්කම තිබෙන්නේ මේක ඒගොල්ලන්ගේ මිල පිරිවැයට අනුරූප වන මිලට විකුණන්න ඒගොල්ලන්ට අවස්ථාව සලසා දෙන එක පමණයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඒක හරි. එහෙමවත් බෙදන්නේ නැත්නම් ගිවිසුම් වෙනස් කරනවා ද කියලායි මම අහන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඒ සම්බන්ධයෙන් අපි operatorsලාත් එක්ක අදත් ජනාධිපති ලේකම් කාර්යාලයේ සාකච්ඡාවක් පවත්වනවා. ඒ අය එකඟ නොවී මේ තත්ත්වයෙන් දිගටම කරගෙන ගියොත්, අපේ තිබෙන ගිවිසුම්වලට අනුකූලව සහ අපේ අමාත්‍යාංශයට තිබෙන බලතල අනුව, ඛනිජ තෙල් සම්බන්ධ පනතේ තිබෙන බලතල අනුව ගන්න ඕනෑ පියවර මොනවාද කියන එක සම්බන්ධයෙන් අපි නීති උපදෙස් අරගෙන ඒ අනුව කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. *[බාධා කිරීමක්]* ඒ කාලයේ ගිවිසුම් ගහනකොට ඔබතුමන්ලා සද්ද නැතුව හිටියා නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You may pose your Question to the Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள் பின்வருமாறு:

1. தேசிய கல்வி டிஜிட்டல்மயமாக்கல் திட்டத்தின்கீழ் தோட்டப் பாடசாலைகளுக்கு கணினிகள் மற்றும் 'ஸ்மாட் போட்'களை - smart boards - வழங்குவதற்கு, பெரும்பாலான தோட்டப் பாடசாலைகளில் அடிப்படை மின்சார வசதியோ அல்லது பாதுகாப்பான கணினி அறைகளோ இல்லாத நிலைக்கு வழங்கப்படும் தீர்வுகள் யாவை?

2. அதன்படி, நாட்டில் மின்சார வசதி இல்லாத தோட்டப் பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை? அப் பாடசாலைகளுக்கு மின்சார இணைப்பை வழங்க என்ன நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன?

3. தோட்டப் பகுதிகளில் அமைந்துள்ள பாடசாலைகளில், இயங்கு நிலையிலுள்ள இணைய இணைப்பு (Broadband/4G) வசதி இல்லாத பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை? அப்பாடசாலைகளுக்கு விரைவாக இணைய வசதியை வழங்க எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை?

4. டிஜிட்டல் சாதனங்களின் (Laptops/Tablets/smart boards) பராமரிப்பு மற்றும் பழுதுபார்ப்புக்காக தோட்டப் பாடசாலை மட்டத்தில் ஒதுக்கப்பட்டுள்ள நிதி ஒதுக்கீடுகள் அல்லது வழிமுறைகள் யாவை?

5. டிஜிட்டல் முறையியல் மற்றும் தகவல் தொடர்பாடல் தொழில்நுட்பத்தைப் (ICT) பயன்படுத்தி கற்பிக்கும் இருமொழி ஆசிரியர்கள் போதுமான அளவு உள்ளனரா? இந்தப் பற்றாக்குறையைப் போக்குவதற்கு அரசாங்கம் எடுத்துள்ள அவசர நடவடிக்கைகள் யாவை?

6. நுவரெலியா மாவட்டத்தின் ஸ்ரீபாத கல்வியியற் கல்லூரியை (Sripada National College of Education) அபிவிருத்தி செய்வதற்கு ஏதேனும் எதிர்காலத் திட்டம் உள்ளதா? அதில் அங்குள்ள மாணவர்களுக்கு டிஜிட்டல் கல்வி மற்றும் செயற்கை நுண்ணறிவு (AI) தொடர்பான பாடம் உள்ளடக்கப்பட்டு இருக்கின்றதா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. මෙම අමාත්‍යාංශය යටතේ ජාතික අධ්‍යාපන ඩිජිටල්කරණ ප්‍රතිපත්තිය යටතේ යෝජනා කර ඇති නිර්ණායක පදනම්ව වතු පාසල් ද ඇතුළු අනෙකුත් පාසල් සඳහා සුහුරු පුවරු ලබා දීමට කටයුතු කරනු ඇත.

   ඉන්දියානු ආධාර යටතේ වතු පාසල් 60ක් සඳහා smart classrooms ස්ථාපනය කිරීමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එම පාසල්වලට එම පන්ති කාමරය අලුත්වැඩියා කිරීම සඳහා ද ප්‍රතිපාදන ලබා දී ඇත.

   ඊට අමතරව තවත් වතු පාසල් 75ක ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 101ක් මෙම වසරේ වෙන්කර ඇති අතර, එම ප්‍රතිපාදන ද අවශ්‍යතාව අනුව මෙම කාර්යය සඳහා යොදා ගත හැකිය.

   වතු පාසල්වල නව ගොඩනැඟිලි ඉදි කිරීම වෙනුවෙන් ද මෙම වසරේ රුපියල් මිලියන 500ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇති අතර, මෙම ප්‍රතිපාදන ද ආරක්ෂිත පන්ති කාමර සැකසීම සඳහා යොදා ගනිමින් සිටී.

2. 
   - පළාත් 6ක පිහිටා ඇති වතු පාසල් 849න් වතු පාසල් 3ක පමණක් විදුලි පහසුකම් ලබා දී නොමැත.
   - එම පාසල් 3න් වතු පාසල් 2ක් Type 3 වර්ගයේ වන අතර, එක් වතු පාසලක් Type 2 වර්ගයේ වේ. උක්ත වතු පාසල් 3න් Dayagma West 02 P.V. සහ Depdeen T.V. යන වතු පාසල් 2ට නව ගොඩනැඟිලි සෑදීමට මුදල් වෙන් කර ඇති අතර, අනෙක් වතු පාසල වන Arnhall T.V. තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන යන බැවින්, එම වතු පාසලට විදුලි පහසුකම් ලබා දී නොමැත.

3. මුළු වතු පාසල් සංඛ්‍යාව 864කි. ඒ අතරින් පාසල් 711ක් සඳහා අන්තර්ජාල පහසුකම් නොතිබුණි. එම පාසල් අතරින් පාසල් 446කට අන්තර්ජාල පහසුකම් ලබා දීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත යොමු කර ඇත.

   ද්විතීයික පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීම යටතේ එම සියලු පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් 2026.12.31වන දිනට ප්‍රථම ලබා දීමට සැලසුම් කර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත විදුලි සංදේශ නියාමන කොමිසම හරහා ලබා දී ඇත. අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඩිජිටල් අධ්‍යාපන කාර්යසාධන බලකායේ මැදිහත්වීම හා උපදේශනය මත අදාළ කාර්යය කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

4. ඩිජිටල් මෙවලම් (Laptops/Tablets/smart boards) නඩත්තුව සහ අලුත්වැඩියාව සඳහා කලාප මට්ටමින් ප්‍රතිපාදන වෙන් කර බෙදා හැර ඇත.

   ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙන් කරපු මුදල්වලින් වියදම් කරපු ප්‍රමාණය තමයි මම මේ කියන්නේ.

   වතු පාසල් සඳහා කෑගල්ල කලාපය වියදම් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 860,000.00ක් වේ. දෙහිඕවිට කලාපයේ වතු පාසල්වල උපකරණ අලුත්වැඩියාව සඳහා රුපියල් 400,500.00ක මුදලක් මේ දක්වා වැය කර ඇත. ඌව පළාතේ දෙමළ මාධ්‍ය පාසල් සහිත කලාප සඳහා පමණක් වෙන් කර ඇති මුදල රුපියල් 1,903,368.00ක් වේ.

   ඒ මුදල වියදම් වෙමින් පවතිනවා.

5. දෙමළ භාෂා ගුරුවරුන් සඳහා e-තක්සලාව හා e-ඉගෙනුම් වැඩසටහන් යටතේ දින 3ක් බැගින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ වතු පාසල් ගුරුවරුන් 376ක් ද, උතුරු පළාතේ ගුරුවරුන් 214ක් ද, නැඟෙනහිර පළාතේ දෙමළ විෂය ගුරුවරුන් 223ක් ද පුහුණු කර අවසන් කර ඇත.

6. ඔව්.
   - 2026 වර්ෂයේ ශ්‍රීපාද විද්‍යා පීඨයේ ක්‍රියාත්මක කෙරෙමින් පවතින සංවර්ධන කටයුතු සඳහා රු.71,129,848.32ක් වෙන් කර ඇත.

     ඒ මුදල ශ්‍රීපාද විද්‍යාපීඨයේ විවිධ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා වෙන් කර තිබෙනවා. ඊට අදාළ විස්තර සහිත ඇමුණුම පහත පරිදි වේ.

ඇමුණුම:

| NCoE | | Description of work | Sanctioned Amount (Rs.) |
|---|---|---|---|
| Sripada National College of Education | 1 | Essential repairs to the women' s hostel GH 04 (122'x23', three-storey) and GH 01(122'x23', three-storey) | 17,183,206.15 |
| | 2 | Essential repairs to the women' s hostel GH 02 (122'x 23', three-storey) and GH 03(122'x23', three-storey) | 16,829,077.00 |
| | 3 | Essential repairs to the three-storey men's hostel (122'x25') | 9,138,926.00 |
| | 4 | Library building (103'x45') | 1,850,310.00 |
| | 5 | Repair of Quarters Building (President's Quarters, Vice President's Quarters etc.) | 6,698,388.85 |
| | 6 | Essential repairs of minor staff quarters (male quarters-size 16.9m x 45.6m) | 5,924,063.81 |
| | 7 | Renovation of Bachelor Quarters (Male 25.20 x 10.75m) | 6,611,255.35 |
| | 8 | Renovation of Bachelor Quarters (Female 25.20 x 10.75m) | 6,894,621.16 |

2027 වර්ෂයේ සිට ඉදිරි වසර 5 සඳහා ශ්‍රීපාද විද්‍යා පීඨයේ සැලසුම් කර ඇති සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 1,520ක් වෙන් කර ඇත.

අවුරුදු 5ක වැඩ පිළිවෙළක් යටතේ ශ්‍රීපාද විද්‍යා පීඨයත් දියුණු කරන්න තමයි අපි සැලසුම් කරලා තිබෙන්නේ.

**ඩිජිටල් අධ්‍යාපන සහ AI පිළිබඳ විෂය**

1. දැනට ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ සියලුම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා AI ඍජු විෂයයක් ලෙස අන්තර්ගත කිරීමට ඇති හැකියාව සලකා බැලෙනු ඇත.

2. ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය - LMS

   පන්ති, පැවරුම් සහ දේශන සටහන්, Google Classroom, Moodle හරහා බෙදා හරිනු ලැබේ. ශිෂ්‍ය, ගුරුවරුන් විසින් පැවරුම් අන්තර්ජාලය ඔස්සේ ඉදිරිපත් කරනු ලබයි.

3. ඉගැන්වීම් කටයුතු සඳහා ඩිජිටල් මෙවලම් භාවිතය

   පාඩම් වඩාත් ඵලදායී කිරීම සඳහා දේශකවරුන් විසින් බහු මාධ්‍ය ප්‍රොජෙක්ටර් - multimedia projectors, PowerPoint ඉදිරිපත් කිරීම්, අධ්‍යාපනික වීඩියෝ සහ Kahoot, Quizizz හෝ Mentimeter වැනි වෙනත් අන්තර් ක්‍රියාකාරි මෙවලම් භාවිත කරනු ලබයි.

4. අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන ඇගැයීම්

   අඛණ්ඩ ඇගැයීම් ක්‍රියාවලිය සඳහා කෙටි ප්‍රශ්නාවලි - quizzes - අන්තර්ජාල පරීක්ෂණ සහ විද්‍යුත් කළඹ - e-portfolios - හඳුන්වා දීලා තිබෙනවා.

5. යටිතල පහසුකම් සංවර්ධනය

   විද්‍යාලය සතුව අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක විද්‍යාගාරයක් සහ අධ්‍යයන කටයුතු සිදු කෙරෙන ප්‍රදේශවල Wi-Fi පහසුකම් පවතී. ස්මාර්ට් පන්ති කාමර පහසුකම් අර්ධ වශයෙන් ස්ථාපිත කර තිබෙනවා.

6. ධාරිතා සංවර්ධනය

   දේශකවරුන් සහ ශිෂ්‍ය - ගුරුවරුන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය - ICT - කුසලතා, Google මෙවලම් සහ Microsoft Office භාවිතය පිළිබඳ වැඩමුළු පවත්වා තිබෙනවා.

ඒ සඳහා අවශ්‍ය ඩිජිටල් පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් desktop computers, laptop computers, smart boards with conference platforms, normal smart boards, movable laptop charging racks ලබා දීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත.

විද්‍යා පීඨ පරිශ්‍රය තුළ අන්තර්ජාල සම්බන්ධතා - Internet Fibre Connection and network - වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග මේ වන විට ආරම්භ කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) V.S. Radhakrishnan, if you have any Supplementary Questions, you may raise the first.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

Thank you very much, Hon. Prime Minister.

ඔය කියන ඔක්කෝම කරනවා නම් වඩා හොඳයි; මමත් ස්තුතිවන්ත වෙනවා. මොකද, පසුගිය කාලවල මුදල් වෙන් කළාට වැඩේ වුණේ නැහැ. ඔබතුමිය මේ අවුරුදු දෙකතුන ඇතුළේ ඔය ටික කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා, ගරු අගමැතිතුමියනි.

ඊයේ පෙරේදා මට Indian High Commissioner හම්බ වුණා. ඒගොල්ලන් 2022දී, 200-year-old plantation community එකට Indian Housing Project කියලා project එකක් දුන්නා. ඒ project එකට දීපු Rs. 2.5 billion තිබෙනවාලු. වතු පාසල්වලට හෝ for anything, you can use it. මොන project එකට හෝ ඒවා use කරන්න කියලා ඒගොල්ලෝ කියනවා. ඒ Rs. 2.5 billion අරගෙන education පැත්තට වියදම් කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඔබතුමියට ඒ ගැන අදහසක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි වෙන් කළ මුදල් අනිවාර්යයෙන්ම අපි වියදම් කරනවා; අපි සැලසුම් සහගතවයි ඒ කටයුතු කරන්නේ. අපි පොදුවේ විද්‍යා පීඨ දියුණු කරන්න සැලසුම් කරලා තිබෙනවා, විශේෂයෙන්ම ශ්‍රීපාද විද්‍යා පීඨය ඇතුළුව. වතුකරයේ පාසල්වලට දෙමළ මාධ්‍යයේ ගුරුවරුන් වැඩි කිරීමේ සැලැස්මක් අනුව තමයි අප ඒක කරන්නේ. ඒකයි අප අවුරුදු 5ක සැලැස්මක් හදලා ඉදිරිපත් කරලා ඒකට අනුමැතිය ලබාගෙන ඒ අනුව ක්‍රියාත්මක වෙන්නේ. අපි පටන් ගත්තු වැඩ අනිවාර්යයෙන්ම අපි කරනවා. 2022 අවුරුද්දේ ඔබතුමා ඔය කියන කාරණය ගැන මට ලොකු අවබෝධයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මම ඒක සොයා බලන්නම්. අධ්‍යාපනය වෙනුවෙන් ඒ මුදල පාවිච්චි කරන්න අපට හැකියාවක් තිබෙනවා නම්, අපි ඒ ගැන කථා කරලා බලන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Radhakrishnan, you may raise your second Supplementary Question.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

අධ්‍යාපනයට කියලා නොවෙයි, ඒ Rs. 2.5 billion පොදුවේ වෙන් කරලා තිබෙන්නේ. Plantation community එකට අවුරුදු 200 සමරන්න තමයි Indian Government එක ඒක වෙන් කරලා තිබෙන්නේ. අපි කියන්නේ ඒක අධ්‍යාපන අමාත්‍යාංශයට අරගෙන ඒකෙන් අධ්‍යාපනය දියුණු කරන්න කටයුතු කරන්න කියලා. ඒක වෙන දෙයකට දාන්නේ නැතිව අධ්‍යාපනයට යොමු කරන්න කියලා තමයි අපි යෝජනා කරන්නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ යෝජනාව භාර අරගෙන අපි කථා කරලා බලන්නම්. සමහර විට ඒක Ministry of Plantation and Community Infrastructure යටතේ වෙන්න පුළුවන් තිබෙන්නේ. අපි කථා කරලා බලමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Question No. 4, the Hon. Padmasiri Bandara.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ගරු අගමැතිතුමියගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය, යටිතල පහසුකම් සහ ප්‍රතිපත්තිමය සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම උදෙසා අධ්‍යාපන සභාව පිහිටුවීම අතිශය තීරණාත්මක සහ කාලීන අවශ්‍යතාවකි.

1. අධ්‍යාපන සභාව පිහිටුවීමේ අරමුණු සහ වත්මන් ප්‍රගතිය කුමක්ද?

2. මෙම සභාව ස්ථාපිත කිරීම හරහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන නියාමනය කිරීමටත්, පාඨමාලාවල ප්‍රමිතිය තහවුරු කිරීමටත් අපේක්ෂිත ක්‍රමවේදය කවරේද?

3. උසස් අධ්‍යාපන සභාව පිහිටුවීමට අදාළ කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට නියමිත කාල රාමුව කුමක්ද?

4. පාසල් පද්ධතියේ ගුණාත්මකභාවය උසස් කිරීම උදෙසා මේ හරහා ගුරුවරුන් සඳහා වෘත්තීය බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට සැලසුම් කර තිබේද?

5. මෙම නව ප්‍රතිසංස්කරණ හරහා ගුරු වෘත්තියේ අභිමානය තහවුරු කිරීමට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් නැංවීමට අපේක්ෂිත වැඩ පිළිවෙළ කුමක්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප යෝජනා කරලා කැබිනට් අනුමැතිය ලබාගෙන තිබෙන්නේ උසස් අධ්‍යාපන සභාවක් පිහිටුවන්න නොවෙයි, අධ්‍යාපන සභාවක් පිහිටුවන්නයි. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සිද්ධ වන්නේ UGC එක හරහායි. UGC එකේ තිබෙනවා, Quality Assurance and Accreditation Committee එකක්. ඒක හරහා තමයි උසස් අධ්‍යාපනයේ නියාමනය සිදු වන්නේ. පොදුවේ සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ එහි නියුතු වෘත්තිකයන් ශක්තිමත් කිරීම වෙනුවෙන් තමයි අප අධ්‍යාපන සභාව ස්ථාපිත කරන්න යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. අධ්‍යාපන සභාව පිහිටුවීමේ අරමුණු:

   - වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපන වෘත්තිකයන් ලියාපදිංචි කිරීම, වැඩසටහන් සහ ආයතනවල තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතනය සහ වැටුප් සම්බන්ධ කාරණා සඳහා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම,
   - වෘත්තීය සංවර්ධනය, ප්‍රමිතිකරණය, ලියාපදිංචිය, තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයාට උපදෙස් දීම,
   - පෙර පාසල්, ප්‍රාථමික සහ ද්විතීයික මට්ටම්වල සිට සෑම මට්ටමකදීම අධ්‍යාපන වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය සහ ලියාපදිංචිය නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම,
   - පූර්ව නිශ්චිත නිර්ණායක සහ ගුණාත්මක මිනුම් මත පදනම්ව අධ්‍යාපන වෘත්තිකයන් ලියාපදිංචි කිරීම,
   - වෘත්තීය සංවර්ධන වැඩසටහන් සහ වෘත්තීයභාවය වැඩිදියුණු කිරීම,
   - ද්විභාෂා අධ්‍යාපන අවස්ථා සෑම දෙනාටම ලබා දීම සඳහා උසස් තත්ත්වයේ ද්විභාෂා අධ්‍යාපනඥයන් බිහි කිරීම,
   - ජාත්‍යන්තරව පිළිගත් හා ගෞරවනීය අධ්‍යාපන වෘත්තිකයන් නිර්මාණය කිරීම,
   - අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම,
   - අධ්‍යාපන වෘත්තිකයන් පොදු ජාතික අරමුණු සහ ඉලක්ක කරා යොමු කිරීම,
   - අධ්‍යාපන වෘත්තිකයන්ගේ සුබසාධනය වැඩිදියුණු කිරීම,
   - අධ්‍යාපන වෘත්තිකයන් අතර සමඟිය සහ සහයෝගීතාව වර්ධනය කිරීම සහ සියලු පුරවැසියන්ට සාධාරණ සහ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම,
   - බඳවා ගැනීම් සහ උසස්වීම් සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා සුදුසුකම් ප්‍රමිතිකරණය කිරීම, සහ
   - අධ්‍යාපන වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගැටලු විසඳීම සඳහා අධ්‍යාපන වෘත්තිකයන් සහ රජය අතර මැදිහත්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම.

   අධ්‍යාපන සභාව පිහිටුවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ලේකම් විසින් පත් කරන ලද විද්වත් කමිටු සාමාජිකයින් විසින් සකස් කරන ලද වාර්තාව සඳහා උක්ත අරමුණු සලකා අධ්‍යාපන සභාවක් පිහිටුවීමට අදාළව පනත් කෙටුම්පතක් සම්පාදනයට අමප/26/1525/806/084 හා 2026.08.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත.

   එනම්, උක්ත වාර්තාව මඟින් පෙන්වා දී ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් යොමු කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා දැනට බලාත්මක අනෙකුත් නෛතික විධිවිධාන අතර ගැටුමක් ඇති නොවන පරිදි එම වාර්තාව මත පදනම්ව අධ්‍යාපන සභාව ස්ථාපිත කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අදාළ වාර්තාව යොමු කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.

2. රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන නියාමනය කිරීම හා පාඨමාලාවල ප්‍රමිතිය තහවුරු කිරීම මෙම අධ්‍යාපන සභාව පිහිටුවීම මඟින් අපේක්ෂා නොකරන අතර, - මම කිව්ව විධියට ඒක උසස් අධ්‍යාපන branch එකෙන් සහ UGC එකෙන් කෙරෙන්නේ- සාමාන්‍ය අධ්‍යාපනයේ ඉහතින් දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන සභාව ස්ථාපිත කිරීම යෝජිතය.

3. උසස් අධ්‍යාපන සභාවක් පිහිටුවීමට නොව අධ්‍යාපන සභාව පිහිටුවීමට අදාළ පනත් කෙටුම්පතේ කටයුතු වසරක කාලය තුළ අවසන් කිරීමට අපේක්ෂිතය.

4. ඔව්.

අධ්‍යාපන වෘත්තිකයන් සඳහා බලපත්‍ර ලබා දීමේ හා සහතික කිරීමේ ක්‍රියාවලීන් කළමනාකරණය, අයදුම්පත් සමාලෝචනය, තක්සේරු කිරීම් සහ නිපුණතා ප්‍රමිතීන් මත පදනම්ව සුදුසුකම් ලත් පුද්ගලයින්ට බලපත්‍ර ප්‍රදානය කිරීම් ද මෙමඟින් සිදු කිරීමට අපේක්ෂිතය.

5. ගුරු වෘත්තිකයින්ට ද බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම තුළින් අනෙකුත් වරලත් වෘත්තිකයින්ට හිමි වෘත්තීයභාවය ගුරු වෘත්තිකයින්ට ද ලබා දීම මඟින් ගුරු වෘත්තියේ අභිමානය තහවුරු වේ.

ගුරුවරුන්ගේ වෘත්තීය වගකීම කාර්යක්ෂමව ඉටු කිරීමට හැකි වන පරිදි පාසල් හා පන්ති කාමර මට්ටමින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කෙරේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Padmasiri Bandara, do you have any Supplementary Questions to be asked from the Hon. Prime Minister?

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු අගමැතිතුමියනි, අධ්‍යාපන සභාව පිහිටුවීම රටේ ඉතාම ආන්දෝලනාත්මක කාරණාවක් බවට පත් වී තිබෙනවා. ඒ ගැන සමාජයෙන් බොහොමයක් වැරදි මත අපට අහන්න සහ දකින්න ලැබුණා. මේ අවස්ථාවේ ඔබතුමිය විසින් එයට ඉතාම නිවැරදි පිළිතුරක් ලබා දුන්නා. එයට බොහොම ස්තුතියි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

කාලයක් තිස්සේ මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ බරපතළ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අර්බුදයට ගිහිල්ලා තිබුණු අධ්‍යාපන ක්ෂේත්‍රය අපි බලාපොරොත්තු වුණු ප්‍රමාණයට තවමත් ගොඩ ගැනීමට නොහැකි තත්ත්වයක පවතිනවා. ගුරු සේවය, විදුහල්පති සේවය, අධ්‍යාපන පරිපාලන සේවය සහ අධ්‍යාපනඥ සේවය කියන්නේ මෙම පද්ධතියේ පවතින ප්‍රධාන සේවාවන්. රටක අධ්‍යාපනය සංවර්ධනය කරන්නට නම් මේ සේවාවන් ඉතාම ක්‍රමවත්ම, විධිමත්ව සහ ක්‍රමානුකූලව ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය කාරණාවක්. ගරු අගමැතිතුමියනි, මෙම සේවාවන්වල පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පවතිනවා. එම තත්ත්වයන් පිළිබඳව නියාමනයක් අධ්‍යාපන සභාවෙන් සිදු වනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔව්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන සභාවේ අරමුණක් තමයි සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ඒ කියපු සේවාවන් සියල්ලගේම නියාමනය, වෘත්තීයභාවය රැක ගැනීමේ ක්‍රමවේද සහ නිර්ණායක සැකසීම. ඇත්තවශයෙන්ම අධ්‍යාපන සභාවේ වාර්තාව සැකසීමට මෙම සියලු ක්ෂේත්‍ර නියෝජනය කරමින් වෘත්තිකයන් සහභාගි වුණා. ගරු මන්ත්‍රීතුමා මතු කළ පුරප්පාඩුත් අපි මේ වෙලාවේ පුරවමින් යන්නේ. එතුමා මතක් කළ විධියටම අවුරුදු ගණනාවක් තිස්සේ සමහර සේවාවන්වලට බඳවා ගැනීම් සිද්ධ වෙලා නැහැ. නමුත්, අපේ තිබෙන ආර්ථික සීමා තුළ වුණත් අපි 2025දීත්, 2026දීත් එම පුරප්පාඩු ක්‍රමානුකූලව පුරවමින් යනවා.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, අපේ රටේ ගුරුවරුන් සහ වෙනත් අය විසින් දරුවන්ට ගුණාත්මකභාවයෙන් යුක්තව අධ්‍යාපනය ලබා දීමේ යම් ඌනතාවක් තිබෙන බව. ඒ වාගේම අවිධිමත් බවක් තිබෙන බව. ගරු අගමැතිතුමියනි, ඔබතුමියගෙන් මම අහපු මූලික ප්‍රශ්න 5 ඇතුළෙත් ඒ ගැන අදහසක් තිබුණා. මම අහන්නේ, මෙම සමස්ත අධ්‍යපන ක්‍රියාවලිය පිළිබඳව නියාමනය කිරීම සඳහා අධ්‍යාපන සභාවේ වැඩ පිළිවෙළක් පවතිනවාද කියලායි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන සභාවෙන් කෙරෙන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළෙන වෘත්තිකයන්ගේ වෘත්තිකභාවය රැක ගැනීම සහ නියාමනය කිරීම. එතකොට ඔවුන්ගේ capacity එක වැඩි වෙනකොට, ඔවුන්ගේ ගුණාත්මකභාවය, වෘත්තිකභාවය වැඩි වෙනකොට අනිවාර්යයෙන්ම අධ්‍යාපනයට තමයි ඒකේ impact එක දැනෙන්නේ. හැබැයි, අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම අධ්‍යාපන සභාවෙන් නියාමනය වෙන්නේ නැහැ. ඒක අමාත්‍යාංශයෙන් කරන්න ඕනෑ. අපි අධ්‍යාපන සභාව හදන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළෙන වෘත්තිකයන්ගේ වෘත්තිකභාවය ආරක්ෂා කිරීමට සහ දියුණු කිරීමටයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member, what is your point of Order?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු අගමැතිතුමියනි, මම 2026.09.09වැනි දින ඔබතුමියට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඔබතුමිය ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට සති දෙකක කාලයක් ගත්තා. දැන් මාසයක් විතර වෙනවා. ඒක හම්බන්තොට ධීවරයන්ගේ ප්‍රශ්නයක්; හම්බන්තොට වරායේ කළු ගල් මාලදිවයිනට අපනයනය කිරීමේ වැඩ පිළිවෙළ ගැන ලොකු ප්‍රශ්නයක්. මට මේ ගැන ඉක්මනට දැන ගන්න ඕනෑ, ගරු අගමැතිතුමියනි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන සොයා බලලා පුළුවන් තරම් ඉක්මනට උත්තර ලබා දෙන්නම්.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ලංකා සතොස සමාගම: 2020-2025 කාලසීමාව තුළ කාර්යසාධනය
லங்கா 'சதொச' நிறுவனம்: 2020-2025 வரை செயற்றிறன்
LANKA SATHOSA LIMITED: PERFORMANCE FROM 2020-2025

475/ 2025

**1. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා සතොස සමාගම 2020 සිට 2025 දක්වා වර්ෂවලදී වාර්තා කරන ලද ලාභය හෝ අලාභය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක වන එකී ආයතනයේ අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) අද දින වනවිට එම ආයතනයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) වැටුප් සහ දීමනා වෙනුවෙන් දරන ලද මුළු වියදම කොපමණද;

(v) ඉහත (i)හි සඳහන් එක් එක් වර්ෂය තුළ ගෙවන ලද සෘජු සහ වක්‍ර බදු ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එකී ආයතනයේ ප්‍රාග්ධන පදනම කවරේද;

(vii) එකී ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා 2020 සිට 2025 දක්වා ලබාගෙන ඇති ණය ප්‍රාග්ධනය, එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 2020 සිට 2025 දක්වා එක් එක් වර්ෂය සඳහා එකී ආයතනයේ වාර්ෂික පිරිවැටුම සහ විකුණුම් පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட லங்கா 'சதொச'இனால் 2020ஆம் ஆண்டு முதல் 2025ஆம் ஆண்டு வரை பதிவு செய்யப்பட்ட இலாபம் அல்லது நட்டம் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) தற்போதுள்ளவாறாகக் குறிப்பிட்ட நிறுவனத்தின் செயற்பாட்டிலுள்ள விற்பனை நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இன்றுள்ளவாறாகப் பணியாற்றுகின்ற ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) சம்பளங்கள் மற்றும் ஊதியங்களால் ஏற்பட்ட மொத்தச் செலவினம் யாது என்பதையும்;

(v) மேலே (i)இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு வருடத்துக்கும் செலுத்தப்பட்ட நேரடி மற்றும் மறைமுக வரிகளின் தொகையை வெவ்வேறாக யாது என்பதையும்;

(vi) குறிப்பிட்ட நிறுவனத்தின் மூலதனத் தளம் யாது என்பதையும்;

(vii) குறிப்பிட்ட நிறுவனத்தில் 2020ஆம் ஆண்டு முதல் 2025ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் செயற்பாட்டுக்காகப் பெற்றுக்கொள்ளப்பட்ட கடன் மூலதனம் வெவ்வேறாக யாது என்பதையும்;

(viii) 2020-2025 காலப்பகுதியில் ஒவ்வொரு வருடத்திலும் நிறுவனத்தின் வருடாந்தப் புரள்வு மற்றும் விற்பனைச் செலவு வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) profit or loss recorded by Lanka Sathosa Ltd. from 2020 to 2025, separately;

(ii) number of outlets of the said institution in operation as at present;

(iii) number of employees as at today;

(iv) total expenditure incurred on salaries and emoluments;

(v) amount of direct and indirect taxes paid during each year referred to in (i) above, separately;

(vi) capital base of the said institution;

(vii) loan capital obtained for the operation of said institution from 2020 to 2025, separately; and

(viii) annual turnover and the cost of sales of the institution during each year from 2020-2025, separately?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඇමුණුම මඟින් දක්වා ඇත.

**ඇමුණුම:**

| | කෙටුම්පත 2025 | විගණනය කරන ලද 2024 | විගණනය කරන ලද 2023 | විගණනය කරන ලද 2022 | විගණනය කරන ලද 2021 | විගණනය කරන ලද 2020 |
|---|---|---|---|---|---|---|
| කාල පරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය | (රු.721,293,999) අලාභය | (රු.776,083,216) අලාභය | (රු.695,233,136) අලාභය | (රු.35,444,513 )අ ලාභය | (රු.840,281,276) අලාභය | (රු.1,387,666,644) අලාභය (රුපියල් බිලියන 1.3) |

(ii) අළෙවි සැල් 423ක් ඇත.

(iii) සේවකයින් 3,200ක් පමණ සිටී.

(iv) 2025 වර්ෂය සඳහා වැටුප් හා දීමනා වශයෙන් රුපියල් මිලියන 3342.9ක් - රුපියල් බිලියන 3.3ක් - වියදම් වෙනවා.

(v)

| | 2025 | 2024 | 2023 | 2022 | 2021 | 2020 |
|---|---|---|---|---|---|---|
| ඍජු බදු (රුපියල්) | 42,128,654 | 52,480,586 | 54,111,283 | - | - | 11,937,766 |
| වක්‍ර බදු (රුපියල්) | 554,615,232 | 769,996,999 | 42,391,607 | 290,936,290 | 82,336,965 | 6,603,818 |
| බදු එකතුව (රුපියල්) | 596,743,886 | 822,477,585 | 96,502,890 | 290,936,290 | 82,336,965 | 18,541,584 |

(vi) 2025 දෙසැම්බර් 31වන දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 893,752,720කි.

(vii) ලංකා සතොස සමාගම 2020 සිට 2025 දක්වා කාලය තුළ කිසිදු නව ණයක් ලබාගෙන නොමැත. (ස්කන්ධ ප්‍රාග්ධනය පමණක් ලබාගෙන ඇත.)

(viii)

| | කෙටුම්පත 2025 | විගණනය කරන ලද 2024 | විගණනය කරන ලද 2023 | විගණනය කරන ලද 2022 | විගණනය කරන ලද 2021 | විගණනය කරන ලද 2020 |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපාර පිරිවැටුම (රුපියල්) | 51,533,897,266 | 52,822,962,708 | 58,178,566,801 | 57,164,922,663 | 40,850,538,912 | 35,578,943,527 |
| විකුණුම් පිරිවැය (රුපියල්) | (45,177,272,713) | (46,261,974,449) | (51,055,254,523) | (49,843,377,168) | (35,961,364,850) | (31,760,287,760) |

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, you may pose your first Supplementary Question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, සතොස ශාඛා 423ක් තබාගෙන රටේ තිබෙන market share එකෙන් යම් ප්‍රතිශතයක් දරාගන්න පුළුවන් මට්ටමට මේ ආයතන දැන් තල්ලු කරගෙන යනවා. මේ තුළ ඔබතුමන්ලාට තිබෙන ලොකුම ප්‍රශ්නය, පිරිවැටුම ඇති කරන්න තිබෙන කාරක ප්‍රාග්ධනයේ ඌනතාවයි. ඒ කාරක ප්‍රාග්ධනයේ ඌනතාව නිසා අද රුපියල් කෝටි 1,400ක් විතර ගෙවන්න තිබෙනවා, suppliersලාට. ඒ ප්‍රශ්නය නිසා ඔබතුමන්ලාට මම හිතන විධියට මේ ආයතන දියුණු මට්ටමට අරගෙන භාණ්ඩ විකුණන්න පුළුවන් හැකියාව වාගේම සියයට 13ක දළ ලාභයක් - gross profit එකක් - ගෙන ඒමට නොහැකි විධියේ අමාරු තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඉතින් කොයි ආකාරයෙන්ද ඔබතුමා මේ business එක re-engineer කරන්නේ? මොකද, ඒ සාධක දෙක නැතිව ඔබතුමාට තරග කරන්න බැහැ, ඔය තිබෙන අනෙක් supermarkets සමඟ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, සතොස පිළිබඳව ඔබතුමාත් හොඳටම දන්නවා. අපි 2025දී, නැත්නම් 2024 දෙසැම්බර් මාසයේදී මේ පිළිබඳව සොයා බලනකොට accumulated loss එක රුපියල් බිලියන 22යි. ඒ වනකොට සැපයුම්කරුවන්ට ගෙවීමට තිබිච්ච මුදල රුපියල් මිලියන 14,000යි. හැබැයි, මුළු සතොසම සතුව තිබිච්ච තොගයේ වටිනාකම රුපියල් මිලියන 5,800යි. ඒ කියන්නේ ඒ තොග ඔක්කෝම වික්කත් මේක තමයි තිබෙන ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය බැංකු දෙකකට overdraft - OD - එකක් තිබුණා, රුපියල් මිලියන 5,300ක. අපට තිබුණා, ශාඛා 452ක්. ඒ 452න් 250ක් අලාභයි. ඒ නිසා සතොස ප්‍රතිසංවිධානය කරන්න - re-engineer කරන්න - අවශ්‍ය තීන්දු තීරණ ගණනාවක් අපි ගත්තා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කාරක ප්‍රාග්ධනය සම්බන්ධ ප්‍රශ්නයට උත්තරයක් ලෙස overdraft - OD - එකට අපට මාසිකව රුපියල් මිලියන 40ක interest එකක් ගෙවන්න තිබුණා. ඒ නිසා රජය මේ සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා. ඒ අනුව එම overdraft එක භාණ්ඩාගාරය භාරගෙන ඒකෙන් අපි සතොස නිදහස් කළා.

ඊළඟ කාරණය මෙයයි. අපි මේ වනකොට සතොස වෙළෙඳ සැල් විශාල ප්‍රමාණයක් ප්‍රතිසංවිධානය කරන්න අවශ්‍ය කරන තීන්දු අරගෙන relocate කරනවා. ඒ සමහර සතොස ශාඛා අපට වහන්න වෙලා තිබෙනවා. මොකද, ඒවා කිසිම feasibility study එකක් නැතුව ස්ථාපිත කිරීම නිසා බරපතළ ලෙස පාඩු ලබනවා. ඒ වාගේම අපි මේ අවුරුද්දේත් නව shops 25ක් අලුතෙන් විවෘත කරනවා. ඒ 25න් 11කට අපි ගිවිසුම් අත්සන් කරන්න සූදානම් කරලා ඉවරයි. මේ වනකොට ගිවිසුම් 7ක් අත්සන් කරලා ඒ කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම තවත් ශාඛා 14ක් අපි හඳුනාගෙන තිබෙනවා. ඒවා සම්බන්ධව negotiate කරමින් තිබෙනවා, ගිවිසුම් අත්සන් කිරීම සඳහා. ඒ වාගේම shops 100ක් ප්‍රතිසංවිධානය කරලා ඒවාට අවශ්‍ය රාක්ක ටිකේ ඉඳන් deep freezers, fridges කියන සියලු දේ අලුත්වැඩියා කර නව පෙනුමකට සතොස ගේන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි දැන් ක්‍රියාත්මක කරලා ඒ සඳහා ටෙන්ඩර් කැඳවමින් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, පසුගිය වසර ගණනම බැලුවොත් සතොස හැමදාම අලාභ ලබමිනුයි තිබුණේ. අපි 2024 accounts ටික check කරගෙන එනකොට අපට 2025 තව ගිණුමක් හසුවුණා. ගරු මන්ත්‍රීතුමනි, reconciliation account එකක් තිබෙනවා, රුපියල් මිලියන 1,400ක් නැහැ. ඒකත් මේ loss එකට එකතු වනවා. ඒ loss එකත් එක්ක රුපියල් මිලියන 24,000ක loss එකක් එකතු වෙලා තිබෙනවා. ශාඛා 100ක් ප්‍රතිසංවිධානය කරන ගමන් franchise system එකකට ගිහිල්ලා "සතොස" නාමය යටතේ නැවත බඩු විකුණන්න පුළුවන් system එකක් ඉදිරියේදී ස්ථාපිත කරන්න අපි බලාපොරොත්තු වනවා. හැබැයි, ඒකට අපට හොඳ stores system එකක් ඕනෑ. ඒ නිසා අපි ගබඩා පද්ධති නවීකරණයක් සඳහා වෙච්ච යෝජනාවකුත් හදනවා. අපි වැලිසර ප්‍රදේශයේ නවීන පන්නයේ ගබඩාවක් ඉදිකරන්න අවශ්‍ය proposal එක හදලා Budget එකට ඉදිරිපත් කර තිබෙනවා.

ඒ වාගේම අපි මෙම අලාභය අඩු කරගන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ අරගෙන ක්‍රියාත්මක කරන ගමන්, සැපයුම්කරුවන් එක්ක සාකච්ඡා කරමින්, පරණ ණය ටික ටික ගෙවමින්, අලුත් ණය මුදල් ආපසු ගෙවන ගමන් price එක අඩු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළත් ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාත් මේ ගැන දන්නවා. වෙනදා වාගේම සතොසට බඩු දමන්නේ අනෙක් ඔක්කොටම දාලා ඉතිරි වන ටික. සතොසට ඒ විධියට බඩු දමන්න තමයි සැපයුම්කරුවන් බලාගෙන ඉන්නේ. අපි පසුගිය මාස තුනේ suppliersලා අටදෙනෙකුට වැඩිය blacklist කළා. මොකද, sample එක විධියට හොඳ බඩු ගෙනැත් පෙන්වනවා, තොග ගෙනැත් දෙනකොට කුණු වෙච්ච ඒවා දෙන්නේ. අපි මේ ගැනත් ලොකු අරගළයක් කරමින් තිබෙනවා. ඔබතුමා කියනවා වාගේ අපේ බෙදා හැරීමේ ජාලයට ඉදිරියේදී සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවත් එකතු කරගනිමින් සතොසට අඩුවට බඩු දෙන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදන්න කටයුතු කරමින් තිබෙනවා. පරණ පව් ඔක්කෝම එකපාර අහෝසි කරන්න බැහැ තමයි. අපි ඒවා ගැන පියවරෙන් පියවර කටයුතු කරනවා.

රුපියල් මිලියන 24,000ක එකතු වෙච්ච අලාභය, රුපියල් මිලියන 14,000ක් වන සැපයුම්කරුවන්ට ගෙවන්න තිබෙන මුදල්, ඒ වාගේම බැංකුවට ගෙවන්න තිබුණු රුපියල් මිලියන 5,200ක overdraft එක යන සියල්ල balance කර ගනිමින් අපි පසුගිය මාස දෙකම අඛණ්ඩව ලාභ ලබමින් යනවා. අපි මේ අවුරුද්දේ මාස 4ක් ලාභ ලබලා තිබෙනවා. ගිය අවුරුද්දේ තිබුණු රුපියල් මිලියන 700කට ආසන්න අලාභය - accumulated loss එක - මේ වනකොට රුපියල් මිලියන 70කට අපි අඩු කරලා තිබෙනවා. අපි මේ අවුරුද්ද අවසන් වනකොට breakeven එක පහු කරලා සතොස අලාභ නොලබන තත්ත්වයට ගේන්න කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, do you have a second Supplementary Question?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා දීපු උත්තර මම පරිශීලනය කළා. එතුමා ඉලක්ක කරලා තිබෙන්නේ සියයට දහතුනහමාරක දළ ලාභයක් සොයා ගැනීම. මේක supermarket chain එකේ මොන විධියකටවත් කරන්න බැහැ, අත්‍යවශ්‍ය භාණ්ඩවලට සියයට 80ක් යනකොට. ඒ ප්‍රමාණය සියයට 13ක් කරනවා නම්, කවුරුවත් ඔකට එන්නේ නැහැ. ඔබතුමාගේ පිරිවැටුමෙන් සියයට 80ක් විතර යන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩවලට නේ. මේ සම්බන්ධයෙන් ඔබතුමා තොග එකතු කිරීමේ අවශ්‍යතාවක් නැහැ. මේකේ supply credit එක දවස් 45 ලැබෙනකොට ඔබතුමා සල්ලිවලට විකුණනවා මිස creditවලට විකුණන්නේ නැති නිසා cash flow එක තිබෙනවා, ඔබතුමාට වැඩේ කරන්න.

මේකේ තිබෙන ප්‍රශ්නය මෙයයි. තොග මට්ටමට warehouse එක ආවාට පස්සේ සියයට තුනහමාරක, හතරක බඩු නැතිවෙන්නේ ඔන්න ඔතැනදී. ඒක නිසා තමයි ලාභය අලාභය වෙන්නේ. මේ අනුව ඔබතුමාට operational profit එකක් තිබුණාට, දළ වශයෙන් අලාභය වැඩි වෙලා තිබෙනවා කියන එක අපට හංගන්න ඕනෑ කරුණක් නොවෙයි. ඔබතුමා minimum price එක දැම්මත්, retail price එක දැම්මත්, ගැසට් කළත් ඒකේ වෙනසක් ඇති වන්නේ නැහැ. ඉතින් franchise ක්‍රමයට හරි ඔබතුමා centralized stock කරන්න ගියත්, quantity discount එකට වැඩිය හොරකම නිසා අලාභ සිදුවන එක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, මෙකේ ක්‍රම දෙකක් තිබෙනවා. Outsource කරන මට්ටමට තොග තියාගන්න, නැත්නම් ඔබතුමාගේ හොඳ චින්තනය සම්පූර්ණයෙන්ම නැති වේවි. එහෙම වුණොත් දැන් තිබෙන ලාභය අලාභයක් බවට පරිවර්තනය වේවි. මම මේ දේවල් කියන්නේ අත්දැකීමෙන්. මේ සතොස ශාඛා හාරසිය ගණන කරුණාකරලා franchise ක්‍රමයට, නැත්නම් supply credit ක්‍රමයට ක්‍රියාත්මක කළොත් ඔබතුමාට working capital ප්‍රශ්නය ඇති වන්නේ නැහැ. එහෙම නම් ආණ්ඩුවෙන් ගන්න. හාල් ගන්නවාට වඩා මේ ආයතන සඳහා working capital එකක් අරගෙන වැඩේ කරන එක හොඳයි කියන යෝජනාව තමයි මම මේ අවස්ථාවේදී කරන්නේ.

ඒ විතරක් නොවෙයි, දැන් කුකුළු මස්වලත්, බිත්තරවලත් හිඟයක් තිබෙනවා, ඒ නිසා, ගෙනැල්ලා විකිණුවා කියන එක තමයි පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා ඒකට අංගසම්පූර්ණ උත්තරයක් අවශ්‍යයි, ගරු ඇමතිතුමා. මම හිතන විධියට, ඔබතුමාට ඒකට හරියාකාරව උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය වාගේම එතුමා අපේක්ෂා කරන කාරණය ගත්තාම, විශේෂයෙන්ම සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව යටතේ තිබුණු සිල්ලර අංශය ලංකා සතොස කළා. ලංකා සතොස ආයතන අලාභ ලබන ආයතන බවට පත් කළේ පාලකයින් විසින්මයි. අපට ඒක නිවැරදි කරන්න වෙනවා. ගරු මන්ත්‍රීතුමා දන්නවා, දැනටත් ඒ shops විශාල සංඛ්‍යාවක් පාඩු ලබන බව. ඒවා පාඩු ලබන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි. නගරයේ ඉඳන් කිලෝමීටරයක් එහායින් සතොස දමනවා, එතකොට මිනිස්සු බස් එකක යන්න ඕනෑ සතොසට. ඒ විතරක් නොවෙයි. *[බාධා කිරීම්]* දුඹුරු සීනි විකුණන්නේ හරි පොඩි ප්‍රමාණයක් නේ, ගරු මන්ත්‍රීතුමා. දුඹුරු සීනි පොඩ්ඩයි, සුදු සීනි තමයි වැඩිපුර විකුණන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කඩේ, කඩේ. කෝ කඩේ? කඩේ වැහිලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. රටේ රතු සීනි නිෂ්පාදනය අඩුයි. අවුරුද්දකට සුදු සීනි මෙට්‍රික් ටොන් ලක්ෂ පහක් පරිභෝජනය කරනකොට රතු සීනි පරිභෝජනය කරන්නේ මෙට්‍රික් ටොන් 50,000-70,000 අතර ප්‍රමාණයක්. ඒ කියන්නේ සියයට 10ක් වාගේ ප්‍රමාණයක්. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා කියන කාරණය නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා කියනවා වාගේ, මේ සතොස ආයතනවලට කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවක් තිබෙනවා. ඒ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව සඳහා අපි රුපියල් මිලියන 2,500ක් ලබා ගන්න ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, ලංකා බැංකුව සහ මහජන බැංකුව යන බැංකු දෙකට.

ඔබතුමා කියනවා වාගේ තොග පාලනය සහ ගබඩා සම්බන්ධවත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. එතැනින් තමයි සමහර losses create කරන්නේ. ඒ වාගේම transport එකේදිත් ප්‍රශ්න තිබෙනවා. සමහර සැපයුම්කරුවන් මෙහිදී හදාගෙන තිබුණු culture එක අපි වෙනස් කරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා අපේක්ෂා කරපු තැනට ලංකා සතොස ආයතනය ගෙනියන්න සැලකිය යුතු මෙහෙයුමක් අපි දැන් කරනවා. අපේ ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා දැන් Sathosa outletsවලට ගිහිල්ලා ඒවා වෙන වෙනම අධීක්ෂණය කරමින් මේ කටයුත්තට මැදිහත් වනවා. අපි මේ මාසයේ අන්තිමට අලුතෙන් තොග වෙළෙඳ සැල් දෙකක් මාතර සහ කුරුණෑගල පටන් ගන්නවා, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව නැවත ස්ථාපිත කරමින් සතොසට බඩු ටික දෙන්න. ඒ අනුව අල සහ ලූනු මිලදී ගැනීමේ ක්‍රියාවලිය අපි ආරම්භ කරනවා. මොකද, පසුගිය දවස්වල අල කිලෝව රුපියල් 270ට, 280ට, 300ට, 350ට ගියා. ලූනු කිලෝව රුපියල් 250ට, 260ට, 270ට ගියා.

අස්වැන්න වැඩිවීමත් එක්ක මිල පහළට එනවා නම් අපි නැවත මිලදී ගැනීමේ ක්‍රියාවලියට එකතු වෙලා වෙළෙඳ පොළට අල ටික අරගෙන එන්නත්, ගොවියාට මිලක් දෙන්නත් කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන යෝජනාව සැලකිල්ලට ගෙන අපි දැනටත් කටයුතු කරමින් තිබෙනවා. අපි ඒ සඳහා මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කරගන්න අවශ්‍ය මැදිහත්වීම කරමින් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජෝන් කීල්ස්ලාට හරි ඩඩ්ලිට හරි දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඇයි, ඒ? *[බාධා කිරීමක්]* ඇයි, ඔයගොල්ලන්ට බැහැ කියලා අපි,- *[බාධා කිරීමක්]* ජෝන් කීල්ස්ලාට හෝ ඩඩ්ලිට හෝ දෙන්න අපි ආණ්ඩුවක් ගන්නේ නැහැ නේ. ඔයගොල්ලන් ආණ්ඩුවත් දෙන්න යෝජනා කළා, පෞද්ගලික අංශයට. අපි එහෙම යෝජනා කරන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* නැහැ. හාල් මිල අපිත් අඩු කළා. අපි ළඟත් වී තිබෙනවා. *[බාධා කිරීමක්]* අපිත් වී කොටලා දමනවා. *[බාධා කිරීමක්]*

## වාලච්චේන මූලික රෝහල: සංවර්ධනය
### வாழைச்சேனை ஆதார வைத்தியசாலை: அபிவிருத்தி
### BASE HOSPITAL,VALAICHCHENAI: DEVELOPMENT

904/2025

**2.** **ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වාලච්චේන මූලික රෝහල දීර්ඝ කාලයක සිට සංවර්ධනය කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට පැමිණෙන රෝගීන් විශාල ලෙස අපහසුතාවන්ට පත් වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම රෝහල සියලු පහසුකම් සහිත රෝහලක් බවට පත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வாழைச்சேனை ஆதார வைத்தியசாலை நீண்ட காலமாக அபிவிருத்தி செய்யப்படவில்லை என்பதையும்;

(ii) இதன் விளைவாக, அவ்வைத்தியசாலைக்கு வருகைதரும் நோயாளிகள் பாரிய சிரமத்துக்கு உள்ளாகின்றனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வைத்தியசாலையை சகல வசதிகளுடன்கூடியதாக மாற்றுவதற்கான வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) the Valaichchenai Base Hospital has not been developed for a long time; and

(ii) patients visiting the said hospital are facing great inconvenience as a result?

(b) Will he inform this House -

(i) whether there is a programme in place to develop the said hospital with all facilities; and

(ii) if so, that programme?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සහ (ii) ඔව්.

වාලච්චේන මූලික රෝහල මඟින් මඩකලපුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රදේශයන්හි වෙසෙන 170,000ක පමණ ජනගහනයකට සෞඛ්‍ය සේවා සපයනු ලබයි. මෙම රෝහල "A" කාණ්ඩයේ මූලික රෝහලක් ලෙස ක්‍රියාත්මක වන අතර එම බල ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය සේවා සැපයීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සෞඛ්‍ය සේවා සඳහා වර්ධනය වන ඉල්ලුම සහ ප්‍රදේශයේ භූගෝලීය හා සේවා සම්බන්ධ අවශ්‍යතාවලට අනුව මෙම රෝහල වැඩිදුර සංවර්ධනය සඳහා හඳුනා ගෙන ඇත.

(ආ) (i) ඔව්.

(ii) වාලච්චේන මූලික රෝහලේ යටිතල පහසුකම්, පහසුකම් සහ සෞඛ්‍ය සේවා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුළුල් සංවර්ධන වැඩසටහනක් මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අදාළ සැලසුම්වලින් කිහිපයක් ගරු මන්ත්‍රීතුමාගේ දැනගැනීම සඳහා මා සඳහන් කරන්නම්.

අපි මේ රෝහලට අවශ්‍ය කරන ජල පහසුකම් ලබා දීම සඳහා රුපියල් මිලියන 5ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම රියැදුරු නිල නිවාස නවීකරණය කිරීමට රුපියල් මිලියන 2.1ක් වෙන් කර තිබෙනවා. ඊළඟට, මානසික සෞඛ්‍ය වාට්ටුව වාගේම dialysis unit එක නවීකරණය කිරීමට රුපියල් මිලියන 4.5ක් වෙන් කර තිබෙනවා. ඊළඟට, medical ward එක renovate කරන්න රුපියල් මිලියන 1.5ක්, OPD එකට අදාළ සමහර පහසුකම් දියුණු කිරීමට රුපියල් මිලියන 2ක් සහ female medical ward එක වෙනුවෙන් රුපියල් මිලියන 1.5ක් හැටියට සමස්ත වශයෙන් රුපියල් මිලියන 16.6ක් වෙන් කර තිබෙනවා. ඒ, නවීකරණ කටයුතුවලට.

ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහාත් අපි කටයුතු කරනවා. උදාහරණයක් වශයෙන් දක්වනවා නම්, multipara monitor එකක් මිලදී ගැනීමට අපි රුපියල් 525,000ක් වියදම් කරනවා. සමස්ත medical equipment, non-medical equipment සහ furniture ඇතුළු සියලු උපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 18.3ක් වෙන් කර දැන් එම කටයුතු කරගෙන යනවා.

ඊට අමතරව, වාලච්චේන රෝහලේ PBU එකට සහ වාට්ටුවල වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 18.5ක් වෙන් කර තිබෙනවා. මම කලින් කිව්වා වාගේ, ඒකට multipara monitor එකක්, infusion pumps වාගේ දේවල් ඇතුළත් වෙනවා. ඒ වාගේම, PBU සහ OPDහි waiting areasවලට රුපියල් මිලියන 3ක් වෙන් කර තිබෙනවා. OPD building එක තවදුරටත් improve කරන්න රුපියල් මිලියන 5ක්, drug store එකට රුපියල් මිලියන 5ක් වියදම් කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව මෙම රෝහලේ medico-legal unit එකකට අපි රුපියල් මිලියන 22ක් වෙන් කර තිබෙනවා. එහි වැඩ කටයුතු 2027දී ආරම්භ කරනවා. ADB project එකක් හරහා අපි මේ base hospitals develop කරන්න රුපියල් මිලියන 65ක් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඊටත් අමතරව, මෙම රෝහල සඳහා හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකයක් - A & E unit එකක් - හදන්න පළාත් සභාව විසින් යෝජනා කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 500ක් වියදම් කරන්න අපි දැනට කටයුතු කරමින් සිටිනවා.

(ඇ) පැන නොනඟී.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) M.L.A.M. Hizbullah, you may ask your Supplementary Question.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்களுக்கு என்னுடைய நன்றியை தெரிவித்துக்கொள்கின்றேன்.

Valaichchenai Base Hospitalஆனது, வாகரை, ஓட்டமாவடி, வாழைச்சேனை, கிரான் உட்பட ஐந்து பிரதேச செயலாளர் பிரிவுகளைச் சேர்ந்த சுமார் 250,000 மக்களுக்குச் சேவை செய்கின்ற மிகப் பெரியதொரு வைத்தியசாலையாகும். இது கிழக்கு மாகாண சபைக்கு உட்பட்ட மிகப் பெரிய வைத்தியசாலையாகும். BHA gradeஇல் இருக்கின்ற இவ்வைத்தியசாலையில் 8 consultants இருக்கிறார்கள். ஆனாலும், இந்த வைத்தியசாலையில் இன்னும் Accident and Emergency Unit -A & E unit- இல்லை. அதேபோன்று, surgical unitஉம் இல்லை. அங்கு operating theatreகூட temporary buildingஇலே இயங்கிக்கொண்டு இருக்கின்றது. இந்த வைத்தியசாலையில் doctors' shortage இருக்கின்றது. அதுமாத்திரமல்ல, அங்கு இன்னும் ஒரு accountant நியமிக்கப்படவில்லை. இவ்வாறான நிலைமையிலே அந்த வைத்தியசாலை இயங்கிக்கொண்டு இருக்கின்றது.

அத்தோடு, கடந்த 10 வருடங்களுக்கும் மேலாக இந்த வைத்தியசாலையின் cadre creationஆனது reschedule பண்ணப்படவில்லை. அங்கு பழைய cadre இருப்பதால், doctors, ஏனைய பதவிகளுக்குரிய ஆட்களை நியமிக்க முடியாத நிலைமை ஏற்பட்டு இருக்கின்றது. அங்கு போதியளவு கட்டில்கள் - beds - இல்லை. நேற்று முன்தினம் சட்டத்தரணி ரம்ஸீன் அவர்களின் தாயாருக்குச் சுகயீனம் ஏற்பட்டு, அவரை உடனடியாக அங்கு கொண்டுசென்றபோது, அவரை வைப்பதற்கு ஒரு கட்டில் இல்லாத நிலைமை இருந்தது. கௌரவ அமைச்சர் அவர்களே, இந்த வைத்தியசாலையானது முழு கல்குடா தொகுதிக்கும் சேவை செய்கின்ற மிகப் பெரியதொரு வைத்தியசாலையாகும். எனவே, இந்த வைத்தியசாலையின் அபிவிருத்தியில் அதிக கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කිව්වා, අපි A & E unit එකට රුපියල් මිලියන 500ක් යොදවලා ඒක ඉදිකරන්න බලාපොරොත්තු වෙනවා කියලා. ඊළඟට, ඔබතුමා cadre revision එක ගැනත් කිව්වා. ඔව්, 2017 අවුරුද්දෙන් පසුව cadre revision එකක් කරලා තිබුණේ නැහැ. අපි දැන් අමාත්‍යාංශය පැත්තෙන් ඒ කටයුත්ත අවසන් කරලා, මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කරලා තිබෙනවා. දෙසැම්බර් මාසය වනකොට ඊළඟ අවුරුදු තුන සඳහා cadre revision එක අනුමත කරලා බඳවා ගැනීමේ කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා. කොහොම වුණත්, cadre revision එක එනකල් කියලා අපි නිකම් ඉන්නේ නැහැ, අදාළ කරන පුහුණුවීම් කරමින් ඉන්නවා. ඊට අමතරව අවශ්‍ය සෞඛ්‍ය කාර්ය සහායකයින් ප්‍රමාණය පළාත් සභාව විසින් ඉක්මනින්ම බඳවා ගනීවි. අපි නොවැම්බර් පළමු සතියේදී අලුත් හෙද කණ්ඩායමකට Grade III Nursing Officersලා හැටියට පත්වීම් ලබා දෙනවා. එයිනුත් කොටසක් පළාත් සභා රෝහල්වලට යොමු කරනවා. ඒ අනුව වාලච්චේන රෝහලේ අවශ්‍යතාත් ඉටු වේවි.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින් අහනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Mujibur Rahuman.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම මේ අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ තිබෙන නාගොඩ රෝහල පිළිබඳවයි. ඔබතුමා දන්නවා, මීට මාස දෙකකට කලින් කල්මුණේ ප්‍රදේශයේ සෞඛ්‍ය කාර්ය සහායක තනතුරේ ඉන්න කාන්තාවන් හිජාබය පැළඳගෙන යෑම නිසා ගැටලුවක් මතු වෙලා, ඔබතුමන්ලා ඒකට විසඳුමක් හැටියට ඒගොල්ලන්ව වෙන රෝහලකට මාරු කළ බව. 2016 අවුරුද්දේ ඉඳන් 2026 අවුරුද්ද දක්වා කොළඹ මහ රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායකවරියක් හැටියට සේවය කරපු කාන්තාවක් හිජාබය පැළඳගෙන තමයි වැඩ කළේ. ඇයට කිසිම ගැටලුවක් තිබුණේ නැහැ. 2026 අගෝස්තු මාසයේ ඇයට transfer එකක් ලැබුණා, කළුතර නාගොඩ රෝහලට. ඒ රෝහලට වැඩ පටන් ගන්න ගියාම එතැන ඉන්න අධ්‍යක්ෂතුමිය වන වෛද්‍ය මධුහාෂිණී කරුණාරත්න මහත්මිය මේ කාන්තාවට නියෝගයක් දීලා තිබෙනවා, හිජාබය පැළඳගෙන වැඩට එන්න එපා කියලා. ඒක ප්‍රතික්ෂේප කළ නිසා punishment එකක් හැටියට ඒ කාන්තාව දැන් වෙන තැනකට දාලා තිබෙනවා. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ සිදු වුණු මේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමා මීට කලින් දැනුවත් වුණාද කියන්න මම දන්නේ නැහැ. නමුත් මේක හිතාමතාම කරන ක්‍රියාවක් හැටියට තමයි පෙනෙන්නේ. මොකද, මේ කාන්තාව කොළඹ මහ රෝහලේ අවුරුදු දහයක් කිසිම ප්‍රශ්නයක් නැතුව හිජාබය පැළඳගෙන කාර්යය කළා. එතැනදී ඇයට කිසිම බාධාවක් ඇති වුණේ නැහැ. නමුත් ඇයට transfer එකක් ලැබිලා කළුතර නාගොඩ රෝහලට ගියාම එතැන ඉන්න වෛද්‍ය අධ්‍යක්ෂතුමිය නියෝගයක් දෙනවා, හිජාබය පැළඳගෙන එන්න එපා කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ trend එකට යන්න දෙන්න එපා කියලායි. මොකද, මේක ඉතාම නරක trend එකක්. ඔබතුමන්ලා දකිනවා ඇති, මේ වනකොට සමාජ මාධ්‍ය තුළිනුත් නැවත වතාවක් යම් යම් පිරිස් මේ trends අරගෙන නොයෙකුත් ප්‍රශ්න ඇති කරන්න කටයුතු කරමින් සිටින බව. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සඳහා වහාම මැදිහත් වෙලා මේ කාන්තාවට හිජාබය පැළඳගෙන වැඩට යෑමේ අයිතිය ලබා දෙන්න කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මම පළමුවෙන්ම ඉල්ලා සිටිනවා නැති ප්‍රශ්න ඇති කරන්න එපා කියලා. මීට මාසයකට කලින් ඔය ප්‍රශ්නය ආවාට පස්සේ මම ඒකට මැදිහත් වුණා. ජාතික රෝහලේ වැඩ කටයුතු කරපු විධියටම නාගොඩ ශික්ෂණ රෝහලේත් ඇයට කටයුතු කරන්න පුළුවන්. අධ්‍යක්ෂතුමියගේ ප්‍රශ්නයක් නැහැ. නැඟෙනහිර පළාතේ යම් සිදුවීමක් ඇති වුණාට පස්සේ ඒකත් සම්බන්ධ කරගෙන අනවශ්‍ය ප්‍රශ්නයක් මේ රෝහලේ ඇති කරන්න යම් කණ්ඩායමක් උත්සාහ කළා. අපට සෞඛ්‍ය සේවකයන් 150,000ක් විතර

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඉන්නවා. ඒ අයත් එක්ක ප්‍රශ්නයක් නැතුව අපි කටයුතු කරගෙන යනවා. ඒ නිසා අනවශ්‍ය විධියට මැදිහත්වීම් කරලා, ඇඳුමක කොටසක් අල්ලාගෙන සෞඛ්‍ය සේවාව අඩපණ කරන්න කටයුතු කරන්න එපා. මේ ප්‍රශ්නය විසඳලා තිබෙන්නේ, මීට මාස ගණනකට කලින්. ඇයට වැඩ කරන්න පුළුවන් තැනකට වැඩ කරන්න දාලා තිබෙනවා. අපි සෞඛ්‍ය සේවාව මේ රටේ ජාතියක්, ආගමක්, භේදයක් නැතිව හැම දෙනාටම ලබා දෙනවා. ඒකට බාධා කිරීම් කරන්නේ නැතිව උදවු කරන්න කියලායි මම ඉල්ලන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 3 - 1833/2026 - (1), the Hon. S.M. Marikkar. - *[Not in the Chamber.]*

## රඹෑව, මැදවච්චිය, කැබිතිගොල්ලෑව සහ පදවිය ප්‍රා.ලේ. කොට්ඨාස: නිවාස ව්‍යාපෘති
## ரம்பேவ, மதவாச்சி, கெபிதிகொல்லேவ மற்றும் பதவிய பிரதேச செயலாளர் பிரிவுகள்: வீடமைப்புக் கருத்திட்டங்கள்
## RAMBEWA, MEDAWACHCHIYA, KEBITHIGOLLEWA AND PADAVIYA DS DIVISIONS: HOUSING PROJECTS

1917/2026

**4. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලසීමාව තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව, මැදවච්චිය, කැබිතිගොල්ලෑව සහ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘති පිහිටි ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නිවාස ව්‍යාපෘති ආධාර හෝ ණය පදනම මත ක්‍රියාත්මක කර තිබේද;

(v) එම නිවාස ඉදිකළ ඉඩම් නිරවුල්ව හඳුනාගෙන තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(vii) මේ වනවිට පුද්ගලයන් පදිංචි නිවාස සංඛ්‍යාව ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையான காலப்பகுதிக்குள் அநுராதபுரம் மாவட்டத்தின் ரம்பேவ, மதவாச்சி, கெபிதிகொல்லேவ மற்றும் பதவிய ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் நடைமுறைப்படுத்தப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்கள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தின்கீழ் நிர்மாணிக்கப்பட்ட வீடுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) நிதி உதவி அல்லது கடன் அடிப்படையில் வீடமைப்புக் கருத்திட்டங்கள் நடைமுறைப் படுத்தப் பட்டுள்ளனவா என்பதையும்;

(v) குறித்த வீடுகள் நிர்மாணிக்கப்பட்டுள்ள காணிகள் சிக்கலற்ற முறையில் இனங்காணப் பட்டுள்ளனவா என்பதையும்;

(vi) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vii) தற்போது மக்கள் குடியிருக்கும் வீடுகளின் எண்ணிக்கை வீடமைப்புக் கருத்திட்டங்களின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) the number of housing projects implemented in the Rambewa, Medawachchiya, Kebithigollewa and Padaviya Divisional Secretaries' Divisions of the Anuradhapura District during the period from 2015 to 2019, separately;

(ii) the locations where the above projects were implemented;

(iii) the number of houses constructed under each of the above projects, separately;

(iv) whether the housing projects have been implemented on the basis of grants or loans;

(v) whether the lands on which those houses were constructed have been clearly identified;

(vi) if not, the reasons therefor; and

(vii) the number of houses occupied by individuals at present under each project, separately?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 සිට 2019 දක්වා කාලසීමාව තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව, මැදවච්චිය, කැබිතිගොල්ලෑව සහ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිවාස ව්‍යාපෘති 22ක් ක්‍රියාත්මක කර ඇති අතර, එම නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහත දක්වා ඇත.

රඹෑව 8

මැදවච්චිය 3

කැබිතිගොල්ලෑව 3

පදවිය 8

සම්පූර්ණ ගණන 22

(ii) මෙම ව්‍යාපෘති 22 පිහිටි ස්ථාන සවිස්තරාත්මකව පහත ඇමුණුම 01 මඟින් දක්වා තිබේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘති පිහිටි ස්ථානය |
|---|---|---|---|
| 1 | සෑසිරිගම ආදර්ශ ගම්මානය | රඹෑව | 110 වහමල්ගොල්ලෑව තුලාන |
| 2 | විහාරමහාදේවි ආ. ගම්. | රඹෑව | 110 වහමල්ගොල්ලෑව තුලාන |
| 3 | ශ්‍රීමත් ඩබ්. සේනානායකගම | රඹෑව | 110 වහමල්ගොල්ලෑව තුලාන |
| 4 | ගම්මාන අංක 04 | රඹෑව | 110 වහමල්ගොල්ලෑව තුලාන |
| 5 | පණ්ඩුකාභයගම | රඹෑව | 115 පණ්ඩුකාභයපුර |
| 6 | 92 ගෝනෑව | රඹෑව | 92 ගෝනෑව |
| 7 | 92 ගිනිකොටුවැව | රඹෑව | 92 ගිනිකෙටුවැව |
| 8 | 85 වැලෑව | රඹෑව | 85 වැලෑව |
| 9 | ඇකිරිකන්ද | මැදවච්චිය | 59 තුලාන |
| 10 | තුරුණුගම ආ. ගම්. | මැදවච්චිය | 43 ප්‍රබෝධාගම |
| 11 | පුල් එළිය | මැදවච්චිය | 62 පුල්එළිය තුලාව |
| 12 | ඩී. එම්. අමරතුංගගම | කැබිතිගොල්ලෑව | 20 වත්තේවැව තුලාන |
| 13 | ජයනෙතුගම | කැබිතිගොල්ලෑව | 18 තුලාන , කැබිතිගොල්ලෑව |
| 14 | කණුගහවැව | කැබිතිගොල්ලෑව | 27 හල්මිල්ලවැටිය |
| 15 | ඩී එම් ආරියදාසගම | පදවිය | 14, රත්මලේ |
| 16 | විරුජනගම | පදවිය | 13 අළුත්හල්මිල්ලෑව තුලාන |
| 17 | මෛත්‍රීපුර | පදවිය | 08 මෛත්‍රීපුර |
| 18 | 1 කණුව | පදවිය | 01 බිසෝකොටුව තුලාන |
| 19 | බියාය | පදවිය | 04 බියාය |
| 20 | මහසෙන්පුර | පදවිය | 12 මහසෙන්පුර |
| 21 | අභයපුර - 1 | පදවිය | 09 මහසෙන්පුර |
| 22 | අභයපුර - 2 | පදවිය | 10 මහසෙන්පුර |

(iii) මෙම එක් එක් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ නිවාස සංඛ්‍යාව ඇමුණුම අංක 02 මඟින් විස්තරාත්මකව ඉදිරිපත් කර ඇති අතර, එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙසේ දැක්විය හැකිය.

- **රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 08

  ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව 227

  දැනට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව 167

  ඉදිකිරීම් අවසන් නොමැති නිවාස සංඛ්‍යාව 60

- **මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 03

  ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව 90

  දැනට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව 46

  ඉදිකිරීම් අවසන් නොමැති නිවාස සංඛ්‍යාව 44

- **කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 03

  ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව 73

  දැනට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව 50

  ඉදිකිරීම් අවසන් නොමැති නිවාස සංඛ්‍යාව 23

- **පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 08

  ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව 93

  දැනට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව 89

  ඉදිකිරීම් අවසන් නොමැති නිවාස සංඛ්‍යාව 104

(iv) ඔව්. ආධාර හා ණය පදනම මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල විස්තර ඇමුණුම 03 මඟින් විස්තරාත්මකව ඉදිරිපත් කර ඇති අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එහි සාරාංශයක් මෙසේ දැක්විය හැකිය.

- **රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 08

  ණය පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 05

  ආධාර පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 03

- **මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 03

  ණය පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 02

  ආධාර පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 01

- **කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 03

  ණය පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 01

  ආධාර පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 02

- **පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

  නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 08

  ණය පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 07

  ආධාර පදනම මත ඉදිකර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 01

(v) ඔව්. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 තුළ ක්‍රියාත්මක කර ඇති නිවාස ව්‍යාපෘති සඳහා අදාළ වන ඉඩම්හි අයිතිය රජය සතු වන අතර, ජනතා අයිතියට පත් කර ඇති නිවාස ව්‍යාපෘති 9හි පමණක් ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කණුගහවැව නිවාස ව්‍යාපෘතිය ඉදිකර ඇති භූමිය වර්තමානයේ වන සංරක්ෂණ කලාපයක් ලෙස ගැසට් කර ඇති අතර, අනෙක් ඒවායෙහි භුක්තිය පමණක් බාර දී ඇත.

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇමුණුම 04 මඟින් ඉදිරිපත් කර ඇත. නිවාස ව්‍යාපෘති සෑම එකකම ඉඩම් සම්බන්ධයෙන් මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක පිළිබඳව ඇමුණුම 04හි සඳහන් කර තිබෙනවා.

(vi) අදාළ නොවේ.

(vii) මේ වන විට පුද්ගලයන් පදිංචි නිවාස සංඛ්‍යාව පිළිබඳ විස්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පහත දක්වා ඇති අතර, ඒ සම්බන්ධයෙන් වැඩි විස්තර ඇමුණුම 05හි සඳහන් කර ඇත.

- **රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

| | |
|---|---|
| නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව | 08 |
| ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව | 227 |
| දැනට පදිංචි නිවාස සංඛ්‍යාව | 150 |

- **මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

| | |
|---|---|
| නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව | 03 |
| ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව | 90 |
| දැනට පදිංචි නිවාස සංඛ්‍යාව | 46 |

- **කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

| | |
|---|---|
| නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව | 03 |
| ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව | 73 |
| දැනට පදිංචි නිවාස සංඛ්‍යාව | 44 |

- **පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

| | |
|---|---|
| නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව | 08 |
| ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව | 193 |
| දැනට පදිංචි නිවාස සංඛ්‍යාව | 82 |

ඇමුණුම් 02, 03, 04 සහ 05 **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම වර්තමාන විපක්ෂ නායකතුමා 2015-2019 කාලයේ නිවාස අමාත්‍යාංශය භාර ඇමතිවරයා විධියට වැඩ කටයුතු කළ සමයේ නිවාස ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කළ බව අපි දන්නවා. ඒ කාලයේ මහා ලොකුවට සංදර්ශන දැම්මා. හැබැයි, ඒ සංදර්ශන දාපු නිවාස ව්‍යාපෘති හුඟක් ඒවා ගඳ ගහන ප්‍රශ්න ලෙස ඉතුරු කරලා තිබෙන්නේ. මේ නිවාස ව්‍යාපෘතිවලින් නිවාස ගත්ත ජනතාව හැමදාම අපිව හම්බ වෙන්න එනවා. සමහර නිවාස ව්‍යාපෘතිවල තිබෙන නිවාසවල ජනතාවට පදිංචි වෙන්නත් බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, ඒවාට අවශ්‍ය පහසුකම් සපයලා නැහැ. එම නිවාසවලට විදුලිය අරන් දීලා නැහැ. වර්තමාන විපක්ෂ නායකතුමා නිවාස ඇමතිවරයා විධියට හිටපු කාලයේ ඒ කරපු නිවාස ව්‍යාපෘතිවල ප්‍රශ්න ගොඩයි. ඒවා කුණු ගඳ ගහන ප්‍රශ්න බවට පත්වෙලා තිබෙනවා. ඒ නිවාසවල ගැටලු ගණනාවක් තිබෙනවා.

මේ වෙනකොට මේ නිවාස ව්‍යාපෘති 22න්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ඇතුළේ නිවාස විශාල ප්‍රමාණයක් තිබෙනවා, ජනතාවට පදිංචි වෙන්න නොහැකිව. ගරු ඇමතිතුමනි, ලෝක ජනාවාස දිනය මූලික කරගෙන නිවාස 5,000ක් ජනතා අයිතියට පත් කළ බව අපි දන්නවා. ඒක හොඳයි. නිවාස 30,000කට වඩා ජනතාවට ලබා දෙන්න මේ අවුරුද්දේ විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ වැඩසටහන හොඳයි. හැබැයි, ඉතිහාසයේ මේ ගඳ ගහන ප්‍රශ්න වෙනුවෙන් ඔබතුමා අමාත්‍යවරයා විධියටත්, අමාත්‍යාංශය විධියටත් මේ වෙනකොට පරීක්ෂණයක් කරමින් තිබෙනවා ද කියලා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට කලිනුත් ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙකුට මෙවැනි කාරණා සම්බන්ධයෙන් පිළිතුරු ලබා දීලා තිබෙනවා. මේ වාගේ ගම්මාන 2,500ක් රට පුරා හදන්න පටන්ගෙන තිබෙනවා. එයින් ගම්මාන 300 ගණනක් තමයි විවෘත කරලා තිබෙන්නේ. සමහර ඒවා ගම්මාන පිටින්ම ප්‍රයෝජනයට ගන්න බැහැ. මේකෙත් එක ගම්මානයක් තිබෙනවා. ඒවා, වන සංරක්ෂණ භූමි විධියට තමයි නම් කරලා තිබෙන්නේ. ඒ විධියට අතහැරලා තිබෙනවා. නිවාස 50,000ක විතර ඉදිකිරීම් කටයුතු අතරමග නැවතිලා තිබෙනවා. ඒවා ඉදි කරලා නැහැ. මේ වාර්තාවට අනුව, සම්පූර්ණයෙන් ඉදිකර තිබෙන නිවාස සංඛ්‍යාව 352යි. පදිංචි නිවාස සංඛ්‍යාව 322යි. ඒ කියන්නේ, ඉදිකරපු නිවාසවලත් පදිංචිවෙලා නැහැ. ඒක තමයි යථාර්ථය. මේක හරිම සංකීර්ණ ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් අපි කමිටුවක් පත් කරලා තිබෙනවා, භාගෙට ඉදිකරපු නිවාස ප්‍රයෝජනයට ගත හැක්කේ කොහොමද, ඒවා ප්‍රතිලාභීන්ට දෙන්න පුළුවන්ද කියන එක සම්බන්ධයෙන් නිර්දේශය ලබා ගන්න. මේ මාසයේ අන්තිම වෙනකොට අපිට ඒ වාර්තාව ලැබෙයි. අපට දැනට interim report එකක් ලැබිලා තිබෙනවා. ඒ වාර්තාවට අනුව තමයි භාගෙට නතරවෙලා තිබෙන, පදිංචි නැති නිවාසවල තත්ත්වය සහ ඒවා කාටහරි දෙන්න පුළුවන්ද කියන එක අපට සොයාගන්න පුළුවන් වෙන්නේ. හරිම අමාරුයි මේ ප්‍රශ්නය විසඳන්න. නමුත්, අපි ඒකට ප්‍රවේශයක් අරගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අමාත්‍යතුමනි.

කුණු ගඳ ගහන මෙම බරපතළ ප්‍රශ්නය ගැන - මට නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කිව්වා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වනජීවී කලාපය ඇතුළේ නිවාස 400කට වඩා ප්‍රමාණයක් තිබෙනවා කියලා - විධිමත් පරීක්ෂණයක් කරලා, ඉතාම කෙටි කාලයක් ඇතුළත මේකට විසඳුමක් ලබා දීමට මැදිහත්වීමක් කරනවා කියලා ඔබතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම මින් ඉදිරියට මේ වාගේ ප්‍රශ්න ඇති නොවී මේ නිවාස වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට මැදිහත්වීමක් කරමින් තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරගන්න කැමැතියි.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඔව්. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ මේ සම්බන්ධයෙන් තොරතුරු හොයාගන්න ඕනෑ. ඒ වාගේම නිර්දේශ ලබා ගන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දීමට. ඒත් එක්කම, මේ ක්‍රියාත්මක වෙන නිවාස ව්‍යාපෘතිවලට; අය වැයෙන් මුදල් වෙන්කරලා ඒ හරහා භාගෙට ඉදිවෙච්ච නිවාසවලට යම් මුදල් ප්‍රමාණයක් වෙන්කරන්න පුළුවන්ද කියන එකත් බලන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට කලින්, මේ එක් එක් පවුල් සම්බන්ධයෙන් වෙන වෙනම සොයා බලන්න ඕනෑ, ඔවුන්ට නිවාස අවශ්‍යතාවක් - නිවසක් අවශ්‍යද, නැද්ද කියන එක - තිබෙනවාද කියලා. මම ගරු මන්ත්‍රීතුමාට යෝජනා කරනවා, තමන්ගේ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව කැඳවද්දී ඔබතුමා එතැනදී මේ සම්බන්ධයෙන් සාකච්ඡාව ගන්න කියලා. එක එක නිවාස ව්‍යාපෘතිය අරගෙන, එතැන ගෙවල් කීයක් හදලා තිබෙනවාද, කවුද පදිංචි කර තිබෙන්නේ, පදිංචි කට්ටියට ඇත්තටම නිවාස අවශ්‍යතාවක් තිබෙනවාද, හිස් වෙලා තිබෙන නිවාස තිබෙනවාද, ඒවා වෙනත් කෙනෙකුට දීම සඳහා නිර්දේශ කරනවාද, භාගෙට ඉදි වෙලා තිබෙන නිවාස ප්‍රයෝජනයට ගන්න පුළුවන්ද, ඒ භූමිය නැවත නිවාස කටයුතු සඳහාම යොදා ගන්න පුළුවන්ද, ගැටලු නැද්ද කියන කාරණා සම්බන්ධයෙන් සොයා බලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හරහා ඔබතුමන්ලාගේ නිර්දේශත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ විධියට තමයි අපට මේ ප්‍රශ්නය විසඳන්න වෙන්නේ. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමාට යෝජනා කරනවා, ඒ විධියට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හරහාත් අපට නිර්දේශයක් ලබා දෙන්න කියලා. අපි අමාත්‍යාංශය විධියටත් මේ සම්බන්ධයෙන් මැදිහත් වීමක් කරන්නම්.

## ඉහළ ගිං-නිල්වලා ජල හැරවුම් ව්‍යාපෘතිය: වර්තමාන තත්ත්වය
## மேல் ஜின்-நில்வளா நீர் திசைதிருப்பல் கருத்திட்டம்: தற்போதைய நிலை
## UPPER GIN-NILWALA WATER DIVERSION PROJECT: CURRENT STATUS

2297/2026

5\. **ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දකුණු පළාතේ ගංවතුර පාලනය, වාරි කෘෂිකර්මාන්තය දියුණු කිරීම, පානීය ජල හා කර්මාන්ත ජල අවශ්‍යතා සපුරාලීම ඇතුළු අරමුණු රැසක් මුල් කර ගනිමින් දීර්ඝ කාලයකට පෙර යෝජනා කරන ලද 'ඉහළ ගිං-නිල්වලා ජල හරවා යැවීමේ ව්‍යාපෘතිය' තවදුරටත් රජයේ සංවර්ධන සැලසුම් අතර පවතින්නේද;

(ii) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන, පාරිසරික බලපෑම් ඇගයීම්, ඉංජිනේරු සැලසුම් සහ අනෙකුත් මූලික අධ්‍යයන කටයුතු අවසන් කර තිබේද;

(iv) එසේ නම්, එම අධ්‍යයනවල ප්‍රධාන නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන තිබේද;

(ii) නො එසේ නම්, තවදුරටත් ලබා ගත යුතු අනුමැතීන් කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ දක්වා සැලසුම්කරණය, අධ්‍යයන සහ අනෙකුත් මූලික කටයුතු සඳහා රජය විසින් දරා ඇති මුළු වියදම කොපමණද;

(iv) රජය විසින් එම ව්‍යාපෘතිය නැවත සක්‍රිය කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

(v) නො එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தென் மாகாணத்தில் வெள்ளப்பெருக்கை கட்டுப்படுத்துதல், நீர்ப்பாசன விவசாயத்தை அபிவிருத்தி செய்தல், குடிநீர் மற்றும் கைத் தொழில் நீர்த் தேவைகளைப் பூர்த்திசெய்தல் உள்ளிட்ட பல்வேறு நோக்கங்களை அடிப்படையாகக்கொண்டு நீண்ட காலத்துக்கு முன்னர் முன்மொழியப்பட்ட "மேல் ஜின் - நில்வளா நீர் திசைதிருப்பல் கருத்திட்டம்" அரசாங்கத்தின் அபிவிருத்தித் திட்டங்களுள் தொடர்ந்தும் உள்ளதா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய நிலை யாது என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டம் தொடர்பான சாத்தியக் கூற்று ஆய்வுகள், சுற்றாடல் தாக்க மதிப்பீடுகள், பொறியியல் வடிவமைப்புகள் மற்றும் ஏனைய ஆரம்பகட்ட ஆய்வுப் பணிகள் நிறைவுசெய்யப் பட்டுள்ளனவா என்பதையும்;

(iv) அவ்வாறாயின், மேற்படி ஆய்வுகளின் பிரதான பரிந்துரைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டத்தை நடைமுறைப்படுத்து வதற்குத் தேவையான அங்கீகாரங்கள் பெறப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) இன்றேல், மேலும் பெறப்படவேண்டிய அங்கீகாரங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டம் தொடர்பில் இதுவரை திட்டமிடல், ஆய்வுகள் மற்றும் ஏனைய ஆரம்பகட்ட நடவடிக்கைகளுக்காக அரசாங்கத் தால் ஏற்கப்பட்டுள்ள மொத்தச் செலவு எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்தை அரசாங்கம் மீண்டும் செயற்படுத்தி நடைமுறைப்படுத்த எதிர்பார்க் கின்றதா என்பதையும்;

(v) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether the Upper Gin-Nilwala Water Diversion Project, which was proposed a long time ago with a number of objectives including flood control, development of irrigated agriculture and fulfilling the need of water for drinking and for industrial purposes in the Southern Province, is still among the development plans of the Government;

(ii) the current status of the said project;

(iii) whether feasibility studies, environmental impact assessments, engineering designs and other preliminary studies regarding the said project have been completed; and

(iv) if so, the key recommendations of such studies?

(b) Will he also inform this House -

(i) whether necessary approvals have been obtained for the implementation of the said project;

(ii) if not, the approvals that are required further;

(iii) the total amount that has been spent by the Government so far on planning, carrying out studies and on other preliminary activities in relation to the said project;

(iv) whether the Government intends to revive and implement the said project; and

(v) if not, the reasons therefor?

(c) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නැත.

(ii) ශක්‍යතා අධ්‍යයන හා පාරිසරික බලපෑම් ඇගයීම් තවදුරටත් අවසන් කර නොමැත.

(iii) 2017.08.09 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් පහත දක්වා ඇති කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ අධ්‍යයන කටයුතු නිම කිරීම ප්‍රමාද වී ඇත.

- 2017 වර්ෂයේදී ව්‍යාපෘතිය උදෙසා උද්ගත වූ සමාජ විරෝධතා හා චීන ජාතිකයන් සඳහා එල්ල වූ විරෝධතා හමුවේ චීන ජාතිකයන්ට නව ව්‍යාපෘති ප්‍රදේශවලට ඇතුළු වීමට හෝ පැමිණීමට නොහැකි වීම.
- රක්ෂිත වනාන්තර තුළ සිදු කරන ලද අධ්‍යයනයන් සඳහා එම වනාන්තර ප්‍රදේශවලට ඇතුළු වීමට මෙන්ම එම ප්‍රදේශවල සිදු කරන ලද භූ විද්‍යා සමීක්ෂණ කටයුතු සඳහා උපකරණ රැගෙන යෑමට හා ඇතුළු වීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් අවසර ලබා ගැනීම සඳහා වසරක පමණ කාලයක් ගත වීම.
- පැවැති සමාජ විරෝධතා හේතුවෙන් භූ විද්‍යා සමීක්ෂණ කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් හෝ මැනුම් කටයුතු මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරවා ගැනීමට චීන සමාගමට සිදු වූ නිසා ඒ සඳහා අමතර කාලයක් වැය කිරීමට සිදු වීම.
- උමා ඔය ව්‍යාපෘතිය ආශ්‍රිතව ඇති වූ ගැටලු සැලකිල්ලට ගනිමින් ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ භූ විද්‍යා අධ්‍යයන තවදුරටත් තීව්‍ර කිරීම.
- සමාජ විරෝධතා අවම කිරීම සඳහා අවම හානියක් වන අයුරින් විදුම් යන්ත්‍ර අදාළ විදුම් ස්ථාන වෙත ගෙන යාමට, යන්ත්‍ර ගලවා කොටස් කර රැගෙන ගොස් නැවත සවි කිරීමට සිදු වීම නිසා අතිරේක කාලයක් වැය වීම.
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ගාල්ල දිස්ත්‍රික් ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘතිය හේතුවෙන් උද්ගත වූ අනපේක්ෂිත සමාජ-දේශපාලනික විරෝධතා.
- ඉහත ව්‍යාපෘතිය හේතුවෙන් ඇති වූ සමාජ-දේශපාලනික බලපෑම් හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතියට අදාළ රාජ්‍ය යන්ත්‍රණයේ හා ව්‍යාපෘතියේ කටයුතු අඩාළ වීම.
- ජල විද්‍යා, භූ විද්‍යා හා භූ විෂමතා වැනි සංකීර්ණ තාක්ෂණික සාධක මත හා සමාජයීය හා පාරිසරික සාධක අනුව සිදු වූ ව්‍යාපෘති සංරචක වෙනස්වීම හා ඒ අනුව විකල්ප කිහිපයක් ඔස්සේ ශක්‍යතා අධ්‍යයන කිහිප වරක් වෙනස් කිරීමට සිදු වීම.
- ව්‍යාපෘතියේ පවතින තාක්ෂණික සංකීර්ණත්වය මත කොන්ත්‍රාත්කරු විසින් වරින් වර ලබා දුන් ශක්‍යතා අධ්‍යයන හා මූලික සැලසුම් වාර්තා අධ්‍යයනය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ගත වූ අතිරේක කාලයන්.
- ව්‍යාපෘතියේ පවතින තාක්ෂණික සංකීර්ණත්වය නිසා කොන්ත්‍රාත්කරු විසින් ලබා දුන් වාර්තා හා සැලසුම් සමාලෝචනය හා ඇගයීම සඳහා අවස්ථා 2කදී තාක්ෂණික ඇගයුම් කමිටුවට හා තාක්ෂණික සාකච්ඡා කමිටුවට මාස 6 බැගින් වසරක පමණ කාලයක් ගත වීම.
- රට තුළ උද්ගත වූ COVID-19 වසංගත තත්ත්වය හා එය චීන ජාතිකයන් කෙරෙහි වඩාත් සංකීර්ණව බලපෑම.
- වර්තමානයේ -ඒ වන කොට; ඒ කියන්නේ මේ සමීක්ෂණ කටයුතු සිදු කළ කාලයට අදාළව- රට තුළ උද්ගතව ඇති ඉන්ධන හිඟය

හා ආර්ථික ගැටලු හමුවේ ව්‍යාපෘති කටයුතු සිදු කරගෙන යෑමේදී ඇති වී ඇති අපහසුතා.

- මෙන්න මේ කාරණා නිසා මේ සැලසුම්, අනෙකුත් මූලික අධ්‍යයන කටයුතු අවසන් කර ගන්න බැරි වුණු බව තමයි සඳහන් වන්නේ.

(iv) අධ්‍යයන කටයුතු අවසන් කර නොමැති වීම හේතුවෙන් නිර්දේශ ලබා දී නොමැත.

(ආ) (i) මූලික අධ්‍යයන කටයුතු අවසන් කර නොමැති වීම හේතුවෙන් අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන නොමැත.

ඒ කියන්නේ, මීට අදාළ අනුමැතීන් ගත යුතු ආයතනවලින් අවසන් වරට අනුමැතීන් ගැනීමට කටයුතු කර නැහැ. ඒ, අවසන් නිර්දේශ වාර්තාවක් නිකුත් කර නොමැති නිසයි.

(ii) ශක්‍යතා අධ්‍යයනය අවසන් කළ පසු අදාළ අනුමැතීන් ලබා ගත යුතු ය.

(iii) ඇමෙරිකානු ඩොලර් මිලියන 34.5ක මුදලක් China CAMCE සමාගම වෙත ගෙවීම සිදු කර ඇත.

(iv) මේ දක්වා තීරණය කර නොමැත.

(v) මාදුගැට ජලාශය සඳහා UNESCO සංවිධානයේ එකඟතාව හිමි නොවීම.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Prof.) L.M. Abeywickrama, if you have any Supplementary Questions, you may ask now.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහන්න හේතු වුණේ මෙන්න මේ කාරණයයි. අවුරුද්දකට මිලියන 2,000ක් වාගේ මුදලක් මේ ගංවතුර වැළැක්වීමටත්, නිල්වලා ගඟ පහළ නිම්නයේ ගොවීන්ට වන්දි ගෙවීමටත්, අනෙක් කටයුතුවලටත් වැය කරනවා. 1960 දශකයේ තමයි මේ ව්‍යාපෘතිය සඳහා යෝජනාව ගෙන ආවේ. කලින් කලට විවිධ යෝජනා ඉහළ පහළ යමින් තිබිලා 2014 අවුරුද්දේ අනුමැතියකින් තොරව චීන සමාගමකට ශ්‍රී ලංකා රුපියල් බිලියන 4.01ක ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා, මේ වෙනුවෙන්. ඒ සම්බන්ධව යම්කිසි අධ්‍යයනයක් සිදු කරන්න කටයුතු කර තිබෙනවා. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය තමයි ඒ සම්බන්ධව කළ අධ්‍යයනයේ නිර්දේශ මොනවාද, එහෙම නැත්නම් ඒ සම්බන්ධව ගත්තු ක්‍රියාමාර්ගවල වර්තමාන තත්ත්වය මොකක්ද කියන එක.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව, එවකට තිබුණු ආණ්ඩු යම් මැදිහත්වීම් සිදු කර තිබුණත් මෙතැන තිබෙන ප්‍රධානම ගැටලුව තමයි සිංහරාජ වනාන්තරය ආශ්‍රිතව පැන නැඟී තිබෙන ප්‍රශ්නය. UNESCO එක මඟින් සිංහරාජය ලෝක උරුමයක් බවට පත් කරලා තිබෙනවා. සිංහරාජ වනාන්තරය අපේ රටට විතරක් අයිති වස්තුවක් නොවෙයි, මුළු ලෝකයටම අයිති, ලෝකයම ආදරය කරන වනාන්තර ප්‍රදේශයක්. UNESCO එකේ අනුමැතිය නොලැබීම තමයි මෙතැන ප්‍රධානම කාරණය විධියට තිබෙන්නේ. දැනට feasibility studiesවලින් සියයට 90ක ප්‍රමාණයක් අවසන් කරලා UNESCO එකට යොමු කරලා තිබෙනවා, ඒ නිර්දේශ සහ අනුමැතීන් ලබා ගැනීම සඳහා. ඒ අනුමැතීන් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාසිසහගත ලෙස ලබා දුනහොත් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ කිසිදු විරෝධයක්, අකමැත්තක් නැහැ. අපි පරිසරය පිළිබඳවත් හිතන්න ඕනෑ, ඒ වාගේම ජනතාවගේ අවශ්‍යතා ගැනත් හිතන්න ඕනෑ. මේ සියල්ල සලකා බලා ඉදිරි සැලසුම් සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ආණ්ඩුව විධියට අපි කටයුතු කරමින් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Prof.) L.M. Abeywickrama, you may ask your second Supplementary Question.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය පළමුවෙනි ප්‍රශ්නයමයි. රුපියල් බිලියන 4.01ක ප්‍රමාණයක් අනුමැතියකින් තොරව චීන සමාගමට ගෙවීම සම්බන්ධව නීත්‍යනුකූල ක්‍රියාමාර්ග ගන්න 2014 අවුරුද්දෙන් පස්සේ තීරණය කරලා තිබුණා. නිල්වලා ගඟ හා සම්බන්ධ ඒ කියන ව්‍යාපෘතියට වඩා, ඒ මුදල් සම්බන්ධ අධ්‍යයනවල සහ ඒ නීතිමය ක්‍රියාමාර්ගවල වර්තමාන තත්ත්වය මොකක්ද කියන එක තමයි මගේ අතුරු ප්‍රශ්නය. ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සහ ඒ සමාගමට විරුද්ධව හෝ අදාළ පාර්ශ්වයන්ට විරුද්ධව දැනට ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නයට පිළිතුරක් මා අමාත්‍යාංශ මට්ටමින් විධිමත්ව ලබාගෙන ඉදිරිපත් කරන්නම්. මේ වනකොට යම් විශේෂ විනය ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් හෝ අකටයුතුකමක්, මූල්‍ය වංචාවක් එහෙම නැත්නම් නීති විරෝධී කටයුත්තක් සිදු වෙලාද කියන එක සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් ලැබිලා නැහැ. ඒ පිළිබඳව සොයා බලා ගරු මන්ත්‍රීතුමාට ලබා දීමට කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Second Round.

## හල්මුල්ල ග්‍රා.නි. වසමේ කැලණි ගං ඉවුර ඛාදනය: වැළැක්වීම

## ஹல்முல்ல கிராம அலுவலர் பிரிவில் களனி ஆற்றங்கரை அரிப்பு: தடுத்தல்

## KELANI RIVER BANK EROSION AT HALMULLA GN DIVISION: PREVENTION

1833/2026

3. **ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. S.M. Marikkar)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්මුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්මුල්ල පාර, පළමු පටුමග දෙපස කැලණි ගං ඉවුර සේදී යෑම හේතුවෙන් අනතුරුදායක තත්ත්වයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඒ හේතුවෙන් අනතුරට ලක් විය හැකි නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර කවරේද;

(iv) එම ස්ථානවලින් පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන්ට වන්දි ලබා දීමට හෝ නිවාස ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) නො එසේ නම්, පදිංචිකරුවන් එම ස්ථානයේම රඳවා තබා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ආරක්ෂිත ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொலன்னாவ பிரதேச செயலாளர் பிரிவின், ஹல்முல்ல கிராம அலுவலர் பிரிவில், ஹல்முல்ல வீதி, முதலாவது ஒழுங்கை களனி கங்கையின் இருமருங்கின் கரையோரமும் அரித்துச்செல்லப் படுவதால் ஆபத்தான நிலையில் இருப்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அதன் காரணமாக ஆபத்தை எதிர்கொள்ளக்கூடிய வீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அந்நிலைமையைத் தடுப்பதற்காக நீர்ப்பாசனத் திணைக்களம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) குறித்த இடங்களில் வசிக்கும் குடியிருப் பாளர்களை அகற்றுவதற்கு நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்;

(v) ஆமெனில், அந்நபர்களுக்கு இழப்பீடு வழங்கு வதற்கோ அல்லது வீடுகளை வழங்குவதற்கோ நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(vi) இன்றேல், குடியிருப்பாளர்களை அவ்விடத் திலேயே தொடர்ந்து தங்கவைப்பதற்காகப் பின்பற்றப்படும் பாதுகாப்பு வழிமுறைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House-

(i) whether he is aware that a precarious condition has been created due to the erosion of the banks of the Kelani River along both sides of First Lane, Halmulla Road, in the Halmulla Grama Niladhari Division of the Kolonnawa Divisional Secretary's Division;

(ii) if so, the number of houses at risk of damage as a result;

(iii) the steps that have been taken by the Department of Irrigation to prevent that situation;

(iv) whether actions will be taken to evacuate the residents from the said locations;

(v) if so, whether actions will be taken to pay compensation or provide housing to those persons; and

(vi) if not, the safety measure that will be followed to retain the residents in the same place?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්, හඳුනා ගැනීම් සිදු කර ඇත.

(ii) ආසන්න වශයෙන් නිවාස 50ක් පමණ වන අතර, මෙය ප්‍රාදේශීය ලේකම් හරහා තහවුරු කර ගත යුතුය.

(iii) හල්මුල්ල ප්‍රදේශයේ කැලණි ගඟේ වම් ඉවුරු ආරක්ෂා කිරීමේ ඉදි කිරීම් කටයුතු. (Boulder Packing-Chainage 7+110 සිට 7+725 දක්වා)

(iv) වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් සිදු නොකරයි.

(v) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

(vi) කැලණි ගඟේ ඉවුරු ඛාදනය වැළැක්වීම මඟින් ගංවතුර අවස්ථාවලදී ජනතාවගේ ජීවිත හා දේපළවලට සිදු විය හැකි හානි අවම කිරීම සහ ගංගා ඉවුරේ ස්ථාවරත්වය තහවුරු කිරීමේ අරමුණින් හල්මුල්ල ප්‍රදේශයේ කැලණි ගඟේ වම් ඉවුරේ Chainage 7+110 සිට 7+725 දක්වා ගං ඉවුරු ආරක්ෂණ ව්‍යුහයක් ඉදි කිරීම මේ වන විටත් සාර්ථකව සිදු වෙමින් පවතී.

මෙම ව්‍යාපෘතිය 2026.07.02 වන දින ආරම්භ කරන ලද අතර මේ වන විට සියයට 75ක් සාර්ථක ලෙස ඉදි කර අවසන් කොට ඇත. ව්‍යාපෘතිය මඟින් ගං ඉවුරු ඛාදනය අවම කිරීම, සුළු ගංවතුර අවදානම පාලනය කිරීම සහ අවට මාර්ග, නිවාස හා අනෙකුත් යටිතල පහසුකම් සඳහා දිගුකාලීන ආරක්ෂාවක් සැලසීම අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියේ තාක්ෂණික අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

මීට පරිබාහිරව ඇති පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කිරීම සුදුසු වේ.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Questions under Standing Order No. 27(2), the Hon. Leader of the Opposition.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### වහල මත සවි කරන සූර්ය පැනල බැටරි පද්ධති සඳහා බදු සහන
### கூரைமீது பொருத்தப்படும் சூரிய படல மின்கல சேமிப்பு முறைமைக்கான வரிச் சலுகை
### TAX RELIEF FOR BATTERY ENERGY STORAGE SYSTEMS OF ROOFTOP SOLAR PANELS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විශේෂයෙන්ම මේ ප්‍රශ්නය යොමු කරන්නේ පුනර්ජනනීය බලශක්තිය වෙනුවෙන්. මේ මොහොතේ තාප බලාගාර, ඉන්ධන බලාගාර මාෆියාව හිස ඔසවමින් තිබෙනවා. පුනර්ජනනීය බලශක්තියට පක්ෂපාතීවයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ.

බලශක්ති අමාත්‍යාංශය මඟින් 2026 සැප්තැම්බර් 11 දිනැති PE/DEV/03/01-RT ලිපිය මඟින්, වහල මත සූර්ය විදුලි පද්ධති - on-grid rooftop solar PV - සඳහා නව ගිවිසුම්/දීර්ඝ කිරීම් Net Plus ක්‍රමයට පමණක් සීමා කර සූර්යබල ව්‍යවසායකයන්ට වඩාත් හිතකර, සූර්යබල පාරිභෝගිකයන්ටත් හිතකර Net Metering සහ Net Accounting ක්‍රමවේද අත්හිටුවා තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ අත්හිටුවීම ඉතාම වැරැදි, අසාධාරණ ක්‍රියාවලියක් කියලා. විශේෂයෙන්ම මෙම තීරණය විදුලි පිරිවැයට, පද්ධති ස්ථාවරත්වයට සහ 2027 වසරේ විදුලි සැපයුමට බලපාන බැවින් ගරු බලශක්ති අමාත්‍යවරයාගෙන් ප්‍රශ්න ගණනාවක් අහන්න මම බලාපොරොත්තු වෙනවා. ඒ අනුව, මා පහත ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

1. වහල මත සූර්ය විදුලි ජනනය හේතුවෙන් විදුලිබල පද්ධතියට වළක්වා ගත් පිරිවැය - avoided cost - කිලෝවොට් පැයකට රුපියල් කොපමණද? කිලෝවොට් 5ක පද්ධතියකින් විදුලිබල පද්ධතියට වාර්ෂිකව ඉතිරි වන මුදල කොපමණද?

2. වහල මත සූර්ය විදුලි ජනනය අද නොතිබුණේ නම්, එම රික්තකය - vacuum එක - පිරවීම සඳහා ගත යුතු වන විදුලිබල මූලාශ්‍රවල ජනන පිරිවැය - energy weighted average generation cost - කිලෝවොට් පැයකට කොපමණද? දිනකට දැරීමට සිදු වන අමතර සමස්ත ජනන වියදම කොපමණද? එම විදුලි අවශ්‍යතාව සපුරා ලීමට යොදා ගන්නා ජනන ධාරිතාව, ඉන්ධන ප්‍රමාණයන් කොපමණද?

3. පෙර පැවැති සවිකිරීම් ප්‍රවණතාව අඛණ්ඩව පැවැතියේ නම් 2026 සැප්තැම්බර් 11 සිට දෙසැම්බර් 31 දක්වා පද්ධතියට එක් වීමට තිබූ අමතර වහල මත සූර්ය විදුලි ධාරිතාව මෙගාවොට් වශයෙන් කොපමණද?

   මොකද, දැන් එම ක්‍රමවේද නතර කර තිබෙන නිසා ඒවා තිබුණු ආකාරයටම ක්‍රියාත්මක වුණා නම් තවදුරටත් සූර්යබල ශක්තියෙන් උත්පාදනය වන විදුලි ප්‍රමාණයන් කොපමණද කියන එකයි මම මේ අහන්නේ.

   එම ඇස්තමේන්තුව සඳහා භාවිත කරන සැසඳුම් කාලය කුමක්ද? අයදුම්පත්, අනුමැතීන්, ක්‍රියාත්මක කළ පද්ධති වෙන් වෙන්ව දක්වන්නේද?

4. එල් නිනෝ තත්ත්වය හේතුවෙන් 2027 වසරේ පළමු මාස 6 තුළ අපේක්ෂිත විදුලි හිඟය, එම කාලය තුළ උපරිම ඉල්ලුම පවතින අවස්ථාවල ධාරිතා හිඟය මෙගාවොට් කොපමණ ප්‍රමාණයක් යැයි ඔබ සිතන්නේද? එහෙමත් නැත්නම් ඇස්තමේන්තු කරගෙන තිබේද?

   අපි විශ්වාස කරනවා, ඒකට යම් අනුමානයක් කරන්නට ඕනෑ කියලා. මොකද, එය නිශ්චිතව කියන්නට අමාරු වෙයි. නමුත් ඒ සඳහා ඔබතුමන්ලාගේ සූදානම මොකක්ද?

   වහල මත සූර්ය විදුලිය මිල දී ගැනීමේ සාමාන්‍ය පිරිවැය, ඉහත හිඟය තාප විදුලි ජනනයෙන් සපුරාලීමේ පිරිවැය කිලෝවොට් පැයකට කොපමණද?

   එතකොට 2027 ඇති වනවා කියන විදුලි හිඟය ඇත්ත වශයෙන්ම සූර්යබල ශක්තියෙන් පුරවා ගන්න පුළුවන්, මේ සූර්ය බලශක්තියට විරුද්ධ; පුනර්ජනීය බලශක්තියට විරුද්ධ වැඩ පිළිවෙළ නතර කරලා ඉතිරි මාස කිහිපය තුළත් සූර්ය බලශක්තිය; ඒ සංග්‍රාමය ශක්තිමත් කරන වැඩසටහන ක්‍රියාත්මක කරනවා නම්. අපේ ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා විෂය භාර රාජ්‍ය ඇමතිවරයාව සිටි කාල වකවානුවේදී තමයි "සූර්යබල සංග්‍රාමය" කියන වැඩසටහන හරහා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ. මම එය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

   ඒ නිසා මෙම අවදානමට මුහුණ දීමට, අමතර වහල මත සූර්ය විදුලිය සහ බැටරි බලශක්ති ගබඩා පද්ධති යොදා ගන්නේ නම් අවශ්‍ය සූර්යබල කෝෂ ධාරිතාව, බැටරි ධාරිතාව සහ අවශ්‍ය ආයෝජනය කොපමණද?

5. වහල මත සූර්ය ජනනයෙන් හා බැටරි පද්ධති යොදා ගැනීමෙන් පිරිවැය අවම කරගත හැකිව තිබියදී සහස්දනව් විදුලි බලාගාරය මඟින් විදුලි ජනනය සඳහා වැඩි අවස්ථාවක් ලබා දීමට හේතු කවරේද? ඒ සඳහා යෝජිත සමතුලිත ගාස්තුව - levelized tariff - කොපමණද? යම් හෙයකින් එය සූදානම් - standby - බලාගාරයක් ලෙස ක්‍රියාත්මක වුවහොත් කිලෝවොට් පැයකට පිරිවැය කොපමණද?

6. සූර්ය බලශක්තිය යොදා ගනිමින් අඩු වියදම් බලශක්ති නිෂ්පාදනයට හැකියාව තිබියදී හා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමනයෙන් ඔබ්බට යමින් යුගදනව් හා සොබාදනව් බලාගාර මඟින් අමතර විදුලි ගිගාවොට් පැය කොපමණ ප්‍රමාණයක් ජනනය කර තිබේද?

   ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ තිබෙන ඛේදවාචකය මේකයි. සූර්ය බලශක්තිය 2013දී මෙගාවොට් 3යි තිබුණේ. ඒක දැන් මෙගාවොට් 2,502ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම rooftop solar panels තිබෙන වහලවල් 150,000කට වැඩි ප්‍රමාණයක් තිබුණා, 2006 ජුනි වනකොට. ඉලක්කය දසලක්ෂයයි. ඒ වාගේම මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්නට ඕනෑ, විශේෂයෙන් මේ අවස්ථාවේ ඉතාම වේගවත්ව ක්‍රියාත්මක කළ හැකි පුනර්ජනනීය බලශක්තිය ගැන. ඒ තමයි සෝලා බලශක්තිය. හේතුව මේකයි. Fixed charge එකක් නැහැ. Price එකත් අඩුයි. ඒ වාගේම, rooftop solar power unit එක රුපියල් 28 වනවිට ඉන්ධන හරහා නිපදවන ඒවා රුපියල් 51 සිට රුපියල් 129 දක්වා වැඩියෙන් යනවා. ඒ වාගේම අපේ රටේ බලශක්තියෙන් - energy - තෙල් සියයට 16.5ක් සපයන කොට බලශක්ති ජනන වියදමෙන් සියයට 43ක් ඒ සඳහා වැය කරනවා. ඉතින් බොහොම කනගාටුයි කියන්න, ඉන්ධන බලාගාර මාෆියාව - තෙල් බලාගාර මාෆියාව -, විශේෂයෙන්ම තාප බලාගාර මාෆියාව අද හිස එසවීම කනගාටුවට කාරණාවක්. අපි ඒක මොට කරන්න ඕනෑ; මර්දනය කරන්න ඕනෑ; නැති කරන්න ඕනෑ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

7. ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය මඟින් නිකුත් කළ 2024 නොවැම්බර් 12 දිනැති DGM/SYC/TCH/GEN/INT ලිපියට ප්‍රතිචාර ලෙස, අඩු සංඛ්‍යාත බර කපා හැරීමේ ක්‍රමය යාවත්කාලීන කිරීමට සහ 2025 අප්‍රේල් 09 දින සූර්ය පද්ධති විසන්ධි කිරීමට පෙර අඩු ඉල්ලුම් කාලවල විදුලිය භාවිතය දිරි ගැන්වීමට ගත් පියවර කවරේද?

8. ජාලය පිරී යෑම හේතුවෙන් නව සූර්ය විදුලි සම්බන්ධතා භාරගත නොහැකි අඩු වෝල්ටීයතා බෙදා හැරීමේ මාර්ග කවරේද? එම මාර්ගවල නව සම්බන්ධතා සහ දීර්ඝ කිරීම් සඳහා 2025 සහ 2026 වසරවල අනුමත කළ සහ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් සංඛ්‍යාව කොපමණද?

9. කාර්මික සහ ගෘහස්ථ බැටරි බලශක්ති ගබඩා පද්ධති සඳහා දැනට ලබා දෙන බදු සහන වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ හැකිද? ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා සියලු ශක්ති ගබඩා කරන බැටරි සඳහා පොදු අවම බදු මුදලක් පැනවීමට ඇති බාධා මොනවාද?

ඒ වාගේම, rooftop solar panelsවලට අවශ්‍ය උපකරණවලටත් යම්කිසි බදු සහන ක්‍රමයක් ඇති කරලා ඒ rooftop solar panel ඉලක්කය වන දසලක්ෂයක් වහලවල් මත සූර්ය බලශක්තිය නිර්මාණය කිරීමට ඔබ යොමු වෙනවාද, නැද්ද?

10. ජාතික විදුලිබල අවශ්‍යතාව පරිසර හිතකාමී අඩු මිල පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් සැපයිය හැකිව තිබියදී ඒ සඳහා සිදු කළ යුතු ආයෝජන හා ප්‍රතිපත්ති සම්පාදනය නොකර අධිමිල combined-cycle dual-fuel ඩීසල් බලාගාර ඉදි කිරීමෙන් රටට කොපමණ මූල්‍ය අලාභයක් සිදු වේද?

මම ඇත්ත වශයෙන්ම විශේෂ කාරණයක් දැන ගන්න කැමැතියි, "යුගදනවි", "සොබාදනවි", "සහස්දනවි" බලාගාර සම්බන්ධයෙන්. මෑතක ඉදි කළ බලාගාරය තමයි සහස්දනවි බලාගාරය. අපි යුගදනවි බලාගාරය ගත්තොත්, ඒ combined-cycle power plant එක නමට combined cycle, ක්‍රියාත්මක වෙන්නේ ඩීසල්. ඒක ඉන්ධන බලාගාරයක්. හැබැයි, FSRU එක නැති නිසා LNG පැත්ත ක්‍රියාත්මක වන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, would you stick to what is written there in the Question, please?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමන්ලා එය combined-cycle power plant එකක් කියලා ක්‍රියාත්මක කරනවා. නමුත්, FSRU එක නැතුව combined-cycle power plant එකක් ක්‍රියාත්මක කරන්නේ කොහොමද? ඒ, එක කාරණයක්.

අනෙක් කාරණය මෙයයි. ඒවා වෙනුවට සූර්ය බලශක්තිය - solar - ඇතුළු සුනිත්‍ය බලශක්තිය ප්‍රවර්ධනය කරන්නට ඔබ කටයුතු නොකරන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයේ කොටස් 10ක් තිබෙනවා. එම නිසා පිළිතුර සඳහා සංඛ්‍යාලේඛන බොහොමයක අවශ්‍යතාව තිබෙනවා. අපට ඊයේ සවස 3.00ට තමයි මෙම ප්‍රශ්නය ලැබුණේ. එම නිසා සමහර සංඛ්‍යාලේඛන මට මේ වෙලාවේ ඉදිරිපත් කරන්න බැහැ. ඒකට යටත්ව විපක්ෂ නායකතුමා කැමැති නම් මම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමාගේ ප්‍රවේශය තුළ ගම්‍ය වුණා, සූර්ය බලයෙන් ලබා ගන්නා විදුලිය සීමා කිරීම සඳහා කටයුතු කරනවා කියලා. ඇත්තවශයෙන්ම සිදු වන්නේ ඒක නොවෙයි. 2024දී අපි බලයට පත් වනකොට rooftop solarවලින් ලබා ගත් විදුලිය ප්‍රමාණය තිබුණේ මෙගාවොට් 1,400යි. අපේ පළමු අවුරුද්ද තුළ විතරක් rooftop solarවලින් ලබා ගත් විදුලිය ප්‍රමාණය මෙගාවොට් 2,339.7 දක්වා වැඩි කරන්න අපි කටයුතු කළා. ඒ කියන්නේ, 2024 වසරත් එක්ක බලනකොට සියයට 167ක වැඩි වීමක්. ඒ වාගේම 2026 අගෝස්තු මාසය වනකොට rooftop solarවලින් ලබා ගත් විදුලිය ප්‍රමාණය මෙගාවොට් 2,542 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2024 වසරත් එක්ක බලනකොට එය සියයට 181ක වැඩි වීමක්.

ඊළඟට, ground mounted solarවලින් ලබා ගත් විදුලිය ප්‍රමාණය ගැන මම වැඩිය විස්තර කරන්න යන්නේ නැහැ. අපි 2024දී බලයට පත් වනකොට ground mounted solarවලින් ලබා ගත්තේ මෙගාවොට් 163.4යි. හැබැයි, මේ වනකොට එමඟින් ලබා ගන්නා විදුලිය ප්‍රමාණය මෙගාවොට් 534 දක්වා වැඩි වෙලා තිබෙනවා. කවුරු හෝ කියන්න උත්සාහ කරනවා නම්, සූර්ය බලයෙන් නිපදවන බලශක්තිය දුර්වල කරන්න මේ වනකොට අපි උත්සාහ කරනවා කියලා, එය වැරදියි. අපි ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව කිව්වොත්, rooftop solarවලින් 2027 - 2029 කාලය තුළ ගන්න මීට කලින් සැලසුම් කරලා තිබුණේ මෙගාවොට් 300ක විතර ප්‍රමාණයක්. නමුත් මේ වනකොට අපි සැලසුම් කරලා තිබෙනවා, rooftop solarවලින් මෙගාවොට් 500ක් ලබා ගන්න. ඒ වාගේම ground mounted solarවලින් මෙගාවොට් 792ක් ගන්නත් අපි සැලසුම් කරලා තිබෙනවා. එතකොට දැන් තිබෙන මෙගාවොට් 3,076ක ප්‍රමාණයත්, ඒ වාගේම 2024දී තිබුණු මෙගාවොට් 1,564ක ප්‍රමාණයත්, 2029 වනකොට මෙගාවොට් 4,315 දක්වා වැඩි කරන්න සැලැස්මකට අනුව අපි කටයුතු කරමින් යනවා. පොදුවේ solarවලින් ලබා ගන්නා විදුලි බලය සීමා කිරීම සඳහා රජය විසින් කටයුතු කරනවා කියලා කවුරු හෝ ආයෙත් කියනවා නම්, මෙම සංඛ්‍යාලේඛන දිහා බැලුවාම පෙනෙනවා, ඒක එහෙම නොවෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. ජාතික පද්ධතියේ අවම පිරිවැය සැලැස්ම අනුව 2026 අවසානය වනකොට මෙගාවොට් 1,682ක් තිබිය යුතුයි. නමුත්, මේ වනකොට මම කලින් සඳහන් කළා වාගේ

rooftop solarවලින් මෙගාවොට් 2,542ක් සහ ground mounted solarවලින් මෙගාවොට් 534ක් වශයෙන් මෙගාවොට් 3,076ක ධාරිතාවක් තිබෙනවා. ඒ කියන්නේ, අවම පිරිවැය සැලසුමටත් වඩා මෙගාවොට් 1,378ක ධාරිතාවක් පද්ධතියට එකතු කරගෙන තිබෙනවා. විදුලි බලය මේ විධියට පද්ධතියට එන නිසා වළක්වාගත හැකි පිරිවැය ගණනය කිරීමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ. මොකද, ජනන සැලැස්මටත් වඩා මෙගාවොට් 1,378ක් solar හරහා පද්ධතියට එකතු කරගෙන තිබෙනවා. එම නිසා avoided cost එකක් ගණනය කිරීමේ අවශ්‍යතාවක් මේ අවස්ථාවේ පැන නඟින්නේ නැහැ.

2. අපි මෙයත් තේරුම් ගන්න වෙන්නේ, solarවලින් විදුලිය ගත්තේ නැත්නම් ඒ වෙනුවට මොන ප්‍රභේද ද පාවිච්චි කළේ කියන කාරණය මත. මා මේ ඉදිරිපත් කරන්න යන දත්ත අනුව අපට එය වඩාත් හොඳින් තේරුම් ගන්න පුළුවන්කම තිබෙනවා. Solar දුර්වල අවස්ථාවක, ඒ කියන්නේ වැහි බර කාලගුණයක් තිබෙන දවසක සහ වඩාත් හොඳින් හිරු පායා තිබෙන දවසක පවතින තත්ත්ව සංසන්දනය කිරීමෙන් තමයි අපට මේ ප්‍රශ්නයට උත්තරයක් හොයාගන්න පුළුවන්කම ලැබෙන්නේ. සාමාන්‍යයෙන් හිරු එළිය අඩු දවස්වල - gloomy weather එකක් තිබෙන දවස්වල - solar power generation අඩුයි.

අපි උදාහරණයක් හැටියට ගත්තොත්, 2026 අගෝස්තු 03වැනි දා solar power තිබුණේ, ගිගාවොට් පැය 2.76යි. හැබැයි, වැඩියෙන්ම solar power generation තිබිච්ච දවසකට උදාහරණයක් ගත්තොත්, 2026.07.23වැනි දා අපට ගිගාවොට් පැය 12.38ක් ලැබුණා. සමස්ත දවසේ ජනනය ගත්තොත්, 2026.08.03වැනි දා අපට අවශ්‍යතාව තිබුණේ ගිගාවොට් පැය 53.73ක්. හැබැයි, වැඩියෙන්ම solar power generation තිබිච්ච 2026.07.23වැනි දා අපට අවශ්‍යතාව තිබුණා, ගිගාවොට් පැය 60.13ක්. 2026.08.03වැනි දා රාත්‍රි කාලයේ 7.15ට විතර - peak level එකේ - demand එක තිබුණේ මෙගාවොට් 2,693ක්. හැබැයි, අර වැඩියෙන්ම solar power generation තිබිච්ච දවසේ මීට සමාන වෙලාවේදීම මෙගාවොට් 3,043ක අවශ්‍යතාවක් තිබුණා. හැබැයි, solar power generationවල peak වෙලාවේ - උදේ 10.15ට - මෙගාවොට් 774ක් පද්ධතිය තුළ තිබුණා, දුර්වල වෙච්ච අවස්ථාවේදී. වඩාත් හොඳින් ක්‍රියාත්මක වෙච්ච අවස්ථාවේදී මෙගාවොට් 1,682ක් තිබුණා. ඒ වාගේම solar power generation දුර්වලව තිබිච්ච දවසේ coal ඇතුළු අතිරේක ක්‍රමවලින් විදුලිය ජනනය කරන්න රුපියල් මිලියන 990ක් වැය වුණා. ඒ නිසා සමස්තයක් හැටියට cost එක ගත්තොත්, කිලෝවොට් එකක් ජනනය කරන්න රුපියල් 28ක් යනවා කියලා average cost එක ගණනය කළොත්, දුර්වල අවස්ථාවේදී රුපියල් 78ක් හැටියට සහ වැඩියෙන් solar power generation තිබිච්ච දවසේ රුපියල් මිලියන 351ක් හැටියට අපට අතිරේක ලාභයක් solar power නිසා ඇවිල්ලා තිබෙනවා. එතකොට සම්පූර්ණ ප්‍රමාණය මෙගාවොට් 1,068ක් සහ මෙගාවොට් 1,664ක් හැටියට අපට ගණනය කරන්න පුළුවන්.

3. ඇත්තටම මේ යටතේ අහපු ප්‍රශ්නයේ මෙහෙම එකකුත් තිබෙනවා. Solar power තිබුණේ නැත්නම් වෙන්නේ මොකක්ද කියන එක කල්පිතයක් මත අහන ප්‍රශ්නයක්. කෙනෙකුට ඒ ප්‍රශ්නය මේ වාගේ කාරණයකට සම කරන්න පුළුවන්. අපි හිතමු, වාස්තු විද්‍යාත්මක සැලැස්මක් අනුව ගෙයක් හදලා තිබෙනවා කියලා. කෙනෙක් ප්‍රශ්නයක් අහනවා, මේ මැද කණුව තිබුණේ නැත්නම් ගෙට මොකක්ද වෙන්නේ කියලා. එතකොට ඒක සාධාරණ ප්‍රශ්නයක් නොවෙයි.

අපට ජනන සැලැස්මක් තිබෙනවා. ඒ ජනන සැලැස්මට අනුව සහ ඊටත් වඩා අපි solar එකතු කරගෙන තිබෙනවා, මෙගාවොට් 1,378ක්. එහෙම තිබියදී අහනවා, ඒක නොවුණා නම් කිලෝවොට් එකකට කොච්චර වැය වෙනවාද කියලා. මම හිතන විධියට, ඒක සාධාරණ ප්‍රශ්නයක් නොවෙයි.

ඒ වාගේම එතුමා 3වන ප්‍රශ්නයෙන්ම අහනවා, පෙර පැවති සවිකිරීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතියේ නම් කොච්චර ප්‍රමාණයක් ගන්න පුළුවන්කම තිබුණාද කියලා. මම කලිනුත් සඳහන් කළා, solar වාගේ චාලක අවස්ථිතිය නැති ප්‍රභවයකින් බලශක්තිය ගන්නකොට, එහෙම නැත්නම් එවැනි ප්‍රභවයකින් පද්ධතියට සැපයුමක් එනකොට යම් යම් සීමා තිබෙන බව. පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගෙන යෑම සඳහා එවැනි සීමා ගොඩක් තිබෙනවා. ඒ වාගේම grid availability එක බැලුවාමත් සීමා ගණනාවක් තිබෙනවා. ඒ සීමා මැද්දේ වුණත් සැලැස්මටත් වඩා වැඩි විදුලිය ප්‍රමාණයක් දැනටමත් පද්ධතියට එකතු කරලා තිබෙන නිසා අර කලින් තිබිච්ච ප්‍රවණතාව දිගින් දිගටම ගෙනයන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පද්ධතියේ භෞතිකව ඇති වන සීමා, ඒ වාගේම දීර්ඝ කාලීන අවම පිරිවැයකින් ජනන සැලැස්මට අනුව පවතින සීමා ඉක්මවා ගිහිල්ලා දැනටමත් අපි කටයුතු කරන නිසා පෙර පැවැති සීමාව අදාළ වන්නේ නැහැ. විපක්ෂ නායකතුමා සඳහන් කළ ලිපිය සැප්තැම්බර් 11වැනි දා නිකුත් කරන්න කලින් පවා අපි application අරගෙන තිබුණා. නමුත්, බොහෝ තැන්වලට සම්බන්ධතා ලබා දී තිබුණේ නැහැ. මොකද, grid availability එක නැති නිසා.

4. ගරු විපක්ෂ නායකතුමනි, එල් නිනෝ තත්ත්වය නිසා පළමුවැනි මාස හය ඇතුළේ දහවල් කාලයේ ගැටලුවක් ඇති වෙයි කියා අප බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද අපි දන්නවා, පවතින තත්ත්වයටත් වඩා වැඩි වර්ෂාපතනයක් තමයි මේ මාසවල අපේක්ෂා කරන්නේ, පුරෝකථනය කරලා තිබෙන්නේ කියලා. නමුත්, ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය වනකොට එල් නිනෝ තත්ත්වය අඩුවෙමින් යනවා. මුල් මාස තුන තුළ තමයි මේ ප්‍රශ්නය පැන නඟිනවා නම් පැන නඟින්නේ. දහවල් කාලයේ සූර්ය බලය වැඩිපුරත් තිබෙන නිසා අපි අපේක්ෂා කරන්නේ නැහැ, ගැටලුවක් පැන නඟීවි කියලා. හිඟයක් අපේක්ෂා නොකරන නිසා ඒකට අදාළ සපුරාලීමේ පියවරක් ගණනය කරන්න බැහැ. නමුත් අපි දන්නවා, රාත්‍රි කාලයේදී මේ ප්‍රශ්නය පැන නඟින්න පුළුවන් කියලා. ඒ නිසා රාත්‍රී කාලයේදී පැන නඟින්න පුළුවන් මේ ප්‍රශ්නයට පිළිතුරක් හැටියට දැනටමත් අපි Battery Energy Storage System එක හඳුන්වා දීලා තිබෙන බව ඔබතුමා දන්නවා. දැනටමත් මේ අවුරුද්ද තුළ මෙගාවොට් 160ක් එකතු කර ගන්න වාගේම 2027 අප්‍රේල් මාසයට කලින් සම්පූර්ණයෙන් මෙගාවොට් 540ක් පද්ධතියට එකතු කර ගැනීම සඳහා අපි කටයුතු කරනවා. මෙතැනදී බලාපොරොත්තු වෙන්නේ දවල් කාලයේ අපට අතිරික්තව තිබෙන විදුලිය පාවිච්චි කරලා, ඒ බැටරි පද්ධතිය ආරෝපණය කරලා, රාත්‍රී කාලයේදී ඒවා භාවිත කිරීමයි. ඒකට අදාළ ටෙන්ඩර්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැන් බොහෝ වෙලාවට අපි අවසන් කරලා තිබෙනවා, කරුණු දෙකක. ඒ වාගේම මේ ටෙන්ඩර්, ප්‍රසම්පාදන ක්‍රියාවලියත් එක්ක පැන නැඟෙන සමහර ගැටලු නිරාකරණය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ඇතිව විශේෂ කමිටුවක් පත් කරලා තිබෙනවා. මේ හරහා එය මේ පද්ධතියට එකතු කර ගැනීම අප්‍රේල් මාසයට කලින් අවසන් කරන්න පුළුවන් කියා අපි හිතනවා. ඒ නිසා එල් නිනෝ තත්ත්වය හේතුවෙන් රාත්‍රී කාලයේ ඇති විය හැකි මෙගාවොට් ගණනක හිඟය වළක්වා ගැනීම සඳහා අපට කටයුතු කරන්න පුළුවන්කම ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

5. වහල මත සූර්ය ජනනයෙන් හා බැටරි පද්ධති යොදා ගැනීමෙන් පිරිවැය අවම කර ගැනීමට හැකිව තිබියදී

**[ගරු අනුර කරුණාතිලක මහතා]**

සහස්දනව් බලාගාරය මඟින් විදුලි ජනනය සඳහා වැඩි අවස්ථාවක් ලබා දීමට හේතු කවරේද කියායි එතුමා මෙම ප්‍රශ්නයෙන් අහන්නේ. ඇත්තටම මේ සහස්දනව් සහ සොබාදනව් බලාගාර අපේ කාලයේ පටන් ගත්ත, අනුමත කරපු ඒවා නොවෙයි. අවසන් බලාගාරය 2020දී අනුමත කරලා, contract award කරලා, දැන් ඒවායේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. නමුත් මේවායේ අවශ්‍යතාව පැන නඟින්නේ එදිනෙදා විදුලි අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා නොවෙයි, දැන් තිබෙන අපේ generation mix එක දිහා බැලුවාම. විශේෂයෙන් මේ වනකොට සියයට 65කට වැඩිය renewable energyවලින් තමයි අපේ ජනන සැලැස්ම ගන්නේ. ඊළඟට, සියයට 17ක් විතර අපි ගන්නේ coalවලින්. ඒ නිසා සියයට 2කටත් වඩා අඩු ප්‍රමාණයක් තමයි මුළු වාර්ෂික ජනන සැලැස්ම තුළ ගත්තත් මේ වාගේ ඩීසල් සහ අනෙකුත් බලාගාරවලින් ගන්නේ. නැප්තාවලින් අපි යම් ප්‍රමාණයක් ගන්නවා. අන්න අර කිව්වා වාගේ දවල් කාලයේදී වර්ෂාපතනය හරි වෙනත් කාරණයක් නිසා අපට ප්‍රමාණවත් සූර්ය බලයක් නොලැබුණු කාලයක, ඒ වාගේම රාත්‍රී කාලයේ අපේ plant එකක කිසියම් ගැටලුවක් පැන නැඟුණු අවස්ථාවක, අඩු පිරිවැයක් තිබෙන plant එකක ගැටලුවක් පැන නැඟුණු අවස්ථාවක backup එකක් හැටියට පාවිච්චි කරන්න තමයි මේ plantsවල අවශ්‍යතාව අපට පැන නඟින්නේ.

ඔබතුමා අහනවා, යම් හෙයකින් එය සූදානම් බලාගාරයක් ලෙස ක්‍රියාත්මක වුවහොත් කිලෝවොට් පැයකට පිරිවැය කොපමණද කියලා. ඒ වාගේ අවස්ථාවක තිබෙන්නේ මේකට තිබෙන capacity charge එක ගෙවන එකයි. හැබැයි, ඒක ඒකකයක් හැටියට බලාපොරොත්තු වෙනවා නම් ඒක ගණනය කරන්න බැහැ. අපි හිතමු, අප plant එකක් තියාගෙන ඉන්නවා, ඒ plant එකෙන් කිසිම ඒකකයක් ගන්නේ නැහැ, බිංදුවයි කියලා. එතකොට අපි plant capacity charge එක බිංදුවෙන් බෙදුවොත් මොකක්ද වෙන්නේ? කවුරු හරි කියන්න පුළුවන්, unit cost එක අනන්තයයි කියලා. මොකද, බිංදුවෙන් බෙදුවොත් අනන්තයක්. ඒ නිසා එහෙම ගණනය කිරීමක් කරන්න බැහැ කියන එක තමයි මට සඳහන් කරන්න වෙන්නේ.

6. එහෙම දෙයක් කරලා නැහැ. විදුලිබල පද්ධතියේ මෙහෙයුම් කටයුතුවලදී මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමනයන්ට ඔබ්බෙන් කිසිම සිදුවීමක්, කිසිම action එකක් අරගෙන නැහැ.

7. අර ඇති වෙලා තිබෙන සිද්ධිය වළක්වා ගැනීම සඳහා ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය මඟින් අරගෙන තිබෙන පියවර මොනවාද කියන එකයි ඔබතුමා අහන්නේ, ගරු විපක්ෂ නායකතුමනි. මම කලිනුත් සඳහන් කළා වාගේ මෙතැනදී මේ වාගේ පද්ධතියේ බිඳ වැටීමක් සිද්ධ වෙන්නේ වැඩිපුර අව්ව තිබෙන දවස්වල වැඩියෙන් solar මඟින් විදුලිය ජනනය කර ගත්තාට පස්සේ ප්‍රතිවිරුද්ධ බලප්‍රවාහය - reverse power flow එකක් - එන නිසායි. ඒ වාගේ reverse power flow එකක් ආපු අවස්ථාවකදී පද්ධතියේ සමතුලිතතාව බිඳ වැටිලා පද්ධතිය බිඳ වැටෙනවා. ඒක තමයි ඇති වන තත්ත්වය. මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා කරන්න පුළුවන්කම තිබෙන්නේ අන්න අර reverse power flow එකක් ඇති වන එක වළක්වා ගැනීමට ඒ වාගේ වැඩිපුර ප්‍රමාණයක් ජනනය වන අවස්ථාවේදී ඒ ප්‍රමාණය අතිරික්තව බැටරි පද්ධතිය ආරෝපණය කිරීම සඳහා යොදා ගන්නා එකයි. නමුත් ප්‍රමාණවත් බැටරි පද්ධතියක් අපි තවමත් සවි කර නැහැ. ඒ නිසා තමයි අපට මේ වනකොට curtailment කියන එක කරන්න වෙලා තිබෙන්නේ. සමහර අවස්ථාවල අපේ අවශ්‍යතාව මෙගාවොට් 600, 700 වාගේ ප්‍රමාණයට වැටෙනවා. හැබැයි, ජනනය වන ප්‍රමාණය 2,800, 2,600 වාගේ ප්‍රමාණයකට යනවා. එහෙම වුණාම අපට වැඩිපුර ප්‍රමාණයක් curtail කරන්න වෙනවා. අපට අනෙක් plants නවත්වන්න පුළුවන්. නමුත්, solarවලට curtail කරන්න වෙන්නේ ඒ නිසායි. ඒ නිසා මේකට විසඳුම හැටියට දැන් අපේ යෝජනාව තමයි, කිසියම් සැලැස්මක් අනුව බැටරි පද්ධති ක්‍රමක්‍රමයෙන් පද්ධතියට හඳුන්වා දීම. ලබන අවුරුද්දේ අප්‍රේල් වනකොට මෙගාවොට් 540ක් සහ 2029 අවුරුද්දේ අවසන් කාලය වනකොට මෙගාවොට් 1,240ක් සම්පූර්ණයෙන් බැටරි පද්ධතිය හරහා එකතු කරන්න අපි කටයුතු කරනවා. ඒ අනුව දවල් කාලයේ solarවලින් ජනනය වන අතිරික්ත විදුලිය රාත්‍රී කාලයේදී භාවිත කරන්න පුළුවන් හැකියාව ලැබෙනවා. ඒ නිසා අර වාගේ ඇති වන reverse power flow එක අඩුකර ගන්න අපට පුළුවන් වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, in the interest of time, may I request you to shorten your answer?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ප්‍රශ්න ටිකක් දීර්ඝ වනකොට උත්තරත් දීර්ඝ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මූලසුනට සහ ඔබතුමාට තිබෙන පෞද්ගලික ගෞරවය සහිතව මම පිළිතුර ලබා දීම ඉක්මනින් අවසන් කරන්නම්.

8. ඇත්තටම මම කලින් කිව්වා වාගේ සංඛ්‍යාලේඛන මට තවම ලැබී නැහැ. ඒ සංඛ්‍යාලේඛන මම ඉදිරි කාලයේදී ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්, ගරු විපක්ෂ නායකතුමනි.

9. ඇත්තටම මේ වනකොට මෙගාවොට් පැය එකකට වඩා වැඩි ධාරිතාවක් ජනනය කරන අයට අපි bonded warehouse facility එකක් දීලා, ඒවා බදුවලින් නිදහස් කර තිබෙනවා. නමුත් ගෘහස්ථ භාවිත කරන බැටරි සඳහා ඒ තත්ත්වයට යන්න තවමත් අපට පුළුවන්කම ලැබී නැහැ. නමුත්, අපි සුනිත්‍ය බලශක්ති අධිකාරියට කියා තිබෙනවා, ගෘහස්ථ පාවිච්චි කරන්න පුළුවන් බැටරිවල ප්‍රමිතීන් වෙනුවෙන් ඒ අයට කිසියම් බදු සහනයක් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. දැන් ඒ කමිටුව පත් කර තිබෙනවා. ඒ වාර්තාව ඉතා ඉක්මනින් ලැබුණාට පසුව මුදල් අමාත්‍යාංශයත්, රජයත් එක්කත් සාකච්ඡා කරලා කිසියම් බදු සහනයක් ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

10. ඇත්තටම මම කලින් පැහැදිලි කළා වාගේ ඒවා අපි විසින් ආරම්භ කරපු ඒවා නොවෙයි. නමුත් අපට මේ අවශ්‍යතා වෙනුවෙන් ඒවා පවත්වා ගෙන යන්න වෙනවා. ඒ වාගේම ඒ අයත් එක්ක ගිවිසුම්ගත වෙලා තිබෙන නිසා අපට ඒවා ප්‍රතික්ෂේප කරන්න බැහැ. නමුත් අපේ target එක තිබෙන්නේ ඒක backup plan එකක් හැටියට තියා ගන්න මිසක්, දවසේ භාවිතය සඳහා පාවිච්චි කරන්න නොවෙයි. අපි ජනන පිරිවැයෙන් සියයට 70ක් renewable energyවලට යොමු වෙන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. බොහෝ අවස්ථාවල අපි සියයට 65 ඉක්මවා ගිහින් තිබෙනවා. සමහර දවස්වල සියයට 75 දක්වා renewable energy use කරන්න අපි යොමු වෙලා තිබෙනවා. ඔබතුමා සඳහන් කරන පාරිසරික බලපෑම ආදී කාරණා සම්බන්ධයෙන් අපේ කාලයේ ගත්ත තීරණය පිළිබඳව අදාළ වාර්ෂික වාර්තා ගෙන්වා ගන්න මට බැරි වුණා. මොකද, ඒක 2020දී වෙච්ච දෙයක්. ඒ කියන්නේ, මීට අවුරුදු 6කට කලින්. ඒ පිළිබඳ තොරතුරු අපට හොයා ගන්න බැරි වුණා.

තව එක කාරණයක් කියන්න මට විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සභාවේදී ඊයේත් Net Metering සහ Virtual Net Metering පිළිබඳ ප්‍රශ්නය මතු කළා. Net Metering කියන එක තිබුණාට ඇත්තටම මේ ක්‍රම 2ක්. අපි ADB Grant එක හරහා බලාපොරොත්තු වෙන්නේ Virtual Net Metering. හැබැයි, දැන් ඒකේ තිබෙන්නේ Net Metering. වෙනස මේකයි. Net Meteringවලින් කරන්නේ solar panels සවි කරපු කෙනා පෞද්ගලිකව පාවිච්චි කර ඉතිරි වන ප්‍රමාණය මතු කාලයේදී භාවිත කරන්න බලාගෙන පද්ධතියට ලබා දීමයි. හැබැයි, Virtual Net Meteringවලින් කරන්නේ කොහේ හරි තැනක - රජයේ ස්ථානවල හෝ වෙනත් තැනක - වහල මත solar සවි කර ඒකෙන් ජනනය කරන ප්‍රමාණය පද්ධතියට එකතු කිරීමයි. හැබැයි, අඩු ආදායම් ලබන වෙනත් තැනක ඉන්න කණ්ඩායමකට විදුලි බිලට සහනයක් ලබා දීම සඳහා අන්න ඒ විදුලි බලය පාවිච්චි කරනවා. ඒක තමයි Virtual Net Metering කියන්නේ. ඒ නිසා ඊයේ සඳහන් කරපු Net Metering විසන්ධි කරලා තිබෙන වෙලාවක Virtual Net Meteringවලට අවස්ථාව දෙන්නේ කොහොමද කියන කාරණය පැන නඟින්නේ නැහැ. මේක ක්‍රමවේද දෙකක්.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, you may have a short clarification.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. මගෙන් පස්සේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කාරණය අහන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා ලබා දුන්න දීර්ඝ පිළිතුරට අදාළව මම ඉතාම ඉක්මනින් පැහැදිලි කර ගැනීම් ටික ලබාගන්න කැමතියි. ගරු ඇමතිතුමනි, ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා කරලා තිබෙන්නේ Net Metering, Net Accounting වැඩ පිළිවෙළ වෙනුවට Net Plus ක්‍රමවේදය හඳුන්වා දීමයි. මම ඒක ගැන පැහැදිලිව කියන්නම්. උදාහරණයක් වශයෙන් ගත්තොත්, නිෂ්පාදක සහ පාරිභෝගිකයා කියන පුද්ගලයා - prosumer, ඒකක 500ක් - 500 units - පරිභෝජනය කළොත්, අලුත් Net Plus ක්‍රමවේදය තුළ ඒ ඒකක 500ට රුපියල් 40,000ක්, රුපියල් 45,000ක් පමණ ගෙවන්න සිද්ධ වෙනවා. හැබැයි, ඒ පුද්ගලයා ඒකක 500ක් නිෂ්පාදනය කළොත්, ඔහුට ආදායම හැටියට ලැබෙන්නේ රුපියල් 11,000යි. ඔන්න ඔබතුමන්ලා ගෙනාපු අලුත් ක්‍රමය තුළ සූර්ය බලශක්තිය මොට කරන්නේ කොහොමද කියන කාරණාව මම සංඛ්‍යාත්මකව ඉදිරිපත් කළා. ඒ නිසා Net Plus ක්‍රමය වෙනුවට, තිබුණු Net Metering, Net Accounting වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ඔබතුමාගේ සංඛ්‍යාලේඛනවල ඔබතුමා කිව්වා, ආපු දවසේ ඉඳලා මෙච්චර මෙගාවොට් ප්‍රමාණයක් වැඩි කරලා තිබෙනවා කියලා. 2025දී mega voltage 887ක් පද්ධතියට ඇතුළත් කර තිබෙනවා සූර්ය බලශක්තියෙන්. ඒක පිළිගන්නවා. හැබැයි, 2026 - මේ වසරේ - සැප්තැම්බර් වෙනකොට ඇතුළත් වෙලා තිබෙන්නේ mega voltage 214යි. ඒ කියන්නේ ඔබතුමන්ලා සූර්ය බල ශක්තිය මොට කරන්න කටයුතු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවාද මෙගාවොට් 2,500ක් පද්ධතියට එකතු කිරීම තුළ අපේ රටට මාසිකව සූර්ය බලශක්තිය ලබාදෙන වාසිය රුපියල් බිලියන 25ක් බව. ඒක තමයි මේ මොට කරලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමතියි. Acting Secretaryට මොකක්ද තිබෙන අයිතිය licenseeට නියෝග යවන්න? ඒක Electricity Act එකෙත් නැහැ; PUCSL Act එකෙත් නැහැ. මම දන්නවා, ඔබතුමන්ලා සූර්ය බලශක්තියට හතුරුකම් කරනවා කියලා. හැබැයි, සොබාදනව් කිව්වාම, යුගදනව් කිව්වාම, සහස්දනව් කිව්වාම ඔබතුමන්ලා ආදරෙයි. ඒ මොකද? ඒ බලාගාරවලින් විදුලිය ජනනය කරනකොට වැඩිපුර මුදල් ප්‍රමාණයක් යනවා. ජනනයට යන මුදල් ප්‍රමාණය වැඩි වෙන්න, වැඩි වෙන්න මේ රජය ආදරෙයි. මේ රජය තාප බලාගාර මාෆියාවට, ඉන්ධන බලාගාර මාෆියාවට ආදරෙයි.

මම ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමතියි. දැන් ඔබතුමා ඇහුවා නේ, නිවසේ මැද කණුව නැත්නම් ගෙට මොකක්ද වෙන්නේ කියලා. ඉතින්, නිවසේ මැද කණුව තමයි පුනර්ජනනීය බලශක්තිය. ඒක තමයි බලශක්ති උත්පාදනයේ මැද කණුව; පදනම; ඒක තමයි foundation එක.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, would you shorten that, please.?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, I have not finished yet. I have two more points to make. Hon. Deputy Speaker, please do not interrupt me; interrupt කරන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, could you please stick to the original Question, please?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දැන් මා ළඟ තිබෙනවා, PUCSL එක බලශක්ති ලේකම්වරයාට ලියපු ලියුම. PUCSL එක මොකක්ද කියන්නේ? Sahasdhanavi Combined-cycle Power Plant එකේ ඒකකයකට අදාළව ලබා දුන් තොරතුරු, Cabinet Paper එකේ තොරතුරු සම්පූර්ණයෙන්ම වැරදියි. දාලා තිබෙන්නේ unit cost එක විස්සයි දශම ගණනක් කියලා. හැබැයි, scenarios තුනක් පෙන්වලා මහජන උපයෝගිතා කොමිෂන් සභාව -PUCSL එක- කියනවා, "නැහැ, ඒක වැරදියි. Scenarios තුනක් බැලුවත් එක්කෝ ඒක 35 වෙන්න ඕනෑ. අනෙක් එක 43 වෙන්න ඕනෑ. අනෙක් එක 72 වෙන්න ඕනෑ" කියලා. එතකොට Cabinet Paper එකේ, සහස්දනව් බලාගාරයේ ඒකකයක මිල - කිලෝවොට් පැයක මිල - රුපියල් 20 කියලා බොරුවක් දාලා තමයි කැබිනට් එක මේ Sahasdhanavi Combined-cycle Power Plant එක අනුමත කරගෙන තිබෙන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමතියි. එතුමා බොහොම වැදගත් කාරණාවක් කිව්වා, පද්ධතිය බිඳ වැටෙනවා කියලා. මම මේකෙන් පසුව මගේ කථාව නවත්වනවා. පද්ධතිය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

බිඳ වැටීම නිසා මේක පොඩ්ඩක් curtail කරනවා කිව්වා. මට කියන්නකෝ, වඳුරා පැනලා පද්ධතිය බිඳ වැටුණේ සූර්ය බලශක්තිය වැඩිවුණු නිසාද කියලා. ඒක නිසාද? එහෙම නැත්නම් වික්ටෝරියා බලාගාරය trip වුණු හින්දාද? මොකක්ද ඇත්ත කථාව? රටට කිව්වා, සූර්ය බලශක්තිය නිසා විදුලිය ඇණ හිටීම සිද්ධ වුණා කියලා. එහෙම කියලා දැන් ගේනවා, curtailment theory.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් දෙන්න. ඔබතුමා අද කථා කරන්න දෙන්නේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have already posed your Question.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න. කලබල වෙන්න එපා.

වික්ටෝරියා බලාගාරය trip වුණු හින්දා තමයි අර වඳුරා මත දැම්ම බිඳ වැටීම සිද්ධ වුණේ. එහෙම නැතුව සූර්ය බලශක්තිය නිසා නොවෙයි. ඒ නිසා කරුණාකරලා ඔබ සත්‍යය හෙළිදරව් කරන්න. ඔබ අනන්තයක් ගැන කථා කළා. බොරුවේ අනන්තයටම ගිහිල්ලා තිබෙන්නේ, මේ රජය.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අයට පෙනෙන්නේ ප්‍රතිඵලය විතරයි, හේතුව පෙනෙන්නේ නැහැ. Trip වෙච්ච එක පෙනෙනවා, trip වෙන්න හේතුව දකින්නේ නැහැ. මම අර කලින් කිව්වා වාගේ reverse flow එක නිසා තමයි, මේ trip වීම වෙන්නේ, ගරු විපක්ෂ නායකතුමනි. ඒකේ තාක්ෂණික කාරණය සම්බන්ධයෙන් තමයි මම අදාළ පැහැදිලි කිරීම කළේ.

ඔබතුමා Power Purchase Agreement එක ගැන කිව්වා. ඔබතුමා දැන් සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළා නේ. හැබැයි, ඒ සංඛ්‍යාලේඛන ගත්ත ප්‍රභවය මොකක්ද කියලා මට කිව්වේ නැහැ. මම මේ කියන සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්නේ National System Operator (Pvt.) Limited සහ EDL එක මඟින්. ඒවා තමයි රජයේ, අමාත්‍යාංශයේ නිල සංඛ්‍යාලේඛන. ඒ නිසා ඔබතුමා ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛන ගත්තේ කොහෙන්ද කියලා මට කියන්නේ නැතුව සංඛ්‍යාලේඛන ටිකක් කිව්වාට ඒවායේ නිරවද්‍යභාවය මට පිළිගන්න බැහැ. හැබැයි, ඔබතුමා මගේ සංඛ්‍යාලේඛනවලට challenge කළොත් මට පැහැදිලිව ඉදිරිපත් කරන්න පුළුවන්, NSO එකේ සහ EDL එකේ තිබෙන සංඛ්‍යාලේඛන මත. ඒ නිසා ඔබතුමා කියපු Power Purchase Agreement එකේ unit එක - මම කලින් කිව්වා වාගේ PUCSL එකේ කිසිම නියාමනයකට පරිබාහිරව ගිහිල්ලා නැහැ. ඒකේ තිබෙන්නේ formula එකක්. ඒ මිලදී ගන්නා නිශ්චිත දවසේදී ගත්ත ප්‍රමාණයට formula එක apply කරලා තමයි අදාළ ගෙවීම් කටයුතු කරන්නේ. ඒ නිසා Cabinet Paper එකේ එක අගයක් තිබෙන්න පුළුවන්. හැබැයි, Power Purchase Agreement එකේ නිශ්චිත formula එකක් තිබෙනවා නම් ඒ formula එක apply කරලා තමයි ගෙවීම් කටයුතු කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Deputy Speaker, I just seek a clarification from the Hon. Minister.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Are you willing to take that on, Hon. Minister?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
Yes, okay.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Make it very short, Hon. (Dr.) Harsha de Silva.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Okay, Sir.

ගරු ඇමතිතුමනි, මම ඉතාම කෙටි ප්‍රශ්න දෙකක් ඔබතුමාට යොමු කරන්නේ. "Net Plus" කියන එක policy එකේ තිබෙනවා. මට කරුණාකරලා පැහැදිලි කරන්න, ඒකේ තිබෙන්නේ " Net Plus basis" කියලා, on the basis of Net Plus. එතැන තිබෙන්නේ single meter එකක් reverse එකට කැරකෙන එකක්ද, එහෙම නැත්නම් මීටර දෙකක් දමන එකද? මීටර දෙකක් දැම්මාම import එකයි export එකයි දෙකම පෙනෙනවා. එතකොට අපිට transparency එකක් තිබෙනවා, solarවලින් විදුලිය කොච්චර ජනනය කළාද කියලා. එක තමයි පළමුවැනි ප්‍රශ්නය.

දෙවැනි එක තමයි, ඔබතුමා කිව්වා Virtual Net Metering කියලා. එහෙම නම් ඔබතුමා ගැසට් එක ගහන්න සූදානම්ද, EDL එකට household solar power purchase කරන්න පුළුවන් වෙන විධියට? එහෙම නම් strategic locationsවල පොඩි බැටරි හරි පාවිච්චි කරලා ඒක store කරනවාද, එහෙමත් නැත්නම් ඒක කෙළින්ම NSO එකට විකුණන්න ඕනෑද? ඔය ප්‍රශ්න දෙක තමයි තිබෙන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම මුලින්ම අවසාන ප්‍රශ්නයට උත්තර දෙන්නම්. Virtual Net Metering කියන එකෙන් අදහස් කළේ, මම කලින් කිව්ව පරිදි එක් ස්ථානයක generate කරලා ඒක පද්ධතියට එකතු කරන එක, වෙනත් කණ්ඩායමක් තමයි ඒක utilize කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ඒක තමයි මම අහන්නේ, කවුද ඒක ගන්නේ? කවුද purchase කරන්නේ?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මම පැහැදිලි කරන්නම්කෝ. මේ ගැන දීර්ඝ කාලයක් තිස්සේ ADB එකත් එක්ක සාකච්ඡා කරලා, ඒගොල්ලන්ගේ grant එකක් මඟින් තමයි කරන්නේ. ඒ කාලයේදී තමයි Virtual Net Metering කියන නම එතැනදී පාවිච්චි කරලා තිබෙන්නේ. එතකොට NSO එක මිලදී ගන්නවා, EDL එක හරහා. මේක consume කරන අය, - ඒ ප්‍රමාණය නොවෙයි - ඒකට අදාළ ඒකක ගණනක් consume කරන අයගේ බිලේ යම් කිසි ප්‍රමාණයක් මෙතැනින් set off කරනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Accounting set off එකක්?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඒක අවසානයේ ගත්තොත් accounting set off එකක්. හැබැයි, unit හැටියට බලලා තමයි accounting එක set off වෙන්නේ. Rupees ම නොවෙයි. දැන්, rupeesවලදී ගත්තොත් මෙහෙම නේ. අපි generate කරන තැනක ඒකකයකට රුපියල් 28යි කියලා එතැනින් රුපියල් ප්‍රමාණය ගණනය කරනවා. ඒ රුපියල් ගණනට අදාළ unit ගණන එතැනින් set off කරනවා. එහෙමත් කරන්න පුළුවන්. මෙතැනදී අපේ බලාපොරොත්තුව තමයි, unit ගණනට set off කරන එක. ඔබතුමා කලින් අහපු ප්‍රශ්නය මට පොඩ්ඩක් ආයෙත් මතක් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

What I want to know is this. මේකේ තිබෙන්නේ ඉංග්‍රීසියෙන්, "Net Plus basis" කියලා. සිංහල එකේත්, "Net Plus", "Net Metering" කියලා අපි ඉංග්‍රීසියෙන් නේ කියන්නේ. Now, let me ask the question. එතකොට "Net Plus basis", on the basis of Net Plus කියන එකෙන් අදහස් වුණේ, මීටර දෙකකින් ක්‍රියාත්මක වෙන එකද? එහෙම නම් ඔබතුමා කලින් කිව්වා වාගේ accounting set off එකයි, technical set off එකයි දෙකක්. එතකොට එහෙම නම් Net Metering කරන්නත් පුළුවන්, Net Accounting කරන්නත් පුළුවන්, "Net Plus basis" එකක. ඒකයි මගේ ප්‍රශ්නය.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔව්, Net Accounting කියන එක ගත්තොත්, rupeesවලට rupees set off වෙන එක. ඒක හරි. මෙතැනදී Net Plus කියන එක ගත්තොත්, මාර්තු මාසය වනකොට ගැසට් කළ National Policy එකේ තිබෙන්නේ Net Plus කියන එක.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

නැහැ, නැහැ, "Net Plus basis".

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

Net Plus basis.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

හරි, on the basis of Net Plus.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔව්, එතකොට තිබෙන්නේ unit එක.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මොකක්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

එතකොට තිබෙන්නේ unitsවලට, rupeesවලට නොවෙයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)s

අන්න හරි, unitsවලට තමයි. ඒ කියන්නේ import and export, two-meter system.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මෙතැනදී අවස්ථා දෙකම තිබෙනවා. සමහර metersවල මේ අවස්ථා දෙකම තිබෙනවා. Import කරන එක වෙනම measure කරන්න පුළුවන්. Export කරන එක වෙනම measure කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම ඒක පිළිගන්නවා, ගරු ඇමතිතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩ්ඩක් අවස්ථාව දෙන්නකෝ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Hasha de Silva, make it very short, please.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Yes, very short.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I will give you 15 seconds. This has been going on for a very long time, Hon. Member.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Okay. Argument එකක් නොවෙයි, මේක.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මම පිළිගන්නවා, වහල මත සවි කරන සූර්ය පැනලවලින් අපි කොච්චර විදුලිය ජනනය කළාද කියන එක ගැන transparency එකක් තිබෙන්න ඕනෑ බව. දැන් අපි ඒක දන්නේ නැහැ නේ. දැන් Net Plus එකක් එන නිසා දන්නේ නැහැ. මම ඒක පිළිගන්නම්. එතකොට Net Plus basis කිව්වාම, ඒක technical solution එකක්. හැබැයි ගරු ඇමතිතුමනි, Net Metering and Net Accounting කියන්නේ accounting solutions එකක්. මේ දෙක පටලවා ගන්න බැහැ. Net Plus basis එකක Net Metering තිබෙන්නත් පුළුවන්, Net Accounting තිබෙන්නත් පුළුවන්. ඒකයි මගේ තර්කය. ඔබතුමා ඒක පිළිගන්නවාද, නැද්ද කියන එක ගැන අපි පසුව කථා කරමු, දැන් වෙලාව නැති නිසා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. Minister, I will give you aminute, please.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. මෙන්න මේ පදනමින් ගනිමු. Net Plus තමයි පදනම විධියට තිබෙන්නේ. අලුත් policy එක අනුව Net Plus තමයි පදනම විධියට තිබෙන්නේ. හැබැයි, ඒ Net Plusවල deviations හදන්න අපට පුළුවන්. අපි උදාහරණයක් හැටියට මෙහෙම හිතමු. දැන් අපි සාකච්ඡා කරමින් යනවා මෙවැනි ක්‍රමවේදයක් ගැන. දවල් කාලයේ පාවිච්චි කරන එකට දවල් කාලයේ generate කර දෙන එකටම set off කරනවා; හැබැයි, රාත්‍රි කාලයේ වැඩි ජනන පිරිවැයක් තිබෙන ඒකකයක් හරහා set off කරන්නේ නැහැ. එතකොට ඔවුන් rupeesවලින් ගෙවන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, let us make it very short. We have one more Question under Standing Order No. 27(2).

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඉදිරියේදී අපි එහෙම ක්‍රමයකට යනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි පසුව කථා කරමු, ඒ ගැන.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Speaker.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, I gave you time, Hon. Leader of the Opposition

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Just one minute.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We have dragged this on for so long, for almost an hour now.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Just one minute.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Take half a minute please.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්නවාද ඔබතුමන්ලාගේ Net Plus ක්‍රමවේදය තුළ උදාහරණයක් විධියට, පාරිභෝගිකයෙකු units 500ක් පරිභෝජනය කළොත්, ඔහුට රුපියල් 45,000ක් ගෙවන්න වෙනවා කියලා? හැබැයි, ඔහු සූර්ය බලශක්තිය නිෂ්පාදකයෙකු හැටියට තව units 500ක් නිෂ්පාදනය කළත් ඔහුට ආදායම හැටියට ලැබෙන්නේ රුපියල් 11,000යි. ඒක මේ Net Plus ක්‍රමවේදය තුළ සිදු වන අසාධාරණයක් කියන කාරණය ඔබතුමා පිළිගන්නවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are not going to drag this on any further. Hon. Minister, if you want to answer that, you can do so.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මට විනාඩි 5ක්වත් ඕනෑ, මේ ගැන පැහැදිලි කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Then, we will do it at another time.

The next Question under Standing Order No. 27(2), the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ස්ථාවර නියෝග 27 (2) යටතේ කලින් අසන ලද ප්‍රශ්නයට මා හිතන විධියට විනාඩි 45ක් පමණ වේලාව ගත වුණා. දැන් කරුණාකර මගේ ප්‍රශ්නයට ලබා දෙන වෙලාවෙන් නම් අඩු කරන්න නම් එපා. ගිය වතාවකත් එහෙම වුණා. ගරු අමාත්‍යතුමා අමාත්‍යාංශ නිවේදන දෙකක් හරහා පිළිතුරු ලබා දෙන්න ඉන්නවා. ඒවා මාස ගණනක් තිස්සේ බලාපොරොත්තුවෙන් සිටින පිළිතුරු. ඒ නිසා කරුණාකර මට සාධාරණ කාලයක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, there are no Ministerial Statements to be made today.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

The Hon. Minister, I was told, is going to answer two Questions. You would put them off to another day, unless there is adequate time. Those issues, Sir, I have been waiting for months to be clarified.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Rasamanickam, now, would you please start raising your Question?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Thank you, Sir.

## II

## සිවරාසා අනෝජන් වෙත සවුදි අරාබියේදී පනවන ලද මරණ දඬුවමට එරෙහි අභියාචනය
## சவூதி அரேபியாவில் சிவராசா அனோஜனுக்கு விதிக்கப்பட்ட மரண தண்டனைக்கு எதிரான மேன்முறையீடு
## APPEAL AGAINST DEATH SENTENCE IMPOSED ON SIVARASA ANOJAN IN SAUDI ARABIA

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, I raise this Question under Standing Order No. 27(2), again, on the urgent matter of Sri Lankan citizen Sivarasa Anojan, who is facing death sentence in Saudi Arabia. The reason why I am raising this matter again is because the last time I submitted it, the Secretary-General's Office refused it, stating that the Hon. Minister had already responded. But, the Question I asked was never responded to.

Since I last raised this matter, a legal delegation has travelled to Saudi Arabia, a Parliamentary delegation headed by the Deputy Speaker - that is you, Sir - has been proposed and Anojan was reportedly attacked in prison and has sustained injuries. So, I ask:

1. Can the Government confirm the attack, his injuries and condition and give assurances obtained regarding his safety?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த ஒருசில நாட்களுக்கு முன்னர், அனோஜன் அவர்கள் வேறொரு சிறைச்சாலைக்கு மாற்றப்பட்டு இருக்கின்றார். அந்தச் சிறைச்சாலையில் இருக்கின்ற அனைத்துக் கைதிகளும் மரணதண்டனை விதிக்கப்பட்டவர்கள். அங்கே இருக்கும் கைதிகளில் ஒருவர் அனோஜனுடைய தலையில் கத்தியால் கடுமையாகத் தாக்கியதால், அவருடைய உயிருக்கு அச்சுறுத்தலான நிலை இருப்பதாக அவருடைய குடும்பத்தினர் எங்களுக்குத் தெரிவித்து இருக்கிறார்கள். அங்கிருக்கும் மரண தண்டனை விதிக்கப்பட்ட ஏனைய கைதிகளைப் பொறுத்தளவில், இவரைக் கொலை செய்தால் தங்களுக்கு மார்க்க ரீதியாக நன்மை கிடைக்கும் என்ற நம்பிக்கையின் அடிப்படையில் அப்படிச் செய்ததாக ஒரு கருத்து இருக்கின்றது. எனவே, அவர் தொடர்ந்து அந்தச் சிறைச்சாலையில் இருந்தால் அவருடைய நிலைமை மிகவும் அபாயகரமானதாக இருக்கும்.

2. The Hon. Minister previously informed Parliament that the Saudi prosecution filed an appeal, seeking harsher punishment. Will he table the appeal referred to, the original judgment and sentence, Anojan's appeal, the judgment imposing the death sentence and any Supreme Court appeal?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා ලබා දුන් පිළිතුරේදී සඳහන් කළා, මේ සඳහා සවුදි රජය පැත්තෙන් අභියාචනාවක් කළා කියලා. අපි අභියාචනා කළේ නැතත් අපට අවශ්‍යයි, සවුදි රජය පැත්තෙන් කරපු අභියාචනාවේ, ඊට අදාළ තීන්දුවේ පිටපතක්. මේ ඉල්ලීම ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කරලා තිබුණා; ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාත් කරලා තිබුණා. නමුත්, අද වනකල් එම ලියකියවිලි මේ පාර්ලිමේන්තුවේ සභාගත කරලා නැහැ.

3. When did the Government obtain the Saudi prosecution's appeal? Was it available before Anojan's appeal hearing, and were its contents and risk of enhanced punishment communicated to Anojan and his family?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த விடயத்தில் அனோஜன் அவர்களுக்கு எதிராக சவூதி அரசாங்கம் மேன்முறையீடு செய்ததாக கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார். அந்த மேன்முறையீட்டின் பிரதிகளைத் தாருங்கள்! அதுமாத்திரமல்ல, மேன்முறையீடு செய்வதாக நீங்கள் எப்பொழுது அறிந்தீர்கள்? அது பற்றி தெரிந்திருந்தால், நீங்கள் ஏற்கனவே அனோஜனுடைய குடும்பத்தினருக்குச் சொன்னீர்களா?

4. Who authorized Anojan's appeal and what legal advice was obtained?

With regard to this, of course, the Hon. Minister, in his previous Statement, informed us about the actual legal firm that was retained.

5. Will the Hon. Minister table a breakdown of legal payments, including amounts paid by the Government and amounts requested, collected or paid by Anojan's family, with receipts, purposes and recipients?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, මේ සම්බන්ධව දැරූ වියදම් ඔක්කෝම ආණ්ඩුවෙන් ලබා දෙනවා කිව්වත්, මුල් අවස්ථාවේ ඒ තරුණයාගේ පවුලේ කට්ටියගෙන් ලක්ෂ 18ක් අරගෙන තමයි ඒ නඩුව කථා කරන්න ගියේ. එතකොට, ඒ ගත්තු මුදල් කාටද ගෙව්වේ? එතුමා Sri Lanka Bureau of Foreign Employment හරහා ගෙවීම් කරලා විදේශගත වුණු කෙනෙක්. එම නිසා Sri Lanka Bureau of Foreign Employment හරහා ඔහුට ඒ මුදල් ගෙවන්න තිබුණා. මම දන්නේ නැහැ, ආණ්ඩුව පැත්තෙන් ගෙවන්න එවැනි නීතියක් නැද්ද කියලා. මම කියන්නේ, අසරණ වෙලා සිටි අවස්ථාවේ ඒ අයට ලක්ෂ 18ක් තිබුණේ නැත්නම් ලොකු ගැටලුවක් වෙන්න ඉඩ තිබුණා කියලායි.

6. What is the outcome, as at 7th October, of the legal delegation's visit? What meetings occurred, what

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

was agreed upon and has the appeal to the Supreme Court been filed? If not, what is the deadline?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවෙන් සවුදි අරාබියට delegation එකක් ගියා කියලා කියනවා අපි දැක්කා. ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා එක්ක මම අද උදේ කථා කළා. එතුමා කිව්වා, තවත් රැස්වීම් කිහිපයක් තිබෙනවා කියලා. ඊයේ දවසේ රැස්වීම් තිබෙනවා කියලා කිව්ව එකමද, දැනට රජය පැත්තෙන් තිබෙන update එකත්? මෙහි දැන් තත්ත්වය මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ තිබෙන බරපතළකම ගැන කිව්වොත්, පසුගිය සතියේ අනෝජන් පහර කෑමකට ලක්වීමත් සමඟ මේ තත්ත්වය තවත් භයානක වෙලා තිබෙනවා.

7. What is the status of the President's appeal for Royal clemency?

In fact, we asked the Hon. President for a meeting to discuss certain matters with him. But, we, as the Ilankai Tamil Arasu Kachchi, have not received a time yet. So, we would like the Hon. Minister to clarify the position regarding the President's appeal, whether the President has made an appeal or whether they have received the appeal.

8. What is the status of the proposed parliamentary delegation headed by the Hon. Deputy Speaker? Has it been constituted? Who are its members? When will it travel, and has Saudi Arabia agreed to receive it?

Hon. Deputy Speaker, you yourself could tell me that; we do not have to wait for the Minister to respond. Since you were supposed to head the delegation, you could quickly intervene and say, "That is happening on this date." But we have not heard anything about that delegation. We also propose the Hon. Kaveenthiran Kodeeswaran to be part of the delegation. So, we would like to know about that.

9. What official correspondence or response has Sri Lanka received from Saudi Arabian authorities concerning Anojan? Will all such correspondence up to 7th October be tabled?

10. Is it true that Anojan has been transferred to another prison? If so, when, where and why? Is it also true that he has been denied or restricted from communicating with his family? When did he last contact them and when did an Embassy official last had direct access to him?

I request an urgent response and that the relevant documents be tabled.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. අපි මේ ප්‍රශ්නය මතු කරන්නේ, ඒ ප්‍රදේශයේ ජනතාව සහ ඔහුගේ පවුලේ ඥාතීන් දිගින් දිගටම මේ පිළිබඳව අපෙන් අහන නිසායි. මොකද, අපිත් ජීවත් වෙන්නේ ඒ ප්‍රදේශයේ. අනෝජන්ගේ ගෙදර ඉඳලා මගේ ගෙදරට කිලෝමීටර 8ක දුරක් තිබෙන්නේ. ඔවුන් නිතරම අප සමඟ සම්බන්ධ වනවා. ඒ නිසා මේ සෘජු ප්‍රශ්න ඔවුන් හැමදාම අපෙන් අහනවා. අපි මේ ප්‍රශ්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ, ඒ පවුල වෙනුවෙනුයි. මෙතැනදී අපට දේශපාලනයක් අදාළ නැහැ. අනෝජන්ව නිදහස් කර ගන්නයි අපට ඕනෑ. ඒ සඳහා සම්පූර්ණ සහයෝගය පුළුවන් හැම විධියකටම ලබා දෙන්න අපි ලෑහැස්තියි. හැබැයි, අපට මේ ප්‍රශ්නවලට පිළිතුරුත් අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism.

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්න සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් 22වැනි දින මා විසින් පාර්ලිමේන්තුව හමුවේ සිදු කරන ලද සවිස්තරාත්මක ප්‍රකාශයට අමතරව, දැනට සවුදි අරාබි රාජධානිය විසින් මරණ දඬුවම නියම කර ඇති ශ්‍රී ලාංකික ජාතික සිවරාසා අනෝජන් මහතා සම්බන්ධයෙන් පවතින නීතිමය කටයුතුවල සංවේදී ස්වභාවය සැලකිල්ලට ගනිමින් එකී කටයුත්තේ ප්‍රගතිය මා මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරනවා.

සිවරාසා අනෝජන් මහතා පිළිබඳ නීතිමය කාරණය මේ වන විට සවුදි අරාබි රාජධානියේ අධිකරණ බලධාරීන් හමුවේ විභාග වෙමින් තිබෙනවා. අභියාචනාධිකරණය විසින් 2026 සැප්තැම්බර් 17වන දින සිය තීන්දුව ලබා දී ඇති අතර, සිවරාසා අනෝජන් මහතා වෙනුවෙන් අභියාචනයක් සකස් කර සවුදි අරාබි රාජධානියේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ වන විට රජයේ මැදිහත් වීම මත කටයුතු සිදු කරමින් පවතිනවා. ශ්‍රී ලංකාවේ නීති විශේෂඥ කණ්ඩායමක සහාය ඇතිව සහ සවුදි නීති උපදේශකයින්ගේ සහාය ලබා ගනිමින් මෙම අභියාචනා ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබනවා. මේ සඳහා කටයුතු කරන්න නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකු සමඟ ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මැතිතුමා, ඒ වාගේම ජනාධිපති නීතිඥ උපුල් කුමරප්පෙරුම මැතිතුමා ඇතුළු ජනාධිපති නීතිඥවරුන් තුන්දෙනෙක්ම දැනටමත් සවුදි අරාබියට ගිහිල්ලා තිබෙනවා. අද ඒ නීතිඥ සමාගම් සමඟ සාකච්ඡා කරනවා; ඒ මැදිහත් වීම සිදු කරමින් තිබෙනවා.

මෙම ප්‍රස්තුත කාරණයේ අධිකරණමය ස්වභාවය සැලකිල්ලට ගනිමින් සහ සත්කාරක රටේ නීති, අධිකරණ ක්‍රියාපටිපාටි සහ චර්යාධර්ම පද්ධතියට ගරු කරමින් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව එකතුව සවුදි අරාබි රාජධානියේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිත අභියාචනය සම්බන්ධයෙන් සිවරාසා මහතා වෙත අවශ්‍ය සියලු කොන්සියුලර් සහ නීතිමය සහාය ලබා දීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කරනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ ජනාධිපති නීතිඥ අසාද් නවාවි මහතා තමයි අනෙක් දෙදෙනා එක්ක මේ කටයුත්ත සඳහා ගිහිල්ලා තිබෙන්නේ.

ඒ අනුව, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නීතිමය කටයුතු සහ ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර පිළිබඳව ඇතැම් තොරතුරු මෙම අවස්ථාවේදී සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීම

මහින් දැනට ක්‍රියාත්මක අධිකරණ ක්‍රියාවලියට අගතියක් සිදු වීමට හෝ එම ක්‍රියාවලියට මැදිහත්වීමක් ඇති වීමට ඉඩ ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිවරාසා අනෝජන් මහතා දැනට රඳවා සිටින දමාම් බන්ධනාගාරය වෙත තානාපති කාර්යාලයේ නිලධාරින් අවස්ථා දෙකකදී ගොස් තිබෙනවා. එහිදී සිවරාසා අනෝජන් මහතා සම්බන්ධයෙන් බන්ධනාගාර පරිශ්‍රය තුළ සිදු වූ බවට වාර්තා වූ පහර දීමේ සිද්ධිය සම්බන්ධයෙන් කරුණු විමසීම සඳහා ඊයේ - 2026 ඔක්තෝබර් 06වන දින - බන්ධනාගාරයට ගිය අතර. එම සංචාරයේදී තානාපති කාර්යාලයේ නිලධාරින් විසින් බන්ධනාගාර ප්‍රධානියා හමු වූ අතර, රැඳවියන්ගේ සෞඛ්‍ය සේවා සම්බන්ධයෙන් වගකීම දරන බන්ධනාගාර වෛද්‍යවරයා ද එම හමුවට සහභාගි වුණා.

බන්ධනාගාර බලධාරින් විසින් ලබා දුන් තොරතුරුවලට අනුව, සිවරාසා අනෝජන් මහතා සහ ඔහු සමඟ එකම සිර මැදිරියේ රඳවා සිටි තවත් රැඳවියෙකු අතර බහින්බස්වීමක් ඇති වී ඇති අතර, එය පසුව ගැටුමක් දක්වා වර්ධනය වී ඇත. එම සිද්ධිය අතරතුර සිවරාසා මහතාට සීරීම් තුවාල සිදු වෙලා තිබෙනවා; මුහුණේ නියපොතු පාරවල් දක්නට ලැබෙනවා. එම තුවාල සිදු කිරීමට තියුණු පිහියක්, උපකරණයක් හෝ වෙනත් කිසිදු ආයුධයක් භාවිත කර නොමැති බවත්, වෛද්‍ය පරීක්ෂණයට අනුව එම තුවාල අනෙක් රැඳවියාගේ නියපොතුවලින් සිදුව ඇති බවත් බන්ධනාගාර වෛද්‍ය නිලධාරියා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී. බන්ධනාගාර බලධාරින් විසින් තානාපති කාර්යාලයේ නිලධාරින් වෙත තවදුරටත් දැනුම් දෙන ලද්දේ, මේ වන විට සිවරාසා මහතාගේ ජීවිතයට කිසිදු හඳුනාගත් තර්ජනයක් නොමැති බවයි. එමෙන්ම, ඔහුගේ ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගෙන ඇති බවටද එම බලධාරින් විසින් තානාපති කාර්යාලයේ නිලධාරින් වෙත සහතික වී ඇත. මේ වන විට සිවරාසා අනෝජන් මහතා දමාම්වලම වෙනත් සිර මැදිරියකට මාරු කර ඇති බවද දන්වා ඇත. දැනට සිවරාසා මහතාගේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ තොරතුරු සහ අදාළ සියලු නීතිමය ලේඛන සහ නීති ප්‍රගතිය විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සිවරාසා අනෝජන් මහතාගේ සමීපතම ඥාතීන් වෙත ලබා දීමට කටයුතු කර ඇත. එමෙන්ම ඉදිරියේදී ලැබෙන මේ සම්බන්ධයෙන් වන ප්‍රගතිය පවුලේ ඥාතීන් වෙත ලබා දීමට වග බලා ගනු ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදාළ නීතිමය හා අධිකරණ රාමුව තුළ සහ සවුදි අරාබි රාජධානියේ බලපවත්නා නීති ප්‍රතිපාදනවලට අනුකූලව සිවරාසා අනෝජන් මහතා වෙනුවෙන් හැකි සෑම පියවරක්ම ගනිමින්, ඔහු වෙනුවෙන් සහනයක් අත්කර ගැනීමේ අරමුණෙන්, ශ්‍රී ලංකා රජය පූර්ණ කැපවීමෙන් කටයුතු කරමින් සිටී. මෙහිදී සවුදි අරාබි රාජධානියේ නීති සහ ස්ථාපිත අධිකරණ ක්‍රියාපටිපාටිවලට අනුකූලව කටයුතු කරන අතරම, ශ්‍රී ලංකාව සහ සවුදි අරාබි රාජධානිය අතර පවතින දීර්ඝ කාලීන සබඳතාවන්හි පදනම වන අන්‍යෝන්‍ය ගෞරවය, අවබෝධය සහ සුහදතාව අඛණ්ඩව පවත්වාගෙන යමින් කටයුතු කිරීමට රජය වගබලා ගනු ඇත.

ගරු සභාවෙන් මා ඉතාම කාරුණිකව ඉල්ලා සිටින්නේ, මෙම සංවේදී කරුණ පිළිබඳව ඉතා වගකීම් සහගතව, දේශපාලනික හෝ පෞද්ගලික අරමුණු ඉෂ්ට කර ගැනීමේ බලාපොරොත්තුවෙන් තොරව, මානුෂීය කටයුත්තක් සේ සලකා කටයුතු කිරීමට සියලුදෙනාම අවංකව කැපවන ලෙසයි. ඒ අනුව දැනට ක්‍රියාත්මක නීතිමය හා රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලින්ට අනුකූලව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් ඉහත තොරතුරු ලබා දුන්නෙමි.

ඒ වාගේම ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා තිබෙන අවසාන දිනය ඔක්තෝබර් මාසයේ 17වැනි දා බවත් සඳහන් කරමි. ඒ නිසා 17වැනි දාට කලින්, අපි බොහෝ වෙලාවට අද හෝ හෙට දවස තුළ ශ්‍රේෂ්ඨාධිකරණයට appeal එක භාර දෙනවා, අපේ නීතිඥ කණ්ඩායම එහේ නීතිඥ සමාගමත් එක්ක සාකච්ඡා කරලා අවසන් වුණාට පස්සේ. ඒ වාගේම appeal කරපු නඩු සහ ඒ ලබා දීපු තීන්දු සම්බන්ධ පිටපත් මා සතුව තිබෙනවා. මේ අවස්ථාවේදී ඒ සියල්ල මා **සභාගත*** කරනවා.

ඊට අමතරව තව ලිපි ලේඛන වගයක් ලැබෙන්න තිබෙනවා. ඒවා ලැබුණාට පස්සේ මේ සභාවට සභාගත කරන්න සූදානම්. කිසිදු ආකාරයකට මේ ලිපි ලේඛන සඟවා තැබීමේ අවශ්‍යතාවක් නැහැ. පැහැදිලිව ගත්තොත්, අපි appeal එක දමන්න දිනයකට කලින් තමයි prosecutorගේ පැත්තෙන් appeal එක දමා තිබුණේ. ඒ, 23වැනි දා. අපේ appeal එක දැම්මේ 24වැනි දා. ඒ නිසා ඉතා පැහැදිලියි, ඒ පැත්තෙන් තමයි පළමු appeal එක ඉදිරිපත් කරනු ලැබුවේ කියන එක. අපේ රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමට අදාළව delegation එක යාම පිළිබඳව, මේ නීතිමය ක්‍රියාමාර්ගවල අවසානයත් එක්ක ඒ කටයුතු සිදු කරන්න බලාපොරොත්තු වනවා. ඒ කටයුත්තත් එක්ක ඇති වන තත්ත්වය බලලා තමයි දින නියම වන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Shanakiyan Rasamanickam, you may have a very brief clarification.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Thank you, Sir.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සභාගත කරනවා කියපු ලියවිලි අතර සවුදි අරාබියෙන් දමපු appeal එකේ පිටපතක් තිබෙයි කියා මා බලාපොරොත්තු වනවා. ඒ වාගේම නිලධාරින්ගෙන් සහ ලේකම් මණ්ඩලයෙනුත් මං ඉල්ලීමක් කරනවා, අමාත්‍යවරුන් සභාගත කරන තොරතුරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්න සලස්වන්න කියලා. මොකද, ඒක හැන්සාඩ් එකට ගිහිල්ලා, Parliament Library එකට යන්න දවස් කිහිපයක් ගතවනවා. අපි ගමට ගියාට පස්සේ Parliament Library එකෙන් ඒවා ලබා ගන්න විධියක් නැහැ. එතැන තිබෙන්නේ එක එක පිටුව scan කරන යන්ත්‍රයක්. එතකොට ඒ මිනිස්සුත් අසරණයි. ඒ නිසා ඒකත් නිලධාරින්ගේ අවධානයට මා යොමු කරනවා.

ගරු අමාත්‍යතුමනි, මෙකේ සංවේදීභාවය නිසා සමහර කාරණා කියන්න බැහැ කියලා ඔබතුමා කියපු කාරණය පිළිබඳව අපේ විරෝධතාවක් නැහැ, අපි ඒක පිළිගන්නවා. හැබැයි, අනෝජන්ට තුවාල වෙලා තිබෙන්නේ නියපොතු සීරීමකින් කියලා කියන එක ගැන ඒ පවුලේ ඥාතීන් අපි එක්ක කථා කළා. එහෙන් ඒගොල්ලන්ට දුරකථනයෙන් කියපු විස්තර අනුව තමයි කිව්වේ, ඒක පහර දීමක්, ඔළුව පිහියකින් කපලා තිබෙනවා කියලා. එතැන

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

තිබෙන ගැටලුව මේකයි. ඒක බන්ධනාගාර නිලධාරින් මුණ ගැහුණු පසු ඔවුන් කියපු කාරණයක්ද, එහෙම නැත්නම් අපේ නිලධාරින්ට සිවරාසා අනෝජන්ව මුණ ගැහිලා ඒ අවස්ථාවේ ඔහුව බලන්න චාන්ස් එක ලැබුණාද, නැද්ද කියන කාරණයත් මම දැනගන්න කැමැතියි.

දෙවැනි කාරණය තමයි, ගරු අමාත්‍යතුමා කිව්වා වාගේ මෙහෙන් delegation එකක් යනවා කියන එක. අපි clemency, ඒ කියන්නේ සමාව දෙන්න, එහෙම නැත්නම්, මේ තීන්දුව අඩු කර ගන්න ඉල්ලීමක් කරනවා නම් හරි. රජය දැනට මේ සම්බන්ධව ගෙන යන ක්‍රියාමාර්ගය පැහැදිලි කර ගන්නයි මම මේක අහන්නේ. අපේ පළමුවෙනි step එක තමයි, ඔක්තෝබර් 17වැනි දා appeal process එක try කරන එක. Appeal process එකෙන් බැරි වුණොත් clemency, එහෙම නැත්නම් දඬුවම අඩු කර ගන්න තීරණයකද ඔබතුමන්ලා ඉන්නේ කියන එකයි මම අහන්නේ. මේ, කාරණා තුනක්, ගරු අමාත්‍යතුමනි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

පළමුවෙනි කාරණාව තමයි, එහෙන් prosecutorගේ appeal එකේ පිටපත් තවම නොලැබීම. එය ලැබුණු ගමන් සභාගත කරනවා. දෙවෙනි කාරණාව ඉතා පැහැදිලියි. සවුදි අරාබි ආණ්ඩුවේ නිලධාරින් ලබා දෙන තොරතුරු තමයි මා ඉදිරිපත් කළේ. තානාපති නිලධාරින්ට සිවරාසා මහතාව පෞද්ගලිකව බලන්න ඊයේ ඉඩ දීලා නැහැ. ඔහුගේ තත්ත්වය පිළිබඳව වෛද්‍යවරයා සහ බන්ධනාගාර නිලධාරින් දුන් වාර්තාව අනුව තමයි මම විස්තර කිව්වේ. සවුදි අරාබියේ ආණ්ඩුව ගැන විශ්වාසය තියලා තමයි අපි මේ කටයුත්ත කරන්නේ. ඒ වාගේම අපි රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සවුදි අරාබියේ ආණ්ඩුව එක්ක මේ කටයුත්ත පිළිබඳව සම්බන්ධීකරණය වෙමින්, කථා බහක යෙදෙමින් තමයි මේ සියලු දේවල් කරන්නේ. මොකක් හරි ආයුධයකින් ගහලා ඔළුව තුවාල වෙලා කියලා වැරදි කථාවක් පතුරන එක සවුදි අරාබියේ ආණ්ඩුවට, ඒ ආණ්ඩුවේ ප්‍රතිරූපයට ප්‍රශ්නයක් වනවා. ඒ නිසා කරුණාවෙන් මම ඉල්ලා සිටිනවා, අපි ඒ තොරතුරු දන්නේ නැත්නම්, දන්නේ නැහැ කියමු කියලා. මොකද, අනෝජන්ව මේ මොහොතේ මම පෞද්ගලිකව දැකලාත් නැහැ, ඔබතුමා දැකලාත් නැහැ. සාමාන්‍යයෙන් දරුවෙකුට තුවාලයක් වුණා කිව්වාම දෙමව්පියන් ඒක ටිකක් බරපතළ විදියට ගන්නවා. ඒ ගැන අපට අවබෝධයක් තිබෙන්න ඕනෑ.

ඉතාම පැහැදිලිව වෛද්‍යවරයා සහ නිලධාරින් මේ පිළිබඳව අපට කරුණු විස්තර කර දීලා තිබෙනවා. ඒක තමයි අපි තේරුම් ගන්න ඕනෑ දේ. මොකද, අපි clemency එකක් ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නේ. ඒ නිසා ඒ ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. සවුදි අරාබි ආණ්ඩුවේ ඉහළ බලධාරින් අපට දැනුම් දුන්නේ දැනට ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වෙලා තිබෙන කාරණයක් නිසා ඒ අධිකරණයට මැදිහත්වීමක් කිරීම ඔවුන් අනුමත කරන්නේ නැහැ, ඒ නිසා මේ කටයුත්ත අවසන් වනවාත් එක්කම clemency ලබා දෙන්න අවශ්‍ය කරන මැදිහත්වීම කරන්න කියලායි. මේ සම්බන්ධ අන්‍යෝන්‍ය සාකච්ඡාවලදී ඒ පැත්තෙන් අපට දැනුම් දීලා තිබෙන්නේ එහෙමයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Thank you, Hon. Minister. I am in no way questioning the credibility of the Government of Saudi Arabia nor am I speaking against the Government of Saudi Arabia. You are aware of that. I am one of the few Tamil Members who even get invited to the Saudi National Day consistently. So, I am not questioning or attacking the Government of Saudi Arabia. I am only questioning about the information that was received to verify its authenticity. We have faith that the Government of Saudi Arabia would have given us the correct information. So, it is just a clarification I seek; it is not a criticism of the Government of Saudi Arabia or an attack against them. We are also hopeful that the Government of Saudi Arabia and also its Embassy here will take into consideration the current social context in Sri Lanka. I am sure that they have reported and will do their best with regard to Anojan's case. So, I just wanted to clarify.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We will move on to the next item, the Question of Privilege by the Hon. (Dr.) Ramanathan Archchuna.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chief Opposition Whip, what is your point of Order please?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනටම විවාදය පටන් ගැනීමට නියමිතව තිබුණු වෙලාවට වඩා විනාඩි 35ක් ප්‍රමාදයි. කථිකයින් රාශියක් සිටින නිසා විශේෂයෙන්ම අපේ විජිත හේරත් ඇමතිතුමා සභාවේ ඉන්න වෙලාවේ මම ඉල්ලීමක් කරනවා, අද දවසට පමණක් දිවා ආහාරය සඳහා වෙන් කර ඇති කාලය විවාදය සඳහා ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Does the House agree to continue the Proceedings of the House without the lunch interval?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, you can raise your Question of Privilege now.

## වරප්‍රසාද: සමාජ මාධ්‍යවල පළ කරන ලද අපහාසාත්මක වීඩියෝව

## சிறப்புரிமை: சமூக ஊடகங்கள் மற்றும் வலைத்தளங்களில் பகிரப்பட்ட கீழ்த்தரமான காணொளி

## PRIVILEGE: DEROGATORY VIDEO POSTED ON SOCIAL MEDIA

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Dteputy Speaker.

பாராளுமன்ற நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற (தத்துவங்களும் சிறப்புரிமைகளும்) சட்டம் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை ஆகியவற்றின் அடிப்படையில் முன்வைக்கப்படும் சிறப்புரிமைக் கேள்வி.

பாராளுமன்ற நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற (தத்துவங்களும் சிறப்புரிமைகளும்) சட்டத்தில் தெளிவாக வரையறுக்கப்பட்டுள்ள சிறப்புரிமைகளின்படி, பாராளுமன்ற உறுப்பினர் ஒருவர் தொடர்பாக உண்மையற்ற, சட்டத்துக்குப் புறம்பான defamation கருத்துக்களை வெளியிடுவது, பாராளுமன்றத்தையும் இந்த உயரிய சபையையும் ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினரையும் மக்களுடைய ஜனநாயகத்தையும் கேலிக்குள்ளாக்குவதுடன், சட்டரீதியாக குற்றவியல் ரீதியானதாக வரையறுக்கப்பட்டும் இருக்கிறது.

யாழ்ப்பாணம் வலி. தென்மேற்குப் பிரதேச சபையின் தவிசாளராக இருக்கின்ற சண்டிலிப்பாய், யாழ்ப்பாணம் என்னும் முகவரியில் வசிக்கும் கந்தையாக யசீதன் என்பவர் - இதனுடன் இணைக்கப்பட்டுள்ள காணொளியிலுள்ள நபர் - கடந்த மாதமளவில் தன்னுடைய சொந்த முகப்புத்தகத்திலும், AMPALAM A-Z மற்றும் A7TV எனப்படுகின்ற இரண்டு சமூக வலைத்தளங்களிலும், பாராளுமன்ற உறுப்பினராகிய இராமநாதன் அர்ச்சுனா தொடர்பில் மிகவும் கேவலமான வார்த்தைப் பிரயோகங்களுடன்கூடிய காணொளியொன்றை வெளியிட்டு, அந்தக் காணொளியை சமூக ஊடகங்கள் மற்றும் YouTube ஊடாகவும் பகிர்ந்து, இந்த உயரிய சபைக்கு மிகவும் கீழ்த்தரமான அவமதிப்பு ஒன்றைச் செய்துள்ளார். இது தொடர்பான காணொளி மற்றும் காணொளியின் screenshot என்பன இந்த முறைப்பாட்டுடன் *இணைக்கப்பட்டுள்ளன.

இந்தக் காணொளியானது, அவரது சொந்த முகநூல் தளங்களிலும், அதேநேரம் மேலும் பல சமூக வலைத்தளங்களிலும் இன்றுவரை பகிரப்பட்டுக்கொண்டு இருக்கிறது. முக்கியமாக, AMPALAM A-Z எனப்படுகின்ற திலீஸ் சிங்கராஜா என்று சொல்லப்படுகின்ற நபருக்குரிய தனியுரிமை YouTube தளத்திலும் இந்தக் காணொளி பகிரப்பட்டு இருக்கிறது. இதற்குரிய ஆதாரம் இந்த முறைப்பாட்டுடன் சமர்ப்பிக்கப்படுகிறது.

இவ்வாறான செயற்பாடுகள் பாராளுமன்ற நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற (தத்துவங்களும் சிறப்புரிமைகளும்) சட்டத்தின் பகுதிகளை மீறுவதோடு, குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை ஊடாக உச்ச நீதிமன்றத்தில் பாராளுமன்றத்துக்கு அவமதிப்பு ஏற்படுத்தியது தொடர்பில் வழக்குத் தொடரப்பட்டு, வலி. தென்மேற்கு பிரதேச சபைத் தவிசாளர் மற்றும் இந்தக் காணொளியை வெளியிட்ட சிங்கராஜா திலீஸ் குமார் - மாவை கலட்டி, தெல்லிப்பளை; தொலைபேசி இலக்கம்: 0766243205; அடையாள அட்டை இலக்கம்: 883422082V - ஆகியோர் சட்டத்தின் முன் நிறுத்தப்பட வேண்டும். எனவே, இந்த சிறப்புரிமை விடயத்தை ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்துமாறு தங்களை அன்போடு கேட்டுக்கொள்கின்றேன். நன்றி.

---

* වීඩියෝ පටය ඉදිරිපත් නොකරන ලදී.
* காணொளி சமர்ப்பிக்கப்படவில்லை.
* Video not tendered.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම

## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்

## BILLS PRESENTED

### විසර්ජන පනත් කෙටුම්පත, 2027

### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2027

### APPROPRIATION BILL, 2027

"2027 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැකසීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.***

***2026 නොවැම්බර් 12වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 நவம்பர் 12, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Anil Jayantha, on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Thursday, 12th November, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

## ආගමන පනත් කෙටුම්පත
## குடிவரவு சட்டமூலம்
## IMMIGRATION BILL

"ශ්‍රී ලංකාවට තැනැත්තන් ඇතුළුවීම සහ ශ්‍රී ලංකාවෙන් තැනැත්තන් පිටවීම පාලනය කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම පාලනය කිරීම සඳහා ද; ගමන් ලේඛන නිකුත් කිරීම සඳහා ද; (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සහ 1971 අංක 53 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා විසිනි.***

***2026 ඔක්තෝබර් 21වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர் மாண்புமிகு ஆனந்த விஜேபால அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஒக்ரோபர் 21, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Ananda Wijepala, Minister of Public Security and Parliamentary Affairs; to be read a Second time upon Wednesday, 21st October, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

For the notice of the Hon. Members, there is a request to continue the Proceedings of the House without the lunch break today.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "අද දිනට විශේෂිතව, දිවා ආහාර විවේකය සඳහා නියමිත වේලාව තුළත් විවාදය පැවැත්විය යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Member?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I would like to draw your kind consideration to Standing Order No. 118 (3). It is about the Committee on Ethics and Privileges. Let me quote it:

"Such a complaint that is submitted to the Committee should be forwarded to the Speaker with recommendations of the Committee, within two weeks from the date of receipt. However, the Speaker has the authority to grant permission to a request to extend the said period on exceptional grounds."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Ethics and Privileges Committee එකට ගිය අවුරුද්දේ ජනවාරිවල දාපු ඒවා අවුරුදු දෙකක් ගතවෙලාත් තවම Committee එකට submit වෙලා නැහැ. ඒවා ගැන පොඩ්ඩක් බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, it is well noted.

Next, the Hon. (Mrs.) Rohini Kumari Wijerathna, to move the Adjournment Motion. You have 12 minutes and your time starts now.

## වී ගොවීන්ගේ ගැටලු විසඳීම
## நெல் விவசாயிகளின் பிரச்சினைகளைத் தீர்த்தல்
## ADDRESSING THE ISSUES OF PADDY FARMERS

[අ.භා. 12.12]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකයේ වැදගත්ම අංශය වී වගාවයි. මේ මොහොත වනවිට වී ගොවිතැනෙහි නියැළෙන ගොවීන් බරපතළ ගැටලු රැසකට මුහුණ දී ඇත. ගෙවී ගිය කන්න තුනක කාල සීමාව තුළ වී මිලදී ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසීමට ආණ්ඩුව අපොහොසත් විය. ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් වැනි වකවානුවල වී ගොවියාගේ අස්වැන්න විකුණා ගැනීමට සුදුසුම කාලය ලෙස සැලකුවද, අද වනවිට ඔවුන්ට ලැබෙන මිල රජයේ සහතික මිලට වඩා බෙහෙවින් අඩු මිලකි. එමෙන්ම මහා පරිමාණ මෝල් හිමියන් කීරි සම්බා වී මිලදී ගත්තද, නාඩු වී මිලදී ගැනීමට පියවර නොගැනීම තුළ වී ගොවියා බරපතළ අර්බුදයකට මුහුණ දී ඇත.
>
> රට තුළ ගොවියාට වී අස්වැන්න විකුණා ගැනීමට නොහැකිව තිබියදී මහ බැංකු වාර්තාව අනුව සහල් මෙට්‍රික් ටොන් 93,200ක් ආනයනය කිරීමද ගැටලු සහගතය. රජයේ වී ගබඩා ප්‍රමාණවත් මිලදී ගැනීම් නොකොට වසා දැමීම තුළත්, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියා වී මිලදී ගැනීමට මැදිහත්වීම අඩපණ වී ඇති බැවින්ද, නිසි මොහොතේ පොහොර සහනාධාරය නොලැබීම, දිනෙන් දින ඉහළ යන කෘෂි රසායනික මිල ආදී කරුණු හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි ආර්ථිකය බිඳ වැටී ඇත. මේ පිළිබඳව රජයේ කඩිනම් අවධානය යොමුකොට වී ගොවියා ආරක්ෂා කිරීම සඳහා පැහැදිලි, නිරවුල් වැඩ පිළිවෙළක් මේ සභාවට වහාම ඉදිරිපත් කළ යුතු බවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකු වාර්තාව අනුව සහල් මෙට්‍රික් ටොන් 93,200ක් ආනයනය කරලා තිබුණාය කිව්වාට ඇමතිතුමා පසුගිය සතියට කලින් සතියේ පාර්ලිමේන්තුවේදී අහපු ප්‍රශ්නයකට උත්තර දුන්නේ ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 164,000ක් කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ සංස්කෘතිය ගොඩනැඟුණේ "වැවයි දාගැබයි ගමයි පන්සලයි" කියන තේමාව යටතේ වාපි සංස්කෘතිය මුල් කරගෙනයි. ඒ සංස්කෘතියේ ප්‍රධාන සාධකය වුණේ ගොවිතැන. විශේෂයෙන්ම වී ගොවිතැන. පසු කාලීනව ඒවාට අතුරු භෝග සහ අපනයන භෝග එකතු වෙලා තිබෙනවා. නිදහසින් පස්සේ මේ සංස්කෘතිය ඔප්නංවන්නට, ගොවිතැන් කටයුතු වැඩිදියුණු කරන්නට අතීතයේ මේ රටේ හිටපු නායකයෝ විශාල වැඩ කොටසක් කළා. අද අපට ඒවා දකින්න ඉතුරු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඩී.එස්. සේනානායක හිටපු අග්‍රාමාත්‍යතුමා මේ රටේ ගොවි ජනපද ඇති කළා. ඩඩ්ලි සේනානායක මැතිතුමා වගා සංග්‍රාමය ආරම්භ කරලා, ඒක මේ රටේ ස්ථාපිත කළා. ගාමිණී දිසානායක මැතිතුමා මහවැලි ව්‍යාපාරය යටතේ මහවැලි ගොවි බිම් හෙක්ටෙයාර 106,000ක් දක්වා වැඩි කළා. ඒ යෝජනාව යටතේම ගොවි බිම් හෙක්ටෙයාර 190,000ක් සංවර්ධනය කළා. ඒ වාගේම සහල් නිෂ්පාදනය වැඩි කරන්නත් කටයුතු කරලා තිබෙනවා. එමෙන්ම ඒ කාලයේදී සහල් අපනයනය කරන්නත් කටයුතු කළා. වාරිමාර්ග ප්‍රතිසංස්කරණයේ දීප්තිමත් යුගය හැටියට අපට ඒ යුගය හඳුන්වන්න පුළුවන්.

ඒ වාගේම මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා මොරගහකන්ද - කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කළා. එතුමා මාත් එක්ක ලොකු ගැටලුවක් තිබුණා. අපි ඒ කාලයේ මරා ගත්තා, ලැබුණු වන්දිය පිළිබඳව මතු වුණු ගැටලුවලට. ඒක වෙනම පැත්තකින් තැබුවත්, උතුරට -ඉරණමඩුවලට- ජලය ගෙනයන්නට, ඒ ගොවිබිම්වලට ජලය ගෙනයන්නට එම ව්‍යාපෘති ඇති කළා. අද වනකොට කන්තලේ වැව දක්වා ඒ වතුර ටික ගෙනයනවා.

අතීතයේ හිටපු කෘෂිකර්ම ඇමතිවරු මේ රටට විශාල සේවාවක් කළා. මට ඒ ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා. මොකද, මගේ පියා කෘෂිකර්ම නිෂ්පාදන හා අළෙවි ඇමතිවරයා හැටියට කටයුතු කළා. එතුමා 1977දී ගෙනාපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් අනුව තමයි මේ රටේ ගොවි විශ්‍රාම වැටුප ක්‍රියාත්මක වෙන්නේ. ගාමිණී ජයසූරිය හිටපු ඇමතිතුමාගේ කාලයේදී ඒක මේ රටේ යථාර්ථයක් බවට පත් කළා. 1992දී, හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ යුගයේ ධර්මදාස බණ්ඩා මැතිතුමා කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ ඇමතිවරයා හැටියට ඒ ගොවි විශ්‍රාම වැටුප ජනතාවට ලබා දුන්නා. ඒ වාගේම ගොවි සංවිධාන සංකල්පය එතුමා මගේ පියාගේ කාලයේ ඇති කළා. කෘෂි නිෂ්පාදන මිලදී ගැනීමේ මධ්‍යස්ථාන රට පුරා හැදුවා. 1994දී ජනතා විමුක්ති පෙරමුණත් එක්ක ආපු ආණ්ඩුවෙන් ඒවා විනාශ වෙලා ගියා. මේ රටේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය හදන්න යෝජනා කරලා, දඹුල්ලේදී ඒකට මුල්ගලුත් තැබුවා. 1994 ආණ්ඩුව ආවාට පස්සේ තවත් අය ඒකට මුල්ගල් තැබුවා. කොහොම වුණත්, ඒ වැඩේ සිදු වුණා. ශීතාගාර සංකල්පයත් එදාම ගෙනාවා. පසු කාලීනව හර්ෂ ද සිල්වා මැතිතුමා ඒක යථාර්ථයක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු සිදු කළා. මම ඒ සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත්, මේ ආණ්ඩුවට තවම බැරි වෙලා තිබෙනවා, ඒක විවෘත කරලා ජනතා අයිතියට පත් කරන්න.

මම මේ ඉතිහාසය ගැන කිව්වේ ඉතිහාසය ගැන නොදන්නා අයට මේවා මතක් කරලා දෙන්න ඕනෑ නිසායි. ඒ වාගේම මහවැලි වතුරෙන් පෝෂණය වෙච්ච ගොවි බිම්වල ඉපදුණු, ඒවායෙන් බත් කාලා පෝෂණය වුණු ගොවි පුත්තු අද මේ රටේ කෘෂිකර්මයට වගකියනවා. තඹුත්තේගම, අනුරාධපුරයේ වාගේම බත් කෝරළයේ ඉන්න මේ ගොවි පුත්තු මොනවාද කරන්නේ කියලා අද මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා. හැබැයි, ඒවා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය හදපු බස් ස්ටෑන්ඩ් එකේ පාට ගාලා අත්පුඩි ගැහුවා වාගේ, සුද්දෝ හදපු රේල් පාරේ කෝච්චියක් යවලා අත්පුඩි ගැහුවා වාගේ නොවෙයි. ඊට වඩා ලොකු දේවල් බලාපොරොත්තුවෙන් තමයි මේ ආණ්ඩුවට මේ රටේ ජනතාව හැටඅට ලක්ෂයක් ඡන්දය දුන්නේ කියන එක අපි මතක් කර දෙන්න ඕනෑ. පසුගිය අවුරුද්දේ - 2026 දී - ගෙනාපු අය වැය යෝජනාවල, ආයෝජන සඳහා ඉඩම් නිදහස් කිරීම කාර්යක්ෂම කිරීම, කිරි නිෂ්පාදනය වැඩි කිරීම, බඩල්ගම කිරි කර්මාන්තශාලාවේ කටයුතු අවසන් කිරීම, සතුන් අභිජනනය කිරීම, ගොවිපළ වැඩිදියුණු කිරීම ආදී වශයෙන් යෝජනා ගණනාවක් තිබුණු බව අපට මතකයි.

ඒ වාගේම තමයි, මම මීට කලිනුත් කථා කළ, දඹුල්ලේ තිබෙන උෂ්ණත්වය පාලනය කළ හැකි ගබඩාව වැඩිදියුණු කිරීම පිළිබඳ කාරණය. ඒක අද වෙනකල් වහලා තිබෙනවා. හැබැයි, ඉන්දීය අගමැතිතුමාත් හොඳටම ඇන්දුවා. මොකද, එතුමා ඇවිල්ලා විවෘත කළාට අදටත් ඒක වහලා තිබෙන්නේ. මේවා අතර තව යෝජනා තිබෙනවා. එයින් එක යෝජනාවක් තමයි, යන්ත්‍රානුසාරයෙන් වී වේළීම සඳහා පහසුකම් සැලසීම. වී වේළීම කෙසේ වෙතත් අපට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටේ ගොවීන් ඉදිරියේදී වී වගා කරයිද කියලා අපි දන්නේ නැහැ. මොකද, වී ගොවිතැන කරන ගොවියා අද වනකොට ඒ තරම් ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. කන්න 3ක් ගත වෙලා තිබුණත් අද වෙනකල් වී ටික පිළිවෙළකට විකුණා ගන්න ක්‍රමවේදයක් සකස් වෙලා නැහැ. වී අතිරික්තයක් තිබියදීත්

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

සහල් මෙට්‍රික් ටොන් 164,000ක් ආනයනය කර තිබෙනවා. මේ රටේ සහල් ආනයනයට නිසි ප්‍රතිපත්තියක් නැහැ. ඒ වාගේම, බිත්තර වී මිල ගොවියාට දරා ගන්න පුළුවන් තත්ත්වයක නැහැ. පොහොර සහනාධාරය දෙනවා කිව්වාට එය අවශ්‍ය වෙලාවට, නිසි වෙලාවට ලැබෙන්නේ නැහැ. ඒ වාගේම තමයි, කෘමි නාශක, වල් නාශක, දිලීර නාශක, යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් තිබෙන ගැටලුව. අද අස්වැන්න නෙළන්න භාවිත කරන යන්ත්‍රෝපකරණ තිබෙනවා. ජනතාව ඒවාට නොයෙක් නම් භාවිත කරනවා, "භූතයා", "සුනාමිය" ආදී වශයෙන්. මේ යන්ත්‍රයකින් ගොයම් ටික කපාගෙන පිළිවෙළක් කරන්න රුපියල් 25,000ක්වත් ඕනෑ. ඒ සඳහා අය කරන මිල ඒ තරම් ඉහළයි. අද වනකොට ගොවීන්ට ඒ මිල දරා ගන්න බැරි වෙලා තිබෙනවා. වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 137කට වඩා වැඩියි. හැබැයි, රජය කියන්නේ රුපියල් 120ක සහතික මිලක් ගැනයි.

ඒ විතරක් නොවෙයි, වනඅලි තර්ජනයත් තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ මන්ත්‍රීතුමන්ලා සහ නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. පෙරේදාත් - සඳුදා - උදේ නාඋල, අඹන ප්‍රදේශයේ මහ පාරේදී අලියෙක් ගහලා මනුස්සයෙක් මැරිලා තිබෙනවා. මේවා වළක්වන්න වැඩ පිළිවෙළක් හදලා නැහැ. මේ ඔක්කොම දරාගෙන අන්තිමට ගොවීන්ට වී ටික විකුණා ගන්න බැරි තත්ත්වයක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. මොකද, ආණ්ඩුවේ සහතික මිලයි, කුඹුරෙන් වී මිලදී ගන්නා මිලයි පරස්පරයි. අද මේ වී මිලදී ගැනීම මුදලාලිකරණයට යට වෙලා තිබෙනවාය කියලා මම කියනවා. මොකද, ලග්ගල, විල්ගමුවේ කුඹුරෙන් වී මිලදී ගත්තේ කිලෝවක් රුපියල් 90ට. අපි පසුගිය සතිවල තඹුත්තේගම හිටියා. ඒ කාලයේ ඒ හරියේ ගොයම් කැපුවා. රුපියල් 80ට, 90ට තමයි වී කිලෝව මිලදී ගත්තේ. මෙන්න මෙහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේසයට ගහලා අත රිදුණා විතරයි මිනිස්සුන්ට වැඩක් වුණේ නැහැ කියන එක මම කියන්න ඕනෑ.

මේකෙන් පීඩා විඳින තව කට්ටියක් ඉන්නවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ තමයි, අද ගොවියෝ. මේ රටේ අද ගොවියෝ ලක්ෂ තුනහමාරක් ඉන්නවා. මම හිතන විදියට, ඊටත් වඩා වැඩි වෙන්න පුළුවන්. අද වනකොට අද ගොවියා ලොකු ප්‍රශ්නයක ඉන්නවා. වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137කට වැඩිය වියදම් වුණත්, ආණ්ඩුව කියන්නේ රුපියල් 120ක සහතික මිලක් ලබා දෙනවාය කියායි. ඒ අනුව ගොවියාට රුපියල් 17ක් පාඩුයි. රුපියල් 90ට වී කිලෝවක් දීලා, ඉඩම් හිමියාට රුපියල් 120 ගණනේ දෙන්න සිදු වෙලා තිබෙනවා. මේක අතින් කාලා හරක් බලනවා වාගේ වැඩක්. මෙන්න මෙහෙම තත්ත්වයක් අද මේ රටේ වී ගොවිතැනට, වී ගොවියාට අත්වෙලා තිබෙනවාය කියන එක මම බොහොම කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. ඇත්තටම 76 වසරක සාපයක් ගැන කියලා ආපු මේ ආණ්ඩුව මේ රට නොමඟ යැව්වා, රැවැට්ටුවා. ගොවීනුත් ඒ අතරට එකතු වෙලා ඒ රැවටීමට ලක් වුණා. ඇත්තටම සාපය පසුගිය අවුරුදු 76ද, එහෙම නැත්නම් ගොවීන්ට සහන ටික දෙන්න බැරි වෙච්ච මේ අවුරුදු 2ද කියන එක මේ රටේ ගොවියෝ දැන් ප්‍රශ්න කරනවා.

ශ්‍රී ලංකාව පුරාම සිටින ගොවියෝ අපට කථා කරලා අහනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් වෙච්ච පොරොන්දුවලට මොකද වුණේ කියලා. "ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ගැටලු කිහිපයකට මුහුණ දී ඇත. යැපුම් කෘෂිකර්මය, අවම යාන්ත්‍රීකරණය, වැඩි නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන සඳහා නිසි මිලක් නොලැබීම..." ආදී වශයෙන් මහා කරුණු ගොන්නක් පිළිබඳව එහි සඳහන් වෙනවා. අතීතයේ හිටපු චෛතිය රජතුමා කිව්වේ බොරු දෙකයි. හැබැයි, වර්තමානයේ ඉන්න චෛතිය රජතුමා, එහෙම නැත්නම් ගොවි පුතාය කියා ගන්නා කෙනා, කට ඇරියොත් කියන්නේ බොරු. මේ අය හිතාගෙන ඉන්නවා, මේ ගොවියොත්, ගොවිතැන හා සම්බන්ධ, සැපයුම් ජාලවල ඉන්න අයත් අර බැත උඩ යන අම්බරුවන් කියලා. මේ වෙනකොට මේ රටේ වැඩිම ප්‍රමාණයක් රත්‍රන් බඩු උකස් තියලා තිබෙන්නේ කවුද කියලා බැලුවොත්, ඒ මේ රටේ ගොවි ජනතාව බව මේ වෙලාවේ මම කියන්න ඕනෑ. ඒ වාගේම මේ රටේ ගොවි ජනතාවට, ඒ වාගේම ගොවි වරිග සභාවලට බොරු කියලා, මේ රට රවටලා තිබෙනවාය කියන එක නැවත වතාවක් මම කියන්න ඕනෑ.

අපනයන ගම්මාන 1,000ක් ගැන කිව්වා. අඹන්ගඟ, රත්තොට, උකුවෙල, මාතලේ, මහනුවර, මහියංගනය වාගේ පැතිවල ගම්මිරිස් වගා කරනවා. හැබැයි ඒවාට සහතික මිලක් නැහැ. මිනිස්සු බලාගෙන හිටියා. මොකද, මිලදී ගන්න ගම්මාන එහෙමත් හදනවාය කිව්වා. ඒ ගම්මාන කොහේද හැදිලා තිබෙන්නේ? විශේෂයෙන්ම කියන්න ඕනෑ, අර කොටහළු මංගලායෙන් හොයපු සල්ලිවලට අමතරව අක්කරයකින්ද කොහේද ලක්ෂ ගණනක් හොයපු ගම්මිරිස් වගාවක් ගැන කිව්වා. අඩුම තරමේ අන්න ඒ ගම්මිරිස් ප්‍රභේදයෙන් දණ්ඩ ගාණේ හරි ගම්මිරිස් වගා කරන අයට දෙනවා නම් හොඳයි. එහෙම වුණොත් ඒ මිනිසුන්ට යමක් හොයා ගන්න පුළුවන්.

ඒ වාගේම කරන්දෙනියේ කුරුඳු ගැන කිව්වා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි, ඒ රැස්වීමේදී කියපු කුරුඳු ගම්මානය දැන් හදලා තිබෙනවාද කියලා. අඩුම තරමේ ඒකට අවශ්‍ය-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තවත් විනාඩි දෙකක් දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමියට විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අඩුම තරමේ නිලධාරි ප්‍රමාණයවත් එකතු කරලා තිබෙනවාද කියලා කියන්න ඕනෑ. ඒ වාගේම කෙසෙල් වගාව ගැන නොයෙක් දේවල් කිව්වා; නැට්ට හයි කරනවාය කිව්වා. ඒ නැට්ට හයි කරන තාක්ෂණය මේ වෙනකොට ඇවිල්ලා තිබෙනවාද කියලා අපි මේ වෙලාවේ අහන්න ඕනෑ. ඒ වාගේම අපනයන මධ්‍යස්ථාන ඇති කරලා, කෘෂි නිෂ්පාදන සෘජුවම අපනයනය සඳහා සූදානම් කරනවාය කිව්වා. ඒවාට එකතු කිරීමේ මධ්‍යස්ථාන හදනවාය කිව්වා. ඒ කිසි දෙයක් මේ වෙනකල් වෙලා නැහැ. විශේෂයෙන්ම අල ගොවියා, ධාන්‍ය වර්ග - උඳු, මුං - හදන ගොවියෝ, මිරිස් ගොවිතැන කරන අය, වැලිමඩ පැත්තේ, ඒ වාගේම මහවැලි කලාපවල ගොවියෝ අද අනාථ වෙලා ඉන්නවාය කියන එකත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේම විශේෂයෙන් බී ලූනු ගොවියා ගැනත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, ගරු

නියෝජ්‍ය කථානායකතුමනි. බී ලූනු ගොවියාට අද නිසි මිලක් නැතුව ඒ අය ඒ වගා අත්හරින තැනට ඇවිල්ලා තිබෙනවා. අල ගොවියාත් ඒ මට්ටමේමයි. කෙසෙල් ගොවියාත් ඒ මට්ටමේමයි.

මේ කාරණයත් අවසාන වශයෙන් කියන්න ඕනෑ. AI තාක්ෂණය ගැන කිව්වා. චන්ද්‍රිකා තාක්ෂණය ගැන කිව්වා. ස්මාර්ට් කෘෂිකර්මාන්තය ගැන කිව්වා. හැබැයි, අද වෙනකල් ඒ කිසි දෙයක් සිද්ධ වෙලා නැහැ. පසේ තෙතමනය ගැන, පොහොර, ජලය බින්දුවෙන් බින්දුව වැටෙන ආකාරය ගැන කිව්වා. Sensors ගැන කිව්වා. හැබැයි, sensors කෙසේ වෙතත් අද ආණ්ඩුවට මේ රටේ ජනතාව ගැනවත් කිසිම sense එකක් නැති බව මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද ගොවිතැනේ යෙදෙන නිෂ්පාදකයාට මිලක් නැහැ. ජීවත් වෙන්න විධියක් නැහැ. ඒ විතරක් නොවෙයි. අද වෙනකොට කුඹුරේ වැඩ කරලා ලෙඩ වෙලා යන ගොවියාට බෙහෙත් ටිකත් නැහැ. මේ වෙනකොට අපේ රටේ බෙහෙත් වර්ග 125ක් නැහැ. ඒ බෙහෙත් වර්ගවල නම් ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

ඒ විතරකුත් නොවෙයි. රිජ්වේ ආර්යා ළමා රෝහලේ website එකේ පළ කරලා තිබුණා, බෙහෙත් පරිත්‍යාග කරන්න කියලා. බෙහෙත් පරිත්‍යාග කරන්න කියලා පළ කරලා තිබුණු ඒ advertisement එකත් අයින් කරලා තිබෙනවා. අඩුම තරමේ මිනිස්සු ගෙනැල්ලා දෙන බෙහෙත්වලින් හරි ජීවත් වෙන්න තිබුණා. හැබැයි කියන්න කනගාටුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, advertisement එක අයින් කරලා තිබෙනවා. කවුද දන්නේ නැහැ, ඒ advertisement එක අයින් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ගොවි ජනතාව කියන්නේ, මේ ආණ්ඩුව බලයට ගෙන එන්න ලොකු වෙහෙසක් දරපු මිනිස්සු. අඩුම තරමේ ඒ මිනිසුන්ට ජීවත් වෙන්න අවශ්‍ය වටපිටාව හරි සකස් කරලා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. R.M. Ranjith Madduma Bandara. You have been allotted nine minutes to second that Motion.

[අ.භා. 12.27]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I have been allotted ten minutes.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ගොවි ජනතාව ගැන, වී ගොවිතැන ගැන ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය ගෙනාපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා. මේ රටේ සියයට 26ක් පමණ වන ගොවි ජනතාව වෙනුවෙන් අද මේ සභාවේදී කථා කරද්දී, කෘෂිකර්ම ඇමතිතුමා සභාවේ නැහැ. ඒ පිළිබඳව මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. නියෝජ්‍ය ඇමතිතුමා - ගොයම් කාපු කෙනා - ඇතුළේ ඉන්නවා.

1948දී අපි නිදහස ලබනකොට එදා ජනගහනයට අනුව අපට ඕනෑ හාල්වලින් අපි නිෂ්පාදනය කළේ සියයට 35යි. අවුරුදු 76ක ශාපයක් ගැන කියන තමුන්නාන්සේලාට මම පණිවුඩයක් දෙන්න කැමැතියි. එදා අපේ හිටපු නායකයින්ගේ - ඩී.එස්. සේනානායක මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සහ ගාමිණී දිසානායක මැතිතුමා යන අයගේ- ක්‍රියාකලාපය නිසා අපට 1994 වෙනකොට අපේ රට සහලින් ස්වයංපෝෂණය කරන්න පුළුවන් වුණා. ඒකද අවුරුදු 76ක ශාපය?

ඒ අවුරුදු 76න් පස්සේ අද මොකද වෙලා තිබෙන්නේ? මේ රටේ ඒ රජ කළ ගොවියා අද අන්තිම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද ගොවියාට වී ටික විකුණා ගන්න බැහැ. දැන් අවුරුද්දකට වී ටොන් ලක්ෂ 48ක්, 50ක් නිෂ්පාදනය කරනවා. ආණ්ඩුව මිල පාලනය කරන්න නම් අඩු තරමින් සියයට 5ක් ගන්න ඕනෑ. හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනයේ සංඛ්‍යාලේඛන අනුව තමුන්නාන්සේලා වී ටොන් ලක්ෂයක් අරගෙන නැහැ, ටොන් 88,000යි අරගෙන තිබෙන්නේ. ඉතින් ගොවියාට වී ටික විකුණා ගන්න බැහැ, කිලෝව රුපියල් 80යි, 90යි. ඇමතිතුමාම මේ සභාවට ඇවිල්ලා කිව්වා වී කිලෝවකට රුපියල් 137ක නිෂ්පාදන වියදමක් යනවා කියලා. ඇමතිතුමා අනෙක් පැත්තට කියනවා "අපි ගන්නේ 120ට" කියලා. හැබැයි, 120ට ගන්නෙත් නැහැ. දැන් රුපියල් 90යි. පාරිභෝගිකයායි, ගොවියායි අතර ඉන්න අතරමැදියා තමයි අද ඒකෙන් හම්බ කරන්නේ. පාරිභෝගිකයාට ලාභයට හාල් ගන්නත් නැහැ, ගොවියාට තමන් නිෂ්පාදනය කරන මිලට විකුණා ගන්නත් බැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ක්‍රියා පටිපාටිය ඒකයි.

අද ගොවියාට එක පැත්තකින් වී මිල අඩු වෙලා තිබෙනවා; අනෙක් පැත්තෙන් අක්කරයකින් ගන්නා නිෂ්පාදනය අඩු වෙලා. මගේ ළඟ තිබෙනවා සංඛ්‍යාලේඛන. 2014 සිට 2020 වෙනකම් හෙක්ටෙයාර එකක එලදාව කිලෝග්‍රෑම් 4,800ක් වෙනකම් වැඩි වෙලා තිබෙනවා. පසුගිය අවුරුද්දේ 3,914යි. තමුන්නාන්සේලා මේ කරන අපරාධය ගොවීන්ට, මේ රටේ බත් කන මිනිස්සුන්ට, මේ රටට කරන අපරාධයක්. අද පොහොරවලට සහනාධාරයක් නැහැ. බලන්න, 2020 වෙනකොට පොහොර ටොන් 952,000ක් ගෙනැල්ලා තිබෙනවා. ගිය අවුරුද්දේ ගෙනැල්ලා තිබෙනවා 712,000ක්. ගොවියාට ගිනි මිලට, වැඩි මිලට, රුපියල් 17,000ට, 18,000ට පොහොර ගන්න බැහැ. ඒ නිසා මේ රටේ නිෂ්පාදනය, එලදාව අඩු වෙලා. ඒ හේතුවෙන් අද ගොවියෝ ගොවිතැනින් අයින් වෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. 2020 වෙනකොට මේ රටේ ජනතාව සියයට 26.5ක් කෘෂිකර්මාන්තයේ නියැළිලා තිබෙනවා, අද ඒක සියයට 25ට බැහැලා තිබෙනවා. ඒ, තමුන්නාන්සේලාගේ ක්‍රියාකාරකම් නිසා.

තමුන්නාන්සේලා වී ගන්නේ නැති නිසා අද ගොවියෝ රත්තරන් බඩු ටික උගස් තියනවා. පළමුවෙනි මාස 5 තුළ කෝටි 15,000ක රත්තරන් බඩු උගස් තියලා තිබෙනවා. ඒ, ඉතිහාසයේ වැඩිම ගාණ. ඒකෙන් වැඩිම පිරිසක් ගොවියෝ. තමුන්නාන්සේලා මේ විධියට තමයි කටයුතු කරන්නේ. වී නිෂ්පාදනයේ අතිරික්තයක් තිබියදී තමුන්නාන්සේලා හාල් ටොල් ලක්ෂ 2කට කිට්ටු ගාණක් මේ අවුරුද්දේ පිට රටින් ගෙනැල්ලා තිබෙනවා. මෙවා කොමිස්වලට නොවෙයිද ගෙනැල්ලා තිබෙන්නේ? රටේ හාල් තිබෙනවා. ගේනවා කිව්වේ කීරි සම්බා. ගෙනාවේ පොන්නි සම්බා. ඉතින්, මේ රටේ ගොවියාට වී ටික විකුණා ගන්න විධියක් නැහැ.

අනෙක් එක, සහතික මිල. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආපු වෙලාවේ තමයි රුපියල් 120ක සහතික මිල දෙනවා කිව්වේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

එතකොට ඩීසල් ලීටරයක් රුපියල් 289යි; දැන් ඩීසල් ලීටරයක් රුපියල් 392යි. එදා පොහොර මිටියක් රුපියල් 8,000යි; දැන් පොහොර මිටියක් රුපියල් 12,000යි. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, එහෙම නම්, වීවල සහතික මිල තවත් වැඩි වෙන්න ඕනෑ නේද කියලා. නමුත් වැඩි කළේ නැහැ. මා ඉස්සෙල්ලාත් කිව්වා වාගේ රත්තරන් බඩු උගස් තියපු ගොවියා වී විකුණන්න බැරුව ඉන්නවා; අද කන්න දෙකක වී ගෙවල්වල තිබෙනවා. ආණ්ඩුව මොකක්ද මේකට කරන්නේ? විෂය භාර ඇමතිවරයා මේ වෙලාවේ සභාවේ නැහැ, මේවා ගැන අහගෙන ඉන්න. මෙන්න රටේ කෘෂිකර්මයට ඇති වෙලා තිබෙන තත්ත්වය. "අවුරුදු 76ක ශාපය" කියලා තමුන්නාන්සේලා කිව්වා. ශාපයක් නොවෙයි, කාලකණ්ණිකමක් මේ ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා ගොවීන්ට ලබන කන්නයේ වගා කර ගන්න විධියක් නැහැ. මොකද, ගොවීන්ට මුදල් නැහැ. ගොවියෝ මේ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ආණ්ඩුව මේකට කරන්නේ මොකක්ද කියලා අපි අහනවා. මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා පොහොරවලට සහනාධාරයක් දෙන්නේ නැහැ. අපේ යහ පාලන ආණ්ඩුව තිබියදී ලෝක වෙළෙඳ පොළේ මිල ගණන් අනුව පොහොර මිටියක් රුපියල් 6,000යි. අපි පොහොර මිටියක් දුන්නා, රුපියල් 1,500ට. ඒ කියන්නේ අපි සියයට 75ක පොහොර සහනාධාර දුන්නා. අද ලෝක වෙළෙඳ පොළේ මිල ගණන් අනුව පොහොර මිටියක් රුපියල් 12,000ත්, 16,000ත් අතර ප්‍රමාණයක් වනවා. තමුන්නාන්සේලා රුපියල් 30,000යි, හෙක්ටෙයාරයකට පොහොර සහනාධාරය විධියට දෙන්නේ. ඒ දෙන්නේත් වී ගොවියාට විතරයි. හෙක්ටෙයාරයකට පොහොර මිටි 7ක් යනවා. එතකොට රුපියල් 4,000ක් විතර තමයි පොහොර සහනාධාරය. අපි සියයට 75ක පොහොර සහනාධාරයක් දුන්නා. තමුන්නාන්සේලා සියයට 25ක පොහොර සහනාධාරයක් තමයි දෙන්නේ. අපි ආණ්ඩුවේ සිටියදී රුපියල් බිලියන 40ක් පොහොර සහනාධාරය වෙනුවෙන් දුන්නා. හරි නම් ලෝක වෙළෙඳ පොළේ පොහොර මිල වැඩි වෙද්දී පොහොර සහනාධාරය වැඩි කරන්න ඕනෑ. තමුන්නාන්සේලා 2025 වර්ෂයට පොහොර සහනාධාරයට වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 30යි. ඒ කියන්නේ පොහොර සහනාධාරය කපලා. මෙන්න, අප ළඟ ඊට අදාළ සංඛ්‍යාලේඛන තිබෙනවා. මේ තත්ත්වයෙන් තමයි තමුන්නාන්සේලා ගොවියාට සලකන්නේ. විෂය භාර ඇමතිතුමා කියනවා, ඕනෑ නම් වී කිලෝවකට රුපියල් 120ක් දෙන්නම් කියලා. නමුත් වී කිලෝවකට රුපියල් 120ක් දෙන්නත් බැරි වෙලා තිබෙනවා. දැන් තමුන්නාන්සේලා වී ගබඩා ටික වහලා; ඒ නිසා ගොවියන්ගේ වී ටික ගෙදර. මේ විධියට තමයි තමුන්නාන්සේලා ගොවීන්ට සලකන්නේ.

ඒ විතරක් නොවෙයි, මම විශේෂයෙන් තවත් කාරණයක් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේම ආගෝස්තු 6වැනි දා පාර්ලිමේන්තුවේදී කිව්වා, වී කිලෝවක් රුපියල් 120ටයි මිල දී ගත්තේ කියලා. නමුත් තමුන්නාන්සේලා වී කිලෝවක් 120ට මිල දී ගන්නේ නැහැ. ඒ කියපු වී කිලෝ ගණනත් මිල දී ගන්නේ නැහැ. ඒ වාගේම, තමුන්නාන්සේ කිව්වා, ගොවියා අක්කරයකින් රුපියල් 100,000ක් ලාභ ලබනවා කියලා. නමුත් දැන් ගොවියා අක්කරයකින් රුපියල් ලක්ෂයක් ලාභ ලබන්නේ නැහැ. දැන් පාඩුවටයි යන්නේ. ගොවියා රුපියල් ලක්ෂයක් පාඩු ලබනවා. ගොවියා මාස 6කට රුපියල් ලක්ෂයක් ලාභ ලැබුවත්, රුපියල් 16,000යි ගොවියාගේ මාසයක ලාභය. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේම සංඛ්‍යාලේඛන අනුවයි මම මෙය කියන්නේ. අඩුම ගණනේ රුපියල් 18,000ක් යනවා, එක පුද්ගලයෙකුට මාසයකට මේ රටේ ජීවත් වෙන්න. පවුලක ඉන්නවා හතරපස්දෙනෙක්. එතකොට පවුලකට මාසයකට ජීවත් වෙන්න රුපියල් 80,000ක්, 90,000ක් විතර යනවා. ඒක තමයි අප කියන්නේ මේ රටේ අන්තිම දුප්පත් තැනට පත් වෙලා තිබෙන්නේ ගොවියායි කියලා. එම ප්‍රමාණය, මේ රටේ දිළිඳු ජනගහනයෙන් සියයට 26ක් වනවා. තමුන්නාන්සේලාගේ සංඛ්‍යාලේඛන අනුවයි මා එහෙම කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සීනි කර්මාන්තය ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. මේ රටට වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 650,000ක් අවශ්‍යයි. අපි වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 80,000ක් පමණ නිෂ්පාදනය කරනවා. පැල්වත්ත, සෙවනගල, ඇතිමලේ, ගල්ඔය කියන සීනි කර්මාන්තශාලා 4ම පටන් ගත්තේ අපේ පක්ෂයේ නායකවරුන් රට පාලනය කරපු කාලයේ. අද තමුන්නාන්සේලා ඒවා වහන්න යනවා. තමුන්නාන්සේලා උක් ගොවියාට පොහොර සහනාධාරය දෙන්නේ නැහැ. දේශීයව නිෂ්පාදනය කරන උක් සීනි සඳහා සියයට 18ක VAT එකක් අය කර ගන්නවා. බද්ද සියයට 30යි. හැබැයි පිටරටින් ගේන සීනිවලට VAT එකත් නැහැ; බද්දත් නැහැ. තමුන්නාන්සේලා මොනවාද කරන්නේ? තමුන්නාන්සේලා මේ රටේ සීනි කර්මාන්තය විනාශ කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ranjith Madduma Bandara, your time is up.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා මට තවත් විනාඩි 2ක කාලයක් ලබා දෙනවා.

සෙවනගල අක්කර 1,800ක උක් වගා කිරීමෙන් අයින් වෙලා තිබෙනවා. ඇතිමලේ අක්කර 1,500ක උක් වගා කිරීමෙන් අයින් වෙලා තිබෙනවා. පැල්වත්තේ අක්කර 2,000ක උක් වගා කිරීමෙන් අයින් වෙලා තිබෙනවා. ගල්ඔය අක්කර 1,000ක උක් වගා කිරීමෙන් අයින් වෙලා තිබෙනවා.

මේ රටේ මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාව 1984 ඉඳලා අවුරුදු 40ක් උක් වගාවෙන් ජීවත් වුණා. තමුන්නාන්සේලා එය විනාශ කරන්න යනවා. තමුන්නාන්සේලා ඒකට වග කියන්න ඕනෑ. තමුන්නාන්සේලාට පොඩි හිතේ අමාරුවකුත් ඇති. මොකද, 2019 ජනාධිපතිවරණයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාව තමුන්නාන්සේලාව පැරැද්දුවා නේ. අපි මොනරාගල ආසනයත් දිනුවා; බිබිල ආසනයත් දිනුවා. තැපැල් ඡන්ද සංඛ්‍යාව තමුන්නාන්සේලාට වැඩිපුර ලැබුණේ නැත්නම් අපි ඒ දිස්ත්‍රික්කයම දිනනවා. මේ ඒකට පළිගැනීමක්ද කියලා අපි හිතනවා. කරුණාකරලා මේ ගොවියාට සිදු වන විනාශය නවත්වන්න කියා හැම දාම බොරු කියන ජනාධිපතිගෙනුත්, ආණ්ඩුවෙනුත් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Karunaratne. You have 12 minutes to speak on this Adjournment Motion.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 12.37]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු යෝජනාව හොඳයි. හැබැයි, ඒ යෝජනාවට තවත් එකතු වෙන්න ඕනෑ කාරණා ගණනාවක් තිබෙනවා. මා කියන්න ඕනෑ ඩී.එස්. සේනානායක යුගයේ, ඩඩ්ලි සේනානායක, බණ්ඩාරනායක යුගවල අපේ රටේ වාරි ක්ෂේත්‍රයට, කෘෂිකර්ම ක්ෂේත්‍රයට ලොකු වැඩ කොටසක් කෙරුණු බව. මම ඒකත් පිළිගන්නවා. ඊට පසු කාලීනවත් වාරි ක්ෂේත්‍රයේ වැඩ කොටස් කෙරුණා. හැබැයි, පසු කාලීනව ඒත් එක්කම හොරකමත් වැඩි වුණා. වැඩ කරනවාට වඩා හොරකම, කොමිස් ගැහිල්ල පසු කාලීනව වැඩි වුණා. අතීත නායකයන්ට අපේ රටේ පොදු ජනතාවගේ ගෞරවයක් තිබෙනවා. ඒකේ කිසිම විවාදයක් නැහැ. ඒක අවිවාදිතයි.

මේ යෝජනාවේදී ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළේ පසුගිය කන්න තුන ගැනයි. ඒ කන්න තුන තමයි එතුමිය ඉලක්ක කළේ. ඒ කන්න තුන තුළ ගොවියාට කිසිම වැඩ පිළිවෙළක්, කිසිම ක්‍රමවේදයක් සකස් කළේ නැහැ කියන කාරණයයි මතු කරන්නේ. ඒකෙන් ගම්‍ය කරවනවා ඒ කන්න තුනට කලින් - ඒ කියන්නේ, තමුන්නාන්සේලාගේ පාලන යුගවල - ගොවියාට කිරියෙන්, පැණියෙන් ඉතිරිලායි තිබුණේ, ගොවියාගේ ගැටලු, ප්‍රශ්න ඔක්කොම බේරලායි තිබුණේ; ගොවියාට කිසිම ගැටලුවක් නැහැ කියන එක. අන්න එවැනි කාරණාවක් විපක්ෂය මෙහිදී මතු කරනවා.

අප මොකක්ද කරලා තිබෙන්නේ, මොකක්ද කරන්නේ කියන එක පිළිබඳව අපේ කථිකයන්ගේ කථාවලින් පළමුවෙන්ම එළියට එනවා. ඊට පෙරාතුව මමත් ඒ ගැන ටිකක් කියන්නම්. මෙන්න මේ කියන කන්න තුනට ලඝු කරනවා වෙනුවට, ඊට කලින් කන්නවල - කන්න 10ක්, 15ක්, 20ක් විතර එහාට ගියාට පස්සේ, අන්න ඒ කාල වකවානු තුළ - මොකක්ද ගොවි ජනතාවට කළේ කියන එකත් අපි පොඩ්ඩක් මතක් කර ගන්න ඕනෑ. ඒ කාරණාවත් එක්කයි මේ යෝජනාවට අනුව අප අද කරුණු මතු කරන්නේ.

මා පළමුවෙන්ම මතු කරන කාරණය මේකයි. ගොවියා ගැන විශාල දුකකින් හා වේදනාවකින් විපක්ෂයේ ඔබතුමන්ලා අද මෙහිදී කථා කළා. ඒ නිසා ගොවියා සම්බන්ධයෙන් ඔබතුමන්ලා කටයුතු කරපු විධිය පිළිබඳ ඉතිහාසයත් පොඩ්ඩක් මතක් කර දෙන්න ඕනෑ. මේ කථා කරන්නේ වෙලේ පැලේ, ඇළේ දොළේ, ගහේ කොළේ, වත්ත පිටියේ ගොවීන් එක්ක එකට ඉඳලා, ගොවීන් එක්ක එකට එකතු වෙලා සටන් කරලා මා ලබපු සජීවි අත්දැකීම්වලින්. අප ලබපු ඒ අද්දැකීම් අනුව මම කාරණා මතු කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මේ ගරු සභාවේ ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා; මොනරාගල නියෝජනය කරන ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. එතුමන්ලා මා කියන මේ කාරණා ගැන දන්නවා. ඔය විපක්ෂය ආණ්ඩු කරපු කාලයේ අම්පාරේ බඩ ඉරිඟු ගොවියාට රුපියල් කෝටි 32ක් පොලු තිබ්බා; මොනරාගල ගොවියාට රුපියල් කෝටි 16ක් පොලු තිබ්බා. වන්දි ගෙව්වේ නැහැ. එයට අදාළව අපි කොච්චර නම් උද්ඝෝෂණ කළාද? අම්පාර දිසාපතිතුමා දන්නවා, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීම කොච්චර නම් සාකච්ඡා පැවැත්වූවාද, කොළඹ කොච්චර නම් සාකච්ඡා පැවැත්වූවාද කියලා. වන්දි ගෙවනවා කිව්වාට සත පහක් ගෙව්වේ නැහැ. මොනරාගල අහිංසක ගොවියාට රුපියල් කෝටි 16ක් පොලු තිබ්බා. අම්පාර ගොවියාට රුපියල් කෝටි 32ක් පොලු තිබ්බා. ඒ මුදල් ගෙව්වේ නැහැ.

ගරු රෝහිණී කවිරත්න මැතිනියනි, ඒ විතරක් නොවෙයි, මම කියන්න කැමැතියි මාතලේ දිස්ත්‍රික්කය ගැනත්. මාතලේ දිස්ත්‍රික්කයේ තමයි වැඩියෙන්ම ලොකු ලූනු වගා කරන්නේ. ලොකු ලූනු ගොවියාගේ බීජ ලබා ගත්තා, ගොවියාට රුපියල් 9,000 ගාණේ ගෙවනවා කියලා. මෙහි වැඩිම ලොකු ලූනු බීජ පංගුව විකුණුවේ වෙනත් කවුරුවත් නොවෙයි, මධ්‍යම පළාතේ "සූර ගොවියා"; කළු අයියා හෙවත් රත්නේ. ඔහු තමයි වැඩිම ලොකු ලූනු බීජ ප්‍රමාණය දුන්නේ. හැබැයි, ඔහුට සත පහක් ගෙව්වේ නැහැ. ඒවා එවකට තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් ගත්තේ. අපි ඒ පිළිබඳව දඹුල්ලේදී උද්ඝෝෂණය කළා, පෙළපාළි ගියා. පී. හැරිසන් හිටපු ඇමතිතුමන්ලා එක්ක සාකච්ඡා කළා. ඔබතුමියගේ දිස්ත්‍රික්කය නියෝජනය කළ අලුවිහාරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙන්වලා සාකච්ඡා කළා. ඊට පසුව විදුර වික්‍රමනායක දඹුල්ලට ගෙන්වලා සාකච්ඡා කළා. එම සාකච්ඡාවලදී කිව්වා, ගෙවනවා කියලා. හැබැයි, සත පහක් ගෙව්වේ නැහැ. ගොවියාට පොලු තිබ්බා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගොවියාගෙන් ලොකු ලූනු බීජ ටික ගත්තා. හැබැයි, ගොවියාට සත පහක් ගෙව්වේ නැහැ. ඒක තමයි ඉතිහාසය.

ඒ විතරක් නොවෙයි, ගොවියාගෙන් අර්තාපල් ගත්තා. එතකොටත් තිබුණේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. එතකොට ඇමති, රිසාඩ් බදියුදීන්. ඒත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. අර්තාපල් ගොවියාගෙන් ස්ථාන 6කදී අර්තාපල් මිලදී ගත්තා. *[බාධා කිරීමක්]* යහ පාලනය කියන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නේ. ස්ථාන 6කදී අර්තාපල් මිලදී ගත්තා. අර්තාපල් කොච්චර මිලදී ගත්තාද? කිලෝවකට රුපියල් 95 ගණනේ ගොවියාට ගෙවනවා කිව්වා. ගොවියා අල ටික ගිහින් දුන්නා. හොඳම අල ගෙඩි ටික තෝරලා ගත්තා. අල කිලෝ 2,044,000ක් ගොවියාගෙන් ගත්තා. හැබැයි, ගොවියාට සත 5ක් ගෙව්වේ නැහැ, පොලු තිබ්බා. *[බාධා කිරීම්]* ඒ මුදල් ගන්න අපට උද්ඝෝෂණ කරන්න සිද්ධ වුණා. ඒ වාගේම පෙළපාළි යන්න සිද්ධ වුණා. නමුත් සත 5ක් ගෙව්වේ නැහැ. ඒක තමයි ඉතිහාසය. ඒක තමයි තමුන්නාන්සේලාගේ ඉතිහාසයේ පැවති තත්ත්වය. එදා අල ගොවියාට පොලු තිබ්බා. අන්තිමට අපට සිද්ධ වුණා, ගොවියොත් එක්ක ඇවිල්ලා අමාත්‍යාංශය වටලන්න. බදියුදීන් හිටපු ඇමතිතුමා

[ගරු නාමල් කරුණාරත්න මහතා]

පැන්නා. හැබැයි, පැනපු හිටපු ඇමති අපි ගෙන්වා ගත්තා. ඊට පස්සේ ඒ සල්ලිවලින් කොටසක් ගත්තා. හැබැයි, අනෙක් ගොවියෝ ඔක්කෝටම පොලු තිබ්බා. ඒ විධියට කෝටි ගණනක මුදල්වලට පොලු තිබ්බා. ගොවියාගේ අල ටික ගත්තා. අල ටික අරගෙන හොඳි කෑවා. ගොවියාට සල්ලි ගෙව්වේ නැහැ. ඒක තමයි ඉතිහාසයේ පැවති තත්ත්වය.

ඒ විතරක් නොවෙයි, මිල්කෝ සමාගම ගැනත් මම කියන්න ඕනෑ. කිරි ගොවියෝ මිල්කෝ සමාගමට කිරි ටික දුන්නා. එදා තමුන්නාන්සේලා මිල්කෝ සමාගම විකුණන්නයි සැලසුම් කරලා තිබුණේ. ඉන්දියාවේ අමුල් සමාගමට මිල්කෝ සමාගම සහ NLDB එක විකුණන්න දාලා තිබුණේ. ඒකට අන්තිම ගිවිසුම අත්සන් කරන්න විතරයි තිබුණේ. මිල්කෝ සමාගම අපි යටතට එනකොට රුපියල් ලක්ෂ 35,000ක් ණය තිබුණා. ගොවීන්ට රුපියල් ලක්ෂ 17,000ක් ගෙවන්න තිබුණා. අහිංසක ගොවියාගෙන් කිරි ටික ගත්තා. හැබැයි, ගොවියාට සල්ලි ගෙව්වේ නැහැ. ඒ සල්ලි ගන්න අපි ගියා. අපේ ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ඒ වාගේම අපේ සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමාත් ඉන්නවා. විජිත් විජයමුණි ද සොයිසා ඇමති වෙලා ඉන්නකොට අපි ගොවියොත් එක්ක අමාත්‍යාංශයට ගියා. අපි උද්ඝෝෂණය කළා, අමාත්‍යාංශය වැටලුවා. එතකොට සල්ලි දෙන්නම් කිව්වා. පී. හැරිසන් හම්බ වුණා. ඒ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු ඇමතිවරු. එවකට තිබුණේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. නමුත්, සත 5ක් ගෙව්වේ නැහැ. අහිංසක ගොවියා දොවලා ගෙනා කිරි ටික තමුන්නාන්සේලා ගත්තා. කිරි ටික තමුන්නාන්සේලා බිව්වා. හැබැයි, ගොවියාට සල්ලි ගෙව්වේ නැහැ. ගොවියාට පොලු තිබ්බා. අන්තිමේදී අපි ආණ්ඩුව භාරගෙන මාස කිහිපයක් ගත වනකොට මිල්කෝ සමාගම ගොවියාට ගෙවිය යුතු ණය ටික ඔක්කෝම බේරුවා. රුපියල් ලක්ෂ 35,000ම බේරුවා. ගොවීන්ට රුපියල් කෝටි 18ක් වැය කර බෝනස් දුන්නා. සේවකයන්ටත් බෝනස් දුන්නා. අද අන්න ඒ සමාගම ලාභ ලබන තැනට අපි ගෙනැල්ලා තිබෙනවා. මිල්කෝ සමාගම තමුන්නාන්සේලා විකුණන්න දාලා තිබුණේ. තමුන්නාන්සේලා කිරි ගොවියාටත් පොලු තිබ්බා; අල ගොවියාටත් පොලු තිබ්බා; ලූනු ගොවියාටත් පොලු තිබ්බා; බඩ ඉරිඟු ගොවියාටත් පොලු තිබ්බා. ඒ අහිංසක ගොවීන්ගේ අර්තාපල් ටික අරගෙන සල්ලි ගෙව්වේ නැහැ. ඒක තමයි තිබුණු තත්ත්වය.

ඒ විතරක් නොවෙයි, ගොවි විශ්‍රාම වැටුප අහෝසි කළා. ගොවි විශ්‍රාම වැටුප හොඳ වැඩ පිළිවෙළක්. ගාමිණී ජයසූරිය මැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයාව හිටපු කාලයේ තමයි ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පටන් අරගෙන තිබුණේ. ඒක හොඳ වැඩ පිළිවෙළක්. හැබැයි, ගොවි විශ්‍රාම වැටුපට මොකක්ද කළේ? රාජපක්ෂ ආණ්ඩුව එයට මොකක්ද කළේ? 2012දී ගොවි විශ්‍රාම වැටුප අහෝසි කළා. ඒ වනකොට ගොවි විශ්‍රාම වැටුපට දායක වුණු ගොවියෝ 950,223ක් හිටියා. ගොවි විශ්‍රාම වැටුප ලැබූ ගොවියෝ 130,000ක් හිටියා. අහිංසක ගොවියා දායක වෙලා හදා ගත්ත විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කළා. වයසට ගිය ගොවි අම්මා තාත්තාට බුලත් විට කන්න, සිල් ගන්න, පන්සලට යන්න, අවශ්‍ය අඩුමකුඩුම ටික ගන්න, මුණුබුරාට මිනිපිරියට ටොෆියක්, චොක්ලට් එකක් අරගෙන දෙන්න අතට පනම් දෙකක් හම්බ වුණා. අන්න ඒකටත් වැඩේ දුන්නා. අන්තිමට ගොවි විශ්‍රාම වැටුප අහෝසි කළා.

මට මේ වෙලාවේදී මාවිල්ආරු සිද්ධිය මතක් වනවා. එස්.එම්. චන්ද්‍රසේන හිටපු ඇමති ඊට පස්සේ මාධ්‍ය හමුවක් තියලා කිව්වා, ගොවි විශ්‍රාම වැටුප ශුන්‍යයි කියලා. එදා අපට ඒ සම්බන්ධයෙන් අරගළ කරන්න සිද්ධ වුණා. වසන්ත සමරසිංහ ඇමතිතුමාට ඒ කාරණය මතක ඇති. එදා අපි නීතිය හමුවට ගියා, උද්ඝෝෂණ කළා. ඊට අමතරව මානව හිමිකම් කොමිසම ඉදිරියට ගියා. එහෙම කරලා අපි සටන ජයග්‍රහණය කළා. අවුරුදු දෙකකට පස්සේ ගොවි විශ්‍රාම වැටුප අපි නැවත දිනා ගත්තා. හැබැයි, මොකක්ද වුණේ? අර හිඟ මුදල් දුන්නේ නැහැ. අද වනකොට අපි ගොවි විශ්‍රාම වැටුප සක්‍රිය කරලා, ඒ ගොවි ජනතාවගේ හිඟ මුදලුත් ලබා දීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ තත්ත්වයට අපි ගෙනැල්ලා තිබෙනවා. ඒක තමයි දැන් තත්ත්වය.

ඒ විතරක් නොවෙයි, මාවිල් ආරු ප්‍රදේශයේ විනාශ වුණු කුඹුරුවලට වෙන් කරපු වන්දි මුදල් ගැනත් මම කියන්න කැමතියි. යුද්ධය ඇති වුණා. යුද්ධයත් එක්ක මාවිල් ආරු ප්‍රදේශයේ කුඹුරු විනාශ වුණා. ඒකට වෙන් කරපු මුදල්වලට මොකක්ද කළේ? ඒකත් හොරා කෑවා, ඒකත් හොරා කෑවා. එස්.එම්. චන්ද්‍රසේනලාගෙන් අහන්න පුළුවන්, ඒ මුදල්වලට මොකක්ද වුණේ කියලා.

ඒ විතරක් නොවෙයි, අපි ආණ්ඩුව භාර ගන්නකොට 2024 අවුරුද්දේ යල කන්නයේ වගා වන්දි ශත පහක් ගෙවා තිබුණේ නැහැ. ඒ වගා වන්දිත් ගෙව්වේ අපි. ආණ්ඩු බලය ගත්තාට පස්සේ ගොවියාගේ ඒ වගා වන්දි ටිකත් අපි ගෙව්වේ. ඒවා ශත පහක් ගෙවා තිබුණේ නැහැ. අද ගොවියා ගැන කිඹුල් කඳුළු හෙළන කට්ටියටයි අපි මේවා කියන්නේ. තව දේවල් කියන්න තිබෙනවා. විශේෂයෙන්ම වතුරට ගොවියාගෙන් බදු අය කරන්න තමුන්නාන්සේලා පනත් ගෙනාවා. කුඹුරු ගොඩ කරන්න ඕනෑ කියලා කළුතරදී තමුන්නාන්සේලාගේ නායකයෝ කිව්වා. රනිල් වික්‍රමසිංහ මහත්තයා තමයි එහෙම කිව්වේ. විජයපාල මෙන්ඩිස්ලා ඒ කාලයේ රුපියල් දෙකට අක්කරය ගත්තේ. ජනතාවගේ ඉඩම් කොල්ල කෑවා. අන්න එහෙම ඉතිහාසයක් තමයි තමුන්නාන්සේලාට තිබෙන්නේ.

වී අලෙවි මණ්ඩලය ගැන කථා කළොත්, එය පටන් ගත්තේ 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ. 1977දී ආණ්ඩු මාරු වනකොට - තමුන්නාන්සේලාගේ යූඑන්පී එකට ආණ්ඩුව මාරු වනකොට - වී අලෙවි මණ්ඩලයේ සේවකයෝ 1,988ක් හිටියා; ලොරි 17ක් තිබුණා; ජීප් රථ 59ක් තිබුණා; සක්‍රිය වී මෝල් ගණනාවක් තිබුණා; ගබඩා සංකීර්ණ ගොඩක් තිබුණා. ඊට පස්සේ ආණ්ඩු මාරු වීමේ ක්‍රියාවලිය ඉස්සරහට ඇවිල්ලා ආණ්ඩු බලය අපේ අතට එනකොට මොකක්ද වුණේ? වී අලෙවි මණ්ඩලයේ හිටියේ සේවකයෝ 159යි; ලොරි 1යි; වී ගත්තේ නැහැ; වීවලට මිලක් තිබුණේ නැහැ. ඒ තත්ත්වයේ තමයි වී අලෙවි මණ්ඩලය තිබුණේ. නමුත් අපි වී මිලදී ගන්න පටන් ගත්තා. අපි ගොවියාට වීවලට හොඳ මිලක් දුන්නා, රුපියල් 120ට, රුපියල් 130ට, රුපියල් 140ට වී කිලෝවක් ගන්නවා කියලා. තමුන්නාන්සේලාගේ කාලයේ ගබඩා වහලා තිබුණේ. අපි ගබඩා ඇරියා. ඒ විතරක් නොවෙයි, ඉතිහාසයේ පළමුවැනි වතාවට මෝල් හිමියන්ට, සමුපකාරවලට රුපියල් ලක්ෂ 75,000ක් වෙන් කළා, පොලී රහිතව වී මිලදී ගැනීම සඳහා මුදල් නිදහස් කිරීමට. මීට කලින් කවදාවත් මේ වාගේ තීරණ අරගෙන නැහැ. ගොවි ජනතාවගෙන් අද සාධාරණ මිලකට වී මිල දී ගන්නවා. ඔවුන් වී ටික විකුණනවා. යම් යම් තැන්වල පොඩි පොඩි ගැටලු තිබෙනවා. එහෙම ගැටලු නැතුවා නොවෙයි.

අපි කෘෂි කර්මාන්තය පැත්තෙන් අද වනකොට ලොකු පිම්මක් පැනලා තිබෙනවා. මේ වනකොට අස්වනු වැඩි කරගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

පසුගිය දවසක ජල කළමනාකරණ කමිටු රැස්වීම තිබුණා. ඒ රැස්වීම වෙලාවේදී ත්‍රිකුණාමලයේ අල්ල ව්‍යාපාරයේ ගොවි නායකයා නැඟිටලා කිව්වා, "අල්ල ව්‍යාපාරයේ අපි හෙක්ටෙයාරයකින් වී කිලෝ 12,000කට වැඩි ප්‍රමාණයක් ගත්තා" කියලා. මේ තත්ත්වය තුළ අද වනකොට වී අස්වැන්න වැඩි කරගෙන තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

කථිකයාගේ අවසරය ඇතිව තමයි අවස්ථාව ලබා ගන්න වෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Madam, I have a right to - *[Interruption.]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ලොකු ලූනු වගා කරන ගොවියා සාම්ප්‍රදායිකව ඒවා වගා කරනකොට අක්කරයකින් ගන්නේ කිලෝ 8,000ක් විතර ප්‍රමාණයක්. හැබැයි, අද වනකොට කිලෝ 16,000ට වැඩි ප්‍රමාණයක් - කිලෝ 20,000 මට්ටමට - ගන්නවා. *[බාධා කිරීමක්]* රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය කිව්වා, බිංදුව බිංදුව පොහොර වැටෙන විදිය කිව්වා කියලා. ඔව්, බිංදුව බිංදුව පොහොර,-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මගේ නම කියන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමාගේ නම කියැවුණා?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මගේ නම ඔබතුමිය කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ. ඔබතුමාගේ point of Order එක මොකක්ද කියලා කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Point of Order එක මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අර එදා තිබුණු ගොවි රැළියට ඔබතුමා ගියේ නැත්තේ ඇයි කියායි මම අහන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීම්]* කාලය නාස්ති කරන්න එපා, ගරු මන්ත්‍රීවරුනි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

රෝහිණී මන්ත්‍රීතුමිය කෙසෙල් ගෙඩියේ නැට්ටක් ගැන කිව්වා. ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් ඒ නැට්ට ගැන එතුමියගෙන් අහගත්තා නම් හරි. ඔබතුමා කෙසෙල් ගෙඩිවලට හරි ප්‍රසිද්ධයි නේ. *[බාධා කිරීම්]* ඔබතුමා කෙසෙල් ගෙඩියේ නම ගහලා බෙදලා හරි ප්‍රසිද්ධයි. *[බාධා කිරීම්]* මෙතුමියගෙන් ඒ නැට්ට ගැන අහගන්න. *[බාධා කිරීම්]* ඔබතුමිය එතුමාට නැට්ට ගැන කියලා දෙන්න. *[බාධා කිරීම්]* එතුමාට නැට්ට ගැන කියන්න.

අද වනකොට ලොකු ලූනු අස්වැන්න වැඩි කර ගන්න තැනට අපි ඇවිල්ලා තිබෙනවා. අපි අද වනකොට පස පරීක්ෂා කරන ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා.

දැන් පොහොර සහනාධාරය ගැන කිව්වා. තමුන්නාන්සේලා ආණ්ඩු කරපු කාලයේ ගොවියාට හෙක්ටෙයාර දෙකකට පොහොර සහනාධාරය වශයෙන් දුන්නේ රුපියල් 30,000යි. පොහොර සහනාධාරය විදියට හෙක්ටෙයාර දෙකකට අපි රුපියල් 60,000ක් දෙනවා. *[බාධා කිරීමක්]* අක්කර 5ක් සඳහා රුපියල් 60,000ක් දෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

එතුමා කිව්වා, අපි දුන්නේ 1,500ට පොහොර, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඔන්න, අද අපි මෙතැනදී මේ කාරණය අවධාරණය කරනවා. ඒ තමයි, පසුගිය කන්නයේ සහ ඊට කලින් කන්නයේත් වී වගා කළ ඉඩම්වල අතිරේක භෝග වගා කරපු ගොවීන්ටත් අපි පොහොර සහනාධාරය දුන්නා. පළමු වටයේ එක් හෙක්ටෙයාරයකට රුපියල් 15,000 බැගින් හෙක්ටෙයාර දෙකකට රුපියල් 30,000ක් දුන්නා. ඊට පස්සේ හෙක්ටෙයාරයකට ලබා දෙන මුදල රුපියල් 18,000ක් කෙරුවා. ඒ අනුව හෙක්ටෙයාර දෙකකට රුපියල් 36,000ක් දුන්නා.

අන්න ඊයේ ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් රැස් වූ කැබිනට් මණ්ඩලය විසින් අපේ ලාල් කාන්ත ඇමතිතුමා ඉදිරිපත් කරපු Cabinet Paper එක අනුමත කරලා තිබෙනවා. මෙන්න, මම ලැයිස්තුව කියවන්නම්. මේ වනකොට මෙන්න මේ භෝග 13ට පොහොර සහනාධාරය හෙක්ටෙයාරයකට රුපියල් 30,000 බැගින් දෙන්න අපේ ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා. මේ මහ කන්නයේ සිට අපි මේක පටන් ගන්නවා. ඔන්න, මම භෝග ටික කියනවා, අහගන්න. වී, බඩ ඉරිඟු, සෝයා, අර්තාපල්, මිරිස්, මුං ඇට, කව්පි, උඳු, කුරහන්, රතු ලූනු, ලොකු ලූනු, රටකජු, තල කියන මේ සියලු භෝගවලට පොහොර සහනාධාරය ලබා දෙනවා. වී වගා කරන ඉඩම්වල වගා කරන මේ සියලු භෝගවලට පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් ලබා දීමට රජය මේ වනකොටත් තීරණය කර ඇති බව ගොවි ජනතාවට නිවේදනය කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 12.53]

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நெற் செய்கையில் விவசாயிகள் எதிர்கொள்ளும் சவால்கள் தொடர்பில் விவாதித்து தீர்வுகளைக் காணும் நோக்கில், கௌரவ ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் கொண்டுவரப்பட்டுள்ள சபை ஒத்திவைப்பு வேளையின் போதான பிரேரணை காலப்பொருத்தமானது.

ஒன்றுடன் ஒன்று பின்னிப்பிணைந்த பல்வேறு தொடர்ச்சியான சவால்களால் எங்களுடைய வன்னி தேர்தல் மாவட்ட விவசாயிகளும் சொல்லொண்ணாத் துயரங்களை இன்றளவும் அனுபவிக்கின்றனர். அவர்களின் சார்பாளனாக, அவர்கள் எதிர்கொள்ளும் வலிகளைப் பதிவுசெய்ய வேண்டியதும் அவற்றை இழிவளவாக்க இயல்தகு வழிகளில் போராட வேண்டியதும் எம் கடனாகின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, விதை நெல்லை விதைப்பது தொடக்கம் விற்பது வரையுள்ள ஒவ்வொரு கட்டமும் இத்தீவிலுள்ள விவசாயிக்கு சவாலான கட்டம்தான். அதுவும் வட, கிழக்கைச் சார்பாக்கும் விவசாயி என்றால், அவருக்குச் சொந்த நிலத்தில் விதைப்பது என்பதே பெரும் சவால்! வயல் நிலத்தைத் துப்புரவாக்கத் தடை, வயல் நிலத்தை உழுவதற்குத் தடை, வயல் நிலத்துக்கு நீர் பாய்ச்சத் தடை, வாய்க்கால் வெட்டத் தடை என ஒவ்வொரு கட்டத்திலும் வனவளத் திணைக்களம், வனசீவராசிகள் திணைக்களம், தொல்லியல் திணைக்களம் என அரச இயந்திரங்களின் தடைகளுக்கும் வழக்குகளுக்கும் உட்பட்டு, கடன்பட்டு வழக்காடி, பிணை வாங்கி அல்லல்படுகின்ற அவல நிலையைத் தொடரச் செய்வதில் இன்றளவும் இவ்வரசாங்கமும்கூட இதற்கு விதிவிலக்கு இல்லை!

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நேர மட்டுப்பாடு கருதி எங்களுடைய விவசாயிகள் எதிர்கொள்ளும் எட்டுப் பிரச்சினைகளை மட்டும் இச்சபையில் முன்வைக்க விரும்புகின்றேன். விவசாயிகளின் வயற்காணிகள் விடுவிக்கப்படாமை, குளங்கள் புனரமைக்கப்படாமை, புழுதி விதைப்புக்கான ஏற்பாடுகள் பயிர் காப்பீட்டில் கருத்திற்கொள்ளப்படாமை, அதிகரித்துவரும் யானை - மனித மோதலால் வயல் நிலங்களும் விவசாய உற்பத்திகளும் அழிவடைதல், அதிகரித்துவரும் போலி களைநாசினிகள், நெல் உலர்த்துவதில் நிலவும் சவால்கள், அழிவு கொடுப்பனவுகள் கிடைக்கப்பெறாமை, மட்டுப்படுத்தப்பட்ட களஞ்சியசாலைகள் மற்றும் கேள்விக்கும் தேவைக்குமான இடைவெளி அதிகரித்தலும் இறக்குமதியின் தாக்கமும் என்பனவே அவையாகும்.

1. விவசாயிகளின் வயற்காணிகள் விடுவிக்கப்படாமை:

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, முல்லைத்தீவு மாவட்டத்தில் வனவளத் திணைக்களத்தால் கையகப்படுத்தப்பட்டுள்ள பொதுமக்களின் காணிகளை விடுவிப்பதன் பொருட்டு மாவட்டச் செயலாளரின் தலைமையிலும், பின்னர் 2023.02.17ஆம் திகதி சனாதிபதி செயலகத்தின் சமூக விவகார பணிப்பாளர் நாயகம் திரு. கீர்த்தி தென்னக்கொன் தலைமையிலும், 2023.06.01ஆம் திகதி வனவள மற்றும் வனசீவராசிகள் அமைச்சின் மேலதிக செயலாளர் சமந்தி ரணசிங்ஹ, வனசீவராசிகள் திணைக்களத்தின் பணிப்பாளர் திரு. மஞ்சுள அமரரட்ண ஆகியோர் தலைமையிலும், 2024.02.06ஆம் திகதி வனவள மற்றும் வனசீவராசிகள் அமைச்சின் மேலதிக செயலாளர் சமந்தி ரணசிங்ஹ தலைமையிலும் கூட்டங்கள் நடைபெற்றன. அதன்பின்னர் முல்லைத்தீவு மாவட்ட காணிக் கையாள்கைக் குழுவின் பரிந்துரைகளை ஆராயும் அமைச்சுகளுக்கு இடையிலான குழுக் கூட்டம் 2024.02.28ஆம் திகதி நடைபெற்று, குறித்த பரிந்துரைகள் அக்குழுவால் ஏற்றுக்கொள்ளப்பட்டன. எடுக்கப்பட்ட தீர்மானங்கள் சனாதிபதியின் செயலாளர் ஈ.எம்.எஸ்.பி. ஏக்கநாயக்க அவர்களால் வனசீவராசிகள் மற்றும் வனவளப் பாதுகாப்பு அமைச்சின் செயலாளருக்கு அனுப்பி வைக்கப்பட்டது. அதன் அடிப்படையில், 2026.06.06ஆம் திகதியிலிருந்து கள விஜயம் மேற்கொள்வதெனத் தீர்மானிக்கப்பட்டு, பின்னர் ஒருங்கிணைந்த கள விஜயங்கள் மேற்கொள்ளப்பட்டு, தொடர் கூட்டங்கள் நேரடியாகவும் zoom செயலி ஊடாகவும் மேற்கொள்ளப்பட்டு, காணி ஆவணங்கள் ஏதுமின்றி ஒரு தொகுதி காணிகளை விடுவிப்பதாகவும் மேலதிக ஆவணங்களுடன் அடுத்த ஒரு தொகுதி காணிகளை விடுவிப்பதாகவும் தீர்மானிக்கப்பட்டது.

கரைதுறைப்பற்று பிரதேச செயலகப் பிரிவில் 10,102.06 ஏக்கரும் புதுக்குடியிருப்பு பிரதேச செயலகப் பிரிவில் 14,481.9 ஏக்கரும் ஒட்டுசுட்டான் பிரதேசத்தில் 19,246.54 ஏக்கரும் துணுக்காய் பிரதேச செயலகப் பிரிவில் 10,209.72 ஏக்கரும் மாந்தை கிழக்கில் 18,822.04 ஏக்கருமாக மொத்தம் 72,862.26 ஏக்கர் காணி முல்லைத்தீவு மாவட்டத்தில் வனவளத் திணைக்களத்திடமிருந்து விடுவிக்கப்பட வேண்டிய காணிகளாக கடந்த காலத்தில் அடையாளப்படுத்தப்பட்டன. அவற்றுள் கடந்த கால போரினால் ஆவணங்களை மக்கள் தொலைத்த நிலையில், கரைதுறைப்பற்று பிரதேச செயலகப் பிரிவில் 7,447.66 ஏக்கரும் புதுக்குடியிருப்பில் 12,679.29 ஏக்கரும் ஒட்டுசுட்டானில் 17,954.77 ஏக்கரும் துணுக்காயில் 987.93 ஏக்கரும் மாந்தை கிழக்கில் 3,042.78 ஏக்கரும் மணலாற்றில் 1,055.83 ஏக்கருமாக முல்லைத்தீவில் மொத்தம் 43,234.98 ஏக்கர் நிலம் காணி ஆவணங்கள் ஏதுமின்றி விடுவிக்கப்பட வேண்டுமென ஒருங்கிணைந்த குழுவின் களஆய்வின் பின்னர் தீர்மானிக்கப்பட்டது. அத்தோடு, நீர்ப்பாசனத் திணைக்களத்தின் 2,407.92 ஏக்கர் வயற்காணிகளும், கமநல அபிவிருத்தித் திணைக்களத்தின் 2,703.63 ஏக்கர் வயற்காணிகளுமாக முல்லைத்தீவு மாவட்டத்தில் 5,111.55 ஏக்கர் வயற்காணிகள் விடுவிக்கப்பட வேண்டியதாகவும் காணப்படுகின்றன.

இவ்வாறாக, வனவளத் திணைக்களத்தின் கட்டுப்பாட்டிலிருந்து முல்லைத்தீவில் மட்டும் 72,862.26 ஏக்கர் காணி விடுவிக்கப்பட வேண்டியதாக இருக்க, இப்போது வனவளத் திணைக்களத்தால் தங்கள் ஆளுகைக்குள் புதிதாக வனப்பகுதியாக உள்வாங்குவதற்கு முல்லைத்தீவு மாவட்டத்தில் மேலும் 25,854.23 ஏக்கர் நிலம் கோரப்பட்டுள்ளது. இவ்வாறு காடுகளுக்காக மேலதிகமாகக் கோரும் காணிகளில் விசுவமடு நகர்ப்பகுதி உள்ளிட்ட மக்கள் வாழ்விடங்களும் அடங்குகின்றன. எனவே, இலங்கைக்குத் தேவையான பெரும்பகுதி காட்டுத் தேவைக்காக வன்னி மக்களின் வாழ்விடங்களையும் வாழ்வாதார நிலங்களையுமா மேலும் மேலும் கையகப்படுத்துவது? அரச திணைக்களங்களே முன்னின்று இவ்வாறு முனைவது எவ்வகையான நீதி? எனக் கேட்க விரும்புகின்றேன். ஏற்கனவே தீர்மானிக்கப்பட்டதற்கு அமைவாக, காணி ஆவணங்கள் ஏதுமின்றி விடுவிக்கத் தீர்மானிக்கப்பட்ட 43,234.98 ஏக்கர் அளவிலான மக்களின் வாழ்விட வாழ்வாதார நிலங்கள், குறிப்பாக முல்லைத்தீவு மக்களின் 5,111.55 ஏக்கர் விவசாய நிலங்களை உடன் விடுவிக்க இவ்வரசு நடவடிக்கை எடுக்க வேண்டுமென அம்மக்கள் சார்பாகக் கேட்டுக்கொள்கின்றேன்.

2. குளங்கள் புனரமைக்கப்படாமை:

2026.08.07ஆம் திகதிய காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சரின் கூற்றுப்படி, முல்லைத்தீவு மாவட்டத்தில் 34 குளங்களும் வவுனியா மாவட்டத்தில் 243 குளங்களும் மன்னார் மாவட்டத்தில் 180 குளங்களுமாக வன்னித் தேர்தல் மாவட்டத்தில் மொத்தம் 457 குளங்கள் புனரமைக்கப்படாதுள்ளன. முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களில் பெரும்பாலான குளங்கள் வனவளத் திணைக்களம் மற்றும் வனசீவராசிகள் திணைக்களத்தின் கட்டுப்பாட்டுக்குள் இருப்பதாகவும், வவுனியா மாவட்டத்தில் கமநல அபிவிருத்தித் திணைக்களத்துக்குரிய 241 புனரமைக்கப்படாதுள்ள குளங்களில் 171 குளங்கள் வனவளத் திணைக்களத்தின் கட்டுப்பாட்டில் இருப்பதாகவும் தெரிவிக்கப்பட்டுள்ளது. பெரும் எண்ணிக்கையிலான குளங்கள் இவ்வாறான திணைக்களங்களின் கட்டுப்பாட்டில் இருப்பதால் குளங்களைப் புனரமைப்புச் செய்ய முடியாமல் இருப்பதோடு, அவற்றின் கீழுள்ள வயல் நிலங்களையும் பயன்படுத்த முடியாமல் உள்ளது. அத்தோடு, கடந்த ஆண்டு 'தித்வா' புயலால் பாதிப்படைந்த குளங்களில் முல்லைத்தீவு மாவட்டத்தின் ஒட்டுசுட்டான் பிரதேச செயலகத்துக்கு உட்பட்ட பெரிய குளம், விளாப்புக்குளம் மற்றும் வவுனியா மாவட்டத்திலுள்ள பெரிய மருதோடைக்குளம் உள்ளிட்ட இன்னும் சில குளங்கள் இதுவரை திருத்தப்படாதிருப்பதால் முன்னுரிமை அடிப்படையில் எதிர்வரும் ஆண்டில் அவற்றைத் திருத்துமாறு வலியுறுத்திக் கேட்டுக்கொள்கின்றேன்.

3. வடக்கு, கிழக்கில் புழுதி விதைப்பு நெற்செய்கையாளர்கள் இலவச காப்பீட்டைப் பெறுவதிலுள்ள நெருக்கடி:

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள பெருமளவிலான நெற் பயிர்ச்செய்கையாளர்கள் பெரும்போக நெற்செய்கைக் காலத்தில் புழுதி விதைப்பு முறையில் உலர் நிலத்தில் நெல் விதைப்பை மேற்கொள்கின்றனர். மழையை நம்பி, மூன்றரை மாத நெல்லை உலர் நிலத்தில் புழுதி விதைப்பு மேற்கொண்டால், குறித்த நெல்லின் அறுவடைக் காலம் நான்கு மாதங்களைக் கடக்கின்றது. ஆனால், நெல் விதைக்கப்பட்ட நாளிலிருந்து மூன்றரை மாதங்களை - 105 நாட்களை - கடந்த நிலையில், நெற் பயிர்ச்செய்கை அழிவுறுகின்ற சந்தர்ப்பங்களில் அந்த அழிவுக்குரிய காப்பீட்டை கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை வழங்க மறுக்கின்றது. கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபையின் சுற்றறிக்கையின்படி, புழுதி விதைப்பு முறையைப் பின்பற்றும் நெற் பயிர்ச்செய்கையாளர்கள் இதனால் பெரிதும் பாதிப்புகளை எதிர்நோக்குகின்றனர். எனவே, மழையை நம்பி வட, கிழக்கு விவசாயிகள் பெரும்போகத்தில் மேற்கொள்ளும் புழுதி விதைப்பு முறையிலான நெற் பயிர்ச்செய்கைக்கும் இழப்பின் போதான காப்பீடுகளைத் தடங்கல் ஏதுமின்றி வழங்குவதற்கு ஏற்றவாறு கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபையின் சுற்றறிக்கையில் மாற்றங்களைக் கொண்டுவர வேண்டுமென அரசைக் கோருகின்றேன்.

4. அதிகரித்துவரும் யானை-மனித மோதலால் வயல்நிலங்களும் விவசாய உற்பத்திகளும் அழிவடைதல்:

முல்லைத்தீவின் கொக்குத்தொடுவாய் மத்தி கிராம அலுவலர் பிரிவு, கேப்பாப்பிலவு - புலக்குடியிருப்பு பகுதி, புதுக்குடியிருப்பு கோம்பாவில் பகுதி உள்ளிட்ட பல இடங்களில் தற்போது யானைகளால் வீடுகள், விளைநிலங்கள், விவசாய உற்பத்திப் பொருட்கள், தென்னைகள் என மக்களின் வாழ்விடமும் வாழ்வாதார மூலமும் அழிக்கப்படுகின்றன. இவ்வாறு தொடரும் அழிவுகளுக்கு உடன் தீர்வு வழங்க வேண்டும். அடுத்த ஆண்டின் நிதி ஒதுக்கீட்டில் யானை வேலி இடப்படும் வரை மக்களின் வாழ்வுக்கும் வாழ்வாதாரத்துக்கும் யார் பொறுப்பாவது? ஆண்டுக்கணக்கில் வளர்த்தெடுத்த வான்பயிர்கள் ஓர் இரவில் சாய்க்கப்படுகின்றன. இவ்வாறான அத்துமீறிய யானை - மனித மோதலுக்கு பிரதேச மட்டத்தில் வனசீவராசிகள் திணைக்களம் ஊடாக உடனடியாக தற்காலிக தீர்வையேனும் வழங்க இவ்வரசு முன்வர வேண்டும்.

5. அதிகரித்துவரும் போலி களைநாசினிகள்:

மருந்தகங்களில் போலி மருந்துகளை ஆய்வு செய்து கட்டுப்படுத்தும் பொறிமுறையைப்போல, நெற்செய்கையில் பயன்படுத்துவதற்காக கடைகளில் விற்கப்படும்

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

களைநாசினிகளையும் ஆய்வுசெய்து கட்டுப்படுத்தும் பொறிமுறை இலங்கையில் மேலும் முறைப்படுத்தப்பட வேண்டும். விவசாயிகள் விலைக்கு வாங்கிப் பயன்படுத்தும் களைநாசினிகளிலும் போலி களைநாசினிகளின் கலப்படம் இருப்பதால், நெற்செய்கையின் விளைச்சலும் பாதிக்கப்படுவதாக விவசாயிகள் முறையிடுகின்றனர். எனவே, இவ்வாறான போலி மருந்துகளின் கட்டுப்பாடு தொடர்பிலும் அரசு தகுந்த பொறிமுறை ஒன்றை வகுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

6. நெல் உலர்த்துவதில் எதிர்கொள்ளும் சவால்கள்:

வீதியோரங்களிலும் வீதியின் ஒரு பாதியிலும் நெல் உலர்த்தும் நடைமுறைக்கு விரைவாக மாற்று நடைமுறை ஒன்றை அரசு ஏற்படுத்த வேண்டும். வீதியோரங்களில் நெல்லைப் பரவி உலர்த்துவதால் ஒருபுறம் விபத்துகள் சம்பவிப்பதோடு, மறுபுறம் உணவுப் பாதுகாப்பும் கேள்விக்கு உள்ளாக்கப்படுகிறது. தாரோடு மாசாகக் கலந்திருக்கும் உலோகங்கள், வாகனச் சக்கரங்களின் 'ரயர்' தேய்மானத் துணிக்கைகள், வேகத்தடுப்பு உதிரிப்பாகங்களின் தேய்மானத் துணிக்கைகள், தெருவில் சிந்தும் எரிபொருள் உள்ளிட்டவற்றின் மாசுக்கள் வெப்பமான சூழ்நிலையில் காயவிடப்படும் நெல்லோடு கலக்கும் வாய்ப்புள்ளதா?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Give me one more minute, please.

நீண்ட காலச் சூழமைவில் அவற்றை உணவாக உட்கொள்வோருக்கு உடலியல் பாதிப்புகளை ஏற்படுத்துமா என்பது தொடர்பிலும் முறையான ஆய்வுகள் மேற்கொள்ளப்பட வேண்டும். இது தொடர்பில் அரசு கூடுதல் கரிசனைகொள்ள வேண்டும். எனவே, நெல் உலர்த்தும் தளத்தின் பயன்பாட்டை அதிகரித்தல், நெல் உலர்த்திகளின் பயன்பாட்டை அதிகப்படுத்தல் என்பவற்றுக்கு மேலாகவும் மாற்று நடைமுறைகள் ஊடாக நெல் உலர்த்துவது தொடர்பில் விவசாயிகளுக்கு மாற்று வழிகளை ஏற்படுத்த வேண்டுமெனவும் கேட்டுக்கொள்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් බියන්විල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.09]

**ගරු සුනිල් බියන්විල මහතා**
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ දිස්ත්‍රික්කයේ ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීවරිය ගෙනාපු සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් මම එතුමියට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපි කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කරපු මහා කාර්යභාරය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ මේ විධියට කියන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් එතුමියට ස්තුතිය පුද කරන්න කැමතියි. එතුමිය මගේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරියක්. එතුමියට අසාධාරණයක් වෙනවා එතුමිය කියපු කාරණාවලට උත්තර නොදුන්නොත්.

එතුමිය කිව්වා, අපි පසුගිය කාලයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට කිසිම දෙයක්, කිසිම කාර්යභාරයක් කළේ නැහැ, ඉතිහාසයේ තමයි මහා ලොකු කාර්යභාරයක් කර තිබෙන්නේ කියලා. විශේෂයෙන් එතුමිය කියපු කරුණු කාරණා ටික හොඳයි. හැබැයි, 1977න් පසුව ඉතිහාසය පුරා කරපු හොරකම් ටික ගැනත් කිව්වා නම් හොඳයි. එහෙම කිව්වා නම් ගැළපෙනවා. ගොවීන්ට විතරක් නොවෙයි, මේ රටේ රාජ්‍ය සේවකයන් ඇතුළු විවිධ ක්ෂේත්‍රවල අයට පසුගිය කාලය පුරාම සහන දෙන්න බැරි වුණේ ඉතිහාසය පුරාම මේගොල්ලන් කරපු හොරකම් නිසායි. මීට වඩා අපි ගොවීන්ට උදවු කරන්න ඕනෑ. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. අපේ ගරු නාමල් නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වා, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අපි කරලා තිබෙන දේවල් ගැන. නමුත්, ඊටත් වඩා කරන්න ඕනෑ. ඉතින්, ඇයි අපට බැරි වුණේ? බැරි වුණේ, පසුගිය කාලය පුරාම මේ රටේ ආර්ථිකය මේගොල්ලන් කඩා වට්ටපු නිසායි. ඒ හින්දා තමයි අපට ඒවා කරන්න බැරි වුණේ.

එතුමිය අපට චෝදනා කළා. මොකක්ද චෝදනාව? එතුමිය කිව්වා, අපි බලයට එන්න ඉස්සෙල්ලා මහ ලොකු දේවල් ටිකක් කිව්වා කියලා. ඔව්, කිව්වා තමයි. අපි කිව්වා. කිව්වා වාගේම ඒ ටික කරනවා. ඒ ටික කරන්න තමයි පසුගිය කාලයේ දේශපාලන සංස්කෘතිය තුළ අපි බොහෝ දේවල් වෙනස් කළේ. විශේෂයෙන්ම අපි මන්ත්‍රී විශ්‍රාම වැටුප අහෝසි කළා; මන්ත්‍රීවරුන්ට තිබුණු ආරක්ෂාව අයින් කළා; වරප්‍රසාද අයින් කළා. ඒ සංස්කෘතියේ බොහෝ දේවල් වෙනස් කළා. අපි ඒ කැප කිරීම කළේ ඒ වෙනුවෙන් තමයි. ඒ ක්‍රියාවලිය ඇතුළේ මේ රටේ ආර්ථිකය ශක්තිමත් වෙන්න වෙන්න, ඒවා ගොවීන්ට විතරක් නොවෙයි සමස්ත රටේම ජනතාවට සහන වශයෙන් දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමිය කිව්වා, අලි ප්‍රහාරයක් නිසා ඊයේ පෙරේදාත් මාතලේ දිස්ත්‍රික්කය තුළ පුද්ගලයෙක් මිය ගියා කියා. ඔව්, අපි පිළිගන්නවා. මේක වෙනස් කරන්න ඕනෑ. පසුගිය කාලය පුරාම දිස්ත්‍රික්කය ඇතුළේ අලි සහ මිනිස් ඝාතන විශාල ප්‍රමාණයක් සිදු වුණා. ඒ නිසා අපි මේක වෙනස් කරන්න ඕනෑ. ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ශක්තිමත් කරමින් ඉන්නවා. අපේ පැත්තෙන් මේ සඳහා උපරිම වශයෙන් මැදිහත් වෙමින් තිබෙනවා. අපි ඉතාම කෙටි කාලයක් තුළ මේක වෙනස් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම එතුමිය තව කාරණයක් කිව්වා. වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 137ක් වනවාලු. හරි. එතුමිය ඔය කියන්නේ, එතුමියලාගේ ආණ්ඩුව තිබුණු කාලයේ කීඩෑවා රෝගය වාගේ රෝගයක් ආවම ඒ අස්වැන්නත් එක්ක ගණන් හදලා බලලා. මොකද, ඒ කාලයේ ලෙඩ රෝග වැඩියි නේ. කෘමි හානි වැඩියි. අපි ඒවා වෙනස් කරලා තිබෙනවා. කන්නවල වැඩකටයුතු නියම වෙලාවට පටන් ගන්නවා. ඒ වාගේම වතුර දෙනවා, පොහොර සහනාධාරය දෙනවා. ඒකත් එක්ක හානි අඩු වෙලා තිබෙනවා. නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. මේ වෙලාවේ සිදු වන ගණනය වෙන එකක්. අන්න ඒක ගණනය කරගන්න. එහෙම වුණොත් මම හිතනවා එතුමියට හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම එතුමිය අපනයන භෝග සම්බන්ධයෙනුත් කථා කළා. දිස්ත්‍රික්කයක් හැටියට ගත්තත් අපනයන භෝග සම්බන්ධයෙන් අපි මේ වෙලාවේ ඉහළ තැනක ඉන්නවා. අපි ඒගොල්ලන්ට සහන දෙමින්, ශක්තිමත් කරමින් ඉන්නවා. ඒ පිළිබඳව හොයා බලන්න එතුමියට පුළුවන්. ඒ වාගේම බී ලූනු ගොවීන් ගැනත් කිව්වා. පසුගිය කන්නයේ ඒ ගොවීන්ට හොඳ මිලක් දෙන්න බැරි වුණා. හැබැයි, මේ කන්නයේදී අපි ඒ සැලසුම් ටික හදලා හොඳ මිලක් ලබා දී තිබෙනවා. එතුමිය ගොවි විශ්‍රාම වැටුප් සම්බන්ධයෙනුත් කිව්වා. අපේ ඇමතිතුමා සඳහන් කළා විශ්‍රාම වැටුප නැති කළේ කවුද කියලා. ඒ ගැන මම කියන්න යන්නේ නැහැ.

කවුරුත් දන්නවා, අපි පසුගිය කාලයේදී කෘෂිකර්මයට අදාළව කොයිතරම් මැදිහත් වීමක් රට තුළ කළාද කියලා. එතුමිය මේ තිබෙන දත්ත කියෙව්වා නම් හොඳයි. විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙන දත්ත ටික කිව්වොත්, එතුමියට අවබෝධ කරගන්න පුළුවන් වෙයි. 2026 වසර ඇතුළත මාතලේ දිස්ත්‍රික්කයට වී මිලදී ගැනීම සඳහා ලැබුණු ප්‍රතිපාදන බලන්න. විශේෂයෙන් අපි කල්පනා කළා, ආණ්ඩුවක් හැටියට අපට ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා, වී මිලදී ගැනීමේ අමාරුකමක් තිබෙනවා කියන එක. මොකද, පසුගිය කාලය පුරාම වී මිලදී ගැනීමට අවශ්‍ය ගබඩා ටික හානියට පත්වෙලා තිබුණා. අපි ඒවා ප්‍රතිසංස්කරණය කරලා මිලදී ගැනීම ආරම්භ කරලා තිබෙනවා. හැබැයි, මේ විශාල නිෂ්පාදනයත් එක්ක අපි ගැටලුවකට මුහුණ දී තිබෙනවා. ආණ්ඩුවක් හැටියට අපට මේ සමස්තයම මිලදී ගන්න බැහැ. ඒ හින්දා අපි මොකද කළේ? පෞද්ගලික අංශය ශක්තිමත් කරන්න ඕනෑ වැඩ පිළිවෙළ හැදුවා. වී මිලදී ගන්න අයට බැංකුත් එක්ක ගනුදෙනු කරලා ඒ අවස්ථාව ලබාගන්න අමාරුයි. ඒ හින්දා අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා පොලී නැතුව ණය දෙන ක්‍රමයක් හැදුවා. මාතලේ දිස්ත්‍රික්කයට අපි මිලියන 175ක් වෙන් කළා. ඒකෙන් මිලියන 163.65ක් අපි දීලා තිබෙනවා. ඒ තුළින් විශාල ප්‍රමාණයක් වී මිලදී ගන්න කුඩා වී මෝල් හිමියන්ටත් අවස්ථාව දෙන්න පුළුවන් වුණා. මේක යම් ප්‍රමාණයකට පාලනය කරගන්න පුළුවන් වුණා. හැබැයි අපි විශ්වාස කරන්නේ නැහැ, මේක ප්‍රමාණවත් කියලා. අපි කල්පනා කරනවා අපේ වැඩ පිළිවෙළ ඇතුළේ තව කන්නයක් දෙකක් යනකොට අපට මේක වෙනස් කරගන්න පුළුවන් කියලා.

අපි පළමුවෙන්ම වී මිලදී ගන්න පටන් ගන්නකොට අපේ ගබඩාවලට වී ආවේ නැහැ. ඒවා පෞද්ගලික අංශය මිලදී ගත්තා. ඒ කටයුත්ත කරන්න අපට ඒ වෙලාවේ හැකියාව ලැබුණේ නැහැ. නිෂ්පාදනය අඩුයි. හැබැයි, දැන් නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. වැඩි වෙච්ච එක ඇතුළේ පෞද්ගලික අංශයටත්, අපටත් - දෙගොල්ලන්ටම - මේ කටයුත්ත සම්පූර්ණ කරන්න බැහැ. හැබැයි අපි ඉතාම කෙටි කාලයක් ඇතුළත - ඊළඟ කන්නය වෙනකොට - මේකට උත්තර හොයනවා. ඒ හින්දා ඒක ගැන සැකයක් තියාගන්න අවශ්‍ය නැහැ.

පසුගිය කාල සීමාව තුළ ප්‍රජා ශක්ති වැඩසටහන හරහා ගොවීන් ශක්තිමත් කිරීමට විශාල කාර්යභාරයක් කළා. මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, අපි ප්‍රජා ශක්ති වැඩසටහන හරහා මිලියන 567.2ක් වැනි විශාල මුදලක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන් ගොවීන්ගේ නිෂ්පාදන වියදම අඩු කරගන්න, ට්‍රැක්ටර් ලබා දෙන්න ආදී විවිධ දේවල් සඳහා අපි විශාල මුදලක් වෙන් කර තිබෙනවා. දැන් ගොවීන් එහි ප්‍රයෝජන ගනිමින් ඉන්නවා. ඒ නිසා ඉස්සරහටත් අපි ප්‍රජා ශක්ති ඇතුළු විවිධ වැඩසටහන් හරහා ගොවීන්ගේ නිෂ්පාදන වියදම අඩු කර ගැනීමට මැදිහත් වෙමින් ඉන්නවා. ඒ නිසා අපි කල්පනා කරනවා අද නැති දේ ගොවීන්ට හෙට හම්බ වෙයි කියලා. අපට එහෙම විශ්වාසයක් තිබෙනවා. එහෙම වැඩ පිළිවෙළක් ඇතුළේයි අපි යන්නේ. ඒ පිළිබඳව ගොවීන්ට අදහසක් තිබෙනවා. ගොවීන් අවබෝධයෙන් වැඩ කරනවා. අපි ගොවි සංවිධාන තුළ කථා කරනවා. ගොවීන් එකතු කරනවා. විවිධ වැඩසටහන්වලට ගෙන්වනවා. පුහුණු වැඩසටහන් කරනවා. ඒ හින්දා අපි හොඳටම දන්නවා, ගොවීන්ට ප්‍රශ්නයක් නැහැ කියලා. ප්‍රශ්නය තිබෙන්නේ, මාතෘකාවක් නැති විපක්ෂයේ අයට. ඒ නිසා සැකයක් තියා ගන්න එපා. මේ ගොවීන්ගේ වුවමනාව ඉෂ්ට කිරීමට අපට තව කෙටි කාලයකින් පුළුවන්කම තිබෙනවා.

අපි වී ගොවිතැන සම්බන්ධයෙන් විතරක් නොවෙයි, සමස්ත කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය ගත්තාම, පොල් වගාව නඟාසිටුවීම සඳහා, පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහාත් පසුගිය කාලයේ විශාල කාර්යභාරයක් සිදු කර තිබෙනවා. අපි පොල් පොහොර සහනාධාරය ලබා දෙනවා. පොල් වගාවට පොහොර සහනාධාරය දෙන ගමන් ජල සැපයුම ආදී විවිධ දේවල් සඳහා පොල් ගසකට රුපියල් 700 ගණනේ ලබා දෙනවා; පොල් ගසක් නඩත්තු කිරීම සඳහා රුපියල් 700ක් දෙනවා. අපි බලාපොරොත්තු වෙන්නේ, ඒ ගොවීනුත් ශක්තිමත් කරන්නයි. ඒ විධියට, කෘෂිකර්මය අපේ රටේ ආර්ථිකය හදන්න තිබෙන එක් මාර්ගයක් හැටියට සලකලා, අපි ඒකට පහසුකම් ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ අපි මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන් අතර රුපියල් මිලියන 205ක මුදලක් බෙදා දුන්නා. අපි හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් දුන්නා. පූර්ණ හානියට පත් වුණු හැම ගොවියෙකුටම වන්දි ගෙවලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයෙන් මොන චෝදනා කළත්, පසුගිය කාලසීමාව ඇතුළත ගොවීන්ට ඕනෑ කරන, ගොවීන් ශක්තිමත් කරන්න ඕනෑ කරන කාරණා ටික ඉෂ්ට කරන්න අපේ ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඒක ප්‍රමාණවත් නැහැ කියලා. ගොවීන් තව ශක්තිමත් කරන්න ඕනෑ, නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ගොවීන්ට සහනාධාර දෙන්න ඕනෑ. ඒ සඳහා අපි ආණ්ඩුවක් හැටියට බලාපොරොත්තු වෙනවා, ගොවීන්, රාජ්‍ය නිලධාරින්, දේශපාලනඥයින් එකතු වෙලා ගොවීන් නඟා සිටුවීම සඳහා විවිධ වැඩසටහන් බිම් මට්ටමට ගෙන එන්න. අපි ඒ වැඩ කරමින් ඉන්නවා. අපේ ඉලක්කය, අපේ බලාපොරොත්තුව තමයි, 2030 වන විට අපේ රටේ ගොවීන් මෙතැනින් එහාට අරගෙන ගිහිල්ලා, පසුගිය කාලයේ ගොවීන්ට ඇති වූ ප්‍රශ්න ටික විසඳලා, ඒගොල්ලන්ගේ පවුල් ශක්තිමත් කරලා, අපේ රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය ශක්තිමත් කරලා ගොවීන්ට ඉතාම හොඳ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සලස්වන එක. ඒක තමයි අපේ කාර්යභාරය. ඒ සඳහා අපි ආණ්ඩුවක් හැටියට වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. එහි ජයග්‍රහණ ඉදිරියේදී ගේනවා කියලා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.19]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කථාව අවසාන කළේ, 2030 වන විට ගොවියා මෙතැනින් එහාට ගෙනියනවා කියලා. කොහේටද, මහ මුහුදටද?

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා ]

දැන් ගොවියා ගිහින් දමන්න ඉතුරු වෙලා තිබෙන්නේ එච්චරයි. බලයට එන කොට ආවේ ගොවියාට උපරිම සහන දෙනවා කියලා. දැන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලා ගොයම් කැපෙන කාලයට පිටරටින් හාල් ගේනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගොයම් කැපෙන කාලයට මොන ආණ්ඩුවෙන්ද පිටරටින් හාල් ගේන්නේ? මෙට්‍රික්ටොන් ලක්ෂ හතරක විතර හාල් ප්‍රමාණයක් පිටරටින් ගෙනැල්ලා, දැන් කථා කරනවා ගොවියා ආරක්ෂා කරන්න. අන්තිම වරටයි කිව්වා හාල් ගේන්නේ, ආයෙත් ජීවිතේට හාල් ඇටයක් පිටින් ගේන්නේ නැහැ කිව්වා. ගෙනාවොත්- *[බාධා කිරීමක්]* පැන් පහර ගහපු විධිය දැක්කා නේ අපි. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ගොවියාට පොහොර ටික වෙලාවට යන්නේ නැහැ. දැන් කියනවා, වී මිලදී ගන්නවාලු. ගබඩාවලට දීපු වීවලට මාස ගණනකින් සල්ලි ගෙවලා නැහැ. කුඩා පරිමාණයේ මෝල් හිමියන්ට වී මිලදී ගන්න ණයක් දෙනවා කිව්වා. ඒ දෙන මුදලට අරගෙන කුඩා පරිමාණයේ මෝල් ටික කරගෙන යන්න බැහැ. ඒවා වැහිලා යනවා. ගොවියා අන්ත අසරණ තැනට ගෙනැල්ලා තිබෙනවා. අන්ත අසරණ තැනට. හැබැයි, එසේ තිබියදීත් ආණ්ඩුව මොකද කරන්නේ? ආණ්ඩුව ගොවියාගේ ප්‍රශ්න ටික විසඳන්නේ නැතුව තමන්ගේ න්‍යාය පත්‍රයේ ඉන්නවා.

මොකක්ද, තමන්ගේ න්‍යාය පත්‍රය කියන්නේ. මේ හැම ප්‍රශ්නයක්ම යට ගහන එක. මම දැක්කා, පසුගිය දවස්වල ගොවි මහත්වරුන්ගේ, ධීවරයාගේ, කම්කරුවාගේ රත්තරන් බඩු උකස් තබා තිබෙනවා. කෝටිපතියන්ගේ, ආණ්ඩුව දැන් ආශ්‍රය කරන තමන්ගේ හිතවතුන්ගේ, ව්‍යාපාරිකයින්ගේ රත්තරන් බඩු නොවෙයි නේ මේ උකස් තියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අහිංසක ගොවියෝ, ධීවරයෝ, කම්කරුවෝ, එදා වේල හම්බ කරගෙන කන මිනිස්සු ජීවත් වෙන්න විධියක් නැතිව කෝටි 15,000ක කන කර බඩු උගස් කරලා තිබෙනවා. මම දැක්කා පසුගිය දවසක මහා උජාරුවට කියනවා, IMF එකෙන් ඩොලර් මිලියන 250ක්ද, 300ක්ද හම්බ වුණා කියලා. ඒ වාගේ දෙගුණයක්, හම්බන්තොට වරාය හදන්න ගිය ප්‍රමාණයෙන් භාගයක්, ඩොලර් මිලියන 500කට ආසන්න ප්‍රමාණයක කන කර බඩු උගස් කරලා තිබෙනවා. IMF එක අපට ගිය වතාවේ දීපු වාරිකය වාගේ දෙගුණයක වටිනාකමක් සහිත කන කර බඩු උගස් තියලා තිබෙනවා, මේ රටේ අහිංසක මිනිස්සු.

අද ආණ්ඩුව කථා කරනවා, ගොවියා ආරක්ෂා කරන්න. ගොවියා කෙසේ වෙතත් ඔබතුමන්ලා මහා පරිමාණයේ ව්‍යාපාරිකයන් ආරක්ෂා කරන බවක් නම් පෙනෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එක පැත්තකින් උද්ධමනය වැඩි වෙනවා; විරැකියාව වැඩි වෙනවා. ඔබතුමන්ලා උපාධිධාරීන්ට රස්සා දෙන්න පොරොන්දු වුණා. අන්තිමට මොකක්ද වුණේ? දැන් ඔහොම හිනා වෙවී ඉන්න. හෙට අනිද්දාට උපාධිධාරීන් ගෙවල්වලට හොයාගෙන එයි. ඒ ආවාට පස්සේ අපව මතක් වෙයි. ඒ අයට රැකියා දෙන්න තමුන්නාන්සේලා පොරොන්දු වුණා. ලුණු දීලා උපාධිධාරීන් රැවැට්ටුවා; ගෙයින් ගෙට යැව්වා. අවසානයේ මොකක්ද කළේ? ඒ උපාධිධාරීන්ට රැකියා දෙන්න කටයුතු කළේ නැහැ.

පසුගිය දිනවල අපේ සෞඛ්‍ය ඇමතිතුමා ලොකුවට කිව්වා, තිස්තුන්කෝටියක් දෙවියන්ගෙන්වත් සෞඛ්‍ය අමාත්‍යාංශයට ආධාර එපා කියලා. අපට ඕනෑ තරම් මුදල් තිබෙනවා කිව්වා. පසුගිය දවසක රිජ්වේ ආර්යා ළමා රෝහලයි, අපේක්ෂා රෝහලයි Internet එකේ දැන්වීමක් දැම්මා, බෙහෙත් අවශ්‍යයි, තිබෙනවා නම් පරිත්‍යාග කරන්න කියලා. මුදල් පරිත්‍යාග. දවස් දෙකෙන් ඒ දැන්වීම අයින් කළා. බෙහෙත් දෙන එක නොවෙයි කළේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ආණ්ඩුවේ ලජ්ජාව වහගන්න, ඒ දාපු පණිවුඩය අයින් කරපු එකයි කළේ. ආණ්ඩුවේ ලජ්ජාව වහගන්න පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන දේත් අයින් කරන තැනට ඇවිත් තිබෙනවා. එක්කෝ, ආණ්ඩුව බෙහෙත් ටික දෙන්න ඕනෑ. එහෙම නැත්නම්, දෙන කෙනෙකුට දෙන්න ඉඩ දෙන්න ඕනෑ. ඒක කරන්නේ නැතිව පණිවුඩය අයින් කරලා එක පැත්තකින් ආණ්ඩුව උත්සාහ කරනවා, තමන්ගේ නොහැකියාව වසාගන්න.

මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා දැන් අවුරුදු 2ක් ඉවරයි. පොරොන්දු වෙච්ච කිසිම දෙයක් කරලා නැහැ. දැන් ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ඒක වහගන්න ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ඒක වහගන්න ඔබතුමන්ලා මර්දනය පාවිච්චි කරනවා. දැන් ආයෙත් තෙල් පෝලිම් ටික ඇවිත් තිබෙනවා. දැන් ඩීසල්, පෙට්‍රල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ජනාධිපතිතුමා පළමුවැනි රැලියේදී කිව්වා, ලෝක වෙළෙඳ පොළේ මිල වැඩි වුණත් අපි ඉන්ධන මිල වැඩි කරන්නේ නැහැ කියලා; ගොඩබාන කොට තිබුණු ගණනටම දෙනවා කියලා. ඒක කියන කොට ආණ්ඩුවේ සමහරු අන්න හිනා වෙනවා. ඒ මිලටම ඉන්ධන දෙනවා කිව්වා; කොමිස් ටික අයින් කර ගන්නවා කිව්වා; බදු අඩු කරනවා කිව්වා. ඒවා කළේ නැහැ. ඉන්ධන ගොඩබාන කොට තිබුණු මිලටම දෙනවා කිව්වා. ගොඩබාන මිලට වැඩියෙන්වත් දැන් ඉන්ධන ගන්න නැහැ.

අනෙක් පැත්තෙන් මොකක්ද කළේ? ඔබතුමන්ලා ආණ්ඩු බලය ගත්තාට පස්සේ රුපියල් 100කින් තෙල් ලීටරයක මිල වැඩි වෙලා තිබෙනවා. බදු අයින් කරලාත් නැහැ. බදු රුපියල් 30කින් වැඩි කළා, පසුගිය කාලයට වඩා. හැබැයි, මේවා කරනවා කියලා නොවෙයි තමුන්නාන්සේලා පොරොන්දු වුණේ. පොරොන්දු වෙච්ච විධියට ජනතාවට දැන් සහනයක් දෙනවා නම්, ඒත් කමක් නැහැ. හැබැයි එහෙමත් නැහැ. දැන් මොකක්ද කරන්නේ? නොහැකියාව වහගන්න ඔබතුමන්ලාගේ ජේවීපී එකේ සුපුරුදු මර්දනය පාවිච්චි කරනවා.

අපේ පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේගේ සිද්ධිය ගන්න. ඒ කාරණය සම්බන්ධයෙන් අපේ මහාචාර්ය අතිපූජ්‍ය කොටපිටියේ රාහුල අනුනායක ස්වාමීන් වහන්සේ ලිඛිතව දැනුම්දීමක් කළා. ඒ පිළිබඳව උන්වහන්සේගේ සහ සංඝ සභාවේ පණිවුඩය ලබා දුන්නා. ආණ්ඩුව මොකක්ද කළේ? ඒක තුට්ටු දෙකකට ගණන් ගත්තේ නැහැ. ඒක අහන්නත් දෙයක් නොවෙයි. මොකද, මහා නායක හාමුදුරුවන් වහන්සේලා දෙවතාවක්ම ලිඛිතව දැනුම් දුන් කාරණා ඔබතුමන්ලාගේ ආණ්ඩුව වීසි කරලා දැම්මා. හැබැයි, ඒ කාලයේ ඔය සමහරු ජීවිත බේරා ගන්න පන්සල්වලට ගිහිල්ලායි හිටියේ. සමහර අයගේ උපාධි තිබෙන්නේත් පැවිදි නමට. එදා මහා සංඝ රත්නය පිටුපස හැංගිලා ජීවිත බේරාගත්තු ඔබ අද මහා සංඝ රත්නයට එළවා එළවා පහර දෙනවා. ඇහුවාම කියන්නේ, ජාතිවාදය පතුරනවා කියලායි. නැහැ, මෙය ජාතිවාදය පැතිරවීමක් නොවෙයි. ස්වාමීන් වහන්සේනමක් සහ බෞද්ධයෙක් තමන් විශ්වාස කරන ධර්මය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීම ජාතිවාදයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක වැරදියට අර්ථකථනය කරන්න ලැහැස්ති වෙන්න එපා. හැබැයි, තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? *[බාධා කිරීමක්]* තවත් හිනා වෙන්න. තමුන්නාන්සේලා මහා සංඝ රත්නයට ගරහලා, අගෞරව කරමින් හිනා වෙවී ඉන්න. දැන් ඒක නේ තිබෙන අමාරුව. එක පැත්තකින් සංස්කෘතියට ගහනවා; රණවිරුවන්ට ගහනවා. අනෙක් පැත්තෙන් දැන් එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමරන්න ඉඩ දෙනවා. හැබැයි, පසුගිය කාලයේ අර්චුනා මන්ත්‍රීතුමා 'කොටියා' කිව්වා කියලා ඒකට පරීක්ෂණයක් කළා. හැබැයි,

ඔබතුමන්ලාගේ ඇමතිවරුන් ගිහිල්ලා තිලීපන්ගේ පිළිරුවට මල් මාලා දමන ඒවා හොඳයි. විපක්ෂයේ කෙනෙකු ගිහිල්ලා 'කොටියා' කිව්වාම, ඒ ගැන පරීක්ෂණයක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මේකද තමුන්නාන්සේලාගේ ජාතිවාදය? මතක තියාගන්න. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය ජාතිවාදය අවුස්සන එක නොවෙයි කිය කියා මේ රටේ මහා සංඝ රත්නයටයි, බුද්ධ ධර්මයටයි, බෞද්ධ සංස්කෘතියටයි ගහන්න පටන් ගැනීම තුළ තමුන්නාන්සේලා මේ රටේ නැති ජාතිවාදයක් අවුස්සන තැනට මේ රට පරිවර්තනය කරනවා. ඒක මතක තියාගන්න. මහා සංඝ රත්නයට අගෞරව කරන එක, මහා සංඝ රත්නය විවේචනය කරන එක, අපේ හාමුදුරුවන් වහන්සේලාගේ සිවුර ගලවන එක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තියේ දැවැන්ත ජයග්‍රහණක් කියලා ඔබතුමන්ලා හිතනවා නම්, මේකත් මතක තබා ගන්න. මේ රට තුළ තිබෙන්නේ බෞද්ධ ධර්මය සහ බෞද්ධ දර්ශනය මත කේන්ද්‍ර වෙලා හැදුණු සමාජයක් නිසා තමයි මේ රටේ සියලු ආගම් ආරක්ෂා වෙලා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත. ඒක පිළිගන්න කැමැති නැති වෙන්න පුළුවන්. හැබැයි, ඒක තමයි යථාර්ථය. ඒ අවිහිංසාවාදයට විරුද්ධව ඔබතුමන්නාන්සේලාගේ දේශපාලන මර්දනය ක්‍රියාත්මක කරන්න එපා. ඒක කරන්න එපා!

වෙනත් රටක සිටින රජ කෙනෙකුගෙන් ජනාධිපති සමාව ඉල්ලනවා. ඉතින් අපේ එක්කෙනාට ඒක ක්‍රියාවෙන් පෙන්වන්න පුළුවන් නේ. යම්කිසි කෙනෙකු කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් වෙනත් රටක තිබෙන නීතියට, ආගමට අනුකූලව ක්‍රියා කළාම අපේ ජනාධිපතිතුමා පැනලා සමාව ඉල්ලනවා. ඒක හොඳ දෙයක්. ඒ සමාව දෙන්න ඕනෑ. හැබැයි, ඒ එක්කම අපේ එක්කෙනාත් දැන ගන්න ඕනෑ, ආදර්ශයක් වෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

අපේ එක්කෙනාත් දැන ගන්න ඕනෑ, ආදර්ශයක් වෙන්න. අපේ එක්කෙනා කොළේ වහලා ගහලා තව රටකට ගිහිල්ලා තව කථාවක් කියන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. බෞද්ධාගම වෙනුවෙන්, මහා සංඝ රත්නය වෙනුවෙන් පෙනී සිටින අය මර්දනය කරලා, හිර ගෙවල්වල දමලා තමුන්නාන්සේලාගේ දේශපාලනය කරන්න පුළුවන් කියලා හිතාගෙන ඉන්නවා නම්, ඒක සාර්ථක වෙන්නේ නැහැ කියන එකත් මතක තබා ගන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.27]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මොහොතේ අප විවාදයට ගනු ලබන්නේ විපක්ෂය විසින් සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධවයි. වී මිල සම්බන්ධයෙන් සහ කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් ආණ්ඩුවට නිශ්චිත වැඩ පිළිවෙළක් නැහැ, ඒ නිසා ඒ සම්බන්ධව වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න කියලා විපක්ෂයෙන් අද දවසේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ ගැන තමයි අප කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් ආණ්ඩුව විධියට අප දරන මතය, ප්‍රතිපත්තිය සහ සැලසුම් පිළිබඳව මේ රටේ ගොවීන්ට හොඳ අවබෝධයක් තිබෙනවා. මොකද, අපි පිළිගන්නවා, අපේ ආණ්ඩුව සියයට 100ක්ම ගොවි ජනතාව නියෝජනය කරන ආණ්ඩුවක් බව. ගොවීන්ගේ මතය වෙනුවෙන් මේ බිමේ පැය 24ම දේශපාලනය කරන දේශපාලන ව්‍යාපාරයක් විධියට තමයි අපි බලය අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපට ගොවි ජනතාවගේ ප්‍රශ්න කියන්නේ වෙනත් කෙනෙකුගේ ප්‍රශ්න නොවෙයි. ඒ, අපේම ප්‍රශ්න. ඒ නිසා ඒවා විසඳන්න අපි ගත වුණු මාස 24 තුළ - මේ අවුරුදු දෙක තුළ - ප්‍රතිපත්තිමය තීන්දු ගත්තා; ඒ වාගේම ඒවාට අදාළ සැලසුම් සකස් කළා; ඒවා ක්‍රියාකාරි තත්ත්වයට පත් කරලා බිමේ යථාර්ථයක් බවට පත් කරන්න කටයුතු කළා.

අපි 2024 වසරෙන් පසුව 2024-25 මහ කන්නය, 2025 යල කන්නය, 2025-26 මහ කන්නය ආදි වශයෙන් ඒ කන්න කිහිපය තුළම ගොවීන්ට ගොවි බිම තුළ රැකෙන්න, රැඳෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හැදුවා. ගොවියා ඉතා විශ්වාසයෙන් ගොවි බිම තුළ තබා ගන්න ඉතිහාසයේ වෙන කවරදාටත් වඩා මේ ආණ්ඩුව සැලසුම් සකස් කළා.

අපේ දිස්ත්‍රික්කය වන හම්බන්තොට කියන්නේ, ගොවි ජනතාව වැඩිපුර ජීවත් වන දිස්ත්‍රික්කයක්. 2024 වසරට පෙර ගොවීන් ගොවි බිම අත් හැරලායි තිබුණේ. ගොවියා වගා කළේ නැහැ, වගා කළාට පසුව ලැබෙන අස්වැන්න විකුණා ගන්න ලැබුණේ නැහැ. ඔවුන්ගේ පෞද්ගලික ජීවිත කඩා වැටී තිබුණා.

කෘෂි කර්මාන්තය ගැන කිඹුල් කඳුළු හෙළන විපක්ෂයේ මහත්වරුන්ගෙන් අපි අහනවා, 2024 වසරට පෙර - අපි ආණ්ඩු බලය ගන්න පෙර - වී මිල දී ගැනීම සඳහා තිබුණු යන්ත්‍රණය, වැඩ පිළිවෙළ මොකක්ද කියලා. මහා ලොකුවට අපි හැමෝම කථා කරනවා, ඉතිහාසයේ අපට විශාල වී අලෙවි මණ්ඩලයක් තිබුණා කියලා. හැබැයි, ඉතිහාසයේ පැවැති ආණ්ඩු අවුරුදු පහෙන් පහට බලය අරගෙන වී අලෙවි මණ්ඩලය බිමට සමතලා කළා. එහි සිටි 1,000කට වැඩි සේවක සංඛ්‍යාව 150කටත් වඩා අඩු මට්ටමකට පත් කළා. වී අලෙවි මණ්ඩලය සතුව ලොරි රථ 19ක් තිබුණා. එම සංඛ්‍යාව 1ට බැස්සුවා. වී අලෙවි මණ්ඩලය වැහුවා. වී මිල දී

[ගරු අරවින්ද සෙනරත් මහතා]

ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව පැවැති ආණ්ඩු අවධානය යොමු කළේ නැහැ. ගොවීන් වස බිව්වා; එල්ලිලා මැරුණා; තමන්ගේ කුඹුරු අත්හැර දැම්මා. එහෙම ඉතිහාසයක් තිබුණු රටක් අපි 2024 වසරේදී භාරගෙන පළමුවැනි කන්නයේ ඉඳලාම සැලසුම් සකස් කළා.

අපේ වැඩ පිළිවෙළ තුළ ගොවියා ශක්තිමත් කරන්න, කෘෂි කර්මාන්තය ගොඩනඟන්න තිබෙන සියලු සැලසුම් අපට මේ අවුරුදු දෙක තුළ ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා තමයි. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේ ගතවුණු අවුරුදු දෙක තුළ ඉතිහාසයේ ස්වර්ණමය යුගය අපි ගොවියාට නිර්මාණය කර දී තිබෙනවා. එහි විශේෂ පංගුවක් හම්බන්තොට ගොවීන්ට ලබා දෙන්න අපි සමත් වී තිබෙනවා.

ගොවියාට අවශ්‍ය පොහොර ටික දෙන්න, ගොවියාට ඉතාම හොඳ කළමනාකරණයකින් ජලය නිකුත් කරන්න අපේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය ඉතා විධිමත් සැලැස්මක් හදලා තිබෙනවා. ඉතිහාසයේ ඔය මහත්වරුන්ගේ පාලන කාලයන් තුළ අක්කර දහස් ගණන් විනාශ වුණා, වතුර ටික දී ගන්න බැරුව. හැබැයි, අපි ඕනෑම නියඟ තත්ත්වයක් යටතේ වුණත්, තිබෙන වතුර ටික කළමනාකරණය කරලා ගොවියාට ලබා දුන්නා. විශේෂයෙන්ම අපේ කලාපයේ හම්බන්තොට ගත්තොත්, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළේ තියෙනවා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සහ මහවැලියෙනුත් යන දෙකෙන්ම ජලය සපයන තැන්. අසීරු තත්ත්වයන් ආවා. හැබැයි, ගොවියාගේ කුඹුරු අක්කරයක්වත් මැරෙන්න අපි ඉඩ හැරියේ නැහැ. කළමනාකරණය කරමින් ජලය ටික දුන්නා. තාක්ෂණය ගෙනාවා. නිලධාරින් ආවා. උදවු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තවත් ඉතාම වැදගත් කාරණයක් කියන්න ඕනෑ. මේ ගත වෙච්ච කන්න තුන හතරේදීම ඒ වගා කරපු ගොවියාගේ කුඹුරට විශේෂ වූ හානි - පළිබෝධ හානි වෙන්න පුළුවන් - වගාවට ඇතිවන විවිධ වූ තත්ත්වයන් කිසිවක් ඇති නොවී ඉතාම හොඳින් අස්වද්දන්න පුළුවන් වටපිටාව අපි හදලා දුන්නා, නිලධාරින් මැදිහත් වෙලා, දැනුම දීලා, තාක්ෂණය දීලා. ඉතිහාසයේ වැඩිම අස්වැන්න මහවැලි කලාපයේ අඟුණුකොළපැලැස්සේ ගොවියා වාර්තා කරනවා, හෙක්ටෙයාරයකින් කිලෝග්‍රෑම් 12,500ක් ලෙස. ලංකා ඉතිහාසයේ වැඩිම අස්වැන්න මහවැලිය වාර්තා කරනවා, මේ පසුගිය යල කන්නයේ. මෙන්න මේ තත්ත්වයට අපි ගෙනැල්ලා තියෙනවා.

ඊළඟට, වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය බලන්න. මේ ගොඩක් මහත්වරු කියන්න උත්සාහ කරනවා, වී මිලදී ගැනීම ආණ්ඩුව කළේ නැහැ කියලා. වහලා තිබුණු වී අලෙවි මණ්ඩල ගබඩා ටික අපි ඇරලා පිළිසකර කරලා වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කළා. වීවලට රුපියල් 120ක සහතික මිලක් දුන්නා. සහතික මිල දීලා ගොවියාට නිෂ්පාදනය අළෙවි කර ගන්න වැඩ පිළිවෙළක් හැදුවා. රජය මිලදී ගැනීම් කළා. අපි විශ්වාස කරනවා, ගොවියාගේ ඔක්කෝම වී ටික අපට මිලදී ගන්න බැරි වුණු බව. හැබැයි, කවදාවත් ආණ්ඩුවකට එය කරන්නත් බැරි වුණා. අපි එහෙම කරන්න ඕනෑත් නැහැ. මොකද, පෞද්ගලික අංශයක් තියෙන්න ඕනෑ. අපි මැදිහත් වෙන්නේ වෙළඳපොළ කළමනාකරණය සඳහා. මිල ස්ථාවර කර ගැනීම සඳහා තමයි රාජ්‍ය අංශය වී මිලදී ගැනීම් කරන්නේ. ඒ සඳහා අපි මැදිහත් වුණා. විශේෂයෙන් රුපියල් 120ට වී මිලදී ගැනීම සඳහා කටයුතු කරද්දී, හම්බන්තොට දිස්ත්‍රික්කය ගත්තොත්, 2026.08.31 දින වෙනකොට වී කිලෝග්‍රෑම් 3,904,877ක් මිලදී ගෙන තිබෙනවා. මේ වනකොට වී කිලෝග්‍රෑම් 3,904,877ක් මිල දී ගෙන තිබෙනවා, රජයේ වී ගබඩාවලට. කවදාවත් මෙච්චර ප්‍රමාණයක් මිලදී ගෙන නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ වාගේම අපි මුදල් වෙන් කළා, මේ සඳහා. මුදල් වෙන් කරලා වී අලෙවි මණ්ඩලය මඟින් මිලදී ගත්තා. වී අලෙවි මණ්ඩලයෙන් මිලදී ගැනීමට අමතරව අපට අතිරික්ත නිෂ්පාදනයක් තිබෙනවා. ඉතිහාසයේ වැඩිම නිෂ්පාදනය ආවාට පස්සේ ගොවියා රැක ගන්න, ගොවියාට උදවු කරන්න ඒ සඳහා මැදිහත් වෙන්න අපි විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා.

විපක්ෂයේ සමහර මහත්වරු කෑ ගහලා ගියා. ඉතිහාසයේ ගොවියා අමතක කළා. අපි අලුත්ම යෝජනාවක් දුන්නා, වී අලෙවි මණ්ඩලයට විතරක් මේක කරන්න බැහැ කියලා. එහෙනම්, අපි පෞද්ගලික අංශයේ ආයෝජකයන් මෙතැනට ගෙනෙන්න ඕනෑ. කුඩා පරිමාණයේ මෝල් හිමියන්, මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් එක්ක කථා කළා. දිස්ත්‍රික් ලේකම්තුමා මැදිහත් වුණා, නිලධාරින් මැදිහත් වුණා, ගොවි නායකයන් එක්ක කථා කළා, දේශපාලන අධිකාරිය මැදිහත් වුණා. යෝජනාවක් ගෙනාවා, පොලී නැතිව මහා භාණ්ඩාගාරයෙන් මුදලක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතිහාසයේ පළමුවැනි වතාවට කුඩා මෝල් හිමියන් 63කට අපි මුදල් ලබා දීලා තිබෙනවා, රුපියල් 120ට වී මිලදී ගැනීම සඳහා. මෙහෙම කළේ නැහැ, කිසිම ආණ්ඩුවක්. පැවති ආණ්ඩු ඒක ඇතුළේ බිස්නස් කළා, ඒක ඇතුළේ සේවකයන් පුරවලා ඒක කඩා වැට්ටුවා මිසක් ගොවියා වෙනුවෙන් සැලසුම් සකස් කළේ නැහැ. අපි ගොවියාගෙන් වී මිලදී ගන්න වී අලෙවි මණ්ඩලයේ වැඩ පිළිවෙළක් හැදුවා වාගේම ඒකට පෞද්ගලික අංශයත් සම්බන්ධ කළා. අදත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුදල් ඉතුරු වෙලා තිබෙනවා; වී කිලෝග්‍රෑම් 177,584ක් මිලදී ගන්න අපි වෙන් කරපු මුදල් තිබෙනවා. ඒ තත්ත්වයට අපි මේක ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා වී අලෙවි මණ්ඩලය සම්බන්ධයෙන් හෝ වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් විපක්ෂය නඟන මේ චෝදනා අසත්‍යයි. ඒවා මඩ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට අතිරේකව විනාඩි 2ක් ලබා දී තිබෙනවා. ඒ අනුව ඔබතුමාට තව විනාඩි 4ක කාලයක් තිබෙනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)

මේ විපක්ෂය නඟන චෝදනාත් එක්ක ඔවුන් උත්සාහ කළා, හම්බන්තොට ගොවියා පාරට බස්සන්න. විපක්ෂයේ ගොඩක් අය ගිහිල්ලා හම්බන්තොට ගොවියාත් එක්ක කථා කළා, "පාරට බහින්න, ඔබේ වී ටික විකුණා ගන්න බැහැ" කියලා. හැබැයි, ගොවීන් පාරට බස්සන්න බැරි වුණා. ගොවීන්ට ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. මොකද, ඒ ප්‍රශ්න අපිත් දන්නවා. අපිත් ඒ ප්‍රශ්න එක්ක ජීවත් වෙන මිනිස්සු. හැබැයි, ගොවියා සතුටින් ඉන්නවා. ගොවියා තෘප්තිමත් මේ ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව. ආණ්ඩුව මේ ප්‍රශ්න ටික විසඳනවා කියන විශ්වාසය ඔවුන්ට තිබුණා. ඒ නිසා විපක්ෂයට බැරි වුණා, ගොවීන් 100ක් පාරට බස්සවා ගන්න. අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙනවා. මේ යෝජනා ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න කියලා ගෙනාවට අද මුළු රටේම ගොවීන් බලාගෙන ඉන්නවා, මේ විවාදය දිහා. අද මුළු රටේම ගොවීන් ඉතාම සතුටින් ඉන්නවා, බිමේ ක්‍රියාත්මක වෙච්ච වැඩ පිළිවෙළ සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට පෙර කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ආණ්ඩුවට චෝදනා කළා. ඒ අය ටිකක් කලබල වෙලා තිබෙනවා. කලබල වෙන එක සාධාරණයි. මොකද, ඔවුන් දකිමින් ඉන්නවා ඔවුන්ගේ ඉතිහාසය සම්බන්ධයෙන් විවිධ වූ විමර්ශන සිදු වෙමින් තිබෙනවා කියලා. ඒ නිසා කලබල වෙන එක ටිකක් සාධාරණයි.

මේ අය යෝජනා ඉදිරිපත් කළත් අපට චෝදනා කිහිපයකුත් කළා, බෞද්ධාගම සම්බන්ධයෙන්. ඒ මහත්වරු හිතාගෙන ඉන්නේ එයාලා විතරක් බෞද්ධයි කියලාද? එතකොට අපි බෞද්ධ නොවෙයිද? අපි ඇත්ත බෞද්ධයෝ. ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට, බෞද්ධාගමට මොනවා හරි හානියක් වෙනවා නම්, අපේ හදවතෙත් කැක්කුමක් තිබෙනවා. ඔය බොරු පිරිත් නූල් අතේ ගැට ගහ ගත්ත, නිධන් හාරපු, පන්සල්වල සිවුර තුළ රඳවිලා ඉඳගෙන අපරාධවලට සැහවුණු මහත්වරුන් දැන් මේ හාමුදුරුවන්ගේ සමහර නඩු තීන්දු සම්බන්ධයෙන් කථා කරනවා. අපට කම්පනයක් තිබෙනවා. ඒ තීන්දුව දීලා තිබෙන්නේ අධිකරණයෙන්. හාමුදුරුවන්ගේ සිවුර ඉවත් කරනවාද නැද්ද, ජම්පරය අන්දනවාද නැද්ද කියලා තීරණය කරන්නේ ආණ්ඩුව නොවෙයි. ඒක විපක්ෂයේ මහත්වරු තේරුම් ගන්න ඕනෑ. ඒක තීන්දු කරන්නේ අධිකරණය. ඒක තීන්දු කරන්නේ බන්ධනාගාරයෙන්. ඒකට නීතියක් තිබෙනවා. ඒ නිසා බොරු බෞද්ධයෝ උත්සාහ කරමින් ඉන්නවා, බෞද්ධ විරෝධී කියලා මතයක් හදමින් පන්සල් හරහා නැවත බලය ගන්න කටයුතු කරන්න. නැහැ, රටේ මිනිස්සුත් දන්නවා, පන්සල්වල ස්වාමීන් වහන්සේලාත් දන්නවා, මොවුන් තමයි මේ ජඩ වැඩ ඉතිහාසය පුරා කළේ කියලා. බෞද්ධාගමට කරන්න පුළුවන් නිග්‍රහ, අපහාස, මේ සියල්ල කරපු විපක්ෂයේ මහත්වරු තමයි දැන් ඇවිල්ලා අපට කියන්නේ. අපි බෞද්ධයෝ. ඒ වාගේම මෙතැන ඉන්නවා, අනෙකුත් ආගම්වල අය. අපි හැමෝම ආගමික වටපිටාවක් ඇතුළේ හැදුණු අය. ඒ නිසා අපට ආගම් පිළිබඳ වෙන ප්‍රශ්නයක් නැහැ. අපි හැමෝටම තිබෙන්නේ ගෞරවයක්. ඒ නිසා මේක ඇතුළේ සැඟවෙන්න හදන මහත්වරුන්ට අපි උත්තරයක් දෙනවා.

ඒ වාගේම දේශපාලන පළිගැනීම් ගැනත් කියනවා. අපේ ආණ්ඩුවට දේශපාලන පළිගැනීම් කරන්න කිසිදු අවශ්‍යතාවක් නැහැ. මොකද, ඔය කථා කරන හැම මහත්මයෙකුටම විරුද්ධව අපරාධ චෝදනා තිබෙනවා. ඒවා දේශපාලන පළිගැනීම් නොවෙයි. ඒවා සම්බන්ධයෙන් මේ වන විට නීතිය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. නීතිය ක්‍රියාත්මක කරන විට ඔවුන් උත්සාහ කරනවා, ඒවා දේශපාලන පළිගැනීම් කියලා කියන්න. ඒ නිසා මේ මහත්වරුන්ට ඕනෑම කථාවක් කියන්න පුළුවන්, ඕනෑම ප්‍රකාශයක් කරන්න පුළුවන්. නමුත්, මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නේ මේ අපරාධවලට නීතිය ක්‍රියාත්මක කරන තුරුයි. ඒ නිසා මේ මහත්වරුන් දැන් කලබල වෙලා තිබෙනවා. මේ පිළිබඳව කථා කරද්දි විපක්ෂයේ හැම පක්ෂයකම මහත්වරුන් ඇවිල්ලා වටේ පුටුවල වාඩිවෙලා තමයි ඒ අයට රැකවරණය දුන්නේ. අපි ඒ මහත්වරුන්ට කියනවා, මෙතැනදි වටකරගෙන රැකවරණය ලබා දුන්නත්, එළියේ නීතිය ක්‍රියාත්මක වන බව. එළියේ නීතිය ක්‍රියාත්මක වන දවසට ඔය හැමෝටම නීතිය ඉස්සරහ දඬුවම් විඳින්න සිදුවන බවත් මම මතක් කරනවා. ඒ, ඇයි? මේ රට දූප්පත් කළා. මේ රටේ ගොවියාටත්, ගොවියාගේ දරුවාටත් අනාගතයක් නැති කළා.

මෙතුමන්ලා උපාධිධාරීන් පිළිබඳවත් කථා කළා. උපාධිධාරීන්ගේ ඔළු පළලා, උපාධිධාරීන්ට ගහලා පන්නා දැමූ ඉතිහාසයක් තිබෙන මහත්වරුන් අද කියනවා, උපාධිධාරීන්ට වග කියනවා කියලා. උපාධිධාරීන් ඇතුළු තරුණ තරුණියන් 120,000කට රැකියා ලබා දෙන්න අපේ ආණ්ඩුව සැලසුම් කර තිබෙනවා. ඒ වාගේම තවත් මාස කිහිපයක් ඇතුළත 25,000කට ආසන්න උපාධිධාරීන් පිරිසක් ගුරුවරුන් විධියට බඳවා ගැනීමටත් අපි කටයුතු කරනවා. එම නිසා උපාධිධාරීන් පිළිබඳව කයිවාරු ගැහුවත්, මැතිවරණයෙන් පසුව තමන්ගේ කාර්යාලවල තිබුණු උපාධිධාරීන්ගේ රැකියා applications ලක්ෂ ගණනක් පුච්චපු විපක්ෂ දේශපාලනඥයින් ඇවිල්ලා ආණ්ඩුවට කියනවා, මේ ආණ්ඩුව තරුණයින්ට රැකියා ලබා දෙන්නේ නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த சௌனரத்)
(The Hon. Aravinda Senarath)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

උපාධිධාරීන්ට රැකියා ලබා දෙන එක අපේ වගකීමක්. ඒ සම්බන්ධයෙන් විපක්ෂය දඟලන්න අවශ්‍ය නැහැ. විපක්ෂයට අවශ්‍ය නම්, voice-cut එකක් දීලා පොඩි ප්‍රචාරණයක් ලබා ගත්තාට කමක් නැහැ.

අපි උපාධිධාරීන්ගේ ප්‍රශ්නයත් විසඳනවා, තරුණයන්ගේ ප්‍රශ්නයත් විසඳනවා, ගොවීන්ගේ ප්‍රශ්නයත් විසඳනවා. මේක තමයි ගොවියාගේ හොඳම කාලය; ස්වර්ණමය යුගය. ඉදිරි අවුරුදු දෙක තුන ඇතුළත ගොවීන්ගේ මේ ප්‍රශ්න ටික විසඳා, සැබෑ ආර්ථික ශක්තියක් ඇති ගොවි ජනතාවක් බිහි කිරීමට මේ ආණ්ඩුව සූදානම් කියන පණිවුඩය ලබා දෙමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.41]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගොවියාගේ ස්වර්ණමය යුගය පිළිබඳව අද රජයෙන් කරුණු කාරණා ඉදිරිපත් වනවා. ගොවියාගේ ස්වර්ණමය යුගයලු, එය ක්‍රියාත්මක වනවාලු, ඒ පිළිබඳව ගොවියා ඉතාම සතුටින්ලු ඉන්නේ. ඉතින් මම කියන්න කැමැතියි, කුඹුරට බැහැලා ගොයම් කකා, වී කිලෝවකට රුපියල් 150ක් දෙනවා යැයි කියපු එවකට විපක්ෂයේ සිටි ප්‍රධානියකු අද ඇමතිකම් ලබා ගත්තායින් පසුව ප්‍රමුඛස්ථානය ලබා දෙන්නේ වී කිලෝවකට රුපියල් 150ක් ලබා දෙන්න නොවෙයි, වඳුරන් ගණන් කිරීමටයි කියලා. මෙන්න, රජයේ ප්‍රමුඛස්ථානය; මෙන්න, රජයේ ප්‍රමුඛතාව. මොකක්ද, මෙහි ඇත්ත තත්ත්වය?

ජනතා විමුක්ති පෙරමුණු රජයේ ජනාධිපතිවරයා ඇතුළු පිරිස ටොන් පව දේශපාලනය ක්‍රියාත්මක කරමින් ගොවියාව හොඳටම රැවැට්ටුවා. ගොවියාව ඇන්දුවා, ගොවියාට බොරු කිව්වා. මම එහෙම කියනකොට එහා පැත්තේ මන්ත්‍රීවරුන් හිනාවෙනවා. ජනාධිපතිවරයා රට වටේ ටොන් පව දේශපාලනය කරගෙන යනකොටයි ඔබ හිනාවෙන්න ඕනෑ. එහෙම යනකොට ඔහු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

විශේෂත්වයක් කරනවා, කෘෂිකාර්මික ප්‍රදේශවලට කෘෂිකර්ම ඇමතිවරයාටත් එන්න තහනම්, නියෝජ්‍ය ඇමතිවරයාටත් එන්න තහනම්. ඔන්න, තරම. ඔන්න, ආණ්ඩුවේ තරම. තම තමන් වටේ ඉන්න දේශපාලන ගෝලබාලයන් කිහිපදෙනකු අතරට නොවෙයි, ඔබට පුළුවන්ද, සැබෑ ගොවීන්, මහ පොළොවේ ගොවීන්, පොඩි මිනිසුන් අතරට ගිහිල්ලා එක ප්‍රශ්නයක් හෝ අහන්න? ඔවුන් ඔබ පිළිබඳව සෑහීමකට පත් වනවාද? ජනතා විමුක්ති පෙරමුණු රජයේ ගොවියාගේ පුතා ජනාධිපති කළායින් පසුව, අද මේ රටේ වී ගොවිතැනේ නියැළී සිටින ගොවියාට තම අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලැබුණාද කියන අභියෝගය භාරගන්න සූදානම්ද? ගිහිල්ලා ඒක අහනවාද? ඒක කරන්න බැහැ. ඒක කරන්න බැරි ඇයි? වී කිලෝවක් නිෂ්පාදනය කිරීමට වැය වන මිල පිළිබඳව ඔබගේම නිර්මාණයක් තුළ ඔබ අංක ගණිත ජිල්මාට් එකක් කළා. ලාල් කාන්ත ඇමතිවරයාම මේ සභාවට ඇවිල්ලා කිව්වා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් යනවා කියලා. අපි විශ්වාස කරනවා, එතුමා ඒ ප්‍රකාශය කළේ හොඳ සිහියෙන් ඉඳගෙනයි කියලා. ඒ නිලධාරින් ලබා දුන් සත්‍යවාදී සංඛ්‍යාලේඛන උපයෝගී කරගෙන, ඒ කියන්නේ වී කිලෝවකට රුපියල් 106කුත්, සියයට 30ක ලාභයකුත් එකතු කළාම වී කිලෝ එකකට රුපියල් 137යි, 140යි අතර ලැබෙන ගණන ඔබ සහතික මිල ලෙස නියම කළා. එහෙම නම් අද වනකොට වී කිලෝ එකකට රුපියල් 140ක ස්ථාවර මිලක්, සහතික මිලක් දෙන්න ඕනෑ. නමුත් ඔබ කරන්නේ මොකක්ද? වී කිලෝවක් නිපදවන්නට රුපියල් 137ක් යනවාය කියන එක දැන දැන, හිතාමතාම හැම වී කිලෝවකින්ම ගොවියාට රුපියල් 17ක් පාඩු කරලා වී කිලෝ එකකට රුපියල් 120ක සහතික මිලක් නියම කරනවා. ඒ කොහොමද රුපියල් 120ක සහතික මිලක් නිර්මාණය කරන්නේ? නිලධාරින් ලවා බොරුවට වියදම ලෙස රුපියල් 93ක් පෙන්වා, ඒකට සියයට 30ක ලාභාංශ එකතු කරලා රුපියල් 120ක් ලබා දෙනවාය කියන ජිල්මාට් සූත්‍රය හරහා තමයි මේ රටේ ගොවියාව ඔබ අනාථ කරන්නේ. ඒ, එක පැත්තකින්. අනෙක් පැත්තෙන් මොකක්ද කරන්නේ?

අපේ රටේ දළ වශයෙන් හාල් මෙට්‍රික් ටොන් තිස්හතර ලක්ෂයක් පමණ නිපදවෙනවා. ඉල්ලුම විසිපන් ලක්ෂයයි. මෙට්‍රික් ටොන් නව ලක්ෂයක අතිරික්තයක් තිබෙනවා. අතුරු නිෂ්පාදනවලට, වෙනත් අවශ්‍යතාවලට භාර ලක්ෂයක් ගියාය කියා අපි හිතමු. එතකොටත් මෙට්‍රික් ටොන් ලක්ෂ පහක අතිරික්තයක් තිබෙනවා. එහෙව් අතිරික්තයක් තිබෙන අපේ රටේ මොකක්ද කරන්නේ? ජනතාවාදී, ජනහිතකාමී, ගොවියාට ආදරේ කරන ආණ්ඩුව හාල් ආනයනය කරනවා. මෙන්න පොඩ්ඩක් අහගන්න, හාල් ආනයනය කිරීම ගැන එදා කිව්ව දේ. පොඩ්ඩක් අහගන්නකෝ.

***(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්නට සලස්වන ලදී.)***
***(இவ்வேளையில் ஒலிப்பதிவொன்று ஒலிக்கவிடப்பட்டது.)***
*(At this stage, an audio recording was played.)*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමනි, විද්‍යුත් උපකරණ භාවිත කරන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ආ, හොඳයි. මම කියන්නම්, එහෙම නම්. *[බාධා කිරීම්]* හරි, හොඳයි, මම කියන්නම් එහෙම නම්. මොකක්ද කියන්නේ? අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා එදා විපක්ෂයේ ඉන්නකොට කියනවා, "හාල් ආනයනය කරනවාය කියන්නේ අනිවාර්යයෙන්ම හොරකම, කොමිස් ගැසීම, පගා ගැසීම ක්‍රියාත්මක කිරීමයි" කියලා. එතුමා විතරක් නොවෙයි, නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න මැතිතුමාත් එහෙම කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, මම වෙලාව ගන්නවා. ප්‍රශ්නයක් නැහැ. මම විපක්ෂ නායක. *[බාධා කිරීම්]* එතුමිය මේ ගැන දන්නේ නැහැ නේ. සම්ප්‍රදායයක් තිබෙනවා, විපක්ෂ නායකවරයාට කාලය අරගෙන කථා කරන්න පුළුවන්. ඔබතුමිය ඒ සම්ප්‍රදාය අවබෝධ කරගන්න. ඒකයි මම කිව්වේ. තනතුර නොදන්නා නිසායි මම ඔබතුමියට තනතුර කිව්වේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමා කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නාමල් කරුණාරත්න මැතිතුමා මොනවාද කිව්වේ? එතුමා කියනවා, "රටේ ගොවිතැන කඩා වට්ටලා, රටින් හාල් ගෙනෙනවා. ගෙනෙන එක ඇතුළේ කොමිස් ගහනවා. කොමිස් ගහන්න නම් රටින් ගෙනෙන්න ඕනෑ. රටින් ගෙනෙන්න නම් රටේ හිඟයක් ඇති කරන්න ඕනෑ. හිඟයක් ඇති කරන්න නම් ගොවියාට කෙළවන්න ඕනෑ. දැන් ගොවියාට කෙළවලා. මෙයාලා රටින් හාල් ගේනවා. රටින් ගෙනැල්ලා මෙහෙන් උදන් අනනවා" කියලා. මෙහෙම කිව්වේ විපක්ෂයේ ඉන්නකොට.

මම ඔබෙන් මේ කාරණය අහන්න කැමැතියි. ඔබත් රටින් හාල් ගෙන්නුවා, 2025 වර්ෂයේදී මෙට්‍රික් ටොන් එක්ලක්ෂ හැටහත්දහසක්. ඒක කළේත් ගොවියා නැති කරන්න නේද? 2026 වර්ෂයේ මෙට්‍රික් ටොන් එක්ලක්ෂ පනස්නවදහසක් ගෙන්නුවා. එහෙම ආනයනය කළේත් ගොවියා නැති කරන්න නේද? මම පැහැදිලිවම කියන්න කැමැතියි, මේ කරුණු කාරණා සියල්ලක්ම අපි නිර්මාණය කරපු ඒවා නොවෙයි කියලා. ඒ සම්බන්ධයෙන් videos තිබෙනවා. එතුමාම ප්‍රකාශ කරපුවා තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය කියනවා, ඒවා ප්‍රචාරය කරන්න එපාය කියලා. ඒකට මම ගරු කරනවා. හැබැයි, ඒ කියපු දේවල් ඔක්කෝම ඇතුළත් ලේඛනයක් හැමෝගෙම දැනගැනීම සඳහා මම **සභාගත*** කරනවා.

අපි විශේෂයෙන්ම කළ යුත්තේ මොකක්ද? අපි කළ යුත්තේ මේ රටේ ගොවියා තාක්ෂණයෙන්, සුහුරු ක්‍රමවේද තුළින්, නව උපක්‍රම තුළින් ශක්තිමත් කරවා, දැනුමෙන් සන්නද්ධ කරලා, ගොවියාට ලබා දෙන්න පුළුවන් උපරිම සහනය ලබා දීමයි.

මේ, කන කර බඩු උකස් කරලා ගොවිතැනේ නියැළෙන ගොවියා. අද වනවිට ඉන්ධන මිල ඉහළ ගිහිල්ලා, පොහොර මිල ඉහළ ගිහිල්ලා, පළිබෝධ නාශක මිල ඉහළ ගිහිල්ලා, උපකරණ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කුලිය ඉහළ ගිහිල්ලා. ඒ සියල්ලටම වඩා අලි-මිනිස් ගැටුම හරස් වෙලා ජීවිත හානි සිද්ධ වෙනවා. සතුන්ටත් හානි සිද්ධ වෙනවා. වගා හානි, දේපළ හානි මේ හැම දෙයක්ම සිද්ධ වෙලා ගොවියා බොහොම නරක තත්ත්වයකට පත් වෙලා සිටින මොහොතක්, මේ. ඇත්තවශයෙන්ම මේ ආණ්ඩුව යන්නේත් පසුගිය ආණ්ඩුව ගිය පාරේ. පසුගිය ආණ්ඩුව තමයි කාබනික පොහොර සූත්‍රය ගෙනැල්ලා ගොවියා ඉවර කළේ. අද ගොවියාට නිෂ්පාදන කටයුතු කරන්න කියලා කුඹුරට බැහැලා වී කිලෝවක් රුපියල් 150කට මිලදී ගන්නවා කියලා, රුපියල් 150ක මිල රුපියල් 120ට බස්සලා මේ ආණ්ඩුව කරන්නේත් වෙනත් ක්‍රමයකට ගොවියා ඉවර කරන එකයි. පසුගිය ආණ්ඩුව අසූචි පොහොර ගෙනැල්ලා, ජරා පොහොර ගෙනැල්ලා, කාබනික පොහොර සූත්‍රය ගෙනැල්ලා ගොවියා ඉවර කළා. ඔබතුමන්ලා කුඹුරට බැහැලා වී කිලෝවකට රුපියල් 150ක මිලක් ලබා දෙනවා කියලා බොරු කියලා, ටොන් පව කියලා, වී කිලෝවක් රුපියල් 120ට ගන්නවා කිව්වාට දැන් ඒකවත් කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මේ රටේ හොඳට අධ්‍යාපනය ලබපු, උපාධිය ලබපු දරුවෝ 80,000කට වැඩි ප්‍රමාණයක් අද වනකොට රැකියා නැතිව ඉන්නවා. අද ඒ අය මහ පාරේ ඉන්නේ. පාසල්වල සේවය කරන සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට ගන්නවා කියලා පොරොන්දු වුණා. උපාධිධාරීන්ගේ රැකියා ටික ලබා දීම පසුගිය ආණ්ඩුව ක්‍රියාත්මක කළේත් නැහැ, මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්නේත් නැහැ. ඒ අයව තමන්ගේ දේශපාලන ව්‍යාපෘතිවලට පාවිච්චි කළා.

අද අපේ රටේ රෝහල්වල බරපතළ ඖෂධ හිඟයක් තිබෙනවා. අද රජයේ රෝහල්වලින් චිට් එක දෙනවා, පිටින් ගිහිල්ලා බෙහෙත් ටික ගන්න කියලා. පසුගිය ආණ්ඩුව බාල බෙහෙත් ගෙනැල්ලා මේ රටේ ජනතාව මරණ මංචකය කරා ගෙන ගියා. ඒ ඖෂධ මාෆියාවන් එක්ක එකතු වෙලා බාල බෙහෙත් ගෙනැල්ලා, මේ රටේ දරුවෝ ඇතුළු වැඩිහිටියන් ඇත්තවශයෙන්ම බරපතළ තත්ත්වයකට පත් කළා. ඖෂධ හිඟයට විසඳුමක් ලබා දෙන්නට බැරිව වර්තමාන රජය අද වෙනත් ආකාරයකින් නිදහස් සෞඛ්‍ය ආරක්ෂා කරනවා කියන headline එක ගහලා, රජයේ රෝහල් හරහා චිට් එක දෙනවා, ගිහිල්ලා private pharmacy එකකින් බෙහෙත් ගන්න කියලා. සමහර බෙහෙත් එතැනත් නැහැ. ඇත්තවශයෙන්ම අපේ චමල් සංජීව මැතිතුමා අපේ සිවිල් ක්‍රියාකාරිකයෙක් හැටියටත්, අපේ පක්ෂයේ සාමාජිකයෙක් හැටියටත් මේ රටේ ඖෂධ ක්ෂේත්‍රයේ සිදු වන ඒ හොරකම, වංචාව සහ දූෂණය ඇතුළු ඖෂධ හිඟය පිළිබඳව බොහොම හොඳින් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා.

අවසාන වශයෙන් මම තව කාරණාවක් කියන්නට ඕනෑ. මෙක ඉතාම වැදගත් කාරණාවක්. මේ රටේ බුද්ධ ශාසන අමාත්‍යාංශය බිහි කළේ දිවංගත මගේ පියාණන් වන රණසිංහ ප්‍රේමදාස මැතිතුමා. ඒ වාගේම, ජේ.ආර්. ජයවර්ධන ශ්‍රීමතාණන්ගේ නායකත්වයෙන් නිර්මාණය වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සම්බුද්ධ ශාසනයට ප්‍රමුඛස්ථානය ලබා දෙනවා. එතැනින් නතර වෙන්නේ නැහැ. සම්බුද්ධ ශාසනය සුරක්ෂා කරනවා සේම අනෙකුත් සියලුම ආගම්, අනෙකුත් සියලුම සංස්කෘතීන්, අනෙකුත් සියලුම ජන කොට්ඨාසවල අනන්‍යතාව, අන්‍යෝන්‍යභාවය සුරක්ෂිත කරමින්, ඒ අයගේ ආගමික නිදහස, සංස්කෘතික නිදහස - ඒ සියල්ලක්ම - සුරක්ෂිත වන, සැබැවින්ම සංහිඳියාව, සහභාගීත්වය සහ සහයෝගීතාව නිර්මාණය වුණු රටක් බිහි වුණා. අපේ මාතෘ භූමිය තුළ සම්බුද්ධ ශාසනයට මුල්තැන ලබා දෙමින්, අනෙකුත් සියලුම ආගම්, සංස්කෘතීන්වලට ලැබිය යුතු ශක්තිය හා ස්ථාවරය ලබා දිය යුතුයි කියන එක අපේ මතයයි, අපේ චින්තනයයි, අපේ වැඩ පිළිවෙළයි. විශේෂයෙන්ම අපි අවබෝධ කරගන්න ඕනෑ, ආගමික නායකයින්ගේ ගරුත්වය පිළිබඳව. පුද්ගලයෝ පොඩ්ඩක් අමතක කරන්න. විශේෂයෙන්ම චීවරයට සහ අනෙකුත් ආගමික නායකයින් ඒ ආගමේ අන්‍යෝන්‍යභාවය විදහා දක්වන ඇඳුමට අපි නිසි ගරුත්වය ලබා දෙන්න ඕනෑ.

මම විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රෙගුලාසියක් තිබෙනවාලු, 550 කියලා. වරදකරු කරනු ලැබූ සිරකරුවන් බන්ධනාගාර ඇඳුමෙන්ම උසාවියට ඉදිරිපත් නොකළ යුතුය කියලා වගන්තියක් පැහැදිලිවම තිබෙනවා. මේ අවස්ථාවේදී අපි රජයෙන් ඉල්ලීමක් කරනවා. අපි කථා කරන්නේ නඩු තීන්දු ගැන නොවෙයි. අපි කථා කරන්නේ නඩු තීන්දුවල හරි වැරදි ගැන නොවෙයි. අපි මේ යෝජනා කරන දේ හැම ආගමකටම, හැම ආගමික නායකයෙකුටම වලංගු වන දෙයක් මිසක්, එක ආගමකට විතරක් වලංගු වන දෙයක් නොවෙයි. අපි සංවේදී - sensitive - වෙන්නට ඕනෑ. අපි මේ කාරණය අවබෝධ කරගන්නට ඕනෑ. චීවරයට නිග්‍රහ කරන්න බැහැ. එහෙම චීවරය ඉවත් කරනවාද, නැද්ද කියන එක ඒ ආගමික නායකත්වය තීන්දු කළ යුතු දෙයක්. අනෙකුත් ආගම්වලටත් ඒක වලංගුයි. අන්න එහෙමයි ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කියන්න කැමතියි, බන්ධනාගාර ආඥාපනතේ 216වැනි වගන්තිය අනුව එහෙම චීවරය හෝ වෙනත් ආගමික නායකයින්ට අන්‍යෝන්‍ය වූ නිල ඇඳුම හෝ වස්ත්‍රය ඉවත් කරන්න බැහැ කියන එක. ඒක වැරදියි. ඒකෙන් රටට වැරදි පණිවුඩයක් යනවා. ආගම, ධර්මය, සංස්කෘතිය ගැන කථා කරනකොට, කුමන ආගමක් වේවා, කුමන සංස්කෘතියක් වේවා අපි ඒවා ගැන සංවේදී වෙන්නට ඕනෑ. මම කථා කරන්නේ පුද්ගලයින් ගැන නොවෙයි, බෞද්ධ චීවරය ගැන. බුද්ධ ශාසනයට මුල්තැන ලබා දෙන, අනෙකුත් ආගම් සහ අනෙකුත් සංස්කෘතීන් සුරක්ෂිත කරන - අපේ රටේ පුද්ගලයින් පැත්තකින් තියලා - ආගමට, ධර්මයට ගරුත්වයක් හැටියට, පසුගිය දවසේ සිදු වුණු ක්‍රියාවලිය නැවතත් සිදු නොවන්නට අපි වගබලා ගන්නට ඕනෑ. බෞද්ධාගමට පමණක් නොවෙයි, අනෙකුත් සියලුම ආගම්වලටත් ඒ රීතිය වෙනස්කොට ක්‍රියාත්මක කිරීම සංහිඳියාවේ නාමයෙන්, එකමුතුභාවයේ නාමයෙන් යෝග්‍යයි කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ලබා ගත් අතිරේක විනාඩි 8ක කාලය විපක්ෂයේ අනෙක් කථිකයින්ගේ වෙලාවෙන් අඩු වන බවත් මම සඳහන් කරන්න කැමැතියි.

ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.57]

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය කාලයේ මේ රටේ ගොවියෝ පාරේ අරගළ කරද්දී, තමන්ගේ වගා බිම්වලට ජලය සපයා ගන්න බැරිව සිටියදී, අදාළ ඉදිකිරීම් සිදු නොකරද්දී, තමන්ගේම දිස්ත්‍රික්කයේ බී ලූනු බීජ ගොවියාට ආණ්ඩුව පොලු තියද්දී, බඩ ඉරිඟු ගොවියාට රජය පොලු තියද්දී, වැලිමඩ අල ගොවියාට රජය පොලු තියද්දී, ගොවියෝ වස බීලා තමන්ගේ

[ගරු චන්දන තෙන්නකෝන් මහතා]

ජීවිත නැතිකර ගනිද්දි එදා ආණ්ඩුවේ ලොකු පුටුවල හිටපු අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හිටියා. හැබැයි, අද ඒ අය විපක්ෂයට ඇවිල්ලා ගොවියෝ වෙනුවෙන් ටිකක් හයියෙන් කෑ ගහනවා, තමන්ගේ දේශපාලන වාසිය සඳහා. හැබැයි, අද මේ ආණ්ඩුව නියෝජනය කරන්නේ ඇත්ත ගොවියෝ, ඇත්ත ගොවි නායකයින්. ඒ නිසා අපි ගොවි ජනතාවට කියනවා, අප රජයක් විධියට ඔබේ ඇත්ත ප්‍රශ්නය හඳුනාගෙන තිබෙන බව, ඒ ඇත්ත ප්‍රශ්නයට අදාළ විද්‍යාත්මක විසඳුම් ලබා දෙමින් තිබෙන බව. ඒ සම්බන්ධයෙන් ඔබට අවබෝධයක් තිබෙනවා කියාත් අපි විශ්වාස කරනවා.

අපේ රටේ 7,949,751ක් වෙච්ච වැඩ කරන ජනගහනයෙන් - ශ්‍රම බලකායෙන් - සියයට 26ක් පමණ නියෝජනය කරන්නේ ගොවි ජනතාවයි. ඒ වාගේම ශ්‍රම බලකාය ගත්තාම, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් සියයට 56ක්, මොනරාගල දිස්ත්‍රික්කයෙන් සියයට 53ක්, මන්නාරම දිස්ත්‍රික්කයෙන් සියයට 52ක්, අනුරාධපුරය දිස්ත්‍රික්කයෙන් සියයට 52ක් සහ මුලතිව් දිස්ත්‍රික්කයෙන් සියයට 51ක් නියෝජනය කරන්නේ ගොවි ජනතාවයි. විපක්ෂය කියන නිසා නොවෙයි, මේ රටේ ග්‍රාමීය ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහාත්, අපේ රටේ ශ්‍රම බලකායෙන් බහුතරයක් නියෝජනය කරන ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහාත් ආණ්ඩුව විශාල කැපවීමකින් කටයුතු කරනවා.

අපේ රටේ කෘෂි කර්මාන්තයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ඉහළ නිෂ්පාදන වියදමක් තිබීම. අනෙක් පැත්තෙන් ඵලදායීතාව අඩුවෙලා තිබෙනවා. ඒ, පසුගිය අවුරුදු ගණනාවක් තිස්සේ ඔබතුමන්ලා මේ රටේ කෘෂි කර්මාන්තය ගෙනාපු තැන. ඒ නිසා අපි රජයක් විධියට සැලසුම් කර තිබෙනවා, මේ ප්‍රධාන ප්‍රශ්න දෙකට අදාළ විසඳුම් දීලා අපේ රටේ කෘෂි කර්මාන්තය විද්‍යාවෙන්, තාක්ෂණයෙන් ඔප් නැංවුණු, වැඩි ඵලදායීතාවක් සහිත කෘෂි කර්මාන්තයක් බවට පත් කරන්න.

අපි දන්නවා, පසුගිය කාලයේ මේ රටේ පොහොර සහනාධාරය ලබා දුන් ආකාරය. හෙක්ටෙයාරයට -අක්කර දෙකහමාරට- පොහොර සහනාධාරය වශයෙන් ලැබුණේ රුපියල් 15,000යි. අපේ නව රජය පත්වෙලා හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක පොහොර සහනාධාරයක් ලබා දී තිබෙනවා. මේක හෙක්ටෙයාර දෙක දක්වා ගොවීන්ට ලබා දෙනවා. ඒ වාගේම තමයි, පසුගිය කන්නයේ අපි අමතර ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ලෝකයේ තෙල් මිල ඉහළ ගියා. ඒ අනුව, කෘෂිකර්මය ආශ්‍රිත පොහොර මිල ඉහළ ගිහින් තිබෙනවා. හැබැයි, අපි රජයක් විධියට ගොවීන් වෙනුවෙන් ලබාදෙන පොහොර සහනාධාරය දෙගුණ කර දීලා, ඊට අමතරවත් ගොවීන් වෙනුවෙන් මැදිහත් වුණා. රජය විසින් පොහොර මෙට්‍රික්ටොන් 63,000ක් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අරගෙන රුපියල් 10,200 ගණනේ ගොවීන්ට පොහොර ලබා දුන්නා. ඒ සඳහා රජය විශාල වැය බරක් දරා තිබෙනවා. ඒ ගැන ගොවීන් දන්නවා. ඔවුන් අපහසුතාවට, අමාරුවට පත් වෙච්ච හැම අවස්ථාවකම මේ ආණ්ඩුව ගොවියා වෙනුවෙන් පෙනී සිටියා කියන අවබෝධය අපේ රටේ ගොවි ජනතාවට තිබෙනවා. පසුගිය කාලයේ යල කන්නයේ වැඩ කරන වෙලාවේ ඉන්ධන පිළිබඳ ප්‍රශ්නයක් ආවා. ඒ වෙලාවේ රජය මැදිහත් වෙලා ගොවීන්ට සී සෑම සඳහා සහ ඒ නිෂ්පාදන කාර්යයන්ට දායක වීම සඳහා අවශ්‍ය අමතර ඉන්ධන ලබා දෙන්න කටයුතු කළා.

ඒ වාගේම තමයි, පසුගිය කාලයේ මේ රටේ විශාලම ස්වාභාවික අනතුර සිද්ධ වුණා. ගොවීන් වගා කරලා දවස් 7යි, 8යි, මහා වර්ෂාවක් ඇවිල්ලා අපේ රටේ වාරි පද්ධතිය පිටාර ගැලුවා. අපේ රටේ වගා බිම් විශාල ප්‍රමාණයක් විනාශ වුණා. හැබැයි, අපි වගකිවයුතු රජයක් විධියට මේ සියලු ගොවීන් වෙනුවෙන් මැදිහත් වුණා. විනාශ වෙලා ගිය වාරි පද්ධතිය අපි කඩිනමින් සකස් කළා. ඒ වාගේම තමයි, ගොවීන්ගේ විනාශ වෙච්ච සියලු භවභෝග වෙනුවෙන් රජය ඓතිහාසික විධියට වන්දි ගෙව්වා. දවස් 7ක්, 8ක්, 10ක් ගත වෙච්ච වී වගාව වෙනුවෙන් හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක වන්දියක් අපි ගෙව්වා. ඉතිහාසයේ පළමු වතාවට එළවලු ගොවියාට, පලතුරු ගොවියාට, ඒ වාගේම පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු ගොවීන්ට රජයෙන් වන්දි ගෙවලා, අපේ රටේ ගොවි ජනතාව රැක බලා ගත්තා. ඒ නිසා අපේ රටේ ගොවි ජනතාවට අවබෝධයක් තිබෙනවා වර්තමානයේ පත්වෙලා ඉන්න ආණ්ඩුව තමයි සැබෑ ගොවියා නියෝජනය කරන ආණ්ඩුව කියලා. ගොවීන් අසරණ වූ හැම වෙලාවේම ඒ අය රැකබලා ගන්නා ආණ්ඩුව මේකයි කියන එක අපේ රටේ ගොවි ජනතාව දන්නවා.

අපි දන්නවා, වී මිලදී ගැනීම සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් තිබෙන බව. හැබැයි, අපි රජය විධියට සහතික මිලක් නිකුත් කළා. සහතික මිල නිකුත් කර රජය බලාගෙන සිටියේ නැහැ. රජයෙන් වී මිලදී ගන්නට වැඩසටහනක් සකස් කර තිබෙනවා. අපි දන්නවා, වී අලෙවි මණ්ඩලය වසා දමා එයට ස්වාභාවික මරණයක් අත්පත් වෙන්න අත්හැර තිබුණේ කියලා. හැබැයි, අපි බලයට ඇවිල්ලා ගබඩා සුද්ධ කරලා, ගබඩා පිළිසකර කරලා, ගබඩා ටික හදලා වී අලෙවි මණ්ඩලය නැවත සක්‍රිය කරලා වී මිලදී ගන්න පටන්ගත්තා. ඒ සඳහා අපි පළමුවෙන්ම රුපියල් මිලියන 6,000ක් වෙන් කළා. නැවතත් රුපියල් මිලියන 2,500ක් වෙන් කරලා ගොවීන්ගේ වී මිලදී ගන්න රජය විශාල මැදිහත්වීමක් කළා. ඊට අමතරව අපේ සුළු, මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට රජය විසින් මාස 8ක ණයක් දීලා තිබෙනවා අපේ රටේ ගොවි ජනතාවගේ වී සහතික මිලට ගන්න. ඒ සඳහා රුපියල් මිලියන 7,500ක මුදලක් වෙන් කර තිබෙනවා. අපේ වී ගොවිතැනේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අපේ වාරි කර්මාන්තයේ දුර්වලකම. ඒක තේරුම් ගත් අපේ රජය පසුගිය අය වැයෙන් රුපියල් මිලියන 91,000කට වැඩි මුදලක් වාරි කර්මාන්තය පිළිසකර කරන්න වෙන් කර තිබෙනවා. විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තොත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් රුපියල් මිලියන 2,000කට වැඩි මුදලක් වියදම් කර වාරි ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩ විෂයයන් 200කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා රුපියල් මිලියන 800කට වැඩියෙන් මුදල් යොදවලා, විශාල වාරි ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙමින් යනවා. ඒ වාගේම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 1,750ක් වියදම් කරලා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් වාරි ව්‍යාපෘති 400ක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, ඈත ගම්වල ගොවීන් මුහුණ දෙන ප්‍රශ්න තිබෙනවා. සමහර වෙලාවට වැවේ සොරොව්ව කැඩිලා; ඇළ වේලි පද්ධතිය කැඩිලා; වැවේ bund එකෙන් වතුර leak වෙනවා. ඒ වාගේ විශාල ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ නිසා අපි ප්‍රජා ශක්ති වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් ව්‍යාපෘති 803ක්, රුපියල් මිලියන 865ක් වෙන් කරලා ක්‍රියාත්මක කරමින් යනවා.

ඒ වාගේම කෘෂිකර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නංවන්න අපි "යාය" වැඩසටහන හඳුන්වා දීලා තිබෙනවා. "යාය" වැඩසටහන යටතේ අපේ රටේ වී ගොවිතැනේ ඵලදායීතාව ඉහළ නංවන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ යටතේ කන්න එකට වගා කරන්න, එකම වී ප්‍රභේදය වගා කරන්න, නිවැරදිව බිම් සකස් කරන්න, ගැඹුරට සීසාන්න, කාබනික පොහොර භාවිත කරන්න,

ගුණාත්මක බීජ හඳුන්වා දෙන්න හා බීජ ප්‍රතිකාර හඳුන්වා දෙන්න, ඒ වාගේම වල් වී පාලනය, වල් පැළෑටි පාලනය, ජල කළමනාකරණය, රෝග, පළිබෝධ පාලනය වැනි ක්‍රමවේද ගොවීන්ට හඳුන්වා දීලා තිබෙනවා. අද AI මහත්වරු යායට බැහැලා, ගොවීන් එක්ක එකට එකතු වෙලා ඒ වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, අපේ රටේ කෘෂිකර්මාන්තයට තාක්ෂණය ගෙන එන්න මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපි වී ගබඩා පහසුකම් ශක්තිමත් කරලා තිබෙනවා. පසුගිය අය වැයෙන් වී වේළන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 500ක මුදලක් රජය වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ගොවීන්ගේ දත්ත පද්ධතිය අපි ශක්තිමත් කරලා තිබෙනවා. Farmernet.lk පද්ධතිය අපි ශක්තිමත් කරමින්, ගොවීන්ගේ දත්ත, වගා බිමේ තිබෙන දත්ත නිවැරදිව එකතු කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම කන්න සැලසුම් කරන්න කාලගුණික හා විද්‍යාත්මක තොරතුරු එකතු කර ගත්ත සැලැස්මක් අපි හදලා තිබෙනවා. දැන් මේ කන්නයේ -ඉදිරියේදී- එල් නිනෝ තත්ත්වයක් එනවාය කියලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
ඒ නිසා අපි ඒ කාලගුණික තොරතුරු අරගෙන, මේ සැරේ කන්න කලින් පටන්ගන්න අදාළ සැලසුම් හදලා තිබෙනවා. ඒ වාගේම 2026-2027 මහ කන්නය සඳහා හෙක්ටෙයාර ලක්ෂ 8ක් වගා කරයි කියලා ඇස්තමේන්තු කරලා තිබෙනවා. මෑතකදී කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා, ඒ සඳහා පොහොර මෙට්‍රික් ටොන් 20,000ක් මිලට ගන්න සහ වී ප්‍රශ්නය විසඳන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
ඒ වාගේ ගොඩක් කරුණු තිබෙනවා. අපට කියන්න තිබෙන්නේ මෙයයි. ගොවීන්ගේ ප්‍රශ්න දන්න, ගොවීන්ගේ ගැටලු හඳුනන ආණ්ඩුවක් පත්වෙලා තිබෙනවා, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට. අපේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය තිබෙන්නේ, ඇට පැකට් දෙකක් දීලා, උදැල්ලක් බෙදලා, මේ රටේ ගොවීන් සනසලා, සහනාධාර මානසිකත්වයක් ඇතුළේ ගොවීන් අරගෙන යන්න නොවෙයි. මේ රටේ ගොවීන් බලගන්වලා, ගොවීන් ව්‍යවසායකයන් බවට පත් කරන්න, විද්‍යාත්මක කෘෂිකර්මය අපේ බිමට, රටට ගෙන එන්න තමයි අපේ සැලැස්ම තිබෙන්නේ. ඒ වෙනුවෙන් රජය විශාල වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරමින් යනවා. අපි කියනවා, ගොවි ජනතාව ඉන්නේ අපිත් එක්කයි කියන එක. නිකවැරටියේ ගොවි ජනතාව හම්බ වෙන්න ලබන 11 වැනිදා ගරු ජනාධිපතිතුමා එනවා. ඔබතුමන්ලාට බලන්න පුළුවන්, ගොවියෝ කවුරුත් එක්කද ඉන්නේ කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.07]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ වෙළෙඳ ඇමතිතුමා සභාවේ ඉන්න නිසා මම මුලින්ම මේ කාරණය කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මීට මාස තුනකට කලින් මම අහපු කාරණයකට ඔබතුමා මෙතැනදී උත්තරයක් දුන්නා. මම කිව්වා, අල ගලවන්න කලින් tax එක ගහන්න කියලා, ගරු ඇමතිතුමනි. Tax එක ගැහුවා. හැබැයි ඔබතුමා කිව්වා, අල ගලවනකොට අල රුපියල් 300ට විකුණන්න හදනවාය කියලා. දැන් ඔබතුමාගේ වාහනය තිබෙනවා නම් අමාත්‍යාංශයේ, ගනිමු. ඔබතුමායි මමයි - අපි දෙන්නා - දැන් යමු පුළුවන් නම් කැප්පෙටිපොළට. රුපියල් 180යි, ගරු ඇමතිතුමනි. බුදු ඇමතිතුමනි, රුපියල් 180යි! ඒත් අල ගෝනියක් අරගෙන ගිහිල්ලා, උදේ ඉඳලා හවස් වෙනකල් කැප්පෙටිපොළ මාර්කට් එකේ තියාගෙන හිටියත් ගන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව.

මෙහෙමයි, ඔබතුමන්ලාට ඔතැන ඉඳලා එක එක දේවල් කියන්න පුළුවන්. ඒ කිව්වා වාගේ නොවෙයි. ඇත්ත - සත්‍ය - තත්ත්වය, මහ පොළොවේ පැළ වෙන දේ ඔබතුමන්ලා පිළිගන්න. කෘෂිකර්ම ඇමතිතුමා කථා කරලා අනුන්ට බැණලා වැඩක් නැහැ. දැන් අවුරුදු දෙකයි මාසයයි ආණ්ඩුවට. අර ආණ්ඩුව මේවා කළා, මේ ආණ්ඩුව මේවා කළා, අර ඇමති මේවා කළා කියලා පව කෙළින එකේ, බොරු කිය කියා ඉන්න එකේ තේරුමක් නැහැ. ඒ ගැන මම මේ වෙලාවේදී කියනවා.

ඒ එක්කම ඔබතුමා දන්නවා, -මම ඔබතුමාට මීට කලිනුත් මේක කිව්වා- ඔබතුමා වෙන්නායිවලින්, තුත්තුකුඩියෙන් හාල් පටවනකොට මම ඇහුවා, ඔබතුමා ඉන්දියාවේ වෙළෙඳ ඇමතිද කියලා. ඔබතුමා ප්‍රමාණයට වඩා මේ රටට හාල් ගෙනාපු එකෙන් තමයි තරගකාරිත්වයක් නැති වුණේ. ඔය මෝල්කාරයෝ කුඹුරට ගිහිල්ලා කිරුවේ, පහුගිය කාලයේ. පහුගිය කාලයේ කුඹුරුවලට ගිහිල්ලා පොර කකා වී ගත්තේ. හාල් අතිරික්තයක් රටේ තිබුණු නිසා තමයි ගොවීන්ට වී ටික විකුණා ගන්න බැරි වුණේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ගොවියන්ට වී කිලෝවක් රුපියල් 80ට, 90ට, 100ට දෙන්න වුණේ ඒකයි. සහල් අතිරික්තයක් තිබුණු හින්දා තමයි ඒ තත්ත්වයට පත් වුණේ. මේ ගරු සභාවේ වෙළෙඳ ඇමතිතුමා ඉන්න නිසා මම ඒ ගැනත් කියන්න ඕනෑ. වෙළෙඳ ඇමතිතුමනි, මිනිස්සු ඒ සම්බන්ධයෙන් ඔබතුමාට විරුද්ධව පොළොවේ තිබෙන වැලි උඩ දමනවා; ඒ වාගේම ශාප කරනවා. ඔබතුමා රැස්වීම්වලට යනකොට අකුණු සන්නායකයක්වත් සවි කරගෙන යන්න. ඔබතුමා අකුණු සන්නායකයක් සවි කර ගන්නේ නැතුව එළියට බහින්න එපා. ඔබතුමාට මිනිස්සු එච්චරටම ශාප කරනවා. කෘෂිකර්ම ඇමතිතුමාට කියලා වැඩක් නැහැ. කෘෂිකර්ම ඇමති දවල්ටත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉතින් එයාට කියලා තේරුමක් නැහැ. වෙළෙඳ ඇමති හැටියට කටයුතු කරන ඔබතුමා තරුණයෙක්. ඔබතුමාට වගකීමක් තිබෙනවා. ඔබතුමා අනුරාධපුරයේ මනුස්සයෙක්. ඔබතුමා මේ රටේ වගකිව යුතු වෘත්තීය සමිති නායකයෙක්. ඔබතුමාට මේක කර ගන්න බැරි නම්, ඔය වෙළෙඳ ඇමතිකමෙන් ඉල්ලා අස් වෙන්න. ගරු ඇමතිතුමනි, අපට හරියට ඇමතිකමක් කර ගන්න බැරි නම්, අපි ඒ අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් වෙන්න ඕනෑ.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඔබතුමා සහල් ඕනෑවට වඩා මේ රටට ගෙනාපු හින්දා තමයි අද ඔය තත්ත්වයට පත් වුණේ. මම කෘෂිකර්මය ගැන මීට වඩා කථා කරන්නේ නැහැ.

මෙහිදී මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ඥානසාර හාමුදුරුවන් වහන්සේ අත් අඩංගුවට ගැනීම ගැන කථා කළා. අපි බෞද්ධයෝ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් ගොඩක් දෙනෙක් බෞද්ධයෝ; සියයට 75ක් විතර බෞද්ධයෝ. ඒ වාගේම මෙහි අන්‍යාගමිකයෝත් ඉන්නවා. අපේ ඥානසාර හාමුදුරුවෝ චීවරයක් පොරවපු හාමුදුරුවන් වහන්සේනමක්. උන්වහන්සේට වෙනත් ආගම් ප්‍රවර්ධනය කරන්න බැහැ. වෙනත් අය එහෙම කරන කොට කට වහගෙන ඉන්නත් බැහැ. එවැනි සිදුවීම්වලදී නිශ්ශබ්දව ඉන්න හාමුදුරුවන් වහන්සේලාත් ඉන්නවා. ඥානසාර හාමුදුරුවෝ අපේ ආගම ප්‍රවර්ධනය කරන්න, අපේ ආගම වෙනුවෙන් යම් යම් අවස්ථාවලදී පෙනී ඉඳලා තිබෙනවා. උන්වහන්සේ කිව්වේ මොකක්ද? උන්වහන්සේ මුස්ලිම් ජනතාවට විරුද්ධව නොවෙයි කථා කළේ, මුස්ලිම් අන්තවාදීන්ට විරුද්ධවයි කථා කළේ. ඒ මුස්ලිම් අන්තවාදීන්ට විරුද්ධව කථා කරපු නිසා උන්වහන්සේගේ චීවරය -සිවුර- ගලවලා අද අධිකරණයට ගෙනැල්ලා තිබෙනවා. අපේ ආගමට මෙහෙම වෙන්න බැහැ. මේ රටේ බෞද්ධයන් හැටියට අපේ හිත්වලට වේදනාවක් දැනෙනවා. මේ රටේ මිනිස්සු ගොඩ දෙනෙකුට මේ ප්‍රශ්නය තිබෙනවා. ආණ්ඩුව ඒකෙන් ගැලවෙන්න හිතාගෙන කියමින් යනවා, "අපි කිව්වේ නැහැ. මේක පරණ නඩුවක්" කියලා. හැබැයි, ඉතින් මේක කාටත් සමාන වෙන්න එපායැ. ගරු ඇමතිතුමනි, රන්ජන් රාමනායක හිටපු මන්ත්‍රීතුමාත් ජනාධිපති සමාව යටතේ එළියේ ඉන්නේ. දැන් රන්ජන් රාමනායකට එක විධියක්; හාමුදුරුවන්ට තවත් විධියක්. රන්ජන් රාමනායකත් ඉන්නේ ජනාධිපති සමාව යටතේ. එයා ආණ්ඩුවට කඩේ යනවා; එයා ආණ්ඩුවට හොඳ කියනවා. ඒ නිසා එයා එළියේ. නමුත්, ඥානසාර හාමුදුරුවෝ ඇතුළේ. එහෙම වෙන්න බැහැ. වැරදි විධියට ජනාධිපති සමාවක් දුන්නා ලු. නමුත්, කාටත් එක විධියක් වෙන්න ඕනෑ. ඒක විශේෂයෙන් කියන්න ඕනෑ. මේවා ආණ්ඩුවට හොඳ නැහැ. ආණ්ඩුවට කියන්න බැහැ "නැහැ, නැහැ, මේක අපේ කාලයේ වෙච්ච එකක් නොවෙයි" කියලා. ආණ්ඩුවට එහෙම අත හෝදාගන්න බැහැ. කවුද ඒ නඩු තීන්දුව දීපු මිනිහා? ඒ නඩු තීන්දුව දීපු මිනිහා තමයි අද අහවල් ආයතනයේ ප්‍රධානියා. මම එහි නම කියන්නේ නැහැ. මොකද, මට ආයෙත් සැරයක් එන්න කියලා තිබෙන හින්දා මම නම කියන්නේ නැහැ. එයා තමයි අද ඒ ආයතනයේ ලොක්කා. ඒ ආයතනයේ ලොක්කා තමයි නඩු තීන්දුව දුන්නේ. ඔබතුමන්ලාගේ head. ඔබතුමන්ලාගේ head තමයි ඒ කාලයේ ඒ නඩු තීන්දුව දීලා තිබුණේ. ඒක නිසා ඔබතුමන්ලාට මේවා සම්බන්ධයෙන් අත සෝදා ගන්න බැහැ.

ඊළඟ කාරණය මෙකයි. අද මේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද? සිංදුවක් කියන්න ගියත් දැන් රුපියල් 5,000ක්, 10,000ක් දෙන්න වෙලායි තිබෙන්නේ, මොකක්දෝ සංගමයක් හදාගෙන තිබෙන නිසා. ආණ්ඩුව කියනවා, "ඒක අපි හදාගත්තු එකක් නොවෙයි, ඒක සංගමයක්" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජෝතිපාලගේ සිංදුවක් කවුරු ලිව්වාද, ඒකට කවුරු සංගීතය සැපයුවාද කියලා අපි දන්නේ නැහැ. ගම්වල මිනිස්සු දන්නේ නැහැ, ජෝතිපාලගේ සිංදුවේ පද රචනය කවුද, සංගීතය සැපයුවේ කවුද කියන එක. ඒ ගැන කවුරුවත් දන්නේ නැහැ. අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ සිංදුවක්වත් කියන්න බැහැ. ඊයේ පෙරේදා දවසක සභානායකතුමා කෝච්චියේ සිංදු කිය කියා ගියා අපි දැක්කා. ඒක හොඳයි. එහෙම නම්, සභානායකතුමාටත් එහෙම සිංදු කියන්න බැහැ නේ. ඒක Facebook එකේ ගිහිල්ලා ඒ ගැන කවුරු හරි නඩුවක් දැම්මොත් සභානායකතුමාටත් ගෙවන්න වෙනවා නේ. සභානායකතුමා ගම්පොළට කෝච්චියෙන් ගියා, සිංදුවකුත් කිය කියා. ඊට පස්සේ දවසක ඒ කෝච්චි පාරට ගල් ගොඩක් වැටිලා. දැන් ආයෙත් ඒක හදාගෙන යනවා. අනේ අපේ මිනිසුන්ට කන්න නැතුව හරි සතුටින් ඉන්න බැරිද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සතුටින් ඉන්න පුළුවන්? මේ රටේ අනිත් මිනිස්සුත් සතුටින් ඉන්න ඕනෑ; සිංදුවක් කියන්න ඕනෑ; සිංදුවක් අහන්න ඕනෑ. සමහර තැන්වල musical showsවල- *[බාධා කිරීමක්]* හිනා වෙන්න එපා. මේක ඇත්ත කථාව. මිනිසුන්ට උපන් දින පාටි එකකට, කොටහළු උත්සවයකට, විවාහ මංගල්‍යයකට සිංදුවක් කියන්න බැරිද? දැන් හෝටල්වලට ගියාම කියනවා, "ඔයගොල්ලෝ ගිහිල්ලා ඒ වෙනුවෙන් සල්ලි බැඳලා රිසිට් එක අරගෙන එන්න" කියලා. එහෙම සින්දුවක් කියන එකටත් කෙළවන මොකක්දෝ එකක් දැන් ඇවිල්ලා. ආණ්ඩුව කියනවා, "නැහැ, ඒක අපි නොවෙයි කළේ" කියලා. හැම එකකටම එහෙම කරන්න එපා. මම මෙහෙම කියන්නම් කෝ. අද හෝටලයක මඟුලක් ගන්න ගියාම ඒ හෝටලයෙන් කියනවා, "මෙහේ සංගීත කණ්ඩායම් සෙල්ලම් කරන්න බැහැ" කියලා. ඒ මඟුල් ගෙදරට ආණ්ඩුවට විරුද්ධව ඉන්න අපේ කට්ටියක් ගියා කියමුකෝ. ඒ හෝටලයෙන් කියනවා "මේකේ සංගීත කණ්ඩායම් සෙල්ලම් කරන්න බැහැ. එහෙම කරන්න නම් සල්ලි ගෙවලා රිසිට් එක අරගෙන එන්න ඕනෑ" කියලා. මඟුල් ගෙදර ගිය අපේ කට්ටිය දවල් වෙනකොට දෙකක් දාලා, "නොදකින් මේ ආණ්ඩුව! අද සින්දුවක් කියන්නත් බැහැ නේ, නටන්නත් බැහැ නේ" කියනවා. එතකොට ආණ්ඩුවයි ඒකෙන් අපහසුතාවට පත් වෙන්නේ. ආණ්ඩුව කියනවා අහවල් කණ්ඩායමයි ඒක කළේ කියලා. ඒ කණ්ඩායමට බම්බු ගහ ගන්න කියන්න. මේ රටේ මිනිසුන්ට wedding එකකදී සින්දුවක් කියන්න, සංගීත කණ්ඩායමක් යොදා ගන්න අවස්ථාව අරගෙන දෙන්න.

ඊළඟ කාරණය මෙකයි. හිටපු විදුලිබල ඇමතිතුමා අයින් කරලා වෙනත් කෙනෙක් විදුලිබල ඇමතිකමට දැම්මා. හිටපු විදුලිබල ඇමතිතුමනි, මේ අහගන්නකෝ. මොකක්ද එතුමාගේ නම? ඔන්න අපිත් කර ගත්තු වැඩ. මේ සභාවේ හොඳ කථානායකවරයෙක් හිටියා. එතුමා අයින් කරලා වෙන එක්කෙනෙක් දා ගත්තා. හිටපු විදුලිබල ඇමති අයින් කරලා වෙනත් එක්කෙනෙක් දා ගත්තා. හිටපු විදුලිබල ඇමති ඊට වඩා හොඳයි. ඇයි?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තවත් විනාඩි 2ක කාලයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩි දෙකක කාලයක් විතරයි තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේ විදුලිබල ඇමති දැන් මොකක්ද කියන්නේ? ෂිහන්නාගේ පාත්තරයටමයි මේ ආණ්ඩුව මේ විධියට කරන්නේ. වහලයක හරි මොකක් හරි එකක සෝලා පැනල් එකක් සවි කරලා මිනිස්සු කීයක් හරි හොයාගෙන ජීවත් වුණා. සෝලා පැනල් මඟින් විදුලිය නිපදවන ක්ෂේත්‍රයේ විශාල පිරිසක් හිටියා. සෝලා පැනල් එකක් වහලයේ සවි කරලා සූර්ය විදුලි බලයෙන් නිපදවන විදුලිය විකුණලා ඒ අය ජීවත් වුණා. ඒක නැති කළා, අලුත් විදුලිබල ඇමති ඇවිල්ලා. මේවා නවත්වන්න. මොකද, ඒවා හොඳ නැත්තේ ඔයගොල්ලන්ටමයි.

ගරු ඇමතිතුමා, ඔබතුමන්ලා Galle Face එකට වාහන ගොඩක් අරගෙන ගිහිල්ලා මීඩියා සංදර්ශන ටිකක් දැම්මා නේ. ජනාධිපති කාර්යාලයේ වාහන, අර වාහන, මේ වාහන කියලා වාහන ටිකක් එතැනට ගෙනිහිල්ලා මීඩියා සංදර්ශනයක් දැම්මා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඇමතිතුමා, අන්න ගැසට් එකක් දාලා, ජනාධිපති ලේකම් කාර්යාලයෙන්, වාහන 16ක් කුලී පදනම මත ගන්න. අන්න ගැසට් එක දාලා. ඒ ගැන සොයා බලන්න. ආනන්ද විජේපාල ඇමතිතුමනි, ඒ ගැන සොයා බලන්න. තිබුණු වාහන වෙන්දේසි කරලා, විකුණලා ආයෙත් කුලියට ගන්න ඕනෑද? කුලියට ගන්න ඕනෑ නම් ඇයි ඒවා වෙන්දේසි කළේ? ඇයි ඒවා Galle Face එකට ගෙනිච්චේ? ඇයි, ඒවා සම්බන්ධයෙන් මාධ්‍ය සංදර්ශන දැම්මේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අන්න ආයෙත් ජනාධිපති කාර්යාලයෙන් වාහන 16ක් කුලී පදනම මත ගන්න යනවා. මොනවාද මේ කරන්නේ? හතර විළිලජ්ජයි නේ! ඒක හරියට, මීට අවුරුදු 2කට කලින් ඉම්රාන් ඛාන් පාකිස්තානයේ හරක් විකුණුවා වාගෙයි. ඉම්රාන් ඛාන් පාකිස්තානයේ අගමැති වෙච්ච ගමන් රජ මාලිගාවේ හිටපු හරක් ටික විකුණුවා නේ. ඒ වාගේ ඔබතුමන්ලාත් Galle Face එකට වාහන අරගෙන ගිහින් පෙන්නලා "අපි මේ වාහනවලට මෙහෙමයි කරන්නේ" කිය කියා ඒ වාහන වෙන්දේසි කළා. අන්න දැන් ජනාධිපති ලේකම් කාර්යාලයට වාහන 16ක් ගන්න සැලසුම් හදනවා.

ඊළඟට මම කියන්නේ, පහේ ශිෂ්‍යත්වය ගැන. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඊයේ පෙරේදා මේ ගැන කිව්වාම මට බැන්නා. පහේ ශිෂ්‍යත්ව විභාගය සමත් ළමයින්ගේ ශිෂ්‍යත්ව ආධාරය තවම ලැබිලා නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පහේ ශිෂ්‍යත්ව දීමනා හිමි ළමයින්ට මාස හතරක පහක arrears තිබෙනවා. මම මේ ආණ්ඩුවේ අයට කියනවා - මතක් කරලා දෙනවා - ඒ arrears ටික සම්පූර්ණ කරන්න කියලා. ඒ ළමයි පව්! ගිය සැරේ මම මේ සභාවේදී මහපොළ ශිෂ්‍යත්වය ගැන කියන කොට කවුදෝ මට බැන්නා. අපට බණින්න එපා. අපට ජේන අඩු පාඩු ටික මේ පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළාම ඔයගොල්ලෝ ඒවා කථා බහ කරලා හදා ගන්න. මහා ලොකුවට වාහන වෙන්දේසි කරලා දැන් ආයෙත් වාහන 16ක් ජනාධිපති කාර්යාලයෙන් ගන්න ඕනෑද? විළිලජ්ජයි!

එහෙම නම්, මම නවතිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.18]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද උදේ ඉඳලා විතරක් නොවෙයි, මේ දවස් ටිකේම යන විවාද දිහා අපි බැලුවා. මට හිතෙන්නේ, විපක්ෂයට තිබෙනවා පොඩි සිහිනයක්. ඒ තමයි, බොරු කියන එකේ සිහිනය. හැම දාම බොරු කියන එකේ දැනුත් පට්ටපල් බොරුවක් කිව්වා. ඒ වාගේම මහපොළ සම්බන්ධයෙනුත් බොරුවක් කිව්වා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
බොරුව මොකක්ද?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
දැන් බොරුවක් කිව්වා. *[බාධා කිරීමක්]* බොරුව මොකක්ද කියලා මම කියන්නම්. මම කාගේවත් නමක් කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
බොරුවක් කිව්වේ නැහැ.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
නැහැ, නැහැ, පොඩ්ඩක් ඉන්න. අභියාචනාධිකරණයෙන් දීපු තීන්දුවක් ගැන කියමින් නම කියන්නේ නැතිව ඔබතුමා කෙනෙකුගේ තනතුරක් ගැන කිව්වා. තීන්දුව දීලා තිබෙන්නේ අභියාචනාධිකරණයෙන්. *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඊට කලින්- *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
ඉන්න පොඩ්ඩක්. ඒ වාගේම මහපොළ ශිෂ්‍යාධාරය සම්බන්ධයෙන් පසුගිය දවස්වල ප්‍රකාශයක් කළා, මහපොළ ශිෂ්‍යාධාරය මාස 4ක් arrears කියලා. Arrears එකක් නැතිව අඛණ්ඩව මහපොළ ශිෂ්‍යාධාරය ගෙව්වේ අපේ ආණ්ඩුව ආවාට පසුවයි. *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පස්සේ දුන්නේ.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
පස්සේ නොවෙයි. ඒ වනකොටත් අපි ඒවා ගෙවලා තිබුණේ. ඔබතුමාට තොරතුරු දෙන කට්ටිය බොරු කියන්නේ.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ඔබතුමන්ලා රුපියල් 3,000යි දුන්නේ. අපි රුපියල් 10,000ක් දෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හරි, හරි, ඔබතුමා කියන කල්ද ඉඳලා තිබෙන්නේ ගෙවන්න, ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
ඒ විතරක් නොවෙයි, දැන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මෙතැනට ඇවිල්ලා පට්ටපල් බොරුවක් කිව්වා, අපේ ඇමතිවරු පිරිස එල්ටීටීඊ එකේ මොකක් හරි එකකට මල්මාලා දමන්න ගියා කියලා. *[බාධා කිරීමක්]* එතුමා පට්ටපල් බොරු කියනවා. *[බාධා කිරීමක්]* ඒ විතරක් නොවෙයි, මේ දවස්වල විපක්ෂ නායකතුමා කියන ඒවා බලන්න. එතුමා සංඛ්‍යාලේඛන ගොඩක් ගෙනැල්ලා බොරු කියනවා. මීට කලිනුත් එහෙම දේවල් කිව්වා. අපි ඒ කියන ඒවායේ තොරතුරු සොයා බැලුවා. ඒවා වාර්තා කිසිවක් පදනම් කර නොගත්තු පට්ටපල් බොරු.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියත් මම මේ කියන්න යන කාරණය ගැන දන්නවා. *[බාධා කිරීමක්]* විපක්ෂ නායකතුමා පසුගිය දවස්වල ගියා, බුත්තලට. බුත්තල ගිහිල්ලා ප්‍රචාරක වැඩ කටයුත්තක් කළා. ඒ ප්‍රචාරක වැඩ කටයුත්ත කරන කොට එතුමා කිව්වා, "බුත්තල කොට්ඨාසයේ කට්ටියට පොහොර දීලා නැහැ" කියලා. මෙතැන හිටපු ධර්මසේන මන්ත්‍රීතුමාගෙන් මම ඇහුවා, ඔබතුමාගේ කුඹුරු අක්කර 10ට පොහොර සහනාධාර, පොහොර එහෙම හම්බ වුණාද කියලා. එතුමා කිව්වා "නියෝජ්‍ය ඇමතිතුමා, මට විතරක් නොවෙයි, මගේ කොට්ඨාසයේ ඔක්කෝටම හම්බ වෙලායි තිබෙන්නේ" කියලා. මම එතුමාගෙන් ඇහුවා, "එහෙම නම් ඔබතුමන්ලාගේ විපක්ෂ නායකතුමා මොකක්ද අර කියන්නේ?" කියලා. "විපක්ෂ නායකට කිව්වාට තේරෙන්නේ නැහැ. එතුමා කිව්වාම, මම කට්ටිය ටිකක් එකතු කරලා දුන්නා" කියලා ඒ මන්ත්‍රීතුමා කිව්වා. මේ වාගේ විපක්ෂයක් තිබියදී නේ, අපි මේ ආණ්ඩුව කරගෙන යන්නේ.

මෙතුමා පත්තරයකට යම් කථාවක් කියලා තිබුණා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පැල්වත්ත ගැනත් කියන්න.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
පැල්වත්ත සීනි කර්මාන්තශාලාව ගැනත් මම කියන්නම්. අහගෙන ඉන්න. පැල්වත්ත සීනි කර්මාන්තශාලාව ගැන මම රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ. පැල්වත්ත, සෙවනගල ඇතුළු සීනි කර්මාන්තශාලා හතර ගැන එතුමා මෙතැනදී කිව්වා. අපි බලයට ආපු දවස්වල ඉඳලාම එතුමන්ලා කිව්වා, "අපි ඒවා වසා දමනවා" කියලා. සජබයේ නියෝජිතයන් හැටියට ඒ ගොවි සංවිධානවල ඉන්න අය, Sevanagala Sugar Factory එකේ machine එකට දාන්න ගල් ගෙනාපු කට්ටිය. Sevanagala Sugar Factory එකට දාන්න තමයි ඒ අය ඒ ගල් ගෙනාවේ. ඒවා පැටෙව්වේ සජබයේ කාර්යාලය දාපු ගෙදර කෙනා. ඒ ඉඩමෙන් තමයි ගල් ගෙනාවේ. ඒ factory එකට දාන්න තමයි ගල් ගෙනාවේ. එහෙම කරලා ඒ factory එක විනාශ කරන්න හැදුවා. අන්න එහෙම කරපු අය අපට උපදෙස් දෙනවා, "මෙහෙමයි කරන්න ඕනෑ" කියලා.

ගම්මිරිස් මිල ආදිය ගැනත් දැන් මෙතැනදී කථා කළා, අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. මම දන්නවා, පසුගිය අවුරුදු කිහිපය ගත්තොත්, අදටත් වේළපු ගම්මිරිස් කිලෝව රුපියල් 2,000කට වැඩි බව. ගම්මිරිස් කිලෝවක් රුපියල් 2,040ට, 2,300ට ඉහළ ගියා. කරුංකා කිලෝවක් රුපියල් එක්දහස් ගණනක් දක්වා - රුපියල් 1,300 ගණනක් දක්වා - ඉහළ ගියා. කුරුඳුවලට උපරිම මිලක් තිබෙනවා. කොකෝවා කිලෝවක් රුපියල් එක්දහස් ගණනක් දක්වා ඉහළ ගියා. රබර් කිලෝවක් රුපියල් 1,040ක් දක්වා ඉහළ ගියා.

විපක්ෂය දැන් මෙහිදී අපනයන කර්මාන්තය ගැනත් කථා කරනවා. ඇත්තටම ගත්තොත්, පොළොවේ වෙන දේවල් ගැන මොනම අදහසක්වත් නැතුව වෙන කොහේහරි තැනකින් ඇවිල්ලා ඒ අය ඒ දේවල් කියනවා ඇති. අපි කුරුඳු ගැන දන්නවා, ගම්මිරිස් ගැන දන්නවා, කොකෝවා ගැන දන්නවා. අපි ඒ හැම එකක් ගැනම දන්නවා. ඒ හැම එකකම මිල ඉහළ ගියා, තුන් ගුණයකට වැඩි මුදලකින්. මේවා ගැන දැන දැනත් විපක්ෂය අසත්‍ය කියනවා.

අද වී ගැනත් කථා කළ නිසාම මම මේ කාරණයත් කියන්නම්. මෙතුමියලා දැන් ආණ්ඩුවට කියනවා, "ආණ්ඩුව වී මිල දී ගැනීම කරන්නේ නැහැ" කියලා. මම උදාහරණයක් කියන්නම්. මේක හොඳට අහගන්න. 2016දී යහ පාලන ආණ්ඩුව යල කන්නයේ අරගෙන තිබෙන සමස්ත වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 25,447යි. 2017දී යහ පාලන ආණ්ඩුව එක වී කිලෝවක්වත් මිලට අරගෙන නැහැ. 2018 මහ කන්නයේ මිල දී ගෙන තිබෙනවා, වී මෙට්‍රික් ටොන් 4,605ක්; යල කන්නයේ මිල දී ගෙන තිබෙනවා වී මෙට්‍රික්ටොන් 2,082ක්. ඊළඟට 2019 මහ කන්නයේ මිල දී ගෙන තිබෙනවා, වී මෙට්‍රික් ටොන් 48,307ක්. යල කන්නයේ වී කිලෝ එකක්වත් මිල දී ගෙන නැහැ. ඒ කාලයේ වී කිලෝ එකක්වත් මිල දී ගන්නේ නැතුව ගබඩා ටික වහලා, දිරාපත් වෙන්න ඇරලා තිබෙනවා. ඒ කටයුතුවලට සම්පූර්ණයෙන් දායක වෙච්ච කට්ටිය තමයි ඒ යහ පාලන ආණ්ඩුව කරපු අය. ඒකේ හිටපු කට්ටිය තමයි අද අපට කියන්නේ "ආණ්ඩුව වී ගත්තේ නැහැ, වී ගන්නේ නැහැ" කියලා. හැබැයි අපි ගත්තු වී ප්‍රමාණය කොච්චරද? අපි ගත්තු වී ප්‍රමාණයක් තිබෙනවා.

අනෙක් අතට, විපක්ෂය වී මිල ගණන් ගැනත් කථා කරනවා. වීවල මිල ගණන් ගැන කථා කරන කොට, යහ පාලන ආණ්ඩුව කාලයේ වී මිල තිබුණේ කීයටද කියලා බලමු. සාමාන්‍යයෙන් නාඩු වී කිලෝවක් 2016 වර්ෂයේදී රුපියල් 38යි; 2017දීත් නාඩු වී කිලෝවක් රුපියල් 38යි; 2018දීත් රුපියල් 38යි; 2019දීත් රුපියල් 38යි. 2020 වර්ෂයේ ඉඳලා තමයි වී මිල ටිකක් වැඩි වෙලා තිබෙන්නේ. යහ පාලන ආණ්ඩුව පැවැති කාලයේ නාඩු වී

කිලෝවක් රුපියල් 38යි. මේවා හොඳට අහගන්න. අපි වී කිලෝවක් රුපියල් 120යි කියන කොට "වීවලට මිලක් නැහැ, මිලක් නැහැ" කියලා විපක්ෂය කියනවා. විපක්ෂ නායකතුමා දැන් මෙහි සිටියා නම් මේ ගැන අහන්න තිබුණා. විපක්ෂ නායකතුමා ඔය කියන, වී කිලෝවක් රුපියල් 150ට ගන්නවා කියලා අපි කිව්වේ කොයි කාලයේද? පොහොර මිටියක මිල රුපියල් 40,000ට තිබුණු කාලය අනුව ගණන් හදලා තමයි අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා එහෙම කිව්වේ. පොහොරවලට රුපියල් 40,000යි, හාන්න රුපියල් 30,000යි, බීජවලට මෙච්චරයි, ගොයම් කපන්න රුපියල් 30,000යි ආදි වශයෙන් වියදම් එකතු කරලා ඒක බෙදලා ගණන හදලා තමයි කිව්වේ, "මේ මිල අනුව නම් වී කිලෝවක් රුපියල් 150ක් විය යුතුයි" කියලා. දැන් ඒ ගණන් නොවෙයි තිබෙන්නේ. දැන් පොහොර මිල කීයද? රුපියල් 17,000ට තිබෙන පොහොර හොණ්ඩරය රුපියල් 10,200ටයි අපි දෙන්නේ. හැබැයි, ඒ රුපියල් 10,200නුත් රුපියල් 6,000ක් අපි සහනාධාර විධියට දෙනවා. එතකොට රුපියල් හාරදහස් ගණනක් තමයි ගොවියා ගෙවන්න ඕනෑ. අනෙක් මුදල රජය සම්පූර්ණයෙන් දරා ගන්නවා. මා හිතන විධියට, මේවායේ අගක්, මුලක් ගැන අදහසක් නැති විපක්ෂ නායකතුමා වාගේම තමයි ඔබතුමියලාත් කරුණු ඉදිරිපත් කරන්නේ. විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු කරුණු ගැන මම ගොඩක් දේවල් කියන්න යන්නේ නැහැ.

පැල්වත්ත සහ සෙවනගල ෆැක්ටරි ගැන ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා. එතුමන්ලා ගොවීන් ගැන ආදරයෙන් කථා කරනවා. ගොවීන් ගැන ආදරයෙන් කථා කරන එතුමන්ලාට මම මේ කාරණය කියන්න ඕනෑ. පැල්වත්ත සහ සෙවනගල ෆැක්ටරි සම්පූර්ණයෙන් කඩා වැට්ටවීම සඳහා මැදිහත් වන කණ්ඩායම තමයි, සජබය සහ පොහොට්ටුව. සජබයයි, පොහොට්ටුවයි දෙගොල්ලෝ එකතු වෙලා උක් වගා කරපු ගොවියාගේ උක් අස්වැන්න ගිනි තියනවා. මම ඉස්සෙල්ලාත් මේ ගැන කිව්වා. සෙවනගල උක් අස්වැන්න මෙට්‍රික් ටොන් 20,000ක් ගිනි තිබ්බා, මේ පාර පැල්වත්තේ මෙට්‍රික් ටොන් 20,000ක් ගිනි තිබ්බා, ඒ කණ්ඩායම් එකතු වෙලා. ගිනි තියලා ඒවා කඩා වට්ටන්න හදනවා. ඒ දෙකේම උක් අස්වැන්න මෙට්‍රික් ටොන් 20,000 බැගින් ගිනි තිබ්බා.

ඒ විතරක් නොවෙයි, මේ මොහොත වන විටත් ඒවායෙහි සේවක අතිරික්තයක් තිබෙන්නේ. අපි මේ අවුරුදු දෙකට පැල්වත්ත සහ සෙවනගල ෆැක්ටරිවලට එක සේවකයෙකුවත් බඳවා ගත්තේ නැහැ. අප එක් කෙනෙකුවත් බඳවා ගත්තේ නැතත් අදටත් පැල්වත්ත සීනි සමාගමේ සේවකයන් 1,300කට ආසන්න පිරිසක් අතිරික්තයි. ඒ අයව ස්ථිර කරලා පඩි ගෙවනවා. සෙවනගල සේවකයන් 500 ගණනක් අතිරික්තයි. ඒ අයත් ස්ථිර කරලා පඩි ගෙවනවා. මේ බඳවා ගැනීම් කවුද කළේ? යහ පාලන ආණ්ඩුව කාලයේදීත් බඳවා ගත්තා; අනෙක් ආණ්ඩුව කාලයේත් බඳවා ගත්තා. තමන්ට හිතවත් දේශපාලනය පදනම් කරගෙන පත්වීම් ලියුම් කැල්ල දීලා ඒ ලියුමට අනුව බඳවා ගෙන ඒ ෆැක්ටරි දෙකේම අතිරික්ත සේවක සංඛ්‍යාවකින් පුරවලා ඒ අයට නිශ්චිත, ස්ථාවර පඩියක් ගෙවීමේ කටයුත්ත කරමින් ඒ ආයතන වට්ටනවා. ඉතින් එහෙම දේවල් කරලා තමයි අපෙන් ප්‍රශ්න කරන්න එන්නේ.

ඒ විතරක් නොවෙයි, මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ ගරු සභාවට ආපු මන්ත්‍රීතුමාට මම මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමන්ලා ගොවියාට ආදරෙයි නම්, ඔබතුමන්ලා ගොවියාගේ ඉඩ කඩම් දේපොළ ප්‍රමාණය දිහා බලන්න. ගොවියාට නැති ඉඩ කඩම් ප්‍රමාණයක් ඔබතුමන්ලාට තනියෙන් තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් අහන්න, එක එක මන්ත්‍රීවරයාට කොච්චර ඉඩම් තිබෙනවාද කියලා. ඒ අය ඉඩම් මිල දී ගැනීමේ කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කෘෂි කර්මාන්තය ගොඩනැඟීම වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. එකක් තමයි, ගොවියාට සහතික මිලක් ලබා දීම. අප කරන්නේ පාරිභෝගිකයා ආරක්ෂා කරන ගමන් ගොවියා ආරක්ෂා කරන්න තීන්දු තීරණ ගැනීමයි. අපට විපක්ෂ නායකතුමා කියනවා නම්, වී කිලෝවක් රුපියල් 150කට මිල දී ගන්න කියලා, අපි හාල් කිලෝව රුපියල් 250න්, 260න් එහා මිලකට විකුණන්න ඕනෑ. ඒකෙන් පාරිභෝගික ජනතාව ආරක්ෂා කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි පාරිභෝගිකයා ආරක්ෂා කර ගන්නත් ඕනෑ; ගොවියා ආරක්ෂා කර ගන්නත් ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දෙවනුව, ගොවීන්ට ලාභ වැඩි කර ගන්න වී අස්වැන්න වැඩි කරන්න ඕනෑ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පසුගිය කන්නයේ හෙක්ටෙයාරයක අස්වැන්න වී කිලෝ 12,000ක් ඉක්මවා ගියා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මහවැලි කලාපයේ හෙක්ටෙයාරයක අස්වැන්න වී කිලෝ 12,000ක් ඉක්මවා ගියා කියලා. ඒ කියන්නේ, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න යන වියදම අඩු වුණා. එය රුපියල් 50කට ආසන්න මුදලක් දක්වා ගෙන ආවා. රුපියල් 50ක්, රුපියල් 60ක් වියදම යනවා නම්, කිලෝවක් රුපියල් 100ට දුන්නත් ලාභයි නේ. එහෙම වියදම අඩු කරලා තමයි අපි අනිවාර්යයෙන්ම ගොවියාට ආදායමක් ලබා දෙන්න ඕනෑ. මිල විතරක් වැඩි කරලා පාරිභෝගිකයන් මිලියන ගණනකගේ ජීවිත අනතුරේ දාන්න අපේ අමාත්‍යාංශයට බැහැ. එහෙම නම්, ඒ ගැන විපක්ෂයට පොඩි අදහසක් හෝ තිබෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමියනි, මම විශේෂයෙන් ඔබතුමියට මේ කාරණය කියන්න ඕනෑ. පසුගිය දවස්වල ඔබතුමියගේ සංවිධායකවරියක් මාධ්‍යයට කිව්වා, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව කිසිම සහනයක් ඒ පවුලටවත්, ඒ ගමටවත් ලැබුණේ නැහැ කියලා. හැබැයි, එදාම හවස ඇයගේ මහත්තයා මොකක්ද කිව්වේ? ඔහු කිව්වා, "ඔක්කෝම ටික හම්බ වුණේ රජයෙන්. මගේ නෝනා අහවල් කෙනාගේ වේදිකාවට ගියා. වේදිකාවට ගිහිල්ලා කථාවක් කළා. ඒ කථාවේ කියපු දේ ඇත්ත නොවෙයි" කියලා. ඇයගේ මහත්තයා එහෙම කියනවා; ගමේ මිනිස්සු උද්ඝෝෂණය කරනවා. ලජ්ජා වෙන්න ඕනෑ. මා හිතන විධියට, විපක්ෂය පුරුදු වෙලා ඉන්නේම එවැනි අසත්‍යය කීමටයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මා කියන්නේ මෙච්චරයි. මේ දවස් ටිකේම මම විපක්ෂයේ කථා ඇහුවා. විපක්ෂයේ අතිශය බහුතරයක් තොරතුරු සොයා නොබලා කථා කරනවා. මා ගරු කරන මන්ත්‍රීවරුන් දෙන්නෙක්, තුන්දෙනෙක් විතර විපක්ෂයේ ඉන්නවා. එතුමන්ලා හරියට තොරතුරු සොයලා අපට සාධාරණ විවේචනයක් කරනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. හැබැයි, අනෙක් අය පට්ටපල් බොරු තොරතුරු අරගෙන උදේ පාන්දරම අසත්‍ය කියනවා. විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා කියන්නේ, කියන තරම් පට්ටපල් බොරු කියන කෙනෙක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඒ සියල්ලටම උත්තර දෙන්න සූදානම්. අපි ගොවිතැනට ශක්තියක් දෙන්න වැඩ කරනවාය කියන කාරණයත් සඳහන් කරමින් මා නිහඬ වනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ point of Order එක මොකක්ද?

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
එතුමා මාව ඉලක්ක කරගෙන කථා කළා. *[බාධා කිරීමක්]* නැහැ. මාතලේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමිය කිව්වාම මේකේ වෙන කවුරුවත් නැහැ නේ, මම නේ ඉන්නේ. එම නිසා එතුමා කියපු එකට උත්තරයක් දෙන්න මට අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තත්පර 30කින් අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
පළමුවෙන්ම මම කියන්නේ, "දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත් වූ අයට නිවාස ලබාදීම සම්බන්ධයෙනුයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මොනවා කිව්වත් එතැන විතරයි දීලා තිබෙන්නේ. උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස නැති අයට කොහේද නිවාස දීලා තිබෙන්නේ? රත්තොට කොහේද දීලා තිබෙන්නේ? මම වාර්තා ටික දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, එය point of Order එකක් නොවෙයි නේ.

මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 2.31]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අතීතයේ පටන් නිතරම ඇසුණු ප්‍රකට කියමනක් තමයි, "මඩ සෝදා ගත් කල ගොවියා රජකමටත් සුදුසුයි" කියන එක. වර්තමාන ආණ්ඩුවට අනුව එය එසේ නොවුණත් අපේ රටට බත සපයන, ජනතාවගේ කුසගිනි නිවන්නට කැපවන, ලක්ෂ සංඛ්‍යාත අපේ ගොවි ජනතාව මුහුණ දෙන ගැටලු ගැන කථා කරන අද දවසේ මට තිබෙන්නේ ඉතාම සීමිත වෙලාවක් නිසා අදහස් කිහිපයක් විතරක් ප්‍රකාශ කරන්න මම කල්පනා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සංස්කෘතියට අනුව අනාදිමත් කාලයක සිට අස්වැන්න නෙළන කාලය තමයි ගොවි ජනතාවට සෞභාග්‍යය උදාවන කාලය හැටියට සැලකුවේ. ඒ වෙනුවෙන්ම ගොවි ජනතාවගේ සතුට සමරන විවිධ සංස්කෘතික උත්සව පවා පැවැත්වූවා. අලුත් සහල් මංගල්‍යය, කමතේ පැවැත්වුණු ගම්මඩු ශාන්තිකර්ම වාගේ උත්සව පවත්වමින් ගොවි ජනතාව අස්වැන්න නෙළා ගත් සතුට සැමරුවා. ඒවායින් පෙන්නුම් කළේ අස්වැන්න නෙළන දවස කියන්නේ, ගොවියාගේ ජයග්‍රාහී දවස කියන එක. එය ගොවියාගේ මුහුණ සතුටින් පිරුණු දවස. ගොවියා ණය තුරුස්වලින් නිදහස් වන දවස. ගොවියාට අලුත් බලාපොරොත්තු දැල්වුණු දවස. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අද වෙද්දී මොකක්ද තත්ත්වය?

ගොවියාගේ ආණ්ඩුව, නිර්ධන පන්තියේ ආණ්ඩුව, පීඩිත පන්තියේ දහඩිය හෙළන මිනිසුන්ගේ ආණ්ඩුව කියලා අසීමිත බලාපොරොත්තු දීලා බලයට ආපු මේ රජයට වසර දෙකක් පිරෙනකොට අස්වැන්න නෙළන කාලය තමයි ගොවියාගේ පරාජිතම කාලය වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය ඔවුන්ගේ මුහුණේ හිනාව අතුරුදහන් වන කාලය බවට පත් වෙලා තිබෙනවා; ප්‍රශ්නවලට විසඳුම් ලැබෙනවා වෙනුවට තව තවත් අලුත් ප්‍රශ්න ගොඩනැඟෙන කාලය බවට පත් වෙලා තිබෙනවා; පරම්පරාවෙන් පරම්පරාවට ආශීර්වාදයක් වුණු කුඹුර තමන්ටම බරක් කියලා හිතෙන කාලය බවට පත් වෙලා තිබෙනවා. මේක තමයි තමුන්නාන්සේලා වසර දෙකක් තුළ ගොවි ජනතාවට උරුම කර දීපු පොහොසත් රටේ ලස්සන ජීවිතය කියලා කනගාටුවෙන් වුණත් අපට කියන්න සිද්ධ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිසා තමයි රජයට අවුරුදු දෙකක් පිරෙනකොට ජනාධිපතිතුමාට ගොවි ජනතාව ඉන්න ප්‍රදේශවලට ගිහිල්ලා ගොවි හමු පවත්වනකොට විෂය භාර ඇමතිවරුන් කොළඹ හංගලා යන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියලා අපට පෙනෙන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොර සහනාධාරය ගැන අද මොන කතන්දර කිව්වත්, අපේ රටේ රසායනික පොහොර භාවිත කරන්න පටන් ගත්ත දවසේ ඉඳන් එදා මෙදා තුර වැඩිම පිරිවැයක් පොහොර සඳහා දරන්න සිදු වෙලා තිබෙන්නේ නිර්ධන පන්තියේ ආණ්ඩුවක් යැයි කියා ගන්න මේ රජය යටතේය කියන එක මම කියන්න කැමැතියි. අද රට පුරා ගොවි ජනතාව නඟන ප්‍රධානම මැසිවිල්ලක් තමයි, ගොවීන්ට දෙන පොහොර සහනාධාරයවත් වෙලාවට දී ගන්න මේ රජය අපොහොසත් වෙලා තිබෙනවාය කියන කාරණය. ඒ නිසා රජයට මතක් කරන්න අපි කැමැතියි, කොළඹ ඉඳලා වෙලාවට නිවේදන නිකුත් කළ පමණින් ගොයම් ගහ ලොකු වෙන්නේ නැති බව. ගොයම් ගහ ලොකු වෙන්න නම් හරියට වෙලාවට පොහොර ටික ලබා දිය යුතුයි. ඒ වාගේම අපි රජයට මතක් කරන්න කැමැතියි, කොළඹ ඉඳන් මේසයට තට්ටු දැම්මාට වී මිලවත්, හාල් මිලවත් පාලනය කරන්න

බැරි බව. ඒ සඳහා මහ පොළොවේ ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික වැඩ පිළිවෙළක් තිබිය යුතුම වනවා. ආණ්ඩුවේ චක්‍රලේඛවල, ආණ්ඩුවේ නිවේදනවල මොන තරම් සහතික මිල ගැන කිව්වත්, සැබෑ ගොවි බිමේදී මේ ආණ්ඩුව වාගේම ආණ්ඩුව නිකුත් කරන චක්‍රලේඛ සහ නිවේදන සියල්ලම මේ වනකොට හැල්ලුවට ලක් වෙලා ඉවරයි. ඒ නිසා තමයි අද ගොවි ජනතාවට තමන්ගේ අස්වැන්න රුපියල් 80ට, 85ට හා 90ට වාගේ කුණුකොල්ලෙට දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවි ජනතාව කියන්නේ, ඓතිහාසිකව ආත්ම අභිමානයක් තිබුණු මිනිස්සු බවත්, තමන්ගේ දහඩිය බින්දුව ගැන විශ්වාස කළ මිනිස්සු බවත් ඔබතුමා දන්නවා. ඒ මිනිස්සු ඉල්ලන්නේ අනුකම්පාව නොවෙයි, සාධාරණත්වයයි.ඒ උදවිය ඒකයි ආණ්ඩුවෙන් බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවි බිමේ යථාර්ථය එහෙම වෙද්දී සාමාන්‍ය පොදු ජනයාගේ කුස්සියේ යථාර්ථය දිහා අපි බැලුවොත්, එතැනත් තිබෙන්නේ ආණ්ඩුව මවා පෙන්වන චිත්‍රයට වඩා බොහොම අමිහිරි තත්ත්වයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංඛ්‍යා ලේඛනවල මොනවා සඳහන් වුණත්, ඒවා මිනිස්සුන්ගේ බත් පතේ නිරූපණය වෙන්නේ නැත්නම්, දරුවාගේ පාසල් උපකරණ ගන්නකොට ඒක දැනෙන්නේ නැත්නම්, ළදරු කිරිපිටි ගන්නකොට දැනෙන්නේ නැත්නම්, පෙට්‍රල් ෂෙඩ් එකට ගිහිල්ලා මෝටර් බයිසිකලයට, ත්‍රී වීලර් එකට පෙට්‍රල් ටික ගහනකොට දැනෙන්නේ නැත්නම්, මාසය අන්තිමට විදුලි බිල ගෙවනකොට දැනෙන්නේත් නැත්නම්, ලෙඩට දුකට බෙහෙත් හේත් ගන්න ගියාම දැනෙන්නේත් නැත්නම් මොකක්ද අද තිබෙන තත්ත්වය? රජයේ රෝහල්වල බෙහෙත් නැත්නම්, ආණ්ඩුවේ ප්‍රධානියාම කියනවා නම් රෝහල්වලට යන්න එපා, කොත්තමල්ලි ටිකක් බොන්න කියලා ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛනවලින් මොන චිත්‍රයක් මැව්වත්, ඒ කිසිවක් ජන ජීවිත තුළත්, මහ පොළොවේත් යථාර්ථයක් නොවන බව මම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන්ම අද වෙලා තිබෙන්නේ මොකක්ද? රටේ ආර්ථිකය ස්ථාවර වෙලා කියලා ආණ්ඩුව කියනකොට ජනතාවගේ ජීවිත අස්ථාවර වෙන එකයි අද වෙලා තිබෙන්නේ. අපි අනෙක් සියලුම භාණ්ඩ අමතක කළත්, 2026 අවුරුද්දේ සැප්තැම්බර් මාසයේදී ආහාර ද්‍රව්‍යවල උද්ධමනය සියයට 8.7ක් බවට වාර්තා වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උද්ධමනය සියයට 8 ඉක්මවා තිබෙනවා කියන්නේ පාරිභෝගිකයා මුහුණ දෙන තත්ත්වය කොහොමද කියලා ඕනෑම කෙනෙකුට තේරෙන කතන්දරයක්. ඉතින්, ජනතාවගේ ජීවිත සුවපත් නොවී රටේ ආර්ථිකය සුවපත් වෙලායි කිව්වාට වැඩක් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කීයක් තිබෙනවාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව තත්පර 30යි, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මනෝ ගනේසන් මැතිතුමාට විනාඩියක්, දෙකක් දෙන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මගේ කථාව අවසන් කරන්නට පෙර මම කියන්න කැමැතියි, ඔබතුමන්ලා අවුරුදු ගාණක් තිස්සේ විපක්ෂයේ ඉඳලා විවේචනය කළා, ඒ වාගේම ආණ්ඩු බලය අරගෙනත් කරන්නේ විවේචනය කිරීම කියලා. කරුණාකරලා ඒ විවේචනවලට දුන් යම් විසඳුමක් ගැන රට පුරා ගිහිල්ලා කථා කරන්න දැන්වත් පටන් ගන්න කියලා ඉල්ලමින් කාලය ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ කාලයෙන් ඉතුරු වෙච්ච තත්පරය හරි ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාට දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.36]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

බොහොම ස්තුතියි. මම අද කථා කරන්න ආවේ හදිසියේ. මොකද, මට පැමිණිල්ලක් ලැබිලා තිබෙනවා. ඒක අපේ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාගේත් අවධානයට යොමු කළා. මේක අහගන්න. පසුගිය සුමානයේ කොළඹ, පිටකොටුවේ, හෙට්ටිවීදියේ ප්‍රශ්නයක් ඇති වුණා. පොලීසිය හොර රත්‍රන් අල්ලන්න ඒ ප්‍රදේශයට ගියා. ඒක ප්‍රශ්නයක් නැහැ. පොලීසිය කඩ සාප්පුවලට ගිහිල්ලා පහර දෙනවා. හැබැයි, දැන් ගුරුවරුන්ටවත් පාසල් දරුවන්ට ගහන්න බැරි වාතාවරණයක් තිබෙනකොට පොලීසිය කොහොමද මිනිස්සුන්ට ගහන්නේ? ඒක තමයි පළමුවැනි ප්‍රශ්නය.

අනෙක් එක, ජනතාව ඒක දැකලා පාරට ඇවිල්ලා උද්ඝෝෂණය කළා. ඒ උද්ඝෝෂණයේ වීඩියෝ අරගෙන බල බලා දැන් ඒ උද්ඝෝෂණය කරපු එක එක්කෙනා අත්අඩංගුවට ගන්නවා. ඒ විධියට අත්අඩංගුවට ගත් පිරිසක් දැන් මැද කොළඹ DCDB එකේ තියාගෙන ඉන්නවා; ඔවුන්ට පහර දෙනවා. කරුණාකරලා උද්ඝෝෂණය කරපු අය නිදහස් කරන්න කියලා මම කියන්න කැමැතියි. මම මේ සම්බන්ධයෙන් අහන්න IGP ප්‍රියන්ත වීරසූරියට කථා කළා. ඒ වාගේම මැද කොළඹ කොට්ඨාසයේ SSP වන මහේෂ් කුමාරසිංහට කථා කළා. IGP මහත්මයා මට කුමාරසිංහව සම්බන්ධ කරලා දුන්නා. මම කථා කළා. විජේපාල ඇමතිතුමනි, එතුමා මට පොරොන්දු වුණා, ඒ අය නිදහස් කරන්නම් කියලා. ඒ වාගේම පිටකොටුව පොලීසියේ, මාලිගාවත්ත පොලීසියේ OICලා දෙන්නාම වැරදි වැඩ කරනවා කියලා මට දැනෙනවා. ඒ දෙන්නාම මේකෙන් ඉවත් කරනවා කිව්වා. හොරකම් තිබුණා නම්, වැරදි තිබුණා නම් හොයලා බලන්න. ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ මිනිස්සුන්ට පහර දෙන්න එපා. මිනිස්සුන්ට උද්ඝෝෂණය කරන්න අයිතියක් තිබෙනවා. ලජ්ජා නැද්ද? මේක JVP ආණ්ඩුවක් නේ. JVP කියන්නේ protest කරපු පක්ෂයක්. Protest කරන්නේ කොහොමද, උද්ඝෝෂණය කරන්නේ කොහොමද කියලා අපට ඉගැන්නුවේ ඔබතුමන්ලානේ. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, එහෙම නේද? ඔයගොල්ලන් protest කරපු මිනිස්සු අත්අඩංගුවට ගන්නවාද? වැරදියිනේ ඒක. ඒක කරන්න එපා; මේ දේ කරන්න එපා.

හෙට්ටිවීදියේ ඉන්නේ වෙළෙඳ ව්‍යාපාර කරන සාමකාමී, නිහතමානි මිනිස්සු. ඒ, tax ගෙවන මිනිස්සු. එතැන වෙළෙන්දොත් ඉන්නවා, රත්‍රන් කර්මාන්තයට යොමු වෙච්ච ව්‍යවසායකයොත් ඉන්නවා. ඒගොල්ලන් සාමාන්‍ය මිනිස්සු, නීතියට ගරු කරන මිනිස්සු. ඒ අය හොරු නොවෙයි. පොලීසිය හොරු අල්ලන්න ගිහිල්ලා මිනිස්සුන්ට පහර දෙන්න එපා, ගහන්න එපා. ආයෙත් උද්ඝෝෂණයක් කරනවා නම් මමත්

[ගරු මනෝ ගනේසන් මහතා ]

යනවා, ඒ උද්ඝෝෂණය කරන තැනට. එච්චරයි. මා එක්ක සෙල්ලම් කරන්න එපා. මෙහෙම වැඩ කරන්න එපා. මම කියන්න කැමැතියි, ආනන්ද විජේපාල ඇමතිතුමනි, ප්‍රියන්ත වීරසූරිය අයිජීපීතුමනි, ඒ වාගේම එතුමන්ලාගේ යටතේ වැඩ කරන මහේෂ් කුමාරසිංහ එස්එස්පීතුමනි, කරුණාකරලා මට දුන් පොරොන්දුව ඉෂ්ට කරන්න, පොරොන්දු කඩන්න එපා කියලා. වැරදි වැඩ කරන්න එපා. මට මේක බලාගෙන ඉන්න බැහැ. මිනිස්සුන්ට ගහන්න එපා.

අනික් එක, viral videos අරගෙන බලලා නම් කර කර මිනිස්සු අල්ලනවා. හැමදාම හෙට්ටිවීදියට ඇවිල්ලා මිනිස්සු අරගෙන යනවා. දැනුත් අරගෙන යනවා. ඒ අය වහාම නිදහස් කරන්න. හොරකම් අල්ලන්න. හොරකමට, දූෂණයට, පාතාලයට විරුද්ධව ඔයගොල්ලෝ කරන වැඩ ඔක්කෝටම මම කැමැතියි. අත් දෙක උස්සලා සහයෝගය දෙන්නම්. ඕනෑ නම් පුටුවට නැගලා කථා කරන්නම්, කකුල පුටුව උඩින් තියලා කථා කරන්නම්. අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ වාගේ වැඩ කරන්න එපා. වැරදි වැඩ කරන්න එපා. අහිංසක මිනිස්සු අල්ලන්න එපා. එච්චරයි මම කියන්න කැමැති. එහෙම කරනවා නම් මම එතැනට යනවා. එහෙම නේ. මේ ගැන ආණ්ඩුවට අවධානය යොමු කරලා තිබෙන්නේ. මෙතැන ප්‍රධාන පෙළේ අමාත්‍යවරයෙක් වන වසන්ත සමරසිංහ මැතිතුමා ඉන්නවා. කරුණාකරලා මේක කියන්න. මේක කියන්නේ අනුර කුමාර සහෝදරයාට. ඔබතුමා කථා කරලා ඒ ගැන කියන්න. කරුණාකරලා මේක කරන්න. ඒ සඳහා අවධානය යොමු කරන්න. ජනතාවට මෙහෙම කරන්න එපා. මේක JVP ආණ්ඩුව නේ. JVP එක කියන්නේ උද්ඝෝෂණය කරපු අය නේ. උද්ඝෝෂණ කළා කියන කාරණාව මත මිනිස්සු arrest කරනවා නම් ඒක වැරදියි නේ. ඇත්ත මේ කියන්නේ. වැරදියි නේ ඒක. කරුණාකරලා ඒක කරන්න එපා. මට උත්තරයක් දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මනෝ ගනේසන් මන්ත්‍රීතුමා මතු කරපු මේ කරුණ පිළිබඳව ආනන්ද විජේපාල ඇමතිතුමාගේත් අවධානය යොමු කරලා, යම් අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒකට සාධාරණය ඉෂ්ට කරන්න,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ආනන්ද විජේපාල ඇමතිතුමා හොඳයි, ප්‍රශ්නයක් නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අනිවාර්යයෙන්,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
එතුමා දුන් පොරොන්දුව පොලිසියෙන් ඉෂ්ට කරලා නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා මේ ගැන මතු කළා කියන කාරණයත්, ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සාධාරණය ඉෂ්ට කරන්න මැදිහත් වෙන්න කියන කාරණය ඔබතුමා ඉල්ලුවා කියන එකත් දැනුම් දෙනවා. *[බාධා කිරීමක්]* අනිවාර්යයෙන් ඒ ගැන කථා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.41]

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂයෙන් ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව විවාදයට ගන්න මේ මොහොතේදී මටත් ඒ සඳහා අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

පළමුවන කාරණාව මේකයි. රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු මේ සභාව කල් තැබීමේ යෝජනාවේ සඳහන් වෙනවා, වී ගොවියා බරපතළ ගැටලු රැසකට මුහුණ දීලා ඉන්නවා, වී මිලදී ගැනීමේ ක්‍රමවේදයක්, වැඩ පිළිවෙළක් නැහැ, වී වගාව බිඳ වැටිලා ලු කියලා. ඒ සම්බන්ධව තමයි එතුමිය මේ යෝජනාවෙන් ඉදිරිපත් කරන්නේ. හැබැයි, මේ රටේ ගොවි ජනතාව දන්නවා, වී මිලදී ගැනීමේ වැඩ පිළිවෙළක් තිබෙනවාද නැද්ද කියන එක. මේ දේවල් බලන්න වෙන්නේ ඉතිහාසයට සාපේක්ෂව. අපි බලයට එන්න කලින් වී අලෙවි මණ්ඩලයට මොකක්ද කරලා තිබුණේ, වී මිලදී ගැනීම් කොච්චර කළාද, ගබඩාවලට මොනවාද වෙලා තිබුණේ කියලා මේ රටේ ගොවි ජනතාව දන්නවා. එම නිසා එතුමියගේ ඒ කථාව සම්පූර්ණයෙන්ම බොරුවක්. අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ අනුව තමයි වී මිලදී ගැනීම ආරම්භ කරලා තිබෙන්නේ.

අම්පාර දිස්ත්‍රික්කයේ විතරක් මේ කන්නය තුළදී ගබඩා 80කට වී මිලදී ගැනීම් සිද්ධ කළා. ඒ රජයේ ගබඩා සහ පෞද්ගලික අංශයෙන් ලබා ගත්ත ගබඩාවල. එතකොට මීට කන්න හතරකට කලින් කොහොමද? එක ගබඩාවකටවත් වී ගත්තේ නැහැ. මොකද, ගබඩා අලි කඩලා, ඒවායේ වහලවල් කැඩිලා, සත්තු ලැගලා, කැලෑ වෙලා. එහෙම තමයි තිබුණේ. හැබැයි, ඒ ගබඩා ප්‍රතිසංස්කරණය කරලා, මිලියන ගණන් මුදල් ඒ සඳහා වෙන් කරලා, ගොවි ජනතාව, ගොවි සමිති, ආරක්ෂක අංශ කියන ඒ හැමෝගේම සහයෝගයෙන් රට පුරාම ඒ ගබඩා පිළිසකර කිරීමක් සිද්ධ කළා. ඒ වාගේම වී මිලදී ගැනීම ආරම්භ කළා. ගොවියාට සහතික මිලක් ලබා දීලා, ඒ සහතික මිලට අනුව වී මිලදී ගැනීම් ආරම්භ කළා. අපි දන්නවා, වෙළෙඳ පොළ

ක්‍රියාවලිය තුළ එක මොහොතකදී වීවලට මිලක් ලැබෙනවා, තරගකාරිත්වයක් ඇති වෙනවාය කියන එක. සමහර අවස්ථාවල ඒ තරගකාරිත්වය වෙනස් වෙන්න පුළුවන්කම තිබෙනවා. මොකද, මේ සමස්ත වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය, වී නිෂ්පාදන ක්‍රියාවලිය තවමත් අපේ රටේ විධිමත් වෙලා නැහැ. අවිධිමත් තත්ත්වයක තිබෙනවා, වී අලෙවි කිරීම සම්බන්ධ කාරණාව. එය විධිමත් කළ යුතුයි. රටේ අවශ්‍ය ප්‍රමාණයට වී වගා කළ යුතුයි. අතිරික්තය සඳහා වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. සාධාරණ මිලකට ඒවා ලබා ගත යුතුයි. ගබඩා පහසුකම් තිබෙන්න ඕනෑ. වී මිලදී ගැනීමේ යන්ත්‍රණය තවතවත් ශක්තිමත් වෙන්න ඕනෑ. මිලදී ගන්නා වූ වී, සහල් බවට පත් කරන්න සහ තවත් අතුරු නිෂ්පාදන සඳහා යොමු කරන්න ක්‍රියාවලියක් අවශ්‍යයි. එවැනි ක්‍රියාවලියක් අවශ්‍ය බව අපි රජයක් විධියට, ආණ්ඩුවක් විධියට දැකලා තිබෙනවා; කෘෂිකර්ම අමාත්‍යාංශය ඒක දැකලා තිබෙනවා; අපේ ඇමතිතුමන්ලාත් ඒක දැකලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ අපි ආරම්භ කර තිබෙනවා.

අපේ දිස්ත්‍රික්කය විතරක් ගත්තොත්, 2025 යල කන්නයේ වී මෙට්‍රික් ටොන් 19,000ක් මිලදී ගෙන තිබෙනවා. ඊට කලින් අවස්ථාවලදී ටොන් එකක්වත් ගන්න බැරි තත්ත්වයක් උදා කරලා තිබුණා. රුපියල් 120, 125, 130 ආදී සාධාරණ මිල ගණන්වලට මෙතරම් වී කන්දරාවක් මිලදී ගන්න ලැබීමම ගොවි ජනතාව ලබපු විශාල ජයග්‍රහණයක්. ඒ සඳහා වෙන් කරපු මුදල කොච්චරද? රුපියල් මිලියන 2,856ක්. ඒ සඳහා අතිදැවැන්ත මුදලක් භාණ්ඩාගාරයෙන් වෙන් කරලා තිබෙනවා. 2025-2026 මහ කන්නය ගත්තොත්, අම්පාර දිස්ත්‍රික්කයෙන් විතරක් මෙට්‍රික් ටොන් 27,000ක් මිලදී ගෙන තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 3,284ක් වැය කරලා තිබෙනවා. 2026 යල කන්නයේ තවම වී මිලදී ගනිමින් තිබෙනවා. මෙට්‍රික් ටොන් 23,000ක් අරගෙන තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 2,369ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම රජයෙන් වෙන් කරපු මුදල ප්‍රමාණවත් නොවන විට පෞද්ගලික අංශයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්, ගබඩා පහසුකම් තිබෙන අය වෙනුවෙන් රුපියල් මිලියන 12,000ක් වෙන් කර තිබෙනවා, වී මිලදී ගැනීම සඳහා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලන් ඒ මිලදී ගැනීම් සිද්ධ කරමින් සිටිනවා. තවමත් වී මිලදී ගන්න බැරි වුණේ කොහේද, ගබඩා පහසුකම්වල ගැටලු නිසා වී මිලදී ගන්න බැරි වුණු තැන් මොනවාද කියලා සොයා බලා ඒ සඳහා පෞද්ගලික අංශයේ ව්‍යාපාරික මහත්වරුන්ට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඉතිහාසයේ කිසිම දවසක සිදු නොවුණු එවැනි මැදිහත්වීමක් සිදු කරලා තිබෙනවා. මාස 8ක් යනකම් පොලී රහිත ණය මුදලක් ලබා දීලා තිබෙනවා. ඒ ක්‍රියාවලිය දැන් සිද්ධ වෙමින් තිබෙනවා. අපි වී මිලදී ගත්තා, රජය ඒ සඳහා වෙන් කළ මුදල් මෙච්චරයි, දැන් අපට කරන්න දෙයක් නැහැ කියලා ජනාධිපතිතුමා කිව්වේ නැහැ. කෘෂිකර්ම ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා එහෙම කිව්වේ නැහැ. අපි ඒ සඳහා මැදිහත් වෙලා වැඩ පිළිවෙළක් හැදුවා, ගබඩා සීමා ඉක්මවා ගිය තත්ත්වයක් තුළත්. මොකද, ඉස්කෝලවල වී ගබඩා කරන්න බැහැ නේ. පන්සල්වල වී ගබඩා කරන්න බැහැ නේ. තමුන්නාන්සේලා අවුරුදු 76ක් තිස්සේ මොනවාද කළේ? කෘෂි කාර්මික දිස්ත්‍රික්කවල වාර්ෂිකව කොපමණ වී නිෂ්පාදනයක් සිද්ධ වෙනවාද කියලා ගණනය කරන්න ඕනෑ.

අම්පාර දිස්ත්‍රික්කය ගත්තොත්, එක කන්නයකට ආසන්න වශයෙන් වී මෙට්‍රික් ටොන් 320,000ක් නිෂ්පාදනය වෙනවා. අඩුම ගණනේ ඒකෙන් සියයට 10ක් ගන්නවත් අපි ගබඩා හදලා තියන්න ඕනෑ. එහෙම සැලැස්මක් තිබුණාද? දැන් තමයි එහෙම හිතන ආණ්ඩුවක් බලයට පත් වෙලා තිබෙන්නේ කියන එකයි මම විශේෂයෙන් අපේ ගොවි ජනතාවට කියන්නේ. මේ රටේ සමස්ත ආදරණීය ගොවි ජනතාව මේක තේරුම් ගන්නවා කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා ගබඩා පහසුකම් හදන්න ඕනෑ. ඒ සඳහා යන්ත්‍රණයක් හදන්න ඕනෑ. ඒක තමයි අපි මේ සිද්ධ කරමින් ඉන්නේ. ඒ ක්‍රියාවලිය සිද්ධ වෙමින් තිබෙනවා. මේ කන්නයට වඩා ලබන කන්නයේ, ලබන කන්නයට වඩා ඊළඟ කන්නයේ ගොවියා මුහුණ දෙන වී මිලදී ගැනීමේ ප්‍රශ්නය අපි ක්‍රමානුකූලව අවසන් කරනවා. ඒ විතරක් නොවෙයි, මේ වනකොට අධිනිෂ්පාදනයක් තිබෙනවා. අපේ රටේ ඒ නිෂ්පාදනය තිබෙන්නේ කොහොමද? ගොවියා අස්වැන්න නෙළනවා; වී ටිකක් අලෙවි කරනවා; කොටසක් ගෙදර තියා ගන්නවා; වී සහල් කරනවා; සහල් බත් විධියට ආහාරයට ගන්නවා.

හැබැයි, අපේ රටේ චක්‍රලේඛයක් තිබුණා, "සත්ව ආහාර සඳහා සහල් පාවිච්චි කළ නොහැක" කියලා. අමාත්‍යාංශය මැදිහත් වෙලා "සත්ව ආහාර සඳහා සහල් පාවිච්චි කළ හැක" කියලා චක්‍රලේඛයක් නිකුත් කළා. එවැනි තීන්දු - තීරණ ගැනීම අවශ්‍යයි. ඒ වාගේම වී වගා කරන කුඹුරේ අනෙකුත් බෝග වගා කරන්න අවසර දීලා තිබෙනවා. ඒ සඳහා පොහොර සහනාධාරයත් ලබා දෙනවා. එවැනි දිරිගැන්වීම් අවශ්‍යයි.

"බතින් බුලතින් සපිරි රටක්" කියලා ආකල්පයක් තිබෙනවා. මෙතැන "බත" කියන එකෙන් අදහස් කරන්නේ බත්ම නොවෙයි. ගොවි ජනතාවට, රටට අවශ්‍ය සියලුම ආහාර කියන එක බත බුලත කියන එක ඇතුළේ තිබෙනවා. ඒ නිසා රටට ආදායම් ලබා ගන්න පුළුවන්, අපනයන ක්ෂේත්‍රයට යන්න පුළුවන් අනෙකුත් වගාවන් මේ භූමිය තුළ කිරීම සඳහා දිරිගැන්වීම් කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. අපි වෙනස් විය යුතුයි. එවැනි ප්‍රතිපත්තිමය වෙනස්කම් සිද්ධ කරන්න ඕනෑ. ඒ සඳහාත් ආණ්ඩුව මැදිහත් වෙලා තිබෙනවා.

ඒ වාගේම පොහොර සහනාධාරය සඳහා විශාල මුදලක් ලබා දීලා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ විතරක් ගොවි පවුල් 78,674කට පසුගිය කන්නය තුළ රුපියල් මිලියන 2,010ක් ලබා දීලා තිබෙනවා. වෙළෙඳ පොළේ පොහොර මිල ඉහළ යනකොට ඒක ආණ්ඩුව දරාගෙන ආණ්ඩුව රුපියල් 17,000කට, රුපියල් 14,000කට පොහොර මිලදී අරගෙන ගොවියාට ඒවා රුපියල් 10,200ට දෙන්න සමත් වුණා. ඒ සඳහා වැඩ පිළිවෙළක් සහ දැක්මක් තිබෙනවා. හැබැයි, අපි එතැනින් නතර විය යුතු නැහැ. අපි පිළිගන්නවා, මේ රසායනික පොහොර ක්‍රමානුකූලව අඩු කරන්න ඕනෑකම තිබෙනවාය කියලා. භූමි ඒකකයක් තුළ අස්වැන්න වැඩි කරන්න ඕනෑ. එහෙම නම් කාබනික පොහොර සහ රසායනික පොහොර මිශ්‍රණයක් සහිතව යා යුතුව තිබෙනවා. ඒ සඳහා දිරිගැන්වීම් කරමින් අපේ මියැදෙමින් තිබෙන පස සාරවත් කළ යුතුව තිබෙනවා. ඒ සඳහා කාබනික පොහොර අපි එකතු කරගත යුතුව තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළක් සහිතව තමයි අපි ඉදිරියට යන්නේ.

නාමල් රාජපක්ෂ මහත්මයා මේ සභාවට ඇවිල්ලා කරුණු දෙක තුනක් කියලා සභාවෙන් යන්න ගියා. එතුමා මොකක්ද කිව්වේ? වී ගත්තාට සල්ලි දීලා නැහැ කිව්වා. අපි රටේ ජනතාවට කියන්න කැමතියි, මේ වනකොට මිලදී ගත්ත සියලු වී සඳහා භාණ්ඩාගාරය මුදල් නිදහස් කරලා අවසානයි කියන එක. ඒ වාගේ බොරුවක් කියලා එතුමා සභාවෙන් පිටව ගියා. ඒ වාගේම එතුමා හීනෙන් හය වුණා වාගේ "අත්අඩංගුවට ගැනීම් කරනවා, විපක්ෂය මර්දනය කරනවා" වාගේ කතන්දර කියලා ගියා. එතුමා මේ මර්දනය කියලා අදහස් කරන්නේ කුමක්ද? හොරකම් කරපු අයට, වංචා කරපු අයට, දූෂිත වැඩ කරපු අයට අදාළව විමර්ශන කටයුතු කිරීමද මර්දනය? ඔවුන් නීත්‍යානුකූලව අත්අඩංගුවට ගැනීමද මර්දනය? ඔවුන් නීත්‍යානුකූලව සිරගතවීමද මර්දනය? FCID එකට කැඳවීමද මර්දනය? ඔව්, ඔවුන්ට ඒ සියල්ල "මර්දනය" වෙන්න ඇති. හැබැයි, මේ රටේ ජනතාව දන්නවා, ජන වරමට අනුව මේ රටේ නීතිය, දැන් තමයි හරියටම, අකුරටම ක්‍රියාත්මක වෙන්නේ කියන එක.

[ගරු වසන්ත පියතිස්ස මහතා]

ඒ වාගේම සජිත් ප්‍රේමදාස මහත්මයාත් බොරු ගොඩක් කියලා ගියා. වෙනදා වාගේම එතුමා කියපු අදහස් ඇත්තටම සත්‍ය අදහස් නොවෙයි. එතුමා පරණ තොරතුරු වගයක් තමයි ඉදිරිපත් කරලා ගියේ. ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා මේ රටේ ගොවි ජනතාවගේ හදවත් එක්ක සම්බන්ධ වෙලා ඉන්නේ, හැඟීම් එක්ක සම්බන්ධ වෙලා ඉන්නේ. එතුමා යන තැනට දස දහස් ගණන් ගොවි ජනතාව ඒකරාශී වෙනවා. යම් යම් අඩු පාඩුකම් තිබුණත්, සමස්ත වැඩ පිළිවෙළ ජනතාව දැකලා තිබෙනවා, විපක්ෂය දැක්කේ නැති වුණාට, විපක්ෂ නායකතුමා දැක්කේ නැති වුණාට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සමස්ත වැඩ පිළිවෙළ ගත්තාම මෙය, සමස්ත කෘෂි කර්මාන්තය නවීකරණය කිරීමේ දිශාවට යන, තිබෙන සියලුම ප්‍රශ්න -ගැටලු- අවසන් කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගනිමින්, ඉදිරියට යන අවස්ථාවක් බව මතක් කරමින්, ඒ සඳහා අපි රජයක් විධියට තවදුරටත් කැපවීමෙන් කටයුතු කරනවා කියන දේ මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.53]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවියා පිළිබඳවයි අද දිනයේ මේ විවාදයේ කථා කරන්නේ. මේ විවාදයේදී කරුණු දැක්වූ ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් ගොවියාගේ ප්‍රශ්නය ගැන තවමත් හරියට සංවේදී වෙලා තිබෙනවාද, මේ ප්‍රශ්නයේ යථා තත්ත්වය අවබෝධ කරගෙන ඉන්නවාද, නැතිනම් පරණ විධියටම 76 වසරක ශාපය ගැන කියමින්, මුව හමට තඩි බාමින් ඉන්නවාද කියන කාරණා තමයි අපට මේ විවාදයේදී මතු වෙන්නේ. ඒ නිසා පරණ කතන්දරම කියමින්, පරණ දේවල්ම අවුස්සමින්, ගොවියා මේ මොහොතේ මුහුණ දෙන සැබෑ ප්‍රශ්නයට කිසිම විසඳුමක් ඉදිරිපත් කරන්නේ නැතුව, ආණ්ඩු පක්ෂයේ අය අද මේ විවාදයේ කළ කථාවල කිසිම ප්‍රයෝජනයක් නැහැ කියලායි කියන්න තිබෙන්නේ.

ඒ වාගේම මේ වන විට ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය පොඩ්ඩක් හෝ උසස් වෙලා තිබෙනවාද කියලා මම මේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයාගෙන්, ඇමතිවරයාගෙන් අහන්න කැමැතියි. මේ අවුරුදු දෙකට පොඩ්ඩක් හරි උසස් වෙලා තිබෙනවාද? ගොවියා විශාල වශයෙන් අර්බුදයකට මුහුණ දෙමින් තිබෙනවා. ගොවියාට වගා කටයුතු කරන්නට අවශ්‍ය වියදම අධික වෙලා තිබෙනවා. පොහොර මිල අධික වෙලා තිබෙනවා. කෘෂි රසායනික යෙදවුම්වල මිල අධික වෙලා තිබෙනවා. ප්‍රවාහනය සහ ඉන්ධන මිල අධිකයි, බීජවල මිල අධිකයි. හැබැයි, ගොවියා මේ සියල්ල තිබියදී වගා කරලා, අස්වැන්න වෙළෙඳ පොළට අරගෙන ගියාම ඒකට සාධාරණ මුදලක් ලැබෙන්නේ නැහැ. ඒ අයට සාධාරණ මුදලක් ලබා දෙන්නට ඕනෑ වැඩ පිළිවෙළක් තවමත් ආණ්ඩුවට සොයා ගන්නට, උත්තරයක් දෙන්නට බැරි වෙලා තිබෙනවා කියන කාරණය තමයි මේ විවාදයේදී අපිට පෙනෙන්න තිබෙන්නේ.

කෘෂි නිෂ්පාදන මිල දර්ශකවලට අනුව, 2025 අවුරුද්දේ එළවළු ඇතුළු භෝග නිෂ්පාදනය පහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි, 2026 අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ වී, තේ, රබර්, පොල් හා සත්ව නිෂ්පාදන කටයුතු අඩාළ වෙලා තිබෙනවා, පහළ බැහැලා තිබෙනවා. එහෙම නම් අපිට මොකක්ද මේකෙන් කියන්න තිබෙන්නේ? මේ රටේ කෘෂිකර්ම අමාත්‍යාංශය ෆේල් වෙලා තිබෙනවා. මේ රටේ කෘෂිකර්ම අමාත්‍යාංශයට මේ ගොවියා රැක ගන්නට, ගොවියා ගොවිතැනේ තියා ගන්නට අවශ්‍ය කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියන කාරණය තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ඇමතිවරයා වෙන වෙන දේවල් කරමින් ඉන්නවා. මේ විවාදය වැදගත් විවාදයක්. මේවාට උත්තර දෙන්නට ඇමතිවරයා අද දවසේම මැති සභයේ නැහැ. එහෙම නම් කොහොමද ඇමතිතුමා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්නේ? නියෝජ්‍ය ඇමතිවරයා ඉන්නවා. නියෝජ්‍ය ඇමතිවරයා හිටියාට ඇමතිවරයාත් මෙතැන සිටිය යුතුයි.

ඒ වාගේම අපි මතක් කරනවා, ගිය අය වැයේදී ජනාධිපතිතුමා ඇවිල්ලා කිව්වා, ගොවි නිෂ්පාදන ගබඩා කරන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කළා; දඹුල්ලේ ශීතාගාර ටික නැවත ආරම්භ කරන්න රුපියල් මිලියන 250ක් වෙන් කළා කියලා. හැබැයි, ඒවායේ ප්‍රගතිය බින්දුවයි. කිසිම ප්‍රගතියක් නැහැ. එදා අපි දැක්කා, පොළොන්නරුවට ගිහිල්ලා ජනාධිපතිවරයා ගොවි සමුළුවක් කරනවා. හැබැයි, ඇමතිවරයාත් නැහැ; නියෝජ්‍ය ඇමතිවරයාත් නැහැ; මේ රටේ සහල් ව්‍යාපාරිකයෙක් තමයි ඒක සම්පූර්ණයෙන්ම මෙහෙයවූයේ.

අද මේ රටේ ගොවි ජනතාවට; මේ රටේ අතරමැදියා විසින් සූරා කන ගොවි ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්නට මේ රජය තුළ කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා අපි විශේෂයෙන්ම අහන්න කැමැතියි, ගොවි ජනතාවට ඊළඟ කන්නයේදී වගා කරන්නට අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් මේ රජය තුළ තිබෙනවාද කියා, ඔවුන්ගේ අස්වැන්න මිලදී ගැනීමට කිසියම් යන්ත්‍රණයක් තිබෙනවාද කියා. ඔවුන්ට අතිරික්ත අස්වැන්නක් ලැබුණොත් ඒවා ගබඩා කරන්න කිසියම් වැඩ පිළිවෙළක් තිබෙනවාද? එහෙම නැත්නම් එම නිෂ්පාදනවලට සහතික මිලක් දීලා ගොවියාගේ ආර්ථිකය නංවන්නට කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ කිසියම් වැඩ පිළිවෙළක් තිබෙනවාද? එහෙම කිසිම වැඩ පිළිවෙළක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක නිසා මේ ආණ්ඩුව සම්බන්ධව ගොවි ජනතාව අද කලකිරිලා ඉන්නේ.

තවදුරටත් බොරු කථා, කයිවාරු වැඩක් නැහැ. ගොවියාට සාධාරණ මිලක් ලැබෙන්න ඕනෑ. ඒ වාගේම අපිට තවත් පොරොන්දු වැඩක් නැහැ. අපිට අවශ්‍ය කර තිබෙන්නේ ප්‍රතිඵල. ඒ නිසා ප්‍රතිඵල දෙන්න පුළුවන් අමාත්‍යවරයෙක් පත් කරගෙන මේ ගොවි ජනතාවගේ ගැටලු විසඳන්නට කටයුතු කරන්න කියා අපි ආණ්ඩුවට කියනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.59]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் கொண்டுவரப்பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

எமது அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பிற்பாடு விவசாயத்துறையில் ஏற்பட்ட மாற்றங்கள் தொடர்பில் பல்வேறுபட்ட விடயங்களை நான் இங்கு முன்வைக்க விரும்புகின்றேன். அதற்கு முன்னர், பழைய சில விடயங்களை ஞாபகப்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் எவ்வாறு விவசாயிகளுக்கு நன்மைகளைச் செய்தன என்பதை மக்கள் அறிவார்கள். கடந்த காலங்களில் ஆட்சியில் இருந்தவர்கள் இரசாயன உரங்களுக்கு முழுமையாகத் தடைவிதித்தது மட்டுமல்லாமல், சேதன உரங்களை வெளிநாடுகளில் இருந்து இறக்குமதியும் செய்தார்கள். விவசாயிகளின் உற்பத்தியை அதிகரிப்பதற்காக அவர்களுக்குத் தாங்கள் நன்மை செய்ய இருக்கின்றோமெனக் கூறி, பாரிய மோசடியில் ஈடுபட்டு, விவசாயத்துறையை முழுமையாக வீழ்ச்சியடையச் செய்வதற்குரிய அனைத்துவிதமான செயற்பாடுகளையும் மேற்கொண்டார்கள். அதன் விளைவாக, அவர்கள் இரண்டு வருடங்களுக்குள்ளேயே அதன் பிரதிபலனை அனுபவித்து, ஆட்சியைக் கைவிட்டு ஒழிந்தோடக்கூடிய நிலைக்குத் தள்ளப்பட்டார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உரக் கொள்வனவாக இருக்கட்டும், ஏனைய விவசாயத்துறை சார்ந்த விடயங்களாக இருக்கட்டும், அனைத்து விடயங்களிலும் இவர்கள் ஊழல் மோசடியில் ஈடுபட்டு, முழு நாட்டுக்கும் துரோகம் இழைத்த வரலாறுகள் கடந்த காலத்தில் நிறையவே இருக்கின்றன. இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தப் பிரேரணை ஊடாக எங்களுடைய காலப்பகுதியில் நாங்கள் என்னென்ன விடயங்களைச் செய்திருக்கின்றோம் என்பதைக் கூறுவதற்கு ஒரு வாய்ப்பை ஏற்படுத்தித் தந்திருக்கின்றார்கள். அதற்காக அவர்களுக்கு நான் நன்றி கூறுகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த காலங்களைவிட எங்களுடைய ஆட்சிக் காலத்தில் விவசாயிகளுக்கான உர மானியம் வழங்குதல் அதிகரிக்கப்பட்டு இருக்கின்றது. அவர்கள் தாராளமாக உரத்தைக் கொள்வனவு செய்யக்கூடிய வகையில் நாங்கள் மானியங்களை வழங்கியிருக்கிறோம். இதனூடாக எங்களது வன்னிப் பிரதேசத்திலுள்ள விவசாயிகள் - வவுனியா, முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களிலுள்ள விவசாயிகள் - கடந்த காலத்தைவிடக் கூடியளவு நெல்லை உற்பத்தி செய்து, அதிகளவு வருமானத்தைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பு ஏற்பட்டு இருக்கின்றது. அதுமாத்திரமல்ல, கடந்த காலங்களில் அரசாங்கத்தால் மேற்கொள்ளப்படும் நெல் கொள்வனவு அதாவது நெல் சந்தைப்படுத்தல் சபை ஊடான நெல் கொள்வனவு நிறுத்தப்பட்டு இருந்ததுடன், நெற்களஞ்சியசாலைகள் அனைத்தும் காடு மண்டிக் காணப்பட்டன.

கடந்த காலங்களில் தனியார் ஆலை உரிமையாளர்களே நெல்லின் விலையைத் தீர்மானிப்பவர்களாகவும், நெல்லை எவ்வாறு கொள்வனவு செய்ய வேண்டும் என்ற தீர்மானங்களை எடுக்கக்கூடியவர்களாகவும் காணப்பட்டார்கள். இந்த நிலையை இல்லாமல் செய்யும் நோக்கில், எமது அரசாங்கம் கடந்த 2 வருடங்களாக நெல்லைக் கொள்வனவு செய்து வருகின்றது. அதுமட்டுமல்ல, மூடப்பட்டிருந்த பல நெற்களஞ்சியசாலைகளை நாங்கள் திருத்தியமைத்து, துப்புரவுசெய்து, விவசாயிகளிடம் இருந்து நியாய விலைக்கு நெல்லைக் கொள்வனவு செய்கின்ற செயற்பாட்டையும் செய்து வருகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்பொழுது நாங்கள் சிறுபோக நெல்லைக் கொள்வனவு செய்வதற்காக சிறிய மற்றும் நடுத்தர அரிசி ஆலை உரிமையாளர்களுக்கு எட்டு மாதங்களுக்கு வட்டியற்ற கடனை வழங்கிக்கொண்டு இருக்கின்றோம். இவர்கள் 50 மில்லியன் ரூபாய் வரை கடனைப் பெற்று, மூடிக்கிடந்த ஆலைகளை இப்பொழுது மீண்டும் இயக்குகின்ற ஒரு நிலை காணப்படுகின்றது. இதனூடாக அதிகளவு விவசாயிகளுடைய நெல்லைக் கொள்வனவு செய்வதற்குரிய வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுத்து இருக்கின்றோம்.

இங்கு சிலர் உரையாற்றும்பொழுது, விவசாயிகள் நெல்லை உலர்த்துவதற்கு வீதிகளைப் பயன்படுத்துவதாகத் தெரிவித்தார்கள். அதற்குத் தீர்வுகாணும் முகமாக, 'பிரஜா சக்தி' அல்லது 'சமூக சக்தி' திட்டங்கள் ஊடாக நாங்கள் நெல் உலர்த்தும் தளங்களை கூடுதலாக அமைத்து வருகின்றோம். உதாரணத்துக்கு, இவ்வருடத்தில் வவுனியா மாவட்டத்தில் மட்டும் கிட்டத்தட்ட 32 நெல் உலர்த்தும் தளங்களை கிராம சேவையாளர் பிரிவு மட்டத்தில் அமைத்துக்கொடுத்து இருக்கின்றோம். அதேபோன்று, முல்லைத்தீவு மாவட்டத்திலும் அமைத்து வருகின்றோம். அதுமட்டுமல்ல, கிட்டத்தட்ட 45 நெல் உலர்த்தும் இயந்திரங்களைக் கொள்வனவு செய்து, அவற்றை இலங்கை முழுவதிலுமுள்ள விவசாயிகளுக்கு வழங்குவதற்காக கூட்டுறவுச் சங்கங்களுக்கு நாங்கள் வழங்க இருக்கின்றோம். இந்த ஒவ்வோர் இயந்திரமும் கிட்டத்தட்ட 90 மில்லியன் ரூபாய் பெறுமதியானவை. இதனூடாக விவசாயிகள் வீதிகளில் நெல்லைக் காயவைக்கும் செயற்பாட்டை கணிசமான அளவு குறைக்கக்கூடியதாக இருக்குமென நம்புகின்றோம். இந்த இயந்திரத்தின்மூலம் ஒரு நாளைக்கு கிட்டத்தட்ட 10,000 கிலோகிராம் நெல்லை உலர்த்தக்கூடியதாக இருக்கும். நெல்லை உலர்த்துவதில் காணப்படுகின்ற பிரச்சினையை இதனூடாகப் படிப்படியாக தீர்த்துக்கொள்ளக்கூடியதாக இருக்குமென நம்புகின்றேன்.

கடந்த காலபோகச் செய்கையின்போது, உரத்தின் விலையானது வெளிச் சந்தையில் அதிகரித்திருந்தது. இதன் காரணமாக, விவசாயிகள் உரத்தைக் கொள்வனவு செய்வதில் இடர்பாடுகளை எதிர்நோக்கி இருந்தார்கள். இதை நிவர்த்தி செய்யும் பொருட்டு, வெளிச் சந்தையில் 17,000 ரூபாய்க்கு விற்கப்பட்ட உர மூடையை கமநல சேவைகள் திணைக்களத்தின் ஊடாகக் கொள்வனவு செய்து, 10,200 ரூபாய்க்கு விவசாயிகளுக்கு வழங்கி, அவர்களின் சுமையைக் கூடியளவு குறைத்திருக்கின்றோம்.

பல்லாண்டு காலமாக வவுனியா, முல்லைத்தீவு, மன்னார் பகுதிகளில் புனரமைக்கப்படாமல் இருந்த விவசாயக் குளங்கள், குறிப்பாக கமநல சேவைகள் திணைக்களம், மாகாண நீர்ப்பாசனத் திணைக்களம், மத்திய நீர்ப்பாசனத் திணைக்களம் ஆகியவற்றின் கீழுள்ள குளங்கள் எங்களுடைய அரசாங்கத்தின் பல்வேறு வேலைத்திட்டங்களின் ஊடாகப் புனரமைத்துக் கொடுக்கப்பட இருக்கின்றன. அதற்கென

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

'வாரி மஹிம' என்ற விசேட செயற்றிட்டம் நடைமுறைப்படுத்தப்பட்டு இருக்கின்றது. இதன்கீழ் முல்லைத்தீவு மாவட்டத்தில் தெரிவு செய்யப்பட்ட 10 குளங்களைப் புனரமைப்பதற்கான பணிகள் ஆரம்பிக்கப்பட்டு இருக்கின்றன. அங்கு மட்டுமல்ல, வவுனியா, மன்னார் மாவட்டங்களிலும் இப்பணிகள் ஆரம்பிக்கப்பட்டு இருக்கின்றன. இவ்வாறு, பல ஆண்டுகளாகப் புனரமைக்கப் படாத குளங்களைப் புனரமைப்பதற்குரிய செயற்பாடுகளைச் செய்திருக்கின்றோம். இவற்றைச் செய்து முடிக்கின்றபொழுது, நிச்சயமாக அந்தக் குளங்களைப் பயன்படுத்தி விவசாயம் செய்கின்ற விவசாயிகள் கூடியளவு நெல் விளைச்சலைப் பெற்றுக்கொள்ளக் கூடியதாக இருக்கும். இதற்கான விசேட வேலைத்திட்டங்களை விரைவு படுத்துவதற்குரிய அனைத்து நடவடிக்கைகளையும் நாங்கள் எடுத்திருக்கின்றோம். அது மட்டுமல்ல, தித்வா' சூறாவளி காரணமாகப் பாதிப்படைந்த குளங்களைப் புனரமைப் பதற்காக "Rebuilding Sri Lanka" நிகழ்ச்சித்திட்டத்தின் ஊடாக நிதி ஒதுக்கியிருக்கின்றோம். தற்பொழுது, அதற்கான tender procedure வேலைகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. நான் நினைக்கின்றேன், இன்னும் ஓரிரு வாரங்களில் அந்த வேலைத்திட்டமும் ஆரம்பிக்கப்படும் என்று. இதனூடாக நூற்றுக்கணக்கான குளங்கள் புனரமைக்கப்பட்டு, விவசாயிகள் நன்மையடைந்து, கூடுதலான விளைச்சலைப் பெறக்கூடியதாக இருக்கும்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
ஒரு நிமிடம் தாருங்கள்!

இவ்வாறு எங்களுடைய அரசாங்கம் விவசாயிகளின் பல்வேறுபட்ட பிரச்சினைகளுக்குத் தீர்வுகண்டு வருகின்றது. பல்வேறுபட்ட நெருக்கடியான சூழ்நிலைகளிலும் குறிப்பாக, 'தித்வா' புயலால் ஏற்பட்ட பாதிப்பு, எரிபொருள் நெருக்கடி போன்ற சூழ்நிலைகளிலும் நாங்கள் விவசாயிகளுக்கான அபிவிருத்தித் திட்டங்களைத தொடர்ச்சியாக மேற்கொண்டு வருகின்றோம்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
ஒரேயொரு விடயத்தைக் கூறி, எனது உரையை முடிக்கின்றேன்.

முழுமையாக அழிவடைந்த நெல் விளைச்சலுக்கு ஹெக்டெயாருக்கு 150,000 ரூபாய் வீதம் நட்டஈடு வழங்கி இருக்கின்றோம். கடந்த காலங்களில் இவ்வாறான பாரிய தொகை வழங்கப்படவில்லை. பகுதியளவில் சேதமடைந்த விளைநிலங்களுக்குரிய இழப்பீடு இன்னும் வழங்கப் படவில்லை. எதிர்காலத்தில் அதை வழங்குவதற்கான ஏற்பாடுகளையும் மேற்கொண்டு வருகின்றோம் என்பதை இவ்விடத்தில் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.10]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
( மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ගොවියා ගැන කථා කිරීමේදී කියන්න ඕනෑ, ඉතාම කනගාටුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියන එක. මට ඉස්සරහ ආණ්ඩු පක්ෂය පැත්තේ අපේ ගරු නියෝජ්‍ය ඇමති නාමල් කරුණාතිලක මැතිතුමාත් වාඩිවෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, ගොවියෝ කොච්චර මහන්සි වුණාද කියලා ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට ගෙනෙන්න. අවුරුදු කිහිපයක් තිස්සේ, ඒ කියන්නේ මැතිවරණයට අවුරුදු දෙකකට විතර කලින් ඉඳලා තමයි ඔබතුමන්ලා විසින් ගොවියා පාරට ගත්තේ. හැබැයි අවංකව හිතන්න, අද ගොවියාට සාධාරණයක් ඉෂ්ට වෙලා තිබෙනවාද කියා.

මම ඉන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ. මම ගිය සතියේ ගියා, හිරියාලේ තිබෙන අපේ ගොවි ජනපදයට. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ තමයි එය හදා තිබෙන්නේ. අද ඒ ගොවීන් පුදුමු විධියට අසරණ තැනකට පත් වී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන මගේ එක පැත්තකින් දැන් වාඩි වෙලා ඉන්නවා, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. එතුමා දැන් ටිකකට කලින් කථා කළා, අනුරාධපුරයේ, පොළොන්නරුවේ ගොවියාට ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන. මගේ අනෙක් පැත්තෙන් දැන් වාඩි වෙලා ඉන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. අපේ රටේ මොන පැත්ත දිහා බැලුවත්, ඒ කියන්නේ මුළු ලංකාව පුරාම සිටින ගොවීන් අද පුදුම විධියට අසරණ වෙලා තිබෙනවා. මම හිතන විධියට මේ රජයට ඒ ශාපයෙන් නම් ගැලවෙන්න පුළුවන්කමක් නැහැ. මේක විශාල ශාපයක් හැටියට තමුන්නාන්සේලා වටේ කැරකෙනවා.

තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම පාරට දැම්මේ ගොවියා තමයි. ඒ, රුපියල් 150ක් වී කිලෝවකට දෙනවා කියලා. නිකවැරටිය, ගල්ගමුව, යාපහුව, හිරියාල කියන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවි බිම් තිබෙන ප්‍රදේශ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ ගම යාපහුව. ඔබතුමාට පුළුවන් නම් කියන්න, අද වන විට ඒ එක පැත්තකවත් රුපියල් 100න් එහාට වී කිලෝ එකක් විකුණන්න පුළුවන් කොහේද කියා. ආණ්ඩුවෙන් වී කිලෝවක් ගන්න ගණන රුපියල් 120යි කියලා කියනවා. නමුත් ඒ අවශ්‍ය ප්‍රමිතියට වී නිෂ්පාදනය කරන්න ගොවියාට කොහොමටවත්ම බැහැ. ඒ නිසා අද ගොවියා ඉතාම අසරණ තැනට පත් වෙලා තිබෙනවා. කන්න දෙකක වී තිබෙනවා, ගෙවල් ඇතුළේ. කන්න දෙකක වී! අපි කවුරුවත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවකින් මෙවැනි තත්ත්වයක් බලාපොරොත්තු වුණේ නැහැනේ.

ඉස්සර අපට කිව්වේ කොහොමද? ධනවාදී ආණ්ඩුවලින් ගොවියා දිහා බලන්නේ නැහැ කියලායි කිව්වේ. එහෙම කියලා තමයි ගොවියා පාරට අරගෙන තමුන්නාන්සේලා ගොවියාගේ

ඡන්ද ටික අරගත්තේ. ගොවි ජනතාවගෙන් සියයට 80ක් තමුන්නාන්සේලා බලයට පත් කරන්න ඡන්දය දුන්නා. එහෙම අයට තමයි දැන් මෙහෙම සලකන්නේ. අද ගොවියාට කථා කරන්න කෙනෙක් නැහැ. දැන් තමුන්නාන්සේලාට ගිහිල්ලා ගොවීන් එක්ක සාකච්ඡා කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද? නැහැ. ඒ නිසා අද ගොවියා ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත්වෙලා තිබෙනවා.

ගොවි ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා අද උදේ ඉඳලා කථා කරපු දේවල් මම අහගෙන හිටියා. පුදුම බොරු තොගයක් කියන්නේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කාටද මේ බොරු කියන්නේ? මෙහෙම බොරු කිව්වා කියලා ගොවියා රවට්ටන්න පුළුවන්ද? පොළොන්නරුවේ ගොවියා රැවටෙන්නේ නැහැ. ඒක මතක තියාගන්න. ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේලා ගොවියා රැවැට්ටුවා තමයි. හැබැයි, ආයෙත් රවටන්න බැහැ. ඒක මතක තියාගන්න. මොකද, අද වන විට ගොවීන් බොහොම දුප්පත් තත්ත්වයකට පත්වෙලා, විශාල පීඩාවකට පත්ව සිටින පිරිසක් බවට පත්වෙලා තිබෙනවා. අද එතැනට ඔවුන් පත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගොවියාට අපහාස කරන තැනටත් තමුන්නාන්සේලා පත්වුණා. විශේෂයෙන්ම ඉස්සර අපේ රටේ ගොවියා ගැන කියපු දෙයක් තමයි, "මඩ සෝදා ගත් කල ගොවියා රජකමටත් සුදුසුයි" කියන එක. තමුන්නාන්සේලා මෙතැනට ඇවිල්ලා ඒකටත් යම් යම් දේවල් කිව්වා. මම තමුන්නාන්සේලාට කියනවා, ගොවියාගේ වී ටිකට සාධාරණ මිලක් ලබා දෙන්න බැරි වුණා විතරක් නොවෙයි, ගොවියා සම්පූර්ණයෙන්ම පාවිච්චි කරලා බලයට ඇවිල්ලා, අද ගොවියාට පයින් ගහලා, මේ රටේ ගොවීන් ඉතාම අසරණ තත්ත්වයකට පත් කරලා තිබෙන බව. ඉතිහාසයේ කිසිම ආණ්ඩුවක් ගොවියා මෙවැනි තත්ත්වයකට පත් කළේ නැහැයි කියන එක මම පැහැදිලිවම කියන්න ඕනෑ. ගමට ගියාම ඒක අපට පැහැදිලිව පෙනෙනවා.

ඒ නිසා මම කියනවා, තමුන්නාන්සේලා මේ විධියට කටයුතු කිරීම තුළ මේ රටේ අවුරුදු ගණනාවක් ගොවිතැන් කරපු - අවුරුදු 76ක් ගැන කියමින් දැන් තමුන්නාන්සේලා අපට බණිනවා - ගොවි ජනතාව අද ගොවිතැනින් අයින් වෙන්න ලැහැස්ති වෙලා ඉන්න බව. මේ කන්නය වගා නොකරන විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් කන්න දෙකක වී ගෙදර තියාගෙන ඉන්නවා. බොහෝ වෙලාවට ගොවියාගේ ගෙදරක කාමර දෙකයි, තුනයි තිබෙන්නේ. ඒකෙනුත් කාමර දෙකක වී පුරවාගෙන ඉන්නවා. එවැනි තත්ත්වයක් තුළ මේ කන්නයේ ගොවියා වගා කරයි කියලා තමුන්නාන්සේලා හිතනවාද? අපේ ප්‍රදේශවල ගොවියෝ ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එම නිසා මේ ඇත්ත තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්න.

තමුන්නාන්සේලා අද කියනවා, ආණ්ඩුවට සල්ලි තිබෙනවා කියලා. එහෙමනම් ඇයි, ගොවියා ගැන නොබලන්නේ? ඇයි, ගොවියාට සහනාධාරයක් නොදෙන්නේ? ඇයි, ගොවියාට අවශ්‍ය පහසුකම් ටික ලබා නොදෙන්නේ? එම නිසා මම කියනවා, තමුන්නාන්සේලා අද ආත්මාර්ථකාමී විධියට ගොවියා නොසලකා හැර තිබෙනවා කියලා. ඒ නොසලකා හැරීම තුළ එක පැත්තකින් වෙන්නේ මොකක්ද? අපේ රටේ ඉතිහාසයේ ඉඳලා ගොවිතැන් කරලා බත සැපයූ ගොවියාට ඒ වැඩේ එපා කරවලා, අපේ රටේ වී ගොවිතැන විනාශ කරන තැනට තමුන්නාන්සේලා මේ රට ගෙනැල්ලා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව බොහොම පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේකට ප්‍රධානම හේතුව තමයි, අප්‍රේල් මාසයේ තමුන්නාන්සේලා මේ රටට හාල් ගේන්න තීරණය කිරීම. ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයට, සීමා රහිතව හාල් ආනයනයට තමුන්නාන්සේලා අවසර ලබා දුන්නා. ඒ තුළ තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

තමුන්නාන්සේලා ගොවියාගේ කරපිටින් බලයට ඇවිල්ලා, අද ගොවියාට කරන මේ අසාධාරණය තමුන්නාන්සේලාට ශාපයක් වෙනවාය කියන එක මතක් කරමින්, මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.15]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் கொண்டுவரப்பட்டுள்ள விவசாயிகள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

இன்று பாராளுமன்றத்தில் எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள், "இந்த அரசாங்கம் நாட்டில் இருக்கின்ற விவசாயிகளுக்கு என்ன செய்துகொண்டு இருக்கின்றது?" எனக் கேட்கின்றார்கள். நாங்கள் அவர்களிடம் கேட்கின்றோம், "நீங்கள் கடந்த காலங்களில் இந்த நாட்டின் விவசாயப் பெருமக்களுக்கு எதைச் செய்தீர்கள்?" என்று. கடந்த காலங்களில் இந்த நாட்டை ஆட்சி செய்த அரசாங்கங்கள் விவசாயிகளின் தேவைகளைக் கருத்திற்கொள்ளாமல் தான்தோன்றித்தனமாகச் செயற்பட்டதை நாங்கள் பார்க்கக்கூடியதாக இருந்தது. அந்த அடிப்படையில், நாங்கள் இங்கு பல விடயங்களைக் கூற முடியும்.

இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தப் பிரேரணையில், இந்த அரசாங்கம் இரண்டு வருடங்களைக் கடந்து பயணிக்கின்ற இந்த வேளையில்தான் விவசாயிகளுக்கு அதிகமான பிரச்சினைகள் ஏற்பட்டு இருக்கின்றன, அவர்களுடைய உற்பத்திகள் கொள்வனவு செய்யப்படவில்லை, அவர்களுக்கான தேவைகள் நிறைவு செய்யப்படவில்லை என்பதாகப் பல கருத்துக்கள் கூறப்பட்டிருப்பதைப் பார்க்கின்றோம். இவர்கள் கடந்த மூன்று போகங்களை வைத்துப் பேசுகின்றார்களா? அல்லது இவர்களது ஆட்சிக் காலத்தில் விவசாயிகள் விவசாய நடவடிக்கைகளில் ஈடுபடும்போது இருந்த நிலைமைகளைப் பற்றி பேசுகின்றார்களா? என்று நான் கேட்கின்றேன். அரசாங்கத்தை விமர்சிப்பதற்காக, விவசாயிகளிடத்தில் அரசாங்கம் பற்றிய தவறாக எண்ணத்தை ஏற்படுத்துவதற்காக இந்தப் பிரேரணையைக் கொண்டுவந்து இருப்பதுபோல்தான் தெரிகின்றது.

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

கடந்த காலங்களில் இவர்கள் அம்பாறை மாவட்ட விவசாயிகளிடமிருந்து கொள்வனவு செய்த நெல்லுக்கான 32 கோடி ரூபாய் கொடுப்பனவைச் செலுத்தவில்லை. கடந்த காலங்களில் விவசாயிகளோடு நின்ற இந்த அரசாங்கத்தினர், அவர்கள் சார்பாகப் போராடி, அந்தத் தொகையின் ஒரு பகுதியைப் பெற்றுக்கொடுத்த வரலாறு இருக்கின்றது. கடந்த காலங்களில் அரசாங்கங்களுக்கு எதிராக விவசாயிகள் வீதிக்கு இறங்கிப் பல போராட்டங்களை நடத்தியிருந்தார்கள். அதுமாத்திரமல்ல, விவசாயத்துக்குப் பயன்படுத்திய கிருமிநாசினியை அவர்கள் அருந்திய வரலாறும் இருக்கின்றது. அதுமாத்திரமல்ல, பாதைகளை மறித்து பாய்களை விரித்து ஆர்ப்பாட்டம் செய்த வரலாறும் இருக்கின்றது. இந்தப் புதிய ஆட்சியில் எதிர்பார்த்த விடயங்களை இந்த அரசாங்கம் அவர்களுக்காக நடைமுறைப்படுத்திக்கொண்டு இருக்கின்றது என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

'நல்லாட்சி' அரசாங்க காலத்தில் இவர்கள் 6 இடங்களில் ஒரு கிலோகிராம் 99 ரூபாய்படி உருளைக்கிழங்கைக் கொள்வனவு செய்தார்கள். அன்று விவசாயிகளிடமிருந்து கொள்வனவு செய்த உருளைக்கிழங்குக்கான கொடுப்பனவையும் இவர்கள் கொடுக்கவில்லை. இப்போது அமைச்சர்களாக, பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கின்ற பலரும் அன்று அப்போதிருந்த அரசாங்கத்துக்கு எதிராக வீதிகளில் இறங்கி, விவசாயிகளோடு சேர்ந்து போராட்டம் நடத்தியிருந்தார்கள். அந்தக் கொடுப்பனவின் சிறு தொகையை அப்போதிருந்த அரசாங்கத்திடமிருந்து அவர்கள் பெற்றுக்கொடுத்தார்கள். இப்போது நாங்கள் பால் உற்பத்தியாளர்களைக் கவனித்து வருகின்றோம். 'மில்கோ' என்று சொல்லப்படுகின்ற நிறுவனத்தை மூடுவதற்கு, தனியார் மயப்படுத்துவதற்கு இவர்கள் முயற்சி செய்தார்கள். இன்று அந்த 'மில்கோ' நிறுவனம் சிறந்ததொரு நிறுவனமாக, அதிக இலாபம் ஈட்டுகின்ற நிறுவனமாக இருப்பதை நாங்கள் பார்க்கின்றோம்.

விவசாயிகளைப் பற்றி பேசுகின்றபோது, நாங்கள் உரம் சம்பந்தமாகவும் பார்க்கவேண்டி இருக்கின்றது. விவசாயிகளுக்குத் தரமான உரத்தை இந்த அரசாங்கம் வழங்கி வருகின்றது. கடந்த காலங்களில் இவர்கள் திண்மக் கழிவிலிருந்து தயாரிக்கப்படுகின்ற இயற்கை உரத்தை வழங்குவதற்கு முற்பட்டார்கள். செயற்கை உரத்தை இவர்களால் கொள்வனவு செய்து, விவசாயிகளுக்கு வழங்க முடியாத நிலை காணப்பட்டது. எங்களுடைய நாட்டின் விவசாய உற்பத்திகள் குறைவடைந்து சென்றதை அப்பொழுது நாங்கள் அவதானித்தோம்.

கடந்த காலங்களில் உற்பத்தி செய்யப்பட்ட சோளத்தின் அளவு சிறுத்துப் போனதை நாங்கள் பார்த்தோம். அதன்மூலம் கடந்த கால அரசாங்கம் எவ்வாறான உரத்தை விவசாயிகளுக்கு வழங்கியது என்பதைப் புரிந்து கொள்ளக்கூடியதாக இருந்தது. இந்த அரசாங்கம் விவசாயிகளோடு சேர்ந்து, விஞ்ஞானபூர்வமாக அணுகி, எதிர்காலத்தில் இந்த நாட்டுக்குத் தேவையான உற்பத்திகளை இந்த நாட்டின் முதுகெலும்பாக இருக்கின்ற விவசாயிகள் மூலமாகப் பெற்றுக்கொள்வதற்குத் தேவையான புதிய தொழில்நுட்பங்களை அவர்களுக்கு வழங்கி இருக்கின்றது.

அம்பாறை மாவட்டத்தில் விவசாயிகளின் நெல்லைக் கொள்வனவு செய்து சேமிப்பதற்கான எந்தவிதமான அமைப்பும் இருக்கவில்லை. அங்கிருக்கும் நெற்களஞ்சிய சாலைகளில் எலி, புறா, பூனை போன்றவைதான் காணப்பட்டன. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தபிற்பாடு, அவ்வாறான நெற்களஞ்சியசாலைகளைப் புனர்நிர்மாணம் செய்ததால், இப்போது அங்கு தரமான பல நெற்களஞ்சியசாலைகள் இருப்பதை நாங்கள் பார்க்கின்றோம். அதற்காக இந்த அரசாங்கத்துக்கு அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற விவசாயிகள் நன்றி கூறுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. குறிப்பாக, நாங்கள் விவசாயிகளைச் சென்று சந்திக்கும்போது, அவர்கள் பேசுகின்ற விதத்தைப் பார்க்கும்போது எங்களால் அதனைப் புரிந்துகொள்ளக்கூடியதாக இருக்கின்றது. இன்று எதிர்க் கட்சியில் இருக்கின்றவர்கள் இந்தப் பிரேரணையைக்கொண்டு வந்து, அரசாங்கத்துக்குச் சேறுபூசுகின்ற விதமாகப் பேசுகின்றார்கள். எவ்வாறு விவசாயிகளுக்கு உதவ முடியும்? என்ற கேள்வி இன்று இருக்கின்றது. இந்த அரசாங்கம் விவசாயிகளோடு சேர்ந்து பயணிப்பதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

இலங்கையில் விவசாயிகள் எதிர்கொள்ளும் நெல் கொள்வனவு மற்றும் சந்தைப்படுத்தல் தொடர்பான பிரச்சினைகளுக்குத் தீர்வாக, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு, நெல் சந்தைப்படுத்தல் சபை ஊடாக அரசாங்கத்தால் 2026ஆம் ஆண்டின் சிறுபோகத்தில் பல்வேறு விசேட திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டுள்ளன.

சிறுபோக நெல் கொள்வனவுக்கான அவசர வேலைத்திட்டத்துக்காக கமத்தொழில் அமைச்சுக்கு ஆரம்பத்தில் ஒதுக்கப்பட்ட 6,000 மில்லியன் ரூபாய்க்கு மேலதிகமாக, மேலும் 2,500 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டை வழங்க அமைச்சரவை அனுமதி வழங்கியுள்ளது. அந்த நிதி இப்போது விவசாயிகளின் நெல்லைக் கொள்வனவு செய்வதற்குப் பயன்படுத்தப்பட்டு இருக்கின்றது.

அநுராதபுரம், பொலன்னறுவை, புத்தளம், மன்னார், முல்லைத்தீவு மாவட்டங்கள் மற்றும் மகாவலி வலயங்களில் அறுவடை தாமதமடைந்ததன் காரணமாக ஏற்பட்ட நிதிப் பற்றாக்குறைக்குத் தீர்வாக இந்த மேலதிக நிதி வழங்கப்பட்டுள்ளது. இதன்மூலம் திட்டமிடப்பட்ட வரம்பைவிட 67,000 மெற்றிக்தொன்னுக்கும் அதிகமான நெல் அரசாங்கத்தால் நேரடியாகக் கொள்வனவு செய்யப்பட்டுள்ளது. அது மாத்திரமல்ல, தனியார் துறையைச் சேர்ந்த இடைத்தரகர்கள் குறைந்த விலையில் நெல்லைக் கொள்வனவு செய்வதைத் தடுக்கும் வகையில் அரசாங்கத்தால் நிலையான உத்தரவாத விலை நிர்ணயிக்கப்பட்டுள்ளது. 'நாடு' நெல் ஒரு கிலோகிராம் 120 ரூபாய், 'சம்பா' நெல் ஒரு கிலோகிராம் 130 ரூபாய், 'கீரி சம்பா' நெல் ஒரு கிலோகிராம் 140 ரூபாய் என்ற அடிப்படையில் விலை நிர்ணயம் செய்யப்பட்டு, விவசாயிகளுடைய வாழ்வாதாரத்தை இந்த அரசாங்கம் அதிகரித்திருக்கின்றது.

களஞ்சிய வசதிகள் மற்றும் மாவட்ட மட்டத்திலான தலையீடு செய்து 143 நெற்களஞ்சியங்களைத் திறந்து வைத்துள்ளோம். நாடு முழுவதும் நெல் கொள்வனவு செய்வதற்கும் பாதுகாப்பான நெல் கையிருப்பைப் பேணுவதற்கும் நெல் சந்தைப்படுத்தல் சபைக்குச் சொந்தமான 143 களஞ்சியங்கள் செயற்படுத்தப்பட்டுள்ளன. இப்போது, அம்பாறை மாவட்டத்தில் 83 நெற்களஞ்சியசாலைகள் இயங்கிக்கொண்டு இருக்கின்றன. இதன் காரணமாக 64,900 மெற்றிக்தொன் நெல்லைக் கொள்வனவு செய்யக்கூடியதாக இருக்கின்றது. இதன்மூலம் 22,049 விவசாயிகள் நன்மையடைந்து இருக்கின்றார்கள்.

பொதுவாக, கொள்வனவு செய்யப்படும் நெல்லின் அளவுக்கு வரம்புகள் காணப்பட்டபோதிலும், தேவையும் வசதிகளும் காணப்படும் சந்தர்ப்பங்களில், பிராந்திய முகாமையாளர்களின் ஒப்புதலுடன் ஒரு விவசாயியிடமிருந்து கொள்வனவு செய்யப்படும் அதிகபட்ச நெல்லின் அளவை 5,000 கிலோகிராம் வரை அதிகரிப்பதற்கு வாய்ப்பு வழங்கப்பட்டுள்ளது.

இந்த அரசாங்கமானது, இந்த நாட்டில் இருக்கின்ற விவசாயிகளைக் கண்காணித்து, அவர்களுக்கான அனைத்துத் தேவைகளையும் நிறைவேற்றுவதில் கரிசனை காட்டிவருகின்ற ஓர் அரசாங்கமாகக் காணப்படுகின்றது. இதன் காரணமாகத் தான் சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கு நாட்டின் அனைத்து மாகாணங்களிலும் இருக்கின்ற விவசாயிகள் ஆதரவு தெரிவிக்கின்றார்கள். தொடர்ந்து இவருடைய ஆட்சி இந்த நாட்டில் நிலவுவதன்மூலம் விவசாயிகளின் எதிர்பார்ப்புகள் நிறைவேறுமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.25]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினரான மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் கொண்டுவரப்பட்டு இருக்கின்ற விவசாயம் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பலரும் பல்வேறுபட்ட விடயங்களைப் பேசினார்கள்.

'தித்வா' புயல் மற்றும் அதன்போது ஏற்பட்ட வெள்ளப்பெருக்கால் திருகோணமலை மாவட்டத்தில் விவசாய நடவடிக்கைகள் பாரியளவில் சீர்குலைந்து காணப்பட்டன. குறிப்பாக மாவிலாறு அணைக்கட்டு பல இடங்களில் உடைந்ததன் காரணமாக மூதூர், கிண்ணியா பகுதிகள் நீரில் மூழ்கி பலத்த சேதங்களுக்கு உள்ளாகியதை நாங்கள் பார்த்தோம். இந்தப் புயலின் காரணமாக திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற சிறிய, நடுத்தர அளவிலான பல குளங்களும் ஆயிரக்கணக்கான பாசனக் கால்வாய்களும் விவசாய வீதிகளும் கடுமையாகச் சேதமடைந்து காணப்படுகின்றன. இவற்றைப் புனரமைக்கின்ற வேலைகளை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

விவசாயிகள் பெரும்போகத்துக்குத் தயாராகி வருகின்ற இந்த வேளையில், சேதமடைந்த குளங்களைச் சீர்செய்யாமல் இருக்கின்ற காரணத்தால், பருவ மழையால் கிடைக்கின்ற நீரைச் சேகரிக்க முடியாமல் இருக்கின்றது. அதனால் அந்நீர் கடலுக்குச் செல்கின்றது. நீர் பற்றாக்குறை ஏற்பட்டு, வரட்சியை எதிர்நோக்க வேண்டிய ஒரு சூழ்நிலை இனிவரும் காலங்களில் ஏற்படலாம் என்பதனால் சேதமடைந்த குளங்கள், கால்வாய்கள், நீர்ப்பாசன வீதிகள் சம்பந்தமாக அரசாங்கம் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அண்மைக் காலமாக எங்களுடைய மாவட்டத்தில் மிக முக்கிய பிரச்சினையாகக் காணப்படுகின்ற ஒரு விடயத்தை இந்த இடத்தில் குறிப்பிடலாமென நினைக்கின்றேன். மொறவெவ பிரதேச செயலாளர் பிரிவுக்கு உட்பட்ட ரொட்டவெவ மற்றும் மிரிஸ்வெவ பகுதிகளில் இருக்கின்ற விவசாயிகள் 30 வருடங்களுக்கும் மேலாக சேனைப் பயிர்ச்செய்கையில் ஈடுபடுகின்றவர்களாக இருக்கின்றார்கள். அந்தப் பிரதேசங்களில் 400-450 குடும்பங்களைச் சேர்ந்தவர்கள் சேனைப் பயிர்ச்செய்கையை நம்பியே தங்களுடைய விவசாயச் செயற்பாடுகளை முன்னெடுக் கின்றார்கள். இவர்கள் வருடத்தில் 3 அல்லது 4 மாதங்கள்தான் சேனைப் பயிர்ச்செய்கையில் ஈடுபடுகின்றவர்களாக இருக்கின்றார்கள். இப்பொழுது, அந்தப் பிரதேசங்களில் அவர்கள் சேனைப் பயிர்ச்செய்கையைச் செய்ய முடியாத அளவுக்கு, அங்கிருக்கின்ற forest officersஆல் இடையூறு விளைவிக்கும் செயற்பாடுகள் முன்னெடுக்கப்படுகின்றன. அங்குள்ள மக்கள் 30 வருடங்களுக்கும் மேலாக சேனைப் பயிர்ச்செய்கையை மேற்கொண்டு வந்த நிலையில், திடீரென்று அவர்களிடம், "இந்தப் பிரதேசத்துக்குள் பயிர்ச்செய்கை மேற்கொள்ள வேண்டாம்; அவ்வாறு செய்தால் உங்களைக் கைது செய்வோம்" என அங்கிருக்கின்ற வன அதிகாரிகள் எச்சரிக்கும் தொனியில் கூறுவதால், அவர்களுடைய சேனைப் பயிர்ச்செய்கை நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு இருக்கின்றன. இந்தப் பிரதேசத்தில் இன்னும் பல கிராம சேவகர் பிரிவுகள் காணப்படுகின்றன. அந்தக் கிராம சேவகர் பிரிவுகளில் இதற்கு எந்தத் தடையும் இல்லை. ஏன் இந்த மக்களுக்கு மட்டும் தடை விதிக்கிறீர்கள்? என நான் கேட்கின்றேன்.

இந்தப் பிரதேசத்தில் வாழுகின்றவர்கள் முஸ்லிம்கள் என்ற காரணத்தினால்தானா இந்த விவசாயச் செயற்பாடுகளைச் செய்யவிடாமல் தடுக்கின்றீர்கள்? என்ற சந்தேகம் எங்களிடம் காணப்படுகின்றது. சென்ற காலங்களில் முத்துநகர் போன்ற பிரதேசங்களில் நடந்த நிகழ்வுகளைப் பாருங்கள்! அங்குகூட, முஸ்லிம்கள் தாங்கள் விவசாயம் செய்த காணிகளை இன்று முழுமையாக இழந்திருக்கின்றார்கள். அவ்வாறான மறைமுகமான ஒரு விடயம் இன்று ரொட்டவெவ, மிரிஸ்வெவ போன்ற பகுதிகளிலும் முன்னெடுக்கப்படுகின்றதா? என நாங்கள் கேட்க விரும்புகின்றோம். ஏனென்றால், அங்குள்ள மக்கள் சேனைப் பயிர்ச்செய்கையை நம்பித்தான் தங்களுடைய குடும்பச் செயற்பாடுகளை முன்னெடுத்துச் செல்கின்றார்கள். அங்குதான் காலங்காலமாக வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். சென்ற காலங்களில் யானை வேலி அமைக்கும் திட்டத்தைச் சரியான முறையில் முன்னெடுக்கவில்லை. யானை வேலிகள் கிராமங்களுக்குள் அமைக்கப்பட்டிருக்கின்றன. அதற்குள் சென்றால் கைதுசெய்கின்ற நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்கின்றது. மேற்குறித்த விடயம் அரசாங்கத்தால் முன்னெடுக்கப்படுகின்றதா? அல்லது இனவாதத்தை ஏற்படுத்த வேண்டும் என்பதற்காக அதிகாரிகள் செய்கின்றார்களா? என நாங்கள் கேட்க விரும்புகின்றோம். ஏனென்றால், யானை வேலிகளை அமைப்பது தொடர்பில் நான் இந்தப் பாராளுமன்றத்தில் பேசும்போது பல விடயங்களை முன்வைத்தேன். அந்த நேரத்தில் அவர்கள், இது யானை - மனித மோதலைத் தடுப்பதற்காக அமைக்கப்படுகின்ற யானை வேலியாகத்தான் இருக்குமென்ற உத்தரவாதத்தைத் தந்தாலும், இன்று அந்தப் பிரதேசத்துக்கு மக்கள் செல்ல முடியாத நிலை காணப்படுகின்றது.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම කතාව අවසන් කරනවා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் கேட்கின்ற விடயம் என்னவென்றால், காணி தொடர்பான பிரச்சினைகள் இருந்தால், அவற்றை முறையான விசாரணை மற்றும் சட்ட ரீதியான நடைமுறைமூலம் தீர்க்க வேண்டும் என்றுதான். குறிப்பாக, அங்கிருக்கின்ற பிரதேச செயலாளர், forest officers, இதனோடு சம்பந்தப்பட்ட ஏனைய அதிகாரிகள் மற்றும் விவசாயிகளோடு கலந்துரையாடி, அந்தப் பிரதேசத்தில் அவர்கள் சேனைப் பயிர்ச்செய்கையை முன்னெடுப்பதற்கான அனுமதியை நீங்கள் வழங்க வேண்டுமென இந்த உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.31]

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය විසින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයෙන් මේ අවුරුදු දෙක ඇතුළත ගොවි ජනතාවට මොනවත් වුණේ නැහැ කියලා අද යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම මුලින්ම කියන්න කැමතියි, අපි ආණ්ඩුවක් හැටියට අමාත්‍යාංශ වෙන් කරද්දී වතුරට එක ඇමති කෙනෙක්, ඉඩමට එක ඇමති කෙනෙක්, අස්වැන්නට එක ඇමති කෙනෙක්, ඇළ බැම්මකට එක ඇමති කෙනෙක් විධියට ඇමතිවරු වෙන් කළේ නැහැ කියන එක. අපේ ආණ්ඩුව, වැඩ ටික සියල්ල එක අමාත්‍යාංශයකින් කර ගන්න පුළුවන් වන විධියට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග, මහවැලි කියන අමාත්‍යාංශ එකතු කරලා එක අමාත්‍යාංශයක් හදලා, අපේ රටේ ගොවි ජනතාවට තමන්ගේ වැඩ කරගන්න සහනයක් ලබා දීලා තිබෙනවා කියන කාරණය මුලින්ම මම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වී වගාව පිළිබඳව තමයි ප්‍රධාන වශයෙන්ම එතුමිය ඒ යෝජනාවෙන් කියලා තිබුණේ. අපි ආණ්ඩු බලය ගන්නකොට 2024 අවුරුද්දේ අපේ රටේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.7ක්. හැබැයි, අපි ආණ්ඩුව ගත්තාට පස්සේ 2025 අවුරුද්දේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 5.1ක්. ඒ වැඩිවීම ප්‍රතිශතයක් හැටියට ගත්තොත්, 6.6ක්. 2026 අවුරුද්ද ගත්තොත් එය සියයට 14.6ක් ලෙස වැඩි වෙලා තිබෙනවා. මේ සංඛ්‍යා දත්තවලින්ම තේරෙනවා, අවුරුදු 76ක් තිස්සේ වී නිෂ්පාදනය, එහෙම නැත්නම් අපේ රටේ කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් අද විපක්ෂයේ ඉන්න අය ලබා ගත් ප්‍රගතියයි, 2024 අවුරුද්දේ ඉඳලා අපි ලබා ගත් ප්‍රගතියයි කොහොමද කියලා.

2024 සැප්තැම්බර් 21වැනි දා බහුතර බුද්ධිමත් ජනතාවක් අපේ රටේ කරපු දේශපාලන, සමාජ, ආර්ථික පරිවර්තනයේ ප්‍රතිඵල අද අපේ සුවහසක් ජනතාවම භුක්ති විඳිමින් සිටින බව අපට දැකගන්න පුළුවන්. අපේ රට තුළ සාමාන්‍යයෙන් වී වගා කරන භූමි ප්‍රමාණය හෙක්ටෙයාර අටලක්ෂයක්, නවලක්ෂයක් විතර වෙනවා. මෙලෙස වගා කරන භූමි ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා අපි කටයුතු කරන්න ඕනෑ. තව හෙක්ටෙයාර 135,000ක් විතර වගා කරන්න තිබෙනවා. ඒ වාගේම සැලකිය යුතු ප්‍රමාණයක් පුරන් කුඹුරු බවට පත් වෙලා තිබෙනවා.

අපේ අමාත්‍යාංශයේ ජාතික වැඩසටහනක් හැටියට "එක මිටට - ගොවි බිමට" කියන ජාතික ව්‍යාපෘතිය පදනම් කරගෙන, මෙතෙක් වගා කරලා තිබුණු භූමි නැවත වගා කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මේකත් කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට අපේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් ගත් ඉතා සුවිශේෂී ක්‍රියාමාර්ගයක්. මීට අමතරව, මේ දෙගොල්ලන් ආණ්ඩු කරපු කාලයේ වැව් අල්ලාගෙන හිටියේ, වාරි පද්ධති අල්ලාගෙන හිටියේ. මෙන්න මේ ටික නිදහස් කරගන්න ඕනෑ. "වාරි මහිම - අපේ උරුමය" ව්‍යාපෘතිය යටතේ අපි දැන් වැව් ටික නිදහස් කර ගන්නවා, වැව් භාරනවා. වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අපේ ආණ්ඩුව මුදල් වෙන් කරලා තිබෙනවා කියන එකත් අපි මතක් කරන්න කැමතියි. අපි එක වැවක්වත් අල්ලන්න ගියේ නැහැ. වැව් ටික අල්ලලා තමන්ගේ ඉදිකිරීම් කරපු, සංවර්ධනය කියලා ඒ තමන්ගේ වැඩ කරපු මේ අය දැන් අපට කියනවා, කෘෂිකර්ම අමාත්‍යාංශය මොකක්වත් කළේ නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය අපනයන බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා "පොකුරු ගම්මාන" ව්‍යාපෘතිය, ජාතික ව්‍යාපෘතියක් හැටියට පටන්ගෙන තිබෙනවා. ඒ අනුව, "පොකුරු ගම්මාන" 500ක් ඉදිකිරීමේ ක්‍රියාවලිය මේ වනකොට අපි පටන්ගෙන තිබෙනවා. ඒ වාගේම, 2030 අවුරුද්ද වනකොට තැඹිලි ගම්මාන 250ක් පිහිටුවීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතිනවා. කෘෂි කර්මාන්තයට අදාළව, වගා භූමියට අදාළව මේ විධියට අපි වැඩ ටික කරගෙන යනකොට තමයි කියන්නේ, පසුගිය අවුරුදු දෙක ඇතුළත මේ ආණ්ඩුව මොකක්වත් කළේ නැහැ කියලා. අපි ඔබතුමන්ලාගෙන් මේ කාරණයත් අහනවා. ඔබතුමන්ලා අවුරුදු 76ක් තිස්සේ මේ දේවල් කළා නම් අපිට මොකක්වත් කරන්න ඉතුරු වෙන්නේ නැහැ නේ. ඔබතුමන්ලා එහෙම කළා නම් අපිට මේ පාර්ලිමේන්තුවට එන්න ලැබෙන්නේත් නැහැ කියන එක හොඳට මතක තියා ගන්න ඕනෑ. ඒක නිසා ඔබතුමන්ලා නොකරපු දේ තමයි අපි මේ කරන්නේ. ඒ වාගේම අපි කියනවා, ඔබතුමන්ලාට නැවත අපේ රටේ මේ ජාතියේ වැඩ කරන්න ඉඩ දෙන්නේත් නැහැ කියන එක. අර පරණ කරපු ඒවා තව ටිකක් මේ අවුරුදු දෙක තුන තුළදීත් කරන්න ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න. අපි ඔබතුමන්ලාට ඉතාම වුවමනාවෙන් මේ කාරණය කියනවා. අද මේ මාතෘකාව ගෙනාපු එකම හොඳයි. මොකද, මේ වාගේ මාතෘකාවක් ගෙනැල්ලා අපි කරපු වැඩ ටික පාර්ලිමේන්තුව තුළදී රටට ඇහෙන්න, ජාතියට ඇහෙන්න, ජාත්‍යන්තරයට ඇහෙන්න කියා ගන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

වී අලෙවි මණ්ඩලය හැටියට අපි මේ අවුරුද්දේ වී මෙට්‍රික් ටොන් 68,149ක් මිලදී අරගෙන තිබෙනවා. අපි ඔබතුමන්ලාගෙන් අහනවා, ඉතිහාසයේ කවදා හරි දවසක මේ තරම් වී ප්‍රමාණයක් මිලදී අරගෙන තිබෙනවාද කියලා. ඔබතුමන්ලා වී මිලදී ගැනීම නොවෙයි කළේ. අපේ නියෝජ්‍ය ඇමතිතුමා මතක් කළ ආකාරයට, ඔබතුමන්ලා අපේ රටේ තිබුණු වී ගබඩා ටික සම්පූර්ණයෙන්ම වැහෙන්න ඇරියා, කැලැ වැද්දුවා. එහෙම කරලා ඒවා එක එක අයට පෞද්ගලිකව දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන්නේ මහනුවර දිස්ත්‍රික්කය. මහනුවර දිස්ත්‍රික්කයේ වී ගබඩා 9ක් තිබුණා. ඒ වී ගබඩා 9න්, ගබඩා 6ක්ම ඔබතුමන්ලා,

ඔබතුමන්ලාගේ යාළුවන්ට පෞද්ගලිකව බදු දුන්නා, විකුණුවා, අත්හැරියා. අපි බලයට ඇවිල්ලා ඒ වල් වැදිලා තිබුණු ගබඩා ටික සුද්ද කළා. වල් වැදිලා තිබුණු ගබඩා ටික, කඩා වැටිලා තිබුණු ගබඩා ටික අපි ත්‍රිවිධ හමුදාව යොදාගෙන හදා ගත්තා. වී අලෙවි මණ්ඩලයට අයිති ගබඩා 5ක මේ සැරේ මිනිපේ ව්‍යාපාරයේ වී කිරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ කාලයේ ඒවා වැහෙන්න ඇරියා, කඩා වැට්ටුවා, ඉඩම් කෑල්ලත් එක්කම විකුණුවා. එහෙම කරලා අද අහනවා, මොකක්ද කළේ කියලා. ඒ දේවල් නැවත හදපු එක තමයි අපි කළේ. අපි ආණ්ඩු බලය ලබා ගෙන තවම ගත කළේ අවුරුදු දෙකයි. අපිට ඉදිරියට තව අවුරුදු 3ක් තිබෙනවා. ඒ ටිකත් ඉස්සරහට යනකොට බලමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ අයට - මේ දෙගොල්ලන්ට - අපි දැන් සටන් පාඨ අහෝසි කරමින් යන්නේ. ඔබතුමන්ලාගේ පළමුවැනි සටන් පාඨය වුණේ මොකක්ද? ලුණු නැහැ කිව්වා. දැන් ඔබතුමන්ලා එක්කෙනෙක්වත් ලුණු ගැන කථා කරනවාද? දැන් ලුණු ගැන කථා කරන්නේ නැහැ. ඊට පස්සේ හාල් ගැන කථා කළා. දැන් හාල් ගැන කථා කරනවාද? දැන් හාල් ගැන කථා කරන්නේත් නැහැ. දැන් හාල් වැඩියි. දැන් වී මිලදී ගැනීම ගැන කථා කරනවා. අපි කැට තියලා කියනවා, ඔබතුමන්ලාට වී ගැන කියන්න වෙන්නේත් මේ කන්නයේදී විතරයි කියලා. මේ කන්නයේදී විතරයි වී ගැන කියන්න වෙන්නේ. ඊළඟ කන්නයේ අස්වැන්න නෙළනකොට, 2026-2027 මාස් කන්නය අවසන් වනකොට, ගොයම් කපනකොට ඔබතුමන්ලාට නැවත වී ගැන කථා කරන්න හම්බ වෙන්නේත් නැහැ.

අපි දැන් ඔබතුමන්ලාට සටන් පාඨ නැති කරමින් යන්නේ. ඔබතුමන්ලා ගොවි ජනතාව සම්බන්ධයෙන් කථා කරන්න කියලා මේ පාර්ලිමේන්තුවේ විවාදයක් ඉල්ලලා ගොවියා ගැන වචනයක් දෙකක් කිව්වා කියලා ගොවි ජනතාව නැවත රැවටෙන්නේ නැහැ. ඒ අය නැවත රැවටෙන්නේත් නැහැ, රවටන්නත් බැහැ. මොකද, ඒ මිනිස්සු දැන් වෙනස් වෙලා ඉන්නේ. ඒ මිනිස්සු 2022 අවුරුද්දෙන් පස්සේ - අරගළයෙන් පස්සේ - වෙනස් වෙලා ඉන්නේ.

මම මීට කලින් කථා කරපු අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු දෙතුන්දෙනෙක් කියපු කථා ගැනත් කියන්න කැමතියි. අපේ රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය මාතලේ දිස්ත්‍රික්කයයි නියෝජනය කරන්නේ. මේක කියන්නත් ලජ්ජයි. මෙතුමියලා පළපුරුදු, අවුරුදු 25ක්, 30ක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ හිටපු අය. අපි මේ අයගේ නම කිව්වාම නැඟිටිනවා නේ. ඇත්ත කිව්වත් නැඟිටිනවා, බොරු කිව්වත් නැඟිටිනවා. නම කිව්වාම නැඟිටින මන්ත්‍රීවරු, මේ. ඉස්කෝලේ එක වසරේ, දෙක වසරේ ඉන්න ළමයින්ගේ නම් කථා කරද්දී ඒ ළමයි නැඟිටිනවා වාගේ මේ අයත් නැඟිටිනවා. ඒ වාගේ තමයි ඒ අය මේ පාර්ලිමේන්තුවත් පාවිච්චි කරන්නේ. අපි හිතුවා, මේ අයගෙන් අපිට අත්දැකීම් ගන්න පුළුවන් කියලා. මොන අත්දැකීම්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? නම කියනකොට නැඟිටිනවා. මොන නමක් කිව්වත් නැඟිටිනවා. මම කියන්නේ, දැනුත් ඉන්නවා නම් නැඟිටින්න කියලායි. එහෙම එකක් තිබෙන්නේ.

රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය කිව්වා, අද ගොවීන්ට වී කිලෝවකින් රුපියල් 37ක් පාඩුයි කියලා. මම අහනවා, අද ගොවීන් ඉඩම් හිමියාට දෙන්නේ වී කිලෝ ගාණද, එහෙම නැත්නම් වී විකුණලා මුදල්ද කියලා. මේ අය ඒකවත් දන්නේ නැහැ. වී දෙන්නේ, සල්ලි නොවෙයි. අද ගොවියා, අද කුඹුර කොටලා ඉඩම් හිමියාට දෙන්නේ වී මිසක් සල්ලි නොවෙයි. නමුත් එතුමිය කියනවා, මෙච්චරක් පාඩුයි කියලා.

ඊළඟට අපි දැක්කා ළමා ලෝකයේ වීරයා. අදත් එයා වීරයා කියලා පෙන්නුවා. මේ ගරු සභාව ඇතුළට ඇවිල්ලා, mobile phone එක on කරලා mike එකට අල්ලනවා, අහගෙන ඉන්න. ඕවා මේ රටේ මිනිස්සු අහලා තිබෙනවා. මේවා ළමා ලෝකයේ වීරයා කරන වැඩ. ගරු මන්ත්‍රීවරුනි, ඔය විපක්ෂ නායකතුමාත් එක්ක ඔබතුමන්ලාට ජීවිතේට දිනන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා වෙන විපක්ෂ නායකයකු හොයා ගන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
මට තව පොඩි වේලාවක් දෙන්න.

නාමල් රාජපක්ෂ මහත්මයාත් මොනවාද කියලා ගියා. අපි සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට මාස 8ක පොලී රහිත ණයක් දීලා තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට පොලී රහිත ණය දුන්නාම ඒගොල්ලන් විනාශ වෙනවාලු. අපි අහනවා, එහෙම විනාශ වෙන්නේ කොහොමද කියලා. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට මාස 8ක පොලී රහිත ණයක් දුන්නාම ඒ අය විනාශ වෙනවා කියලා නාමල් බේබි කියනවා! මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයට මේවා තේරුම් කරන්න අපි ඉගෙන ගෙන නැහැ.

බොහොම ස්තුතියි, වෙලාව ලබා දුන්නාට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.42]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත මේ රටේ ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් යටපත් කරන පනතක්, කෲර වධ හිංසාවලට පුරවැසියන් යටත් කරන පනතක් කියන කාරණය ගැන දීර්ඝ කාලයක් විවේචන තිබුණා. ඒ නිසා වසර 40කට වැඩි කාලයක් මේ රටේ භාවිත වෙලා තිබෙන මේ තාවකාලික විධිවිධාන පනත; ඒ නීතිය වෙනුවට අලුත් නීතියක් අරගෙන එන්න ඕනෑය කියන එක, ඒ කියන්නේ පුරවැසි අයිතිය රකින, රාජ්‍යය රකින, ත්‍රස්තවාදයෙන් රට ආරක්ෂා කරන ගමන්ම මානව හිමිකම් ආරක්ෂා කරන නීතියක අවශ්‍යතාව කවුරුත් පිළිගත්තා. ඒ අනුව තමයි දීර්ඝ කාලයක් තිස්සේ මේ කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය සිද්ධ වුණේ, අලුත් නීතියක් අරගෙන එන්න.

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ නීතිය කියලා අලුත් පනත් කෙටුම්පතක් තමුන්නාන්සේලාගේ රජය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි අපේක්ෂා කළේ මොකක්ද? අපේක්ෂා කළේ, තිබුණු අසාර්ථක පනත වෙනුවට අලුත් නීතියක් අරගෙන ඒමයි. තිබුණු පනතින් ත්‍රස්තවාදය වළක්වා ගන්නත් බැරි

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

වුණා, පුරවැසි අයිතිය රකින්නත් බැරි වුණා. අවසානයේදී මහ යුද්ධයකින් මේ රටේ දස දහස් ගණනක් මිනිස්සු - සෑම ජාතියකම - ජීවිත පිදුවා. මේ රටේ නීති පද්ධතිය කඩා වැටුණා. සිවිල් යුද්ධයක් ඇති වුණා. ඒ නිසා අසාර්ථක වෙච්ච ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට අලුත් නීතියක් අරගෙන ඒමයි අපේක්ෂා කළේ.

මේ ගෙනැල්ලා තිබෙන අලුත් පනත් කෙටුම්පත පිළිබඳව නිර්දේශ ලබා ගැනීමට වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු විශේෂඥ කණ්ඩායමක් පත් කළා. ඒ කණ්ඩායම පත් කළේ රජය. ඒ අය රජය වෙනුවෙන් කෙටුම්පතක් සකස් කළා. ඒ කෙටුම්පත පිළිබඳව දීර්ඝ කාලයක් වාද විවාද කළා. මෙතෙක් කල් තිබුණු නීතියේ අඩුපාඩුකම්, ඒ නීතිය ක්‍රියාත්මක වීමේදී ඇති වුණු ප්‍රශ්න, මානව හිමිකම් කෙරෙහි තිබුණු තර්ජන, ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව නීති සකස් කිරීමේදී රටට තිබෙන වගකීම, ජාත්‍යන්තරයේ අපට තිබුණු විවේචන කියන මේ සියල්ල ගැන අවධානය යොමු කරමින්, නිරපරාදේ අහිංසක මිනිසුන්ව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට අරගෙන කටයුතු කරන - යම් කාරණයක් පිළිබඳව සිවිල් විරෝධයක් පාන, පුරවැසි අයිතිය රකින්නට පාරට එන, ප්‍රකාශ කරන, පොත් ගහන, පත්‍රිකා ගහන, පෝස්ටර් බෙදන, පෙළපාළි යන, මේ රටේ නීත්‍යනුකූලව රජයට එරෙහිව සටන් කරන පුරවැසියන්ව ත්‍රස්තවාදීන් ලෙස අර්ථ නිරූපණය කරලා ඔවුන්ව දීර්ඝ කාලීනව නඩු නැතිව, හේතු නැතිව, සාක්ෂි නැතිව, ආරක්ෂක ඇමතිවරයාගේ විධානය මත හිරකරලා තබන - ඒ කෲර නීතිය ඉවත් කරන්නයි මේක යෝජනා කළේ. නමුත් මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒ කමිටුවේ නිර්දේශවලට පටහැනිව කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම නම්, කමිටු දැම්මේ මොකටද? විශේෂඥ මතය ගත්තේ මොකටද? මේ ආණ්ඩුව, අනුර කුමාර දිසානායක මහත්මයාගේ රජය විශේෂඥ මතය සලකන්නේ නැද්ද? විශේෂඥ මතයට ගරු කරන්නේ නැද්ද? ඒ අය විසින් ඉදිරිපත් කරපු, අනුමත කරපු කෙටුම්පත සලකා බලන්නේ නැතිව හිතුවක්කාර විධියට මේ රටේ පුරවැසි අයිතිය යටපත් කරන, සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනාම විසින් ප්‍රතික්ෂේප කළ යුතු නීතියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා, මේ නැවත අරගෙන එන්නේ කෲර නීතියක්; මේ නැවත අරගෙන එන්නේ පුරවැසියාව යටපත් කිරීමට අදාළ කාලයේ පවතින රජයට අනවශ්‍ය තරම් අධික බලතල දෙන නීතියක්. සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන්, මිනිස්සුන්ගේ ජීවත්වීමේ අයිතිය වෙනුවෙන්, ගොවියාගේ අයිතිය වෙනුවෙන්, කාර්මිකයාගේ අයිතිය වෙනුවෙන්, වෘත්තීය සමිති අයිතිවාසිකම් වෙනුවෙන්, නීතිඥ වෘත්තියේ අයිතිවාසිකම් වෙනුවෙන්, පොදුවේ රට වෙනුවෙන් පාරට බසින, සටන් කරන, මිනිස්සුන්ව පීඩාවට පත් කරන නීති කෙටුම්පතක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා සමගි ජන බලවේගය හැටියට අපි මේ නීතියට එරෙහි වෙනවා. ඒ වාගේම, සියලු පක්ෂ එකමුතුව මේ පනත් කෙටුම්පත පරාජයට පත් කරන්න අපි කටයුතු කරනවා කියන කාරණය ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.46]

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විපක්ෂය විසින් අද දිනයේ ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව ගැන තමයි මේ වෙලාවේ අපි කථා කරන්නේ. මම පළමුවෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. දැන් විපක්ෂයට අමු කැවිලා තිබෙන්නේ. එක් මන්ත්‍රීවරයෙක් නැඟිටලා කියනවා කන්න දෙකක වී දැන් ගොවි ජනතාව ළඟ ඔවුන්ගේ ගෙවල්වල තිබෙනවා කියලා. කන්න දෙකක වී ගෙවල්වල තබාගන්න ගොවි ජනතාවට පුළුවන් නම් ගොවියාගේ ආර්ථිකයේ විශාල ශක්තිමත්භාවයක් ඇති වෙලා තිබෙනවා. පසුගිය දශකය ගත්තොත්, පසුගිය දශකය තුළ ගොවි ජනතාව වස බිව්වා, තමන්ගේ නිෂ්පාදන විකුණාගන්න බැරිව. ගොවි ජනතාව වස බීපු යුගයක් තිබුණා, ගොවි ජනතාවගේ වී ඇටයක් ගෙදරක නොතිබුණු යුගයක් තිබුණා. ඒ යුගය පසු කර ඇවිත් දැන් මේ මාතෘකාවක් විවාදයට අරගෙන ඒගොල්ලන්ම කියනවා, කන්න දෙකක වී stock වෙලා තිබෙනවාලු ගොවි ජනතාවගේ ගෙවල්වල. එහෙම නම්, ගොවි ජනතාව ශක්තිමත් වෙන්න ඕනෑ. අපි හිතන්නේ නැහැ ගොවි ජනතාව තවම එහෙම ප්‍රමාණයකට ශක්තිමත් වෙලා කියලා. නමුත්, විපක්ෂය තමන්ගේ දේශපාලන බංකොලොත්භාවය වහගන්න හදනවා නැති ප්‍රශ්නයක් විවාදයට ගෙන එමින්.

දැන් එතුමන්ලා ගත්ත විවාදය තුළ කිව්වා නේ, පොළොන්නරුවේ පැවැති රැලියක් පිළිබඳව. ඒ පොළොන්නරුවේ රැලිය කළේ ව්‍යාපාරිකයින්, පොළොන්නරුව රැලියේ රටේ කෘෂිකර්ම ඇමති, නියෝජ්‍ය ඇමති හිටියේ නැහැ කියලා කිව්වා. ඒ රැලියේ සිටියේ ගොවි ජනතාව. අපි කළේ ගොවිජන රැලියක්. ඒ රැලියේ වේදිකාවේ සිටියේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම ව්‍යාපාරවල ගොවි නායකයින්. මහවැලි ගොවි නායකයින් වේදිකාවේ සිටියේ. අපි ගොවි රැලියක් කළාම ඒ ගොවි රැලියට කෘෂිකර්ම ඇමති යන්න ඕනෑද? මොකක්ද දන්නේ නැහැ විපක්ෂයට ඒ ගැන හැදුණු බඩේ අමාරුව? තමන්ගේ සජබයේ ප්‍රශ්න ගැන කථා කරගත්තා නම් ඉවරයි නේ. අපි සූදානම් කරපු ගොවි රැලියේ කෘෂිකර්ම ඇමති නැහැ, නියෝජ්‍ය ඇමති නැහැ කියලා සජබයට මොකද? සජබය මොකද ඒකට මර ළතෝනි දෙන්නේ? මේ ඉන්නේ, අපි. අදටත් සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ලේකම්, මම. ඉතින්, අපි සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ රැලියක් පැවැත්වූවාම, ඒකට සජබයට "ඩෝං" ගිහින් තිබෙන්නේ මොකද?

උදේ පාන්දර අපේ විපක්ෂ නායකතුමා කිව්වා, වී කිලෝවක් සඳහා රුපියල් 150ක් දෙන්න කියලා අපි සටන් කළාය කියලා. අපි එහෙම සටනක් කරලා නැහැ. එතුමා තමයි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පට්ටපල් බොරු කියන්නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ අපේ රටේ රසායනික පොහොර භාවිතය සම්පූර්ණයෙන්ම නතර කළා. එදා, පොහොර මිටියක් රුපියල් 50,000කටත් වඩා වැඩි වුණු වෙලාවේ, ගොවි ජනතාවගේ නිෂ්පාදන වියදම ඉහළ ගියා. ඒ වාගේම, අස්වැන්න අඩු වුණා. අස්වැන්න ගන්න බැහැ පොහොර ගහන්නේ නැතිව. දැන් නම් අක්කරයකින් අවම අස්වැන්න වී කිලෝ 2,000ක් විතර එනවා. ඒ වෙලාවේ අක්කරයකින් වී කිලෝ 1,000ක්වත් ආවේ නැහැ. ඒ අවස්ථාවේ වී කිලෝවක නිෂ්පාදන වියදම වැඩිවෙලා තිබුණා, රුපියල් 150කට වඩා. එක්කෝ ඒ නිෂ්පාදන වියදම අඩු

කරන්න ඕනෑ. එහෙම නිෂ්පාදන වියදම අඩු කරන්නේ නැත්නම් ගොවීන්ට සහනාධාරයක් දෙන්න ඕනෑ, රුපියල් 150ට වටින. අපි ඒ රුපියල් 150 ගැන කථා කළේ එහෙමයි. එහෙම නැතිව වී කිලෝවක් සඳහා රුපියල් 150ක් ගෙවන්න කියලා අපි කථා කළේ නැහැ. මොකද, ඒ වෙලාවේත් අපි කිව්වා රුපියල් 150ට වී කිලෝවක මිල වැඩි කළොත් හාල් කිලෝවක මිල රුපියල් 300ට වඩා වැඩි කරන්න වෙනවා කියලා. ඒ නිසා අපි ඒ ගැන කථා කළේ නැහැ. හැබැයි, විපක්ෂ නායකතුමාට කොහෙන් හරි වැරදි තොරතුරුම නේ දෙන්නේ. කවුරු හරි එතුමාට ලියලා දෙනවා තොරතුරක්. ඒක ගෙනැල්ලා මෙතැන දෙසා බානවා. ඒවා ගැන මොන දෙයක්වත් හොයන්නේ නැහැ; බලන්නේ නැහැ. වී කිලෝ එක රුපියල් 150ක් කරන්න කියලා අපි සටනක් ගෙන ගියා කියලා පුළුවන් නම් පෙන්වන්න. අපි එවැනි සටනක් ගෙන ගියේ නැහැ. අප හැමදාම සටන් කළේ, නිෂ්පාදන වියදම තුනෙන් බෙදලා, ඒකට එක ගුණයක් එකතු කරලා වීවල මිල තීන්දු කරන්න කියලායි. ඒක තමයි අපේ සටන් පාඨය වුණේ. අවුරුදු 10ක්, 15ක් නොවෙයි, අවුරුදු 20ක්, 30ක් තිස්සේම අප සටන් පාඨය විධියට අරගෙන ආවේ එයයි. ඒ සටන් පාඨයෙන් තොරව අපි ගියේ නැහැ.

ඊළඟට කියනවා, වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න - නිෂ්පාදන වියදම - රුපියල් 137ක් යනවා කියලා. රුපියල් 137ක් යන්නේ, වර්ෂා පෝෂිත ප්‍රදේශවල; වර්ෂාවෙන් වගා කරන ඉඩම්වල මිස වාරිමාර්ග ඉඩම්වල නොවෙයි; කෘෂිකාර්මික ඉඩම්වල නොවෙයි. වර්ෂාවෙන් වගා කරන ඉඩම්වල අස්වැන්න අඩුයි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය තොරතුරු කියන්නේ, හෙක්ටෙයාරයකට අස්වැන්න වී කිලෝ 1,000ක් ලෙස අරගෙනයි. එතකොට වී කිලෝ 1,000 නිෂ්පාදන වියදමෙන් බෙදුවාම එහෙම වැඩි මිලක් එනවා. අද මේ සාකච්ඡාව පැවැත්වෙන නිසාම මම පොළොන්නරුවේ ගොවියෙකුගෙන් ගෙන්වා ගත්තා, ඒ ඒ ගොවි ජනතාවට ඒ ඒ itemsවලට යන නිෂ්පාදන වියදම පිළිබඳ විස්තරයක්. මේක ගොවියෙකුගෙන් ගෙන්වා ගත්තේ. මම මේ ලේඛනය සභාගත කරන්නම්.

මේක අප කියන එකක් නොවෙයි. ඒ ගොවියා කියනවා, ඇළ වේලි සුද්ද කරන්න, එනම් වතුර දෙන වෙලාවේ ඇළ වේලි සුද්ද කරන්න රුපියල් 1,000ක් යනවා කියලා. සාමාන්‍යයෙන් පැය දෙකතුනකදී ඇළ වේල්ලක් සුද්ද කරන්න රුපියල් 1,000ක් යනවාලු. හී තුන හාන්න අක්කරයකට රුපියල් 25,000යි; නියර බඳින්න, රහින්න අක්කරයකට රුපියල් 14,000යි. වී වැපිරීම සඳහා අක්කරයකට රුපියල් 7,000යි. වල් නාශක සඳහා අක්කරයකට රුපියල් 5,000යි. බිත්තර වී සඳහා අක්කරයකට රුපියල් 9,000යි. මූලික පොහොර, ඒ කියන්නේ මඩ පොහොර -TSP - සඳහා අක්කරයකට රුපියල් 4,900යි. මතුපිට පොහොර, යූරියා ඇතුළු පොහොර වර්ග සඳහා අක්කරයකට රුපියල් 35,000යි. කෘමිනාශක සඳහා රුපියල් 4,000යි. වල් නාශක, දිලීර නාශක සඳහා රුපියල් 3,000යි. අස්වනු නෙළීම - කැපීම - සඳහා රුපියල් 15,000යි. ඊළඟට, වී වේළීමට රුපියල් 3,000යි; ප්‍රවාහනය සඳහා රුපියල් 2,500යි. අනෙකුත් වියදම් සඳහා රුපියල් 8,000යි. මේවා තමයි ගොවි මහත්මයෙක් එවා තිබෙන, අක්කරයකට යන නිෂ්පාදන වියදම්. මම මේ විස්තරය ගෙන්වා ගත්තා. එතකොට මේ කියන මුළු වියදම, රුපියල් 137,400යි. අස්වැන්න කිලෝ 2,000යි. ඒ 137,400 බෙදුවාම 2,000න්, කිලෝ එකකට රුපියල් 68යි. අක්කරයක අස්වැන්න කිලෝ 1,800යි කියලා හිතුවොත්, කිලෝ එකකට රුපියල් 76යි. මේක තමයි ගොවියාට යන වර්තමාන නිෂ්පාදන වියදම. ඕනෑම ගොවියෙකුගෙන් අහන්න පුළුවන් මේ ගැන. දැන් මේ කයිවාරු ගහන, මේ යෝජනාව විවාදය සඳහා ඉදිරිපත් කරපු කට්ටිය පුළුවන් නම් කියන්න, මේ item එකෙන් item එකට අක්කරයකට යන වියදම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ අය ගොවිතැන් කරන්න එපායැ, ඒ ගැන කියන්න.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ඒ අය ගොවිතැන් කරන්නේ නැහැ නේ. ව්‍යාපාරිකයෝ නේ ඇවිල්ලා තිබෙන්නේ. මේක තමයි ගොවියාගේ නිෂ්පාදන වියදම. හැබැයි, අපි විශ්වාස කරනවා ගොවියාට ජීවත් වෙන්න මේකෙන් ලබන ලාභය විතරක් ප්‍රමාණවත් නැහැ කියලා. ගොවියාට ජීවත් වීම සඳහා යන තවත් වියදම් තිබෙනවා. දරුවන් පාසල් යවන්න ඕනෑ; ආහාර ගන්න ඕනෑ; ඇඳුමක් කැඩුමක් ගන්න ඕනෑ; විනෝද වෙන්න ඕනෑ. ඒවා සඳහා යන තවත් සමාජ වියදමක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේ මුදල හම්බ වුණේත් නැහැ, මේ මහත්තුරු රට පාලනය කළ කාලයේ. නිෂ්පාදන වියදමට සාධාරණ මිලක් තිබුණේ නැහැ, සජබයේ අය ආණ්ඩු කරපු කාලයේ. 2010-2015 කාලයේත් මේ රටේ වගා හානි සිද්ධ වුණා. එක කුඹුරකටවත් වගා වන්දි ගෙව්වාද? "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා ගොවි ජනතාවගේ කුඹුරු විනාශ වුණා. "දිට්වා" සුළි කුණාටුව එනකොට ගොයම සාමාන්‍යයෙන් දින 10-15 අතර වයසක තිබුණේ. දින 10-15 අතර වයසක ගොයමකට හානි වුණාම මූලිකව ගිය වියදම් විතරයි වන්දි මුදල විධියට සාමාන්‍යයෙන් ගෙවන්නේ. ඒ කියන්නේ, රුපියල් 5,000ක්, 10,000ක් ගෙවයි. ඊට වඩා ගෙවන්නේ නැහැ. මෙතෙක් ඉතිහාසයේ ගෙවලා තිබුණේ එහෙමයි. හැබැයි, අපි පූර්ණ හානියක් ලෙස සලකා, ඒ කියන්නේ කුඹුර පැහෙන කල් යන වියදම සලකා, ගොයම් කපන්න යන වියදමත් ගණනය කරලා හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් ගෙව්වා. සජබයේ ඔබතුමන්ලාත් ආණ්ඩු කරපු යූඑන්පී ආණ්ඩු ඉතිහාසයේ හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක වගා වන්දි ගෙවපු අවස්ථාවක් පුළුවන් නම් කියන්න; මෙන්න මේ කන්නයේ එතරම් මුදලක් ගෙව්වා කියලා පුළුවන් නම් කියන්න. අපි ගොවීන් එක්ලක්ෂ දාහත්දහසකට ගෙවලා තිබෙනවා, රුපියල් මිලියන අටදහස් නවසියයකට වඩා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
වැඩි වෙලාවක් දෙන්න බැහැ නේ.

අපි ගොවීන් එක්ලක්ෂ දාහත්දහසකට ගෙව්වා, රුපියල් මිලියන අටදහස් නවසියයක්. ඒ වාගේම, අපි පොහොර සහනාධාරය සම්පූර්ණයෙන්ම ගොවීන්ට ගෙවනවා. විපක්ෂය දැන් කියනවා, පොහොර සහනාධාරය කලට වේලාවට ලැබෙන්නේ නැහැ කියලා. අපි පොහොර සහනාධාරය විධියට ගොවියාට දෙන්නේ මුදලක්. ඕනෑම තැනකින් පොහොර ටික ගන්න කියලා අපි ගොවියාට කියනවා. හැබැයි, පසුගිය කන්නයේ ඇති වෙච්ච ප්‍රශ්නය නිසා අපි පොහොර ගෙනැවිත් ගොවීන්ට ලබා දුන්නා. එහෙම නැත්නම් ඕනෑම තැනකින් ගොවියාට පොහොර ටික ගන්න පුළුවන්. ඒ සඳහා වන මුදල් අපි දෙනවා. ඒ නිසා කලට වේලාවට පොහොර ටික ලැබෙනවා. කලට වෙලාවට වතුර ටික ලැබෙනවා. ඊළඟ කන්නයට වතුර ලබා දීම සම්බන්ධයෙන් තීන්දු ගන්න ගොවි නායකයන් එකතු කරන Water Panel රැස්වීම අපි

[ගරු ටී.බී. සරත් මහතා]

පැවැත්වූවා. එය පැවැත්වුණේ මහනුවර. ඒ රැස්වීමේදී ත්‍රිකුණාමලයේ අල්ල කලාපයේ ගොවි ජනතාවගේ නායකයෝ කිව්වා, හෙක්ටෙයාරයකට වී කිලෝ දොළොස්දාහක් ගන්නවා කියලා. මේ 130,000 ඒ 12,000න් බෙදුවොත් රුපියල් 30කටත් වඩා අඩුයි. ඒ අය හෙක්ටෙයාරයකට වී කිලෝ 12,000ක් ගන්නවා. වී නිෂ්පාදනය වැඩි වෙලායි තිබෙන්නේ.

මේ රටේ ගොවි ජනතාවට ප්‍රශ්න තිබෙනවා. අවුරුදු දෙකක් ඇතුළත ඒ සියලු ප්‍රශ්න විසඳන්න බැහැ. හැබැයි, මේ රටේ ගොවි ජනතාව සමඟ අපි ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න ක්‍රමානුකූලව විසඳමින් ඉන්නවා. ඔවුන්ගේ වී නිෂ්පාදනය සඳහා කිලෝවකට රුපියල් 120ක සාධාරණ මිලක් දීලා තිබෙනවා. හැබැයි, සම්පූර්ණ අස්වැන්න රුපියල් 120ට විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. එහෙම නම් වෙළෙඳ පොළ ඇතුළේ රුපියල් 120ට සියයට සියයක්ම විකුණන්න පුළුවන් වටපිටාවක් හදන්න ඕනෑ. අපි ඒ වටපිටාව හදමින් ඉන්නවා. අපි ගොවියාට ඕනෑ කරන දියුණු උපකරණ ගෙනැවිත් දෙමින් ඉන්නවා, දියුණු යන්ත්‍රෝපකරණ ගෙනැවිත් දෙමින් ඉන්නවා, ගොවියාගේ නිෂ්පාදන වියදම අඩු කරමින් ඉන්නවා.

සෑම දිස්ත්‍රික්කයකම ගොවි ජනතාව වගා කරන සෑම නිෂ්පාදනයකටම සාධාරණ මිලක් ලබා දෙමින් සාධාරණය ඉෂ්ට කරමින් ඉන්නවා. බී ලූනු ටික නිසි මිලකට විකිණෙමින් තිබෙනවා, අල ටික විකිණෙමින් තිබෙනවා, එළවලු ටික විකිණෙමින් තිබෙනවා. වෙනදා වාගේ නොවෙයි, ගොවි ජනතාවගේ නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලැබෙමින් තිබෙනවා. හැබැයි, ඒ මිල ඔවුන්ගේ අනෙකුත් වියදම්වලට සාපේක්ෂව ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. එහෙම නම්, ගොවි ජනතාවගේ ජීවිත වෙනස් කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් වෙනත් වැඩ පිළිවෙළක් අපේ ආණ්ඩුව සතුව තිබෙනවා. ඉදිරි අය වැයේදී දැනගන්න පුළුවන් වෙයි, මේ ආණ්ඩුව ගොවි ජනතාව වෙනුවෙන් තවත් මොනවාද කරන්නේ කියලා.

අපි බොහොම පැහැදිලිව මේ කාරණය කියනවා. ගොවි ජනතාවට ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න විසඳා ගන්න ගොවියෝ සමගි ජන බලවේගය ළඟට එන්නේ නැහැ. ප්‍රශ්න විසඳා ගන්න ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවක් එන්නේ අපේ රැලිවලට. ඔවුන් අපේ රැලිවලටයි එන්නේ. අපේ රැලිවලට ඇවිල්ලා තමයි ඔවුන්ගේ ප්‍රශ්න විසඳා දෙන්න කියලා කියන්නේ. මේ රටේ ගොවීන්ගේ සාධාරණ අයිතීන් හැමදාමත් රැක්කේ, අපි. ආණ්ඩුව ඇතුළේත් අපි ඒ සාධාරණ අයිතීන් රකිනවා; ගොවි ජනතාවට සාධාරණය ඉෂ්ට කරනවා. ඒ වාගේම, මේ රටේ සමස්ත ගොවි ජනතාව ජාතික ජන බලවේගය ආණ්ඩුව සමඟ ඉදිරියටත් ඉන්නවා කියන කාරණය කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තාහීර් මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහීර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
මට විනාඩි 5ක් තිබුණා නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමායි වැඩිපුර කාලය අරගෙන තිබෙන්නේ.

[අ.භා. 3.59]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහීර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගොවි ජනතාව අද මුහුණ දෙන ප්‍රශ්න සම්බන්ධයෙන් විපක්ෂය ගෙනාපු යෝජනාව ගැන අපි දෙගොල්ලන්ම කථා කරනවා. ඇත්තටම ගොවි ජනතාව ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒකේ කිසිම සැකයක් නැහැ. එක එක පළාතට එක එක විධියේ ප්‍රශ්න තිබෙනවා; නැඟෙනහිරට වෙනම ප්‍රශ්නයක්, උතුරට වෙනම ප්‍රශ්නයක්, වයඹට වෙනම ප්‍රශ්නයක් වශයෙන්. ඒ නිසා ගොවි ජනතාවගේ ප්‍රශ්න හරියට හඳුනාගෙන විසඳුම් ලබා දෙන්න ඕනෑ.

අවුරුදු 76ක් තිස්සේ ප්‍රශ්නයක් තිබුණා. වර්තමානයේත් ඒ ප්‍රශ්නය තිබෙනවා. එහෙත් අවුරුදු දෙකකට පස්සේ ඒ ප්‍රශ්නය විසඳිලා තිබෙනවා කියන එක නොවෙයි දැන් මෙතැන තිබෙන කාරණය. ඇත්තටම අද වී ගොවියාට වී ටික විකුණා ගන්න බැහැ. ගොවීන් ගෙවල්වල වී stock කරගෙන ඉන්නවා. ඒකට පිළිතුර මොකක්ද? ඒ වෙනුවෙන් කරන්න පුළුවන් මොකක්ද කියලා අපි හොයන්න ඕනෑ.

දඹුල්ලේ බී ලූනු ගොවීන්ට බී ලූනු ගලවලා වෙළෙඳ පොළට දාන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒකට විසඳුම මොකක්ද? ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය සහ නොරොච්චෝලේ ප්‍රදේශවල එළවලු ගොවීන් හා පලතුරු ගොවීන් අද වනකොට කඩාගෙන වැටිලා. ඒ වාගේම අද වනකොට පොල් කර්මාන්තය කඩාගෙන වැටිලා. වයඹ පළාත ගත්තත් එහෙමයි. අපේ ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. එතුමා මගේ යාළුවා. නමුත් වයඹ පළාතේ ගොවි ජනතාව කොච්චර ප්‍රශ්නවලට මුහුණ දෙනවාද? මම නිතරම පුත්තලම සහ කල්පිටිය ප්‍රදේශවල ගොවි ජනතාව වෙනුවෙන් කථා කරනවා. ඔබතුමා ඒ ගොවි ජනතාව වෙනුවෙන් ගත්ත විසඳුම් මොනවාද? ඇත්තටම අද පොහොර මිටියක් කීයද? රුපියල් 16,000යි. කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ, ඒ ගොවි ජනතාවට. පොහොර මිටියක් රුපියල් 350ට දීපු කාලයක් තිබුණා. ඔය 76 වසරක කාලය තුළ පොහොර මිටියක් රුපියල් 350ට දීපු කාලයක් තිබුණා. එහෙම කාලයක් තිබුණේ නැහැ කියන්න බැහැ. අද පොහොර මිටියක් කීයද? අපි එක එක් කෙනාට බැණලා, එයා යෝජනා ගෙනැල්ලා එහෙම කිව්වා, මෙහෙම කිව්වා කියලා හරියන්නේ නැහැ. කාලීන අවශ්‍යතා අනුව වැඩ කරන්න ඕනෑ. ගොවි ජනතාවගේ ඇත්ත ප්‍රශ්න විසඳන්න ඕනෑ. ඒක තමයි මේ සභාවේ සියලුදෙනාගේ වගකීම. ආණ්ඩු පක්ෂයටත් ඒ වගකීම තිබෙනවා, විපක්ෂයටත් ඒ වගකීම තිබෙනවා. ඒ වගකීම ඉෂ්ට කරන්න ඕනෑ. ගම්වලට ගිහිල්ලා බලන්න. මම කිව්වා වාගේ එක එක ප්‍රදේශවල එක එක ප්‍රශ්න තිබෙනවා. ඒ පළාත්වලට ගිහිල්ලා ඒ ජනතාවත් එක්ක කථා කරලා බලන්න. එහෙම කථා කරලා ඒ ප්‍රශ්න විසඳනවා නම් ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද කියන එක අදාළ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සහෝදර ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා විශේෂ කාරක සභාවක් පිහිටුවන ලෙස ඉල්ලා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, කොරෝනා වසංගතය

පැවති කාලයේ මුස්ලිම් ජනතාවගේ මිනී පිළිස්සීම සම්බන්ධයෙන්. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා මේකට මැදිහත් වෙන්න ඕනෑ. ඒ මිය ගිය සමහර මිනිස්සුන්ව පුච්චලා එක එක තැන්වල වළලා තිබෙනවා. ඒ ගැන නිවැරදි සංඛ්‍යාලේඛනත් නැහැ. රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා, ඒකට විසඳුමක් ලැබෙයි කියලා. අපේ ගරු ඉම්රාන් මහරුෆ් සහෝදර මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව සොයා බලන්න විශේෂ කාරක සභාවක් පිහිටුවන ලෙස පාර්ලිමේන්තුවට පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්තටම ඒක ජනතාව බලාපොරොත්තු වන දෙයක්. ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න. ඇත්තටම අපි මේ කාරණය කියන්නේ අවංකව, දේශපාලනිකව නොවෙයි. ඇත්තටම මිය ගිය තමන්ගේ අම්මා තාත්තා වළලා තිබෙන්නේ කොතැනද කියන ප්‍රශ්නය ඒ අයගේ ඥාතීන්ට තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

ගොවි ජනතාව සම්බන්ධයෙන් තිබෙන මේ ප්‍රශ්නයේදී සියලුදෙනාටම අවංකව විසඳුම් ලබා දෙන්න. ප්‍රශ්න තිබෙන්නේ කොතැනද ඒ ප්‍රශ්න විසඳන්න, නිකම් එහාට මෙහාට ඇඟිල්ල දික් කරමින් අරක කළා මේක කළා කියලා කියන්නේ නැතිව. ඔබතුමන්ලා ආණ්ඩු කළ කාලයක් තිබුණා. වර්තමාන ගරු ජනාධිපතිතුමා කෘෂිකර්ම ඇමති වෙලා හිටියා. එතුමාත් කෘෂි කර්මාන්තය සංවර්ධනය කළා. නමුත් එක වතාවට එක පැත්තකට විතරක් ගහන්න එපා. අඩුපාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කරන එක ආණ්ඩුවේ වගකීමක් බව ප්‍රකාශ කරමින්, සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.04]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දවසේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමිය ප්‍රමුඛ විපක්ෂයේ සමස්ත ගරු මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධයෙන් දක්වන අදහස් පිළිබඳව සලකා බැලීමේදී මට නම් හැඟී යන්නේ, දශක ගණනාවක් තිස්සේ ඔවුන් ගෙන ගිය ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළ ගොවියාගේ ප්‍රශ්න විසඳන්න ඉතාම හොඳ ක්‍රියාවලියක් තිබුණා, ඒ ක්‍රියාවලිය අපි ආණ්ඩුව අත්පත් කර ගත්තාට පස්සේ සම්පූර්ණයෙන්ම නතර වුණා වාගේ අදහසක්. ඒ හැඟීම ඇති වන විධියට තමයි ඔවුන් කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් කළ මේ යෝජනාවේ ප්‍රධානම කාරණය ලෙස ඉස්මතු කරලා තිබුණේ අද දවසේ වී ටික මිලදී ගන්න ගියාම ගොවීන්ට මුහුණ දෙන්න වන ගැටලු සම්බන්ධයෙන් ආණ්ඩුව වැඩ පිළිවෙළක් හදලා නැහැ, තිබුණු වැඩ පිළිවෙළත් ආණ්ඩුව විසින් අරාජික කරලා තිබෙනවා වාගේ කථාවකුයි. අපි ආණ්ඩුව ගන්න මොහොතේදී වී ගබඩාවල තත්ත්වය කොහොමද තිබුණේ කියන කාරණය සම්බන්ධයෙන් අදහස් දක්වන්න මම කැමැතියි. අපේ ආණ්ඩු පක්ෂයේ සියලු ගරු ඇමතිතුමන්ලා, ගරු නියෝජ්‍ය ඇමතිතුමන්ලා සහ ගරු මන්ත්‍රීවරුන් කථා කරපු කාරණා තුළත් මේ සම්බන්ධයෙන් කියැවුණා. විශේෂයෙන්ම සේවකයෝ වී අලෙවි මණ්ඩලය අත්හැර ගිය වටපිටාවක් තිබුණා. ඒ විතරක් නොවෙයි, වී අලෙවි මණ්ඩලයට තිබුණු වාහන ටික සියල්ලම විනාශ වෙලා තිබුණු වටපිටාවක් තිබුණා. විශේෂයෙන්ම වී ගබඩා වල් වැදිලා, වී මිලදී ගැනීම අරාජික වෙලා තිබුණු තත්ත්වයක් යටතේ තමයි අපි මේ ආණ්ඩුව භාර ගත්තේ. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කය තුළ වාගේම සමස්ත රට පුරාම වල් වැදිලා තිබුණු වී ගබඩා ටික යුද හමුදාවේ සහයෝගයත් අරගෙන ප්‍රතිසංස්කරණය කරලා, වී මිලදී ගැනීම ආරම්භ කළේ අපි විසින් කියන එක මම මතක් කරන්න කැමැතියි.

කොහොම වුණත්, මම ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ඉදිරිපත් කරපු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියට. මේ යෝජනා අවුරුදු ගණනාවක් තිස්සේ - දශක ගණනාවක් තිස්සේ - තමන්ගේ ආණ්ඩුවලට ඉදිරිපත් කරලා, ඒ සම්බන්ධයෙන් සාධාරණ කථා බහක් කරගන්න එතුමියටත් බැරි වෙන්න ඇති. හැබැයි, මම එතුමියට ස්තුතිවන්ත වන්නේ ආණ්ඩුව විධියට අපි ගොවියා වෙනුවෙන් අරගෙන යන සමස්ත වැඩ පිළිවෙළ, ඒ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අද දවසේ අපිට හැකියාව ලැබිලා තිබෙන නිසායි. ඒ වාගේම, දවසක කාලය වෙන් කරගෙන රටේ මහජනතාව වෙනුවෙන්, ගොවි ජනතාව වෙනුවෙන් අපි කරන්නේ මොනවාද කියන එක සම්බන්ධයෙන් කථාබහ කරන්න අපට අද අවස්ථාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනරාගල දිස්ත්‍රික්කයේ වී ගබඩා 9ක් තිබෙනවා. 2015 අවුරුද්දේ ඉඳලා 2025 අවුරුද්ද දක්වාම මේ වී ගබඩා වී මිලදී ගෙන තිබුණේ නැහැ. අපේ ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරලා තිබුණේ පසුගිය කන්න තුන ඇතුළත අපි වී මිලදී ගන්න අසමත් වුණා කියන කාරණාවයි. හැබැයි, තිබුණු සැබෑ තත්ත්වය මොකක්ද කියන එක සම්බන්ධයෙන් මම අදහස් දක්වන්න කැමැතියි. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙනවා, අලුත්වැව වී ගබඩාව. 2015 අවුරුද්දේ ඉඳන් 2025 අවුරුද්ද වෙනකම් කන්න 5කදීම මේ වී ගබඩාව වී මිලදී ගෙන නැහැ. ඒ වාගේම, මුතුකණ්ඩිය වී ගබඩාව කන්න 8ක් තිස්සේ, දොඩම්වත්ත වී ගබඩාව කන්න 15ක් තිස්සේ, හුලංදාව වී ගබඩාව කන්න 7ක් තිස්සේ, වැල්ලවාය වී ගබඩාව කන්න 8ක් තිස්සේ, මැදගම වී ගබඩාව කන්න 15ක් තිස්සේ සහ ඇතිමලේ වී ගබඩාව කන්න 14ක් තිස්සේ ගොවියාගේ වී ටික ගන්න අපොහොසත් - අසමත් - වෙලා තිබුණා. හැබැයි, ඔවුන් කථා කරන්නේ එහෙම නොවෙයි. අපි ආණ්ඩු බලය ගත්තාට පස්සේ ක්‍රියාවලියක් ආරම්භ කරලා, පසුගිය කන්න තුන ඇතුළතම ගොවියාගෙන් සැලකිය යුතු වී ප්‍රමාණයක් මිලදී ගන්න සමත් වීම තුළ තමයි මේ යෝජනාව ඉදිරිපත් වන්නේ. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ යෝජනාවේ තිබෙන බොහෝ කාරණා පදනම් විරහිත ඒවා බව.

මොනරාගල දිස්ත්‍රික්කය ඇතුළත තිබෙන වී ගබඩා 9න්, වී ගබඩා 6ක් ඉතාම හොඳ තත්ත්වයට පත් කරලා, 2025, 2026 අවුරුදුවල මෙන්න මේ කන්න තුනේදීම ගොවීන්ගේ වී ටික මිලදී ගන්න අපිට හැකියාව ලැබුණා. විශේෂයෙන්ම 2025 යල කන්නයේදී වී කිලෝග්‍රෑම් 1,561,120ක ප්‍රමාණයක් අපි මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවගෙන් මිලදී ගෙන තිබෙනවා. 2026දී වී කිලෝග්‍රෑම් 2,150,736ක ප්‍රමාණයක් අපි ගොවීන්ගෙන් මිලදී ගෙන තිබෙනවා. විශේෂයෙන්ම වී ගබඩාවල තිබුණු තත්ත්වය ගත්තොත්, 2015 අවුරුද්දේ ඉඳන් 2020 අවුරුද්ද දක්වා වර්ෂවල දත්ත පරීක්ෂා කිරීමේදී වී අලෙවි මණ්ඩලයේ අලාභය හැටියට වාර්තා වෙනවා, රුපියල් මිලියන 11,305.6ක ප්‍රමාණයක්. මේගොල්ලන් ආණ්ඩු කරපු කාලය තුළ වී ගබඩාවලට අත්පත් වෙලා තිබුණේ එවැනි ඉරණමක්. විශේෂයෙන්ම අපි ආණ්ඩුව විධියට 2026 අවුරුද්දේ වී මිලදී ගැනීම පසුගිය ජූලි

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

13වැනි දායින් ආරම්භ කරලා, පළමුවැනි දින 8 ඇතුළතම වාර්තාගත වී මිලදී ගැනීමක් සිද්ධ කළා. ඒ අනුව දින 8ක් ඇතුළත වී මෙට්‍රික් ටොන් 1,910ක වාගේ ප්‍රමාණයක් මිලදී ගැනීම අපි සිදු කරනවා. ජූලි 13වැනි දා වී මිලදී ගැනීම ආරම්භ කරනවා. ජූලි 23වැනි දා වනකොට - පළමු දින 10 ඇතුළත - මෙට්‍රික් ටොන් 5,390,165ක වී ප්‍රමාණයක් ගොවීන්ගෙන් මිලදී ගැනීමට අපිට හැකියාව ලැබිලා තිබෙනවා. මේ වෙනුවෙන් ආණ්ඩුව රුපියල් මිලියන 648ක මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වන ආකාරයට, 2026 අවුරුද්දේ අපේ ඉලක්කය බවට පත් වෙලා තිබෙන්නේ වී මෙට්‍රික් ටොන් 39,000ක ප්‍රමාණයක් මිලදී ගැනීමයි. විශේෂයෙන්ම ගත්තොත්, වී අලෙවි මණ්ඩලයට රජය විසින් මේ කාරණය සඳහා රුපියල් මිලියන 6,000ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේ දී ගරු මන්ත්‍රීතුමියට මෙම කාරණා පිළිබඳ නොදැනුවත්භාවයක් තිබෙන්න ඇති කියලා මම හිතනවා.

ඒ විතරක් නොවෙයි. ඒ යෝජනාව ඇතුළේ කියවුණා, සුළු පරිමාණ මෝල් හිමියන්ට වී ටික මිලදී ගන්න වැඩ පිළිවෙළක්, ක්‍රියාවලියක් නැහැ කියලා. හැබැයි, එහෙම නොතිබුණේ ඔවුන්ගේ කාලයේදීයි කියන එක අමතක වෙන්න ඇති. විශේෂයෙන්ම ඔඩපණ ණය ක්‍රමය ඇතුළේ සුළු පරිමාණ මෝල් හිමියන්ට පොලී රහිත ණය මුදලක් ලබා දීම ඉතිහාසයේ පළමු වතාවට අප විසින් ආරම්භ කරලා මේ වනකොට එය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුව මේ සඳහා රුපියල් මිලියන 7,500ක පමණ මුදලක් වෙන් කරලා තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයට මෙම ඔඩපණ ණය ක්‍රමය ඇතුළේ සුළු පරිමාණ මෝල් හිමියන් වෙනුවෙන් රුපියල් මිලියන 250ක මුදලක් වෙන් කරලා ඒ මුදල් ටික සම්පූර්ණයෙන්ම ඒ මෝල් හිමියන්ට දීලා වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය මේ වනකොට ආරම්භ කරලා තිබෙනවා. වී අලෙවි මණ්ඩලය වාගේම සුළු පරිමාණ මෝල් හිමියනුත් මේ කාර්යයට අවතීර්ණ වෙලා ගොවියාගේ ප්‍රශ්නයට මැදිහත් වෙමින් සිටිනවා.

ඒ වාගේම මේ යෝජනාව ඇතුළේ කියවුණා, පොහොර සහනාධාරය නියමිත පරිදි ගොවීන්ට ලැබෙන්නේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමාත් පොහොර මිල පිළිබඳව කථා කළ බව. හැබැයි, ආණ්ඩුව විධියට අපි පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක මුදලක්, ඒ කියන්නේ ගොවියාට කොයි තරම් මුදලක් අපි ලබා දෙනවාද කියන කාරණාව ගැන එතුමන්ලා කථා කළේ නැහැ. 2025 යල කන්නයේ දී මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවීන් 36,438කට වගා බිම් හෙක්ටෙයාර 20,014ක ප්‍රමාණයකට පොහොර සහනාධාරය දෙන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම 2026 යල කන්නයේදී ගොවීන් 57,468කට වගා බිම් හෙක්ටෙයාර 32,891කට පොහොර සහනාධාරය දෙන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. 2026 යල කන්නයේ දී මොනරාගල දිස්ත්‍රික්කය තුළ ගොවීන් 26,193කට හෙක්ටෙයාර 15,332ක් සඳහා පොහොර සහනාධාරය දෙන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ලෝකයේ යුද්ධමය තත්ත්වයක් පවතින අතරතුර, අපේ රටේ මූල්‍ය කටයුතු ඉතා හොඳින් කළමනාකරණය කරමින් තමයි අපි ගොවීන්ට මේ සහනාධාරය ලබා දීලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමිය කථා කරපු කන්න තුන ඇතුළේ අපට හැකියාව ලැබිලා තිබෙනවා, රුපියල් මිලියන 663.2ක් මොනරාගල දිස්ත්‍රික්කයට වෙන් කරමින් වී කිලෝග්‍රෑම් 5,637,418ක ප්‍රමාණයක් මිලදී ගන්න.

ගරු මන්ත්‍රීතුමිය කථා කරපු තවත් කාරණයක් තමයි, තාක්ෂණය එහෙම නැත්නම් ඩිජිටල්කරණය ගොවීන්ට එකතු කරනවා කියන එක. විශේෂයෙන්ම මම ඒකත් මතක් කරන්න කැමැතියි. මේ වනකොට CROPIX පද්ධතිය මඟින් ගොවීන්ට විශේෂ වරප්‍රසාදයක් අපි අත්පත් කර දීලා තිබෙනවා. රට පුරා වගා කරන එළවලු ප්‍රමාණ සජීවීව විශ්ලේෂණය කිරීම මඟින් තමන් මේ කන්නයේදී වගා කළ යුත්තේ මොන එළවලු ද, මොන බීජ වර්ගයද හිටවිය යුත්තේ, වෙළෙඳ පොළ කොයි තරම් දුරට අත්පත් කර ගන්න හැකියාව ලැබෙනවාද කියන විශ්ලේෂණය ඇතුළේ ගොවීන්ට තම වගා කටයුතු ඉතා ම හොඳින් කළමනාකරණය කර ගන්න මේ තුළින් හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි, ගොවියා, පාරිභෝගිකයා, වෙළෙන්දා කියන මේ සමස්තය ආරක්ෂා කර ගනිමින් අපේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය ඇතුළේ ඉතාම හොඳ යන්ත්‍රණයක් අපි දියත් කරමින් ඉන්න බව. ඒ යන්ත්‍රණය ඇතුළේ ඔක්කෝම ප්‍රශ්න අපට අවුරුදු දෙකක් ඇතුළත විසඳන්න බැරි වුණත් අපි විශ්වාස කරනවා, මේ සමස්තය කළමනාකරණය කර ගනිමින් රටේ සමස්ත පුරවැසියාට මේකේ ජයග්‍රහණ අත්පත් කර දෙන්න අපට පුළුවන් වෙයි කියලා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා, ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[පි.ව. 4.17]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் இன்றைய தினம் கொண்டுவரப்பட்டு இருக்கின்ற, விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையானது மிக முக்கியமானதொரு பிரேரணையாகும். ஏனெனில், விவசாயிகளின் வாழ்க்கைத் தரத்தை உயர்த்துவது, அவர்களுக்குத் தேவையான வசதிகளைச் செய்து கொடுப்பது நம் எல்லோரினதும் முக்கிய கடமையாகும். ஆளுங்கட்சி, எதிர்க்கட்சி என்றில்லாமல், நாங்கள் எல்லோரும் ஒற்றுமைப்பட்டு, விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகளுக்குத் தீர்வுகளைக் காண வேண்டும். குறிப்பாக, அவர்கள் இலாபம் ஈட்டக்கூடிய வகையில் நிரந்தரத் தீர்வுகளை அரசாங்கம் முன்வைக்க வேண்டுமென நான் கௌரவ அமைச்சரிடம் கேட்டுக்கொள்கின்றேன்.

எங்களுடைய அம்பாறை மாவட்டமானது, தேசிய மட்டத்தில் 20 சதவீதமான நெல் உற்பத்தியை மேற்கொள்கின்றது. 2026 இடைப்போகத்தில் மாத்திரம் அம்பாறை மாவட்டத்தில் 320,000 மெற்றிக்தொன் நெல் உற்பத்தி செய்யப்பட்டது. இந்த வருடம் மகாபோகத்தில் அம்பாறை மாவட்டத்தில் 420,000 மெற்றிக்தொன் நெல்லை உற்பத்தி செய்வதற்கான எல்லா ஏற்பாடுகளும் செய்யப்பட்டுக்கொண்டு இருக்கின்றன. இம்மாவட்டத்தில் இடைப்போகத்தில் உற்பத்தி செய்யப்பட்ட 320,000 மெற்றிக்தொன் நெல்லில், 20,000 மெற்றிக்தொன் நெல் சந்தைப்படுத்தல் சபை ஊடாகக் கொள்வனவு செய்யப்பட்டு

இருக்கின்றது. அம்பாறை மாவட்ட அரசாங்க அதிபர் ஊடாக தனியார் நெல் ஆலை உரிமையாளர்களுக்கு 680 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டு, 5,750,000 கிலோகிராம் நெல்லைக் கொள்வனவு செய்வதற்கான நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. ஆனால், 320,000 மெற்றிக்தொன்னில் மிகுதி நெல்லை விற்பனை செய்ய முடியாமல் உள்ளது. உதாரணத்துக்கு, சம்மாந்துறை, நிந்தவூர், அக்கரைப்பற்று, அட்டாளைச்சேனை, பொத்துவில் போன்ற பிரதேசங்களிலுள்ள அதிகமான விவசாயிகள் தங்களுடைய நெல்லை விற்க முடியாமல் இருக்கின்றார்கள். கட்டங்கட்டமாகச் சில ஏற்பாடுகள் நடைபெற்றாலும், மூன்றாவது கட்டமாக இந்த நெல்லை விற்பனை செய்வதற்குரிய ஏற்பாடுகளை கௌரவ அமைச்சர் அவர்கள் செய்ய வேண்டுமென நான் என்னுடைய மாவட்ட விவசாய மக்கள் சார்பாகக் கேட்டுக்கொள்கின்றேன். அரசாங்க அதிபர் ஊடாக தனியார் நெல் ஆலை உரிமையாளர்கள்மூலம் மேற்கொள்ளப்படுகின்ற நெல் கொள்வனவின்போது, ஒரு கிலோகிராம் நெல்லை 120 ரூபாய்க்குக் கொள்வனவு செய்யுமாறு பணிக்கப்பட்டு இருக்கின்றது.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් මන්ත්‍රීවරුන්ට දුන්නා වාගේ මටත් තව විනාඩි දෙකක් දෙන්න. මොකද, අද ගොවීන්ට තිබෙන ප්‍රශ්නයක් ගැන තේ කථා කරන්නේ.

அந்த விலைக்கு நெல்லைக் கொள்வனவு செய்து, அரிசியை உரிய விலைக்கு விற்பனை செய்ய முடியாத நிலைமை ஏற்பட்டுள்ளது. அரசாங்கத்தில் இருக்கின்ற பிரதி அமைச்சர் ஒருவர் சொல்லியிருக்கிறார், "நாங்கள் 70,000 - 75,000 மெற்றிக்தொன் அரிசியை மத்திரமே இறக்குமதி செய்யத் திட்டமிட்டு இருந்தோம். ஆனால், தினசரி நிலைமையைக் கண்காணித்தபோது, அந்தளவு போதுமானதாக இருக்காதெனத் தெரியவந்தது. அதனால் சுமார் 180,000 மெற்றிக்தொன் அரிசியை இறக்குமதி செய்தோம்" என்று. இவ்வாறு வெளிநாட்டிலிருந்து அரிசியை இறக்குமதி செய்வதால், நமது நாட்டு விவசாயிகளின் நெல்லின் விலை சம்பந்தமாக நாம் யோசிக்கவேண்டி இருக்கின்றது. எனவே, அந்த விவசாயிகள் வேளாண்மை செய்து, தங்களது நெல்லை விற்கும் காலத்திலாவது, பெருந்தொகையான அரிசியை இறக்குமதி செய்வதை அரசாங்கம் நிறுத்த வேண்டுமென நான் விவசாயிகள் சார்பில் கேட்டுக்கொள்கின்றேன்.

2026ஆம் ஆண்டில் மகா போகத்தில் அறுவடை செய்யும் நெல்லை 2027ஆம் ஆண்டு சனவரி மாதம் 15ஆம் திகதிக்குள் வாங்கவேண்டிய நிலைமை கமத்தொழில் அமைச்சுக்கு ஏற்படும். இந்த நிலைமையில், அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப்படுத்தல் சபையின் 83 நெற்களஞ்சியசாலைகளில் கடந்த ஒன்றரை வருட காலமாகச் சேமித்து வைக்கப்பட்டுள்ள 70,275 மெற்றிக்தொன் நெல்லை அவற்றிலிருந்து வெளியேற்றுவதற்கான விசேட ஏற்பாடுகளை மேற்கொள்ளுமாறு நான் மூன்று தடவை இந்தப் பாராளுமன்றத்தில் சொல்லியிருக்கிறேன். எங்களுடைய மாவட்டத்தில் இவ்வளவு தொகை நெல் 83 நெற்களஞ்சியசாலைகளிலே இருக்கின்றது. எனவே, இந்தக் களஞ்சியசாலைகளிலுள்ள நெல்லை அகற்றுவதற்கான ஏற்பாடுகளைச் செய்து, எதிர்வரும் போகத்துக்கான நெல்லைக் கொள்வனவு செய்யக்கூடிய ஏற்பாட்டை கௌரவ வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு அமைச்சரும் கமத்தொழில் அமைச்சரும் இணைந்து செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப்படுத்தல் சபையின் நெற்களஞ்சியசாலைகளில் நீண்ட காலமாகச் சேமித்து வைக்கப்பட்டுள்ள நெல்லை, ஒரு நாளைக்கு ஓரிலட்சம் கிலோகிராம் வீதம் நீங்கள் வெளியே எடுத்துச் சென்றால்கூட, 72 நாட்கள் தேவைப்படும். எனவே, விசேட ஏற்பாடுகளை மேற்கொண்டு, 83 நெற்களஞ்சியசாலைகளிலும் இருக்கும் நெல்லை வெளியே எடுத்துச் செல்வதற்கான வேலைத்திட்டங்களை ஆரம்பிக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

அம்பாறை, மொனராகலை மாவட்ட மக்களின் நீண்டகாலத் தேவையான ஹெடஓயா, கும்புக்கன் ஓயா நீர்ப்பாசனத் திட்டங்கள், சம்புக்களப்பு - பெரிய களப்பு வடிச்சல் திட்டம், கரைவாகுப்பற்று வடிச்சல் திட்டத்தை ஆரம்பிக்குமாறு மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் தலைமையில் நடைபெற்ற அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில், நானும் கௌரவ பிரதி அமைச்சர் வசந்த பியதிஸ்ஸ அவர்களும் கௌரவ நிசாம் காரியப்பரும் இணைந்து மாண்புமிகு சனாதிபதி அவர்களிடம் கோரிக்கை விடுத்தோம்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් නිසා කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

මට තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

மாண்புமிகு சனாதிபதி அவர்கள் இத்திட்டங்களை ஆரம்பிப்பதற்கான ஏற்பாடுகளை மேற்கொள்ளுமாறு நீர்ப்பாசன அமைச்சின் அதிகாரிகளுக்குப் பணிப்புரை வழங்கினார். அதன் பின்னர், கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் கௌரவ கே.டீ. லால் காந்த அவர்களின் தலைமையில் பாராளுமன்றத்தில் விசேட கூட்டமொன்று நடத்தப்பட்டு, அதற்கான ஏற்பாடுகளைச் செய்திருக்கிறார்கள். இதற்காக மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கும் கமத்தொழில் அமைச்சர் அவர்களுக்கும் அமைச்சின் அதிகாரிகளுக்கும் எமது அம்பாறை மற்றும் மொனராகலை மாவட்ட மக்கள் சார்பில் நன்றியைத் தெரிவித்து, விடை பெறுகின்றேன்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 4.21]

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය විසින් අද දවසේ ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් වූ විවාදයට අපි සහභාගි වෙමින් ඉන්නවා. අපේ රටේ වී ගොවිතැනේ නියැළෙන ජනතාව ගැනයි අද අපි කථා කරන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළා, "සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා" කියලා. ඒ කියන්නේ, සියලු සත්වයෝ ආහාර මත යැපෙනවා කියන එකයි. ලෝකයේ විවිධ රටවල මිනිස්සු තමන්ගේ ආහාරවලට විවිධ දේවල් භාවිත කරනවා. දකුණු ආසියාතික රටක ජීවත් වන අපේ ප්‍රධාන ආහාරය බත්. එම නිසා වී ගොවිතැන අපේ රටේ ප්‍රධාන ගොවිතැන බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ ප්‍රධාන ආහාරය බත් වීම නිසාම වී ගොවිතැන හැම අවුරුද්දකම විවාද සම්පන්න මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා.

1950 අවුරුද්දට කලින් අපට පුළුවන්කම තිබුණේ අපේ වාර්ෂික වී අවශ්‍යතාවෙන් සියයට 35ක, 40ක ප්‍රමාණයක් නිපදවා ගන්න විතරයි. එම නිසා ගොඩක්දුරට ආහාර හිඟකමින් අපි ඒ කාලයේ පෙළුණා. වී ගොවිතැන අපට පරම්පරාවෙන් ආවේ. එම නිසා අදටත් අලුතෙන් වැවක් හදනකොට, කැඩී බිඳී ගිය පැරණි වැව් පිළිසකර කරනකොට, වාරි ජලය ලබා ගන්න ජනතාව බලන්නේ කුඹුරු ඉඩමක් හදා ගන්න. මොකද, අපේ ජනතාවගේ ඔළුවේ තැන්පත් වෙලා තිබෙනවා, ගේ ඇතුළේ වී කරල් දෙක තුනක් තිබෙනවා නම් ලුණු කැඳ ටිකක් හරි හදලා දරුවන්ගේ බඩගින්න නිවන්න දෙන්න පුළුවන් කියලා. එම නිසා ආහාර සුලබතාව අඩුවීම ඒ කාලයේ අපට තදින් දැනුණු දෙයක්.

1940 දශකයේ අවසාන භාගයේ ඉඳලා 1970 දශකය වනතුරු ලෝකයේ හරිත විප්ලය සිදු වුණා. හරිත විප්ලවයත් එක්ක තවදුරටත් තිරස් අතට කෘෂි කර්මාන්තයෙන් අපට වුවමනා ආහාර ලබා ගැනීමේ හැකියාව අඩු වීගෙන යනකොට අපි සිරස් අතට අස්වැන්න වැඩි කර ගැනීමට යොමු වුණා. ඒ කියන්නේ, භූමියේ හිඟකම, වාරි ජලය සැපයීමේ නොහැකියාව කියන කරුණු නිසා අස්වැන්න ලබා ගන්න නොහැකි වනකොට සිරස් අතට අස්වැන්න ලබා ගන්න අපි ඉඩම් ප්‍රමාණය වැඩි කරමින්, වැඩි අස්වැන්නක් ලබා දෙන බීජ හා රසායනික පොහොර භාවිත කරමින්, වාරි කර්මාන්තය කළමනාකරණය කර ගැනීමට කටයුතු කළා. අපට එම කරුණු යොදාගෙන සිරස් අතට අස්වැන්න වැඩි කරගෙන, කෘෂි කර්මාන්තයේ නව පිම්මක් පනින්න පුළුවන් වුණා.

1950ට කලින් අපේ සහල් අවශ්‍යතාවෙන් සියයට 35ක්, 40ක් සපුරා ගත්ත අපි ඒ නව පිම්මත් එක්ක අද වනකොට අපට අවශ්‍ය සම්පූර්ණ වී නිෂ්පාදනය කර ගන්න පුළුවන් මට්ටමට, සහල් නිෂ්පාදනය කර ගන්න පුළුවන් මට්ටමට ඇවිල්ලා තිබෙනවා. වගා කළ හෙක්ටෙයාර ප්‍රමාණය ගත්තොත්, 2023දී අපි හෙක්ටෙයාර 317,000ක්ද, 2024දී හෙක්ටෙයාර 1,287,000ක්ද, 2025දී හෙක්ටෙයාර 1,341,000ක්ද වගා කර තිබෙනවා. හෙක්ටෙයාර 1,300,000කට වැඩි වී වගාවක් කරමින් ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් ලක්ෂ 50 ඉක්ම වූ අස්වැන්නක් 2026 යල කන්නය වනකොට අපි ලබා ගන්නවා.

අපේ ඒක පුද්ගල සහල් පරිභෝජනය ආසන්න වශයෙන් කිලෝග්‍රෑම් 112යි. එම සහල් ප්‍රමාණය හදා ගන්න අපට අවශ්‍ය වනවා, වී මෙට්‍රික් ටොන් ලක්ෂ 38ක්. අපි වාර්ෂිකව හෙක්ටෙයාර 1,300,000කට වඩා වගා කරලා, මෙට්‍රික් ටොන් ලක්ෂ 50කට වැඩි වී අස්වැන්නක් ලබා ගන්නවා. අපට වී මෙට්‍රික් ටොන් ලක්ෂ 38ක් අවශ්‍ය වෙනවා, සහල් ටික හදා ගන්න. ඒ අනුව අපට දැන් පැහැදිලියි, අපේ වී වගාවේ අතිරික්තයක් තිබෙන බව. මේක තමයි අද අපි මුහුණ දීලා තිබෙන මේ ප්‍රශ්නවලට එක හේතුවක් වෙලා තිබෙන්නේ. අතීතයේත් පැවති තත්ත්වය මෙහෙමම තමයි. ගොවි ජනතාවට, වී ගොවිතැනේ නියැළුණු අයට අතීතයේදී බොහොම හොඳින් සැලකුවාය කිව්වා. විපක්ෂය පැත්තේ මන්ත්‍රීවරයෙක් කිව්වා, "මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසුයි" කියලා ඒ කාලයේ ඔවුන්ට සැලකුවා, නමුත් අද ගොවියා අසරණ වෙලා ඉන්නවාය කියලා. නමුත්, අතීතයේ ඉඳලා අපි රජය භාර ගන්න තුරුම අපට දකින්න තිබුණේ ගොවි ජනතාව සම්පූර්ණයෙන්ම සැලකුම් නොලබපු, ඔවුන්ගේ අවශ්‍යතා ගැන හොඳ අවධානයක් යොමු නොවුණු තත්ත්වයක්. නමුත්, අපි දැන් මේ තත්ත්වයට මුහුණ දෙමින්, මේ තත්ත්වය කළමනාකරණය කර ගනිමින්, අතිරික්තව නිපදවා ගන්නා වී ප්‍රමාණය කළමනාකරණය කරගෙන ගොවි ජනතාවගේ අතට ඔවුන්ගේ මහන්සියට සරිලන ආදායමක් ලැබෙන්නේ කොහොමද, ඔවුන් මුහුණ දෙන ගැටලු ටික විසඳා ගන්නේ කොහොමද කියන කාරණයට මැදිහත් වෙමින් ඉන්නවා.

අපේ රටේ දැන් තිබෙන්නේ වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය. අපි කැමති වුණත්, අකැමති වුණත් ඒ යටතේ තමයි අපේ රටේ ආර්ථිකය පාලනය වන්නේ. ඉල්ලුමට අනුව සැපයුම තිබිය යුතුයි. සැපයුම වැඩි නම් මිල අඩු වෙනවා. එම නිසා අපි දැන් වී වගාව කළමනාකරණය කර ගන්න තැනට එන්න ඕනෑ. වී ගොවිතැනේ යෙදෙන කොටස් දෙකක් ඉන්නවා. එක කොටසක් තමයි, වාණිජ අරමුණින් අපේ රටේ වී වගාව කරන අය. ඒගොල්ලන් තමයි අපේ රටට වැඩිම වී අස්වැන්නක් ලබා දෙන්නේ. අනික් කොටස තමයි, ජීවනෝපාය සඳහා විකල්ප මාර්ග ගොඩක් නැති නිසා වී වගාවට - කෘෂි කර්මාන්තයට - පෙළඹිලා වගා කරගෙන යන ග්‍රාමීයව වෙසෙන ජනතාව. ඒ අනුව කුඩා කුඩා ඉඩම් කොටස් යොදා ගනිමින්, පහසුකම් අඩුවෙන්, අඩු ප්‍රාග්ධනයක් සහිතව, අඩු දැනුමක් සහිතව එකතු වෙලා කෘෂි කර්මාන්තයේ යෙදෙන කොටසකුත්, වාණිජ අරමුණු සඳහා වැඩි ඉඩම් ප්‍රමාණයක - වපසරියක - වගා කරමින් අපේ රටට බත සපයන කොටසකුත් ඉන්නවා. මේ කොටස් දෙක හරියට කළමනාකරණය කරගෙන අපේ ඉලක්කයට අපි මේක අරගෙන එන්න ඕනෑ. එහෙම වුණොත් තමයි ගොවි ජනතාවගේ අවශ්‍යතාව සපුරන විධියේ මුදල් ප්‍රමාණයක් ඔවුන්ගේ අතට දෙන්න අපට පුළුවන් වන්නේ. ඒ කියන්නේ, ආර්ථික වශයෙන් ලාභදායී දෙයක් බවට මෙය පත් කරන්න පුළුවන් වෙන්නේ. පැවතුණු රජයන් මේ තත්ත්වය තේරුම් අරගෙන, මේ තත්ත්වය කලින් දැනගෙන ගොවි ජනතාව

වෙත බීජ ටික, පොහොර ටික, ජලය, තාක්ෂණය, උපකරණ සහ රැකවරණය ලබා දුන්නේ කොයි විධියටද කියන කාරණය මේ සභාවේ බොහෝ දෙනෙකුගෙන් කියැවුණා. ඒ ටික නිසි පිළිවෙළට වුණා නම් ගොවි ජනතාව අද ඉන්න තත්ත්වයට පත් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට තිබෙන අභියෝගය තමයි රජය විධියට අපි මේ ටික හරියට කළමනාකරණය කර ගන්නේ කොහොමද කියන එක. අපි ආසන්න වශයෙන් හෙක්ටෙයාරයකින් වී කිලෝ 4,000 - 4,300 අතර ප්‍රමාණයක් තමයි ගන්නේ. චීනය වාගේ රටක් වී කිලෝ 7,300ක් ගන්නවා. වියට්නාමය වාගේ රටක් වී කිලෝ 6,000ක් ගන්නවා. අපිත් හෙක්ටෙයාරයකින් ඒ ප්‍රමාණයට වී අස්වැන්න ගන්නවා නම් ගොවි ජනතාවගේ අතට ලැබෙන මුදල් ප්‍රමාණය වැඩි වෙනවා. එම නිසා අපි එතැනට එන්න උත්සාහ කරනවා. අපි ඒ වෙනුවෙන් "ආදර්ශ යාය" වැඩසටහන ක්‍රියාත්මක කරලා තිබෙනවා. හෙක්ටෙයාර 50 බැගින් වන යායවල් 150ක් තෝරාගෙන 2026 අවුරුද්දේදී අපි එම වැඩසටහන ක්‍රියාත්මක කරනවා. එහිදී අපි ඒගොල්ලන්ට තාක්ෂණික පැකේජයක් ලබා දෙනවා. පොළොව ගැඹුරට හාරලා බිම හදා ගැනීම, ලියැදි සම්පූර්ණයෙන්ම විශාල කිරීම, එකවර බිම් සකස් කිරීම, වැපිරීම, කෘෂි රසායන යෙදීම සහ එකවර අස්වනු නෙළීම ආදී සියලු කටයුතු සාමූහිකව කරලා, වැඩි අස්වැන්නකට යන්න පුළුවන් හැකියාව අපි ඒගොල්ලන්ට මේ පැකේජය යටතේ හදා දෙමින් ඉන්නවා. අපේ "යාය 150" වැඩසටහන තුළින් හෙක්ටෙයාරයකින් වී කිලෝ 6,000කට ආසන්න ප්‍රමාණයක් ගන්න පුළුවන් මට්ටමට අපි මේ වනකොට ඇවිල්ලා තිබෙනවා. ඒ ගැන අපිට කියන්න සතුටුයි. එහෙම නම් අපට දැන් බලාපොරොත්තුවක් තිබෙනවා. අපේ රටේ හෙක්ටෙයාරයකින් ලබා ගන්න අස්වැන්නේ ප්‍රමාණය වී කිලෝ 6,000කට ගෙනෙන්න පුළුවන් වුණොතින් අපට පුළුවන්කම ලැබෙනවා, ඔවුන්ගේ අතට වැඩි මුදල් ප්‍රමාණයක් ලබා දීමට අවස්ථාව සලසන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවි ජනතාවගේ දැනුම වැඩි කරලා, වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා ඔවුන්ට ව්‍යාප්ති සේවය අංගසම්පූර්ණව ලබා දීමට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්වරු, ගොවිජන සංවර්ධන නිලධාරීන් අලුතෙන් බඳවා ගෙන, රාජ්‍ය සේවය කළමනාකරණය කරන වැඩේට AI මහත්වරු සමඟ එකතු වෙලා ඒ වෙනුවෙන් කටයුතු කරන්න අපි දැන් අත තියලා තිබෙනවා.

මේ සභාවේදී කථා කරපු බොහෝ මන්ත්‍රීවරුන්ගෙන් කියැවුණා, මෙච්චර කල් අක්‍රිය වෙලා තිබුණු වී අලෙවි මණ්ඩලය ගැන. අපි ආපහු වී අලෙවි මණ්ඩලය සක්‍රිය කරලා ගොවි ජනතාව වෙත මැදිහත් වෙමින් ඉන්නවා. වී අලෙවි මණ්ඩලය ප්‍රමාණවත් නැති නිසා අපි ඔඩපන ණය - pledge loans - ලබා දෙන, වී මිලදී ගන්නා මහා පරිමාණ මෝල් හිමියනුත් රජයේ සම්මත මිලට වී ගන්න කැමැති කරවා ගත්තා. ඒ වාගේම අපි සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ටත් පොලී රහිත ණයක් ලබා දීලා, අපේ ගොවීන්ගේ වී මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම ගොවීන්ට වුවමනා උපකරණ ටික සාධාරණ මිලකට ගන්න, අපි machinery hub ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් ඉන්නවා. දැන් අපි මේ සියලු කටයුතු කළමනාකරණය කරනවා. අපි යල මහ කන්න දෙකේදී හෙක්ටෙයාර ලක්ෂ 13කට වැඩි ඉඩම් ප්‍රමාණයක වී වගා කරනවා. හෙක්ටෙයාරයකින් වී කිලෝග්‍රෑම් 6,000ක ඉලක්කයකට අපට යන්න පුළුවන් නම්, එක කන්නයයි අපි මේ කුඹුරු කරන්න ඕනෑ. හෙට මහ කන්නයේ ආසන්න වශයෙන් හෙක්ටෙයාර 850,000ක පමණ වී වගා කරනවා. අපට හෙක්ටෙයාරයකින් වී කිලෝග්‍රෑම් 6,000ක ඉලක්කයකට යන්න පුළුවන් වුණොත්, වී මෙට්‍රික් ටොන් ලක්ෂ 51ක් එක කන්නයකින් ගන්න පුළුවන්. එහෙම වුණොත් අපේ අවශ්‍යතාව එක පාරින් සම්පූර්ණ වෙනවා. ඒ නිසා ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය වෙනත් වගාවන්ට, අතිරේක භෝග හෝ වෙනත් වගාවන්ට අපට යොමු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ විධියට කුඹුරු ඉඩම් ටික කළමනාකරණය කරගෙන ගොවි ජනතාව අතට වැඩිපුර සල්ලි ලැබෙන විධියට අපි ඒක හදා ගන්න ඕනෑ.

ඒ වාගේම වාරි ජලය සැපයීමට අඩු හැකියාවක් තිබෙන ප්‍රදේශවල තිබෙන කුඹුරු ඉඩම් ටික තෝරා ගෙන ඒවායේ කුරුඳු, ගම්මිරිස් වගා කරන්නත්, ඒ වාගේම වගුරු බිම් සඳහා සෝජන් ක්‍රමයට තැඹිලි වගාව කරන්නත් ආදී වශයෙන් විකල්ප ක්‍රම ගොවි ජනතාවට හඳුන්වා දෙමින් ගොවි ජනතාවගේ අතමිට සරු කරන ආර්ථිකයක් අපි හදමින් ඉන්නවා. ඒ සඳහා වී ගොවිතැනේ නියැළෙන ජනතාව කුඩා කුඩා කොටස් එකතු කරමින් නිෂ්පාදන සමිති හදලා, ඔවුන් මහා පරිමාණ හැකියාවක් සහිත පිරිසක් බවට පත් කරන ගමන්, වාණිජ අර්ථයෙන් වී වගාව කරන අයට වුවමනා පහසුකම් ටික සලසමින්, ඔවුන්ට මේ ක්ෂේත්‍රයේ දිගටම රැඳී සිටීමට අවශ්‍ය පහසුකම් ටික අපි හදමින් ඉන්නවා. පොහොර සහනාධාරය, කෘෂි රක්ෂණ සඳහා වන්දි, දැනුම, උපකරණ මේ සියල්ල ලබා දෙමින්, ඒ හරහා ගොවි ජනතාව ශක්තිමත් කරමින් ඉන්නවා. අපි භාර ගත්ත ඉලක්කය අනුව, ගොවි ජනතාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම, තෘප්තිමත්භාවයකින් යුතුව කෘෂිකර්මාන්තයේ නියැළෙන්න පුළුවන් තැනට ඔවුන් පත් කිරීම කරමින් ඉන්නවා කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.31]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවි ජනතාව වෙනුවෙන් කථා කරනකොට, "ආණ්ඩුවට වසර දෙකයි - රටට සුබයි" කියනවා. මොකක්ද, රටට වෙච්ච සුබේ කියලා මම අහන්න කැමැතියි. ගොවි ජනතාවට වෙච්ච සුබේ මොකක්ද කියලා මම අහන්න කැමැතියි. ගොවි ජනතාවට ගහන්න තියෙන ඔක්කෝම ගහලා ඉවරයි. දැන් හෙණ විතරයි ගහලා නැත්තේ. ගොවි ජනතාව ගැන මේ කණ්ඩායම් කථා කරනවා; එක එක ප්‍රකාශයන් කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉන්න නියෝජ්‍ය ඇමතිතුමා කථා කරමින් කිව්වා, හම්බන්තොට දිස්ත්‍රික්කයටත්, රටටත් ස්වර්ණමය යුගයක් උදා වෙලා කියලා. මේ අවුරුදු දෙක තුළ ස්වර්ණමය යුගයක් උදා වුණා කියලා කිව්වා. මම අහන්න කැමැතියි, මොකක්ද උදා වෙච්ච ස්වර්ණමය යුගය කියලා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්වලට ගිහිල්ලා ගොවියෝ හම්බ වෙන්න. එතකොට ඔක්කෝටම හොඳට ස්වර්ණමය යුගය පෙන්වයි.

පසුගිය දවස්වල අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ උද්ඝෝෂණ නැහැ කියලා. ඒකාබද්ධ ගොවි සංවිධාන එක්කහු වෙලා තිස්සමහාරාමේ, ලුණුගම්වෙහෙර, අම්බලන්තොට ටවුමේ, සූරිය වැව මේ හැම තැනම මේ ආණ්ඩුවට විරුද්ධව විරෝධය පෑවා. ආණ්ඩුව පත් කරපු ගොවියෝ, ඒකාබද්ධ ගොවි සංවිධාන එක්කහු වෙලා විරෝධය පෑවා, මේ වී මිල ප්‍රශ්නයට සහ මේ සෑම ප්‍රශ්නයකටම. මමත්,

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

මගේ නායකතුමාත් පසුගිය කාලයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජනපදවලට, එනම් තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර, සූරියවැව, අම්බලන්තොට, බඳගිරිය, කොක්ගල්ල, සඳුන්ගම, හබරත්තොට, වැව් ගම්මාන ප්‍රදේශවලට ගිහින් ගොවි ජනතාව හමු වුණා. ගොවියාගේ ප්‍රශ්න ගැන අපි සොයා බැලුවා. වී මිලේ ප්‍රශ්නය ගත්තොත්, රුපියල් 80ට වැඩිය මිලකට හම්බන්තොට දිස්ත්‍රික්කයේ මිනිස්සු වී විකුණා නැහැ. කෘෂි රසායනික ප්‍රශ්නය, කෘෂි උපකරණ ප්‍රශ්නය ඔවුන්ට තිබෙනවා. ඒවායේ බදු සහන ඉවත් කළේ නැහැ. ඉවත් කරනවා කියලා කිව්වා. සියයට 18ක් ලෙස ගහපු බද්ද ඉවත් කරනවා කියලා ජනාධිපතිතුමා කිව්වා. වනඅලි කුඹුරුවලට ඇවිල්ලා කුඹුරු විනාශ කරනවා; හේන් ගොවිතැන් විනාශ කරනවා; පොල් ගස් විනාශ කරනවා. වනඅලි ගෙවල් කඩනවා, මිනිස්සු මරනවා. මේවාට කිසිම විසඳුමක් නැහැ. ඒ වාගේම නිසි ජල කළමනාකරණයක් නැහැ.

ඒ විතරක් නොවෙයි. අද ඩීසල් සහනාධාරය දෙන්නේ නැහැ. ගොවියා එදා කුඹුරු අක්කරය හෑවේ රුපියල් 25,000ට. ඩීසල් ප්‍රශ්නය නිසා දැන් රුපියල් 65,000යි. ඒකට සහනාධාරයක් නැහැ. 2024දී පොහොර සහනාධාරය හෙක්ටෙයාරයකට රුපියල් 15,000යි. 2026දී රුපියල් 25,000යි. කෝ, මොකක්ද ගොවියාට දීපු සහනය? ගොවියා වෙනුවෙන් මොකක්ද කරලා තියෙන්නේ? ගොවි ජනතාවගේ කර පිටින් මේ ආණ්ඩුව පිහිටුවාගෙන අද ගොවි ජනතාවට කරන්න තියෙන කෙනෙහිලිකම් ඔක්කෝම කරනවා. අද ගොවි ජනතාව මහපාරට බැහැලා තියෙනවා. ගොවි ජනතාව රත්තරන් බඩු ටික උකස් තියලා තිබෙනවා. අද ගොවි ජනතාව කරන්න දෙයක් නැති තත්ත්වයට, අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තියෙනවා. කවුද එහෙම පත් කළේ? මේ ආණ්ඩුව. මේ නියෝජ්‍ය ඇමතිවරු.

නයි නටවන කණ්ඩායම්, අභිකුණ්ඨික කණ්ඩායම් පොළවල්වල ගිහිල්ලා නයි නටවනකොට මුළු පළාතේම ඉන්න සෙනග එක්කහු වෙලා නයි නටවන හැටි බලනවා. අන්න ඒ නයි නටවන මිනිස්සු යනවා වාගේ නියෝජ්‍ය ඇමතිතුමා කුඹුරෙන් කුඹුරට, කමතෙන් කමතට අමුඩේ ගහගෙන ගිහිල්ලා මිනිස්සු රවට්ටලා, මුළා කරලා; ගොයම කාලා, මඩ නාලා, ගොවියා රවටලා ආණ්ඩුවක් පිහිටුවාගෙන අද ගොවීන්ට කරන්න තියෙන කෙනෙහිලිකම් ඔක්කෝම කරනවා.

මේ ආණ්ඩුව කෙනෙහිලිකම් කරනවා, මේ ඇමතිවරු කෙනෙහිලිකම් කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව අද හිඟමනට පත් වෙලා තිබෙනවා. ගොවි ජනතාවට අද යන්න එන්න තැනක් නැහැ. ඇයි මෙහෙම කරන්නේ? මේ ආණ්ඩුව පත් කළේ ගොවි ජනතාව. ගොවි ජනතාවට අසාධාරණයක් කරන්න එපා. ගොවියාට පොහොර ටික දෙන්න. වී ටික සාධාරණ මිලකට විකුණා ගන්න අවස්ථාව උදා කර දෙන්න. ඔබතුමන්ලා කිව්වා, භාණ්ඩාගාරයේ මුදල් පිරිලා තිබෙනවා කියලා. ඒ නිසා පොහොර සහනාධාරය දෙන්න. ඇයි මෙහෙම කරන්නේ, ගොවි ජනතාවට? අපට හරි වේදනායි; අපට හරි වියරුයි. මේ වාගේ බොරු කියන්න එපා. ජනාධිපතිතුමා බොරු කියලා කියලා ආණ්ඩුවක් පිහිටුවා ගත්තා. දැන් මෙතැනට ඇවිල්ලා ඔක්කෝම බොරු කියනවා; තරගෙට පව කියනවා. මොකක්ද මේකේ තේරුම? වසර 76ක සාපයක් ගැන කියමින්, පසුගිය කාලයේ කරපු වැරදි වැඩ ගැන කියමින්, හොරු අල්ලනවා කියමින් මේ කරන වැඩේ තේරුම මොකක්ද? බොරු නේ කරන්නේ. ඇයි, මෙහෙම බොරු කියන්නේ? ඔබතුමන්ලා හාල් ගෙන්වනවාලු. වී මිල අඩු වෙනවාලු. අල ගොවියාට එහෙන් කවල්; හේන් ගොවියාට එහෙන් කවල්. මේක මහා අපරාධයක්; මහා සාපයක්. මේ වාගේ අපරාධ වැඩ බත සපයන ගොවීන්ට කරන්න එපා. අද ගොවි ජනතාව අන්ත අසරණ තත්ත්වයට පත්වෙලායි තිබෙන්නේ. ගොවි ජනතාවට ජීවත් වෙන්න විධියක් නැහැ. ඔවුන්ට මහ පාරට බහින්න සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණයක් කියන්න කැමැතියි. අපි බෞද්ධයෝ. අද ස්වාමීන් වහන්සේ නමකගේ බුද්ධ චීවරය ඉවත් කරලා තිබෙනවා. ඒ හාමුදුරුවන් ගැන අපට ප්‍රශ්නයක් නැහැ. ඒ හාමුදුරුවෝ හිරගෙදරට යවනකොට ජම්පරය අන්දලා යවන්න. හැබැයි, හිරගෙදර ඉඳලා උසාවියට එනකොට බුද්ධ චීවරය අන්දන්න. ඇයි, අපේ බුද්ධ ශාසනයට මෙහෙම කරන්නේ? ඒක උසාවියෙන් දීපු නියෝගයක් නොවෙයි, බන්ධනාගාර කොමසාරිස්වරයා දීපු නියෝගයක්. උසාවියෙන් දීලා නැහැ එහෙම නියෝගයක්. මන්ත්‍රීවරු, ඇමතිවරු උසාවියට එනකොට ජම්පරය ගලවලා පාර්ලිමේන්තු සූට් එක ඇඳගෙන එනවා නම් හාමුදුරුවන්ට බැරි ඇයි චීවරය ඇඳගෙන උසාවියට එන්න? බන්ධනාගාරය ඇතුළතදී ඒ අඳින ඇඳුම අන්දන්න. මේ වාගේ බුද්ධ ශාසනයට කෙනෙහිලිකම් කරන කිසිම ආණ්ඩුවකට, කිසිම කෙනෙකුට හරියන්නේ නැහැ කියන එක මම මේ සභාවේදී ප්‍රකාශ කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.37]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වී අලෙවිය සම්බන්ධව - ගොවියාගේ වී ටික විකුණා ගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව - විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් කරපු යෝජනාවට කරුණු ඉදිරිපත් කරන්න ලැබීම සතුටට කරුණක්. ඇයි, මම එහෙම කියන්නේ? ඒ යෝජනාව අද දවසේ කාලීන වුණත් ඒ යෝජනාවේ අන්තර්ගතය සහ ඒ යෝජනාවෙන් හදන්න හදන මතවාදය පිළිබඳව මෙවැනි විවාදයකින් කරුණු ඉදිරිපත් කරනවා නම් තමයි ඒ යෝජනාවට වඩාත් හොඳ සාධාරණීකරණයක් සිද්ධ වෙන්නේ. කොහොම නමුත්, යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමියත් මේ වෙලාවේ සභාවේ නැහැ. ඒකත් මම කියන්න ඕනෑ.

අපි දන්නවා, වී විතරක් නොවෙයි, තවත් භාණ්ඩ ගණනාවක්ම අපේ රට තුළ නිෂ්පාදනය කරන බව. ඒ නිෂ්පාදනය කරන සෑම භාණ්ඩයකම අලෙවිය පිළිබඳ කාරණය ඒ නිෂ්පාදකයා සතු වගකීමක් විධියට සලකනවා. හැබැයි, දීර්ඝ කාලයක පටන් වී නිෂ්පාදනය කරන ගොවියාගේ, එහෙම නැත්නම් ඒ නිෂ්පාදකයාගේ නිෂ්පාදන අලෙවිය සම්බන්ධයෙන් රජය මැදිහත් වීමක් කර තිබුණා. එහෙම මැදිහත්වීමක් කරන්න සිද්ධ වෙන්නෙම වී ගොවියාට තමන් නිෂ්පාදනය කරන භාණ්ඩයේ මිල තීරණය කිරීමේ අයිතිය අහිමි වෙලා තිබෙන නිසායි. අනෙක් සෑම නිෂ්පාදනයකදීම cost of production සහ නිෂ්පාදනයේ මිල තීරණය කිරීමේ අයිතිය නිෂ්පාදකයාට ලැබෙනවා. හැබැයි, වී මිල එහෙම තීරණය කරන්න ගියාට පස්සේ ඒ තුළ ගැටලු ගණනාවක් මතු වෙනවා. මොකද, අපේ රටේ ප්‍රධාන ආහාරය විධියට සෑම ජනතාවකටම අවශ්‍ය දෙයක් තමයි සහල් කියන්නේ. මේ සහල්

පරිභෝජනය ගොවියාට ලබාගන්න පුළුවන් මට්ටමක පැවතුණොත් විතරයි අපේ රටේ ජනතාවට ගැටලුවක් නොවී තමන්ගේ ප්‍රධාන ආහාරය සකසා ගන්න පුළුවන්කම ලැබෙන්නේ.

රජයක් විධියට වගකීමක් තිබෙනවා, ඒ ප්‍රධාන ආහාරයේ මිල අවශ්‍ය මට්ටමට පවත්වා ගන්න. හැබැයි, ඒ නිෂ්පාදනයේ පිරිවැය මොකක්ද කියලා ගොවියාට මෑතක් වෙනකල්ම නිශ්චිත වෙලා තිබුණේ නැහැ. ඔහු ලාභද, නැද්ද කියලා බලන්නේ තමන්ට ලැබුණු වී මිටි ගණනිනුයි; ඒ වී මිටි ලොරියට පටවන විටයි. ඔහුට තමන් කරපු වියදම සම්බන්ධව, ඒ ප්‍රදේශයේ අනෙක් වියදම් සම්බන්ධව, ශ්‍රමය සම්බන්ධව, තමන්ගේ ශ්‍රමය සම්බන්ධව තක්සේරුවක් තිබුණේ නැහැ. හැබැයි, මේ රජය බලයට පත් වෙච්ච මුල් දවස්වල ඉඳන්ම අමාත්‍යාංශ මට්ටමින්, ගම් මට්ටමින් මේ පිළිබඳව සොයන්න පටන් ගත්තා. ගොවීන් තුළ යම් කථාවක් ඇති වුණා, කොතරම් පිරිවැයක් වී කිලෝවක් නිෂ්පාදනය කරන්න දරන්න සිදු වෙනවාද කියලා. බිම සකස් කිරීමට, බිත්තර වී සොයා ගැනීමට, පොහොර ඇතුළු කෘමිනාශකවලට, අස්වැන්න නෙළා ගැනීමට, අස්වැන්න ප්‍රවාහනය කිරීමට යන වියදම් ආදි සියලු දත්ත ටික ගත්තාට පස්සේ ගොවියාට දැන් අවබෝධයක් තිබෙනවා, තමන්ගේ නිෂ්පාදන පිරිවැය සම්බන්ධව. මේ මිල ගණන් තැන් තැන්වල වෙනස් වෙන්න පුළුවන්කම තිබෙනවා. නමුත් අද ගොවියාට පුළුල් අවබෝධයක් ලබා දී තිබෙනවා, තමන් කරන නිෂ්පාදනයේ ඒකකයක පිරිවැය හෙවත්, ඒකකයක නිෂ්පාදන වියදම කොච්චරද කියලා පැහැදිලිව දැනගන්න. ඒ වාගේම ඒකට ලාභාංශය විධියට යම් ප්‍රමාණයක් එකතු කරන්න ගොවියාටත් අයිතියක් තිබෙන බව තහවුරු කරලා රජය එක්තරා මොහොතක වී කිලෝවක මිල හැඳුවා, රුපියල් 120යි කියලා. ඒ රුපියල් 120 ඇතුළේ ගොවියාගේ නිෂ්පාදන වියදම ඇතුළත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒකට එකතු කරපු අගයකුත් තිබෙනවා, ගොවියාගේ ලාභාංශය විධියට. මෙන්න මේ විධියට ගොවියා මේ කියන රුපියල් 120 මිලට හෝ ඊට ආසන්න මිලකට වී ලබා දීමේදී ඒ වී කාටද ලබා දෙන්නේ කියන ගැටලුව ඉතිහාසය පුරාම තිබුණා. අනෙක් භාණ්ඩවලට මේ ගැටලුව එන්නේ නැහැ. මොකද, ඒවාට සංවිධිත ක්‍රමවේදයක් තිබෙනවා; තමන්ගේ භාණ්ඩය රට පුරා බෙදා හැරීමේ, ඒ භාණ්ඩයට අගය එකතු කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. එහෙම නම්, මේ කටයුත්තේදී ගොවියා ආරක්ෂා කරන්න ආයතනයක් අවශ්‍ය වෙනවා. ඒ අනුව වී අලෙවි මණ්ඩලය නමින් ආයතනයක් බිහි වෙනවා. ගොවියාට තනි තනියෙන් වී අලෙවි කර ගන්න බැරි නිසා වී අලෙවි මණ්ඩලය බිහි වෙනවා.

වී අලෙවි මණ්ඩලය බිහි වෙලා අවුරුදු තුනකට වැඩි කාලයක් ගත වෙනවා, වී අලෙවි මණ්ඩලයේ ප්‍රතිලාභය ගොවීන් වෙත ගේන්න. වී අලෙවි මණ්ඩලය බිහි කළ පමණින්ම මේ ප්‍රතිලාභය ගොවියා ළඟට ගෙන යන්න බැහැ කියන එක තමයි ඒකෙන් පෙන්නුම් කරන්නේ. වී අලෙවි මණ්ඩලය තමන්ගේ ක්‍රියාවලිය ආරම්භ කරමින්, වී ගබඩා කරමින් යම් කාල පරිච්ඡේදයක් තුළ ගොවියාගේ වී මිලට ගන්නා ආකාරයට සකස් වෙලා තිබුණා. නමුත් පසුගිය අවුරුදු 25කට, 30කට ආසන්න කාල පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලය සම්බන්ධයෙන් ශෝචනීය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අප මේ රජය භාර ගනිද්දී, වී අලෙවි මණ්ඩලය ක්‍රමානුකූලව බිඳ වැටිලා තිබුණා; ගබඩා කරන්න පුළුවන් ස්ථාන වල් බිහි වෙලා, විනාශ වෙලා, වහලවල් කඩා වැටිලා, ඒ ගබඩා මුර කරන්න සිටි මුරකරුවන් ඉවත් වෙලා, ඒවා නඩත්තු කරමින් පවත්වාගෙන ගිය සේවක පිරිසට ඒවායෙහි තමන්ගේ රාජකාරිය කරගෙන යන්න බැරි මට්ටමකට පත් වෙලා වී අලෙවි මණ්ඩලය බරපතළ ශෝචනීය තත්ත්වයකට ඇද වැටිලා තිබුණා. එහෙම නම් අමාත්‍යාංශය විධියට මේ තත්ත්වය වෙනස් කරන්න මැදිහත් වීමක් කරන්න ඕනෑ.

එදා වී අලෙවි මණ්ඩලය පටන් ගනිද්දී ජනතාව තුළ ඒ සම්බන්ධව තිබුණු ආකල්පමය තත්ත්වය, එය පවත්වාගෙන ගිය නිලධාරින් තුළ තිබුණු ආකල්පමය තත්ත්වය, ඒක ආරක්ෂා කිරීමට තිබුණු වැඩ පිළිවෙළ වෙනස් වෙලා තිබුණා. ඒ ගබඩා සංකීර්ණ විනාශ වීම, ඒවායේ මාර්ග ප්‍රවිෂ්ටය නිසි පරිදි නොතිබීම, ඒවා අත්පත් කර ගැනීම් ආදි වශයෙන් වී අලෙවි මණ්ඩලය මුහුණ දෙන බරපතළ ගැටලු මතු වෙලා තිබුණා. මෙන්න මේ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් හදලා, නව සභාපතිවරයෙක් පත් වෙලා, වී අලෙවි මණ්ඩලය නැවත සකස් කිරීමේ වැඩ පිළිවෙළ රට පුරාම දියත්වෙන්න පටන් ගත්තා. ගබඩා නැවත පිළිසකර කරමින්, වහලවල් අලුත්වැඩියා කරමින්, කෘමි සතුන් ඇතුළු නොවී අඩුම තරමින් මාස 6ක් වී ගබඩා කර තබා ගන්න අවශ්‍ය කටයුතු සකස් කරමින්, මුරකරුවන් සොයා ගනිමින්, එහි වැඩ කරන අයට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් තැන් තැන්වල හදා දෙමින් වී අලෙවි මණ්ඩලය අද බොහොම දුෂ්කර ගමන් මාර්ගයක අරගෙන ඇවිත් වී යම් ප්‍රමාණයක් හෝ ගබඩා කරන්න පුළුවන් මට්ටමට ගෙනැවිත් තිබෙනවා. මෙය, අවුරුද්දකුත් මාස අටක් වැනි කාල පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලය ලබාගෙන තිබෙන ප්‍රගතියයි. මා සතුව සංඛ්‍යාලේඛන තිබෙනවා. ඒවා ගැන කියනවාට වඩා වැදගත් වන්නේ මේ විධියට වී අලෙවි මණ්ඩලය ක්‍රමානුකූලව සංවර්ධනය කරන එකයි. අද එක පැත්තකින් ගොවියා තමන්ගේ නිෂ්පාදන වියදම මොකක්ද කියලා දන්නවා; ඒක ඇතුළේ තමන්ගේ ලාභාංශය කොපමණද කියලා දන්නවා. නාඩු වෙන්න පුළුවන්, සම්බා වෙන්න පුළුවන්, කීරි සම්බා වෙන්න පුළුවන් වී වර්ගය අනුව ඒවායේ මිල වෙනස්වීම පිළිබඳව අද ගොවියාටත් අවබෝධයක් තිබෙනවා.

එහෙම නම්, මේ යෝජනාව ඇතුළේ තිබෙන කාරණා අපි සැලකිල්ලට ගන්න ඕනෑ. මෙවැනි සංවර්ධන ක්‍රියාමාර්ගයකට ප්‍රවිෂ්ට වෙමින් ගොවියාට සහන ලබා දීම සඳහා වී අලෙවි මණ්ඩලය කටයුතු කරන්නේ කොහොමද, නැවත වී අලෙවි මණ්ඩලය පුනරුදයක් කරා ගමන් කරවන්නේ කොහොමද කියන සාකච්ඡාව තමයි අප ගන්න ඕනෑ. වී සම්බන්ධව ගත්තාම, වී නිෂ්පාදනයේදී වී ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ බව, අක්කර ගණන වැඩි කර ගන්න ඕනෑ බව අපි දන්නවා. සංඛ්‍යාලේඛන විධියට ගත්තොත්, මේ ගෙවුණු අවුරුදු තුන තුළ මහ කන්නයේ හා යල කන්නයේ වී නිෂ්පාදනය අපි ක්‍රමානුකූලව වැඩි කරගෙන තිබෙනවා; ඒකක වපසරියක වගා කරන අස්වැන්න වැඩි කර ගෙන තිබෙනවා. ඒක නිසා අද ශ්‍රී ලංකාව තුළ ජනතාවගේ පරිභෝජනය සඳහා ප්‍රමාණවත් විධියට අපේ කුඹුරුවලින් අස්වැන්න ලැබෙනවා. ඒ අස්වැන්න ප්‍රමාණවත්ව ලැබීම නිකම්, අහම්බෙන් සිද්ධ වුණු දෙයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සම්බන්ධව දීර්ඝ කාලයක් සැලසුම් සහගතව වැඩ කටයුතු කරලා, මේ අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ ඒ අස්වැන්න අත්පත් කරගෙන තිබෙනවා. එහෙම නම්, මීටත් වඩා අස්වැන්නක් තමන්ගේ කුඹුරෙන් ලබා ගන්න, හෙක්ටෙයාරයකින් වී කිලෝ 4,000 ඉක්මවා යන තැනකට ගන්න ගොවියා පෙළඹවීමට අදාළ මූලික වැඩසටහන අද ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

වී අස්වැන්න ගැන කථා කරන කොට, වී මිල වැඩි කර ගන්නවා වාගේම වී අස්වැන්න වැඩි කිරීම තුළිනුත් ගොවියාට තවතවත් ප්‍රතිලාභ අත්පත් කරන්න පුළුවන්. ඒක කරන්න නම් රජයට ඒ සම්බන්ධව වගකීමක් තිබෙනවා. වීවල නිෂ්පාදන වියදම හදන කොට, ආණ්ඩුව විසින් වාරි කර්මාන්තයට කරන වියදම, ඒ කියන්නේ වැව හදන්න, සොරොව්ව හදන්න, ඇළ ප්‍රතිසංස්කරණය කරන්න යන වියදමත් බලන්න ඕනෑ. ඒ අදාළ සියලු කටයුතුවලට මෙය ව්‍යාප්ත කරලා, පෙර වෙන් කරපු මුදල්වලට වඩා විශාල මුදල් ප්‍රමාණයක් ආණ්ඩුවෙන් වාරි කර්මාන්තය වෙනුවෙන් අද වනකොට වෙන් කර තිබෙනවා. එහෙම නම්, නිෂ්පාදන වියදම ගණන් හැදීමේදී රජය විසින් දරන ලද ඒ පිරිවැය නිෂ්පාදනයට එකතු කරලා නැහැ. ඒක ලැබිලා තිබෙන්නේ ගොවියාට සහනයක් විධියටයි.

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

ඒ වාගේම පොහොර සම්බන්ධව ගත්තාම, ගොවියාට එදා හෙක්ටෙයාරයකට රුපියල් 25,000ක් වශයෙන් දුන්නු පොහොර සහනාධාරය දැන් හෙක්ටෙයාරයකට රුපියල් 30,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ තුළිනුත් ඔහුගේ නිෂ්පාදන වියදම අඩු කර ගන්න පුළුවන් මට්ටමකට සැලසුම් සකස් කරලා තිබෙනවා. හැබැයි, අප මේ සියලු දේවල් සඳහා මේ රටේ භාණ්ඩාගාරයෙන් වියදම් කරලා තිබෙන්නේම, අපේ සහල් මිල යම් මට්ටමකට ස්ථාවරව පවත්වා ගැනීමටත්, ගොවියාගේ වී වලට සාධාරණයක් ඉෂ්ට කිරීමටත් තමයි. එහෙම නම් අපි මේ යෝජනාවේදී සලකා බලන්න ඕනෑ මේ දෙකේ සමතුලිතතාවයි. අද වනකොට අපේ රටේ සහල් නිෂ්පාදනය පරිභෝජනය සඳහා ප්‍රමාණවත් නම්, සහල් මිල ජනතාවට ලබා ගන්න පුළුවන් ආකාරයට පවත්වා ගෙන යන්න ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද, ඒ වාගේම ඉතාම දුක් මහසියෙන් තමන්ගේ අස්වැන්න නෙළා ගෙන ඒ වී වලට සාධාරණ මිලක් ලබා ගන්නට යැමේදී රජයේ වී අලෙවි මණ්ඩලයේ ක්‍රියාකාරි මැදිහත්වීම කොහොමද කියන කාරණා ඉතාම වැදගත්. මේ අවුරුදු දෙක පුරා රජය විසින් වී අලෙවි මණ්ඩලයත්, කලින් සඳහන් කරපු වාරි ක්‍රියාවලියත්, ඒ වාගේම පොහොර සහනාධාරයත් තුළ නිකම්ම ගොවියාට පොහොර සහනාධාරය ලබා දුන්නා කියන්නේ නැතුව, නිශ්චිත ක්‍රමවේදයකට, අද වනකොට යාය සමාගම්, යාය සමිති විධියට හදා ගෙන තනි යායක් විධියට වගා කරලා, අත්හදා බැලීමක් විධියට, යායට අවශ්‍ය යෙදවුම් මොනවාද, යායට අවශ්‍ය ශ්‍රමය කොහොමද කියලා සංඛ්‍යාලේඛන සහිතව ඉස්සරහට එනවා. වී වල මිල ස්ථාවරත්වයකින් පවත්වා ගෙන යැමට හේතු වන සාධක කොතරම් ප්‍රමාණයක් අඩු වැඩි වෙනවාද, ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වනකොට, ට්‍රැක්ටරයට සපයන්න ඕනෑ ඉන්ධන ප්‍රමාණයේ මිල වැඩි වනකොට, ඒ අනුව බිම සකස් කිරීමේ වියදම කොතරම් ප්‍රමාණයකින් වැඩි වෙනවාද කියන කාරණාත් ඉතාම වැදගත්. මෙන්න මේ සියලු දේවල් එක තැනක දත්ත විධියට එකතු කරගෙන, සංඛ්‍යාලේඛන විධියට එකතු කරගෙන, ගොවියා ආරක්ෂා කරන්න අද නිසි ක්‍රමවේදයකට ප්‍රවිෂ්ට වෙලා තිබෙනවා කියන එක අපි දකිනවා. ඒ නිසා අද වන විට ගොවියා තුළ විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. මේ යෝජනාවේ ඉදිරිපත් කරන කරුණු මොනවා වුණත්, ඉතා පැහැදිලිව අපි කියන්න ඕනෑ ගම් මට්ටමේ ගොවියාට අද තමන්ගේ වී ගොවිතැන සම්බන්ධව ස්ථාවරයක් ඇති වෙලා තිබෙන බව. වී ගොවිතැනින් පරිබාහිරව තවත් තැනකට වී ගොවියා අරගෙන යන්නේ කොහොමද කියලා ඔවුන් වෙතින්ම අත්හදා බැලීම් සිදු වෙනවා. මේ සියලු අර්ථයන්ගෙන් මේ යෝජනාව සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේදී, අපි ජනතාව තුළ ආකල්පමය වෙනසක් හදන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

වී සම්බන්ධයෙන් විතරක් වෙනම මිල දී ගැනීමක් ගැන කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, වී සම්බන්ධයෙන් විතරක් මෙවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන්නේ මොකද කියලා සාකච්ඡා කරන්න ඕනෑ. ඒ සම්බන්ධව අපි සංවාදයක් ඇති කරන්න ඕනෑ. ඒ අර්ථයෙන් ගත් කල මේ සංවාදය කාලීන සංවාදයක් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.49]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය අද උදෑසන සභාව කල්තැබීමේ යෝජනාව තුළින් ඉදිරිපත් කළේ කාලෝචිත මාතෘකාවක්. අද වනවිට ලොකු කථා බහක් ඇති වෙලා තිබෙන, විශාල පීඩනයකට පත් වෙලා ඉන්න, අදටත් සුසුම් හෙළන ගොවීන් වෙනුවෙන් තමයි එතුමිය මෙම යෝජනාව ඉදිරිපත් කළේ. හැබැයි, උදෑසන ඉඳලා නියෝජ්‍ය ඇමතිතුමාගෙන් පටන් ගෙන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී, මැති-ඇමතිවරුන් කළ කථා සියල්ලට ඇහුම් කන් දීගෙන සිටියාම අපට ප්‍රශ්නයක් ඇති වුණා, මේ රටේ ගොවි ජනතාව කන්නයක් අවසන් වෙලා ඉදිරි කන්නය එනකම් හිරි ඇරගන්නද පාරට බැහැලා උද්ඝෝෂණ කරන්නේ කියලා; මාධ්‍යයට ඇවිල්ලා අදහස් ප්‍රකාශ කරන්නේ කියලා. ගොවීන් විවිධ තැන්වලට ඇවිල්ලා ඇමතිවරුන්ට හූ කියන්නේ, ඇමතිවරුන්ට චෝදනා කරන්නේ, ගොවි හමුවලට ඇමතිවරුන්ට යන්න බැරි තැනට පාර කපා තිබෙන්නේ හිරි ඇරගන්නද? ගොවීන්ට ප්‍රශ්නයක් නැද්ද?

දැන් මේ සියලු දෙනා කථා කරන්නේ 2020 වසරේ ආර්ථිකය කඩා වැටුණු තැන ඉඳිමින්. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමාත් කිව්වේ මොකක්ද? ඒ කාලයේ එක රැයින් කාබනික පොහොර ක්‍රමයට ගිහිල්ලා, මේ රටේ කෘෂිකර්මාන්තය කඩා වැටිලා, එතැනින් ආපු figures පාදක කරගෙන තමයි එතුමාත් කථා කළේ. ඊට කලින් තිබුණු තත්ත්වය ගැන කථා කරන්නේ නැහැ. මොනරාගල දිස්ත්‍රික්කයේ ගබඩාවලට කන්න අටකින් වී මිලදී ගෙන තිබුණේ නැහැ කියලා කථා කරනවා. කන්න අටකට ඉස්සෙල්ලා, රටේ වී නිෂ්පාදනයක් තිබෙන්න එපායැ. කාබනික පොහොර ක්‍රමයට ගිහිල්ලා වී නිෂ්පාදනය කඩා වැටීම නිසා වී මිලදී ගන්න තබා අවශ්‍ය නිෂ්පාදනයක් තිබුණේත් නැහැ, වී මිලදී ගන්න තරගයක් තිබුණේ. එහෙම තත්ත්වයක් තිබියදී වී අලෙවි මණ්ඩලයට වී දෙන්න මිනිස්සුන්ට කැක්කුමක් නැහැ. මොකද, නියම කරන මිලට වැඩි මිලක් වෙළෙඳ පොළේ නියම වෙනවා.

ඒ වාගේම ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, මෝල් විශාල ප්‍රමාණයක් රජය සතුව තිබුණා කියලා. ඒවා ගිනිබත් කළේ කවුද? ඒවා මේ රටට අහිමි කළේ කවුද? වී අලෙවි මණ්ඩලය සතුව තිබුණු ලොරි ටික මේ රටට අහිමි වුණේ කවුරු හරහාද? ඒ සියල්ලම තමන්ගේ ක්‍රියාකාරකම් නිසා රටට අහිමි කරලා, අවසානයේ මේ තත්ත්වයට එන්න පාර කැපුණේ කොතැනින්ද කියන එක ගැන කථා කරන්නේ නැතුව තමන්ට බලය ලැබුණාම මේ වසර දෙක ඇතුළත සියලු ප්‍රශ්නවලට විසඳුම් දීලා වාගේ, ගොවීන්ට කිසි ගැටලුවක් නැහැ වාගේ අද මේ පාර්ලිමේන්තුවේදී කථා කරනවා. බොහෝ විසඳුම් ගැන ඔබතුමන්ලාගේ පැත්තෙන්ම ඇහුණා. හැබැයි, ඒවා ප්‍රායෝගික වෙලා නැති ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ.

මෙතැන කථා කළ සියලු දෙනාගේම කථා තුළ - මට පෙර කථා කළ මන්ත්‍රීතුමාගේ කථාව තුළ පවා - බොහොම හරවත් කරුණු ගණනාවක් තිබුණා. ගොවියා හරි අහිංසකයි. වී ගොවියා විතරක් නොවෙයි, මෙම ගැටලුවට මුහුණ දී සිටින්නේ. නමුත් වී ගොවියාගේ හඬ විතරයි බලවත් වෙලා තිබෙන්නේ. අනෙක් සෑම ගොවියෙකුටම තමන්ගේ නිෂ්පාදනවලට මිලක් නැහැ. ඒ මිල නියම කරන්නේ හැම වෙලාවේම වෙළෙඳුන්. නැත්නම් ඉල්ලුම මත තමයි මිල නියාමනය වෙන්නේ. නමුත් ඒ ගොවීන්ගේ ප්‍රමාණය සීමාසහිත නිසා ඒ හඬ එච්චර බලවත් වෙන්නේ නැහැ. හැබැයි, වී ගොවියාගේ හඬ ටිකක් බලවත් වෙන්නේ වී ගොවීන්ගේ ප්‍රමාණය වැඩි නිසායි. ඒ හඬ බලවත් නිසා අනෙක් ගොවීන්ට ඒක අනුයුක්ත වෙලා නැහැ කියන්න බැහැ. මේ රටේ භෝග වගා කරන සියලු ගොවීන්ගේ ප්‍රශ්නවලට රජය පැත්තෙන් විසඳුම් ලැබී නැහැ. ආණ්ඩුව බොහෝ දේවල් කථා කළා, යෝජනා කළා, කිව්වා. හැබැයි, ඔය කියන එකක්වත් මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වෙලා නැහැ.

ඉතිහාසයේ ඔබතුමන්ලා විපක්ෂයේ සිටින තාක්කල් පසුගිය ආණ්ඩුවලට පලු ඇරපු, බැනපු කාරණා ඒ විධියටම අදටත් සිද්ධ වෙනවා. පොහොර සහනාධාරය අස්වනු නෙළනකොටවත් ලැබෙන්නේ නැති පැති තවත් තිබෙනවා. එම ගැටලුව විසඳිලා තිබෙන්නේ කියලා ඔබතුමන්ලාට කියන්න පුළුවන්ද? "සියයට 100කින් අපි මේවා විසඳා තිබෙනවා" කියා කියන්න පුළුවන්ද? පසුගිය ආණ්ඩුවලිනුත් පොහොර සහනාධාරය දුන්නා. දැන් මෙතුමා කිව්වා පොහොර සහනාධාරය විධියට රුපියල් 15,000ක් දුන් බව. මට කලින් කථා කළ මන්ත්‍රීතුමා පිළිගත්තා, පසුගිය ආණ්ඩුව 25,000ක් දුන්නා කියලා. ඔබතුමන්ලා ඇවිල්ලා රුපියල් 25,000 රුපියල් 30,000ක් දක්වා වැඩි කරපු කථාව හරි. ඔබතුමන්ලා ඒක double කරලා හෙක්ටෙයාර දෙකකට කියලා අමුණා කියනවා. හෙක්ටෙයාර දෙකකට 60,000ක් කියලා ඔබතුමන්ලා කියනවා. 25,000 දුන්නේ පසුගිය රනිල් වික්‍රමසිංහ රජයෙන්. ඒක රුපියල් 5,000කින් වැඩි කරනකොට, එදා තිබුණු පොහොර මිලයි, අද තිබෙන පොහොර මිලයි අතර වෙනස කොච්චර ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලාද? කම්කරුවාගේ වැටුප කොපමණ ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලාද? ඉන්ධන මිල වැඩි වෙලා. ඒ නිසා පිරිවැය කොපමණ ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලාද? අපි කියන්නේ නැහැ, ඔබතුමන්ලා නිකම් හිටියා කියලා. ඔබතුමන්ලා යම් කිසි උත්සාහයක් දරනවා. හැබැයි, ඒ උත්සාහය සීමාසහිතයි. ඒවා ප්‍රායෝගික නැහැ. මේ ගැටලුවල අවසානයක් නැහැ. තව වැඩ කටයුතු ගණනාවක් ඒ වෙනුවෙන් කළ යුතුයි.

අස්වැන්න වැඩි කර ගත යුතුයි කියලා කථා කරනවා. නමුත් අස්වැන්න වැඩි කරගෙන තිබෙන්නේ කොහේද? ඔබතුමන්ලා සඳහන් කරන කරුණු කාරණා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න. ඔබතුමන්ලා පසුගිය අය වැයෙන් dryers සවි කරන්න මුදල් ප්‍රමාණයක් වෙන් කළා. නමුත් අපිට තවම අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක තැනකවත් එක dryer එකක්වත් සවි කළ බවක් ගැන දැන ගන්න ලැබුණේ නැහැ. ඒ මුදල්වලට මොකද වුණේ? දැන් මේ වසර අවසානයි. ඔබතුමන්ලා අලුත් අය වැය ලබන මාසයේ ඉදිරිපත් කරනවා. හැබැයි, මේ අවුරුද්දේ අය වැය පව මාලාවක් බවට පත් වෙලා තිබෙනවා. ලබන අවුරුද්දටත් තවත් පව ටිකක් හදාගෙන ඇවිල්ලා ආයෙත් ගොවීන් මෝහනයට පත් කරලා බලාපොරොත්තු අළෙවි කරලා වැඩක් නැහැ. ඒ නිසා අපි කියන්නේ ප්‍රායෝගික වැඩ පිළිවෙළක් සකස් කරන්න කියායි. ඒ ඉලක්ක සපුරා ගන්න වැඩ කරන්න. එහෙම නැතුව කයිවාරු ගැහුවාට වැඩක් නැහැ. අපි දැක්කා, ඇමතිතුමා අම්පාරේ ද කොහේද ගිහිල්ලා කෙසෙල් බඩ මෙහෙන් දැම්මාම, අනෙක් පැත්තෙන් ෂර්ට්, ඇඳුම් එන ෆැක්ටරි එකක් හැදුවා. ඒ විධියට ඔබතුමන්ලා කියන පව ටිකත් මේ පැත්තෙන් ගුලි කරලා, අඹරා ඇතුළට දැම්මාම, එහා පැත්තෙන් ඒවා සත්‍ය වෙලා; ඇත්ත වෙලා එළියට එන ක්‍රමයක් හදන්න පුළුවන් නම් මේ රටේ ගොවීන්ගේ ප්‍රශ්න නිරාකරණය කරගන්න පුළුවන්. හැබැයි, එහෙම එකක් ඔබතුමන්ලාට හදා ගන්න බැහැ. ඔබතුමන්ලා වෙනත් දේවල් හදනවා, කයිවාරු ගහනවා, බොරු කියනවා, බොරු පිඹිනවා. ඒවායින් එහාට ගිහිල්ලා ඒවා යථාර්ථයක් බවට පත් කරන්න කටයුතු කරන්නේ නැහැ.

මීට ඉස්සෙල්ලා මට පිටුපසින් සිටින ඔබතුමන්ලාගේ එක් මන්ත්‍රීවරයෙක් කියනවා අපි දැක්කා, මේ අමාත්‍ය මණ්ඩලය ඉතාම විද්‍යානුකූලව පත් කරලා තිබෙනවා කියලා. ඒ වාගේම, සියලුම අමාත්‍යාංශ අමාත්‍යවරුන්ට අදාළ පරිදි එකතු කරලා දුන්නා කියලා. හැබැයි, කෘෂිකර්ම අමාත්‍යවරයාම කියනවා, "කෘෂිකර්මාන්තය ගැන මට අවබෝධයක් නැහැ" කියලා. ඒ වාගේම, නියෝජ්‍ය අමාත්‍යවරයා සම්බන්ධයෙන් ගත්තොත්, එතුමා පාර්ලිමේන්තුවේදී අතින් කෑම කනවා මම තවම දැකලා නැහැ. හැන්දෙන් සහ ගෑරුප්පුවෙන් තමයි එතුමා හැමදාම කෑම කන්නේ. ගොවියා ළඟට ගිහිල්ලා බුලත් විට කාගෙන, මඩ කාගෙන, බජිරි කාගෙන, ගොවීන් සමඟ ගැටෙමින්, රන්බණ්ඩා මාමලා, උක්කුබණ්ඩා මාමලා ගැන කථා කරන අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට එක දවසක්වත් පාර්ලිමේන්තුවේ අතින් කෑම කන්න බැරි වෙලා තිබෙනවා. එතුමා දැන් ඒ තැනට ගොඩනැඟිලා තිබෙනවා. හැබැයි, ගොවියාට තවම අතින් කන්නවත්, තමන්ගේ වෙල පිරිමහගන්නවත් පුළුවන් ආකාරයේ ආර්ථික ශක්තියක් ඔබතුමන්ලා ගොඩනඟලා නැහැ. තමන්ගේ ජනාධිපතිවරයා පත් කරලා, තමන් පළමු වතාවට ආණ්ඩුකරණයට ඇවිල්ලා මේ වෙනකොට වසර දෙකක කාලයක් අවසන් කරලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ඔබතුමන්ලාට මේ කාරණය නැහැයි කියන්න බැහැ. 1994 ඉඳලා ගත්තාම, ආණ්ඩු දෙකක හැර අනෙක් සෑම ආණ්ඩුවකම ඔබතුමන්ලා කොටස්කරුවෝ. 1994දී චන්ද්‍රිකා මැතිනිය බලයට එන විට ඒ අය එක්ක කටයුතු කළා. 2001දී අපේ ආණ්ඩුව එනකොට නැවතත් චන්ද්‍රිකා මැතිනිය එක්ක කටයුතු කළා. ඊට පස්සේ, ඔබතුමන්ලා අද පවුල් පිටින් හිරේ දාන්න කෙටුම්පත් සකස් කරන, ගමට ගිහිල්ලා වෛරය වපුරන, මහින්ද රාජපක්ෂ පවුල කියන හොර පවුල නිර්මාණය කරන්නත් ඔබතුමන්ලාම තමයි කටයුතු කළේ. සුනාමි ආධාර පිළිබඳ චෝදනා තිබුණු වෙලාවේ ඔබතුමන්ලාම තමයි ඒගොල්ලෝ බලයට ගෙන ඒමේ වගකීම භාර ගත්තේ. මේ සියලු කාරණා අරගෙන බලද්දී, ඔබතුමන්ලා පසුගිය වසර ගණනාව පුරාම ආණ්ඩුකරණයේ සිටියේ නැහැයි කියලා කියන්න බැහැ. අද ඔබතුමන්ලාට සෘජුවම වගකීම් ඇවිල්ලා තිබෙනවා. සෘජුව වගකීම් ඇවිල්ලා තිබෙන අවස්ථාවක, තවමත් පසුගිය ආණ්ඩුවලට බැණ බැණ, පසුගිය හැත්තෑ හය අවුරුද්දට සාප කර කර ඉන්නවා වෙනුවට, දැන් ප්‍රායෝගිකව මේ රටේ ජනතාවට වගකියන යන්ත්‍රණයක් නිර්මාණය කරලා, ඔබතුමන්ලා කියපු කථා ටික සැබෑවක් බවට පත් කරලා, මේ රටේ ගොවියා මේ මර උගුලෙන් ගලවා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.56]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂය විසින් පාර්ලිමේන්තුවට විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගොවියා මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව වාගේම, 2024-2025 මහ කන්නයත්, 2025 යල කන්නයත්, 2026 වසරට අදාළ මහ කන්නයත්, ඒ කියන්නේ කන්න තුනක් පිළිබඳව විශේෂයෙන් මෙම යෝජනාව තුළින් කථා කරලා තිබෙනවා.

ඉතින්, මෙම යෝජනාව තුළින් විපක්ෂය විශේෂයෙන් පෙන්වන්න උත්සාහ කරනවා, වී මිලදී ගැනීම අසාර්ථකයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වී මිලදී ගැනීම අසාර්ථකයි කියලා පෙන්වන්න උත්සාහ කරන විපක්ෂයේ කෙරුවාව ගැන ඉතිහාසයේ ඒ පීඩාවට පත්වුණු ගොවි ජනතාව ඉතා හොඳින් දන්නවා.

විශේෂයෙන්ම මෙහිදී නිවැරදි කිරීමක් කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. මීට පෙර අපේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කළ ගරු අසෝක රන්වල මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, හෙක්ටෙයාරයකට පොහොර සහනාධාරය රුපියල් 25,000ක් ලබා දුන් බව. ඔව්, හෙක්ටෙයාරයකට පොහොර සහනාධාරය හැටියට රුපියල් 25,000ක් ලබා දුන්නේ අපේ ආණ්ඩුවෙන්. 2024 දී අපි බලයට එන විට පොහොර සහනාධාරය විධියට තිබුණේ කීයද? මට කලින් කථා කළ මන්ත්‍රීතුමා එතුමාගේ කථාව කරලා පැනලා ගියා. රන්වල මන්ත්‍රීතුමාට එතුමාගේ අදහස නිවැරදිව ප්‍රකාශ කර ගැනීමට නොහැකි වූ නිසා මෙතුමා ඒකෙන් අවස්ථාවක් ගත්තා. විපක්ෂය හැමදාම කළේ ඕකයි. වචනයක් වැරදුණු විට ඒක අල්ලාගෙන විපක්ෂය දේශපාලනය කරන්න හදනවා. හැමදාම කළේ ඒකයි. දැන් එතුමා බොරු ටිකක් කියලා පැනලා ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 දී අපි ජයග්‍රහණය කරනකොට පොහොර සහනාධාරය විධියට තිබුණේ, අක්කර දෙකහමාරකට රුපියල් 15,000යි. අපේ ආණ්ඩුවෙන් තමයි ඒක රුපියල් 25,000 දක්වා වැඩි කළේ. විපක්ෂයේ බොහෝ දෙනෙකුට අද ඒ කාරණය අමතකයි. ඒකයි තිබෙන ප්‍රශ්නය. ජාත්‍යන්තරයේ යුදමය තත්ත්වයක් තිබියදී තමයි අපි එම රුපියල් 25,000 තවත් රුපියල් 5,000කින් වැඩි කළේ. ඒ අනුව, පොහොර සහනාධාරය රුපියල් 30,000ක් බවට පත් කළා. පොහොර සහනාධාරය සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. මේවා දීලා තිබෙන්නේ ගොවි ජනතාව වෙනුවෙන්; මේවා ලබා දී තිබෙන්නේ වී ගොවියා වෙනුවෙන්. එහෙම තිබියදී විපක්ෂයේ කට්ටිය කොහොමද කියන්නේ, අපි වී ගොවියා අනාථ කළා කියලා? අපි පොහොර සහනාධාරය වැඩි කරලා දුන්නේ වී ගොවියා වෙනුවෙන්. එහෙම නැතුව මේ රටේ වෙන කාටවත් නොවෙයි. ඒ, එක කථාවක්.

ඒ වගේම, තවත් බොරුවක් කිව්වා, පසුගිය වසර දෙක ඇතුළත එක dryer එකක් හෝ සවි කර තිබෙන තැනක් කියන්න කියලා. Dryer එකක්වත් සවි කරලා නැහැ කියලා එතුමා කිව්වා. මොන බොරුද? ඒක නේ මම කිව්වේ, බොරුව කිව්වා, පැන්නා. වී අලෙවි මණ්ඩලයට අයත් තලාව ගබඩාවේ අන්න dryers දෙකක් සවි කරලා තිබෙනවා. මීට පෙර කථා කරපු අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට මම කියනවා, ගිහිල්ලා බලන්න කියලා. අන්න, පදවිය සමුපකාරයේත් dryers දෙකක් සවි කරලා තිබෙනවා. අපේ වෙළෙඳ අමාත්‍යතුමා සමුපකාර දෙපාර්තමේන්තුව හරහා ඒ සඳහා ප්‍රතිපාදන ලබා දීලා, ඒ වාගේම අපි විමධ්‍යගත මුදල්වලිනුත් මුදල් වෙන් කරලා අන්න, පදවිය සමුපකාරයේ dryers දෙකක් සවි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් වෙලා තිබෙන්නේ මේවා කිව්වාට වැඩක් නැති එකයි. කමක් නැහැ, කොහේ හරි ඉඳලා අහගෙන ඉඳීවි නේ. අන්න, dryers සවි කරලා තිබෙනවා, ගිහිල්ලා බලන්න. අපි විපක්ෂයේ ඉන්න කාලයේ ගොවි ජනතාවගේ ප්‍රශ්න නියෝජනය කළා වාගේම අපි ඒවා ප්‍රතිපත්තිවලට ගෙනැල්ලා, දැන් ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැමදාමත් බොරු - පච - කිව්වේ ඒ අය. හැබැයි, අපි අපේ ප්‍රතිපත්ති මාලාව ක්‍රියාවට නැංවීම වෙනුවෙන් මැදිහත් වෙමින් ඉන්නවා.

විශේෂයෙන්ම අද මේ යෝජනාව තිබෙන්නේ, වී මිලදී ගැනීම ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025/2026 යල කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වී මෙට්‍රික් ටොන් 10,200ක් අපි මිලදී අරගෙන තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,234ක් වෙන් කරලා තිබෙනවා. ඒ, කවුරු වෙනුවෙන්ද? වී ගොවියා වෙනුවෙන්. ඒ වාගේම 2026 යල කන්නයේ වී මෙට්‍රික් ටොන් 15,885ක් කිරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,953ක් වෙන් කරලා තිබෙනවා. සම්පූර්ණයෙන් ගත්තොත් වී මෙට්‍රික් ටොන් 26,085ක් කිරලා තිබෙනවා. ඒ වාගේම රුපියල් මිලියන 3,187ක් වෙන් කරලා තිබෙනවා. ඒ, කවුරු වෙනුවෙන්ද? මේ රටේ වී ගොවියා රැකගැනීම වෙනුවෙන්.

ඒ විතරක් නොවෙයි, ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අපේ වෙළෙඳ අමාත්‍යතුමා, කෘෂිකර්ම අමාත්‍යතුමා ඇතුළු සියලුදෙනා මැදිහත් වෙලා විශේෂ සාකච්ඡාවක් පවත්වා, කුඩා හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් මේ යන්ත්‍රණයට සම්බන්ධ කරගන්නේ කොහොමද කියා සොයා බැලුවා. කුඩා හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට ඒ ක්ෂේත්‍රයට එන්න බැරිව ඉන්නේ. ඔවුන් බොහොම අමාරුවෙන් ඒ කටයුතු කරගෙන යන්නේ. ඔවුන් ණය වෙලා ඉන්නේ. හැබැයි, ණය වෙලා ඉන්න ඒ මෝල් හිමියන්ටත් පොලී රහිත ණය මුදල් ලබා දීලා, වී ටික කිරලා තමන්ගේ ව්‍යාපාර ක්‍රමානුකූලව නැවත ආරම්භ කරලා ශක්තිමත් කර ගන්න අපි අවස්ථාව සලසා දී තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 7,500ක් වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 550ක් ලබා දීලා මේ වනකොට වී මෙට්‍රික් ටොන් 3,922ක් මිලදී අරගෙන තිබෙනවා.

මෙච්චර දේවල් කරද්දි නේ, ගොවියාට මොකුත් කරලා නැහැ කියන්නේ. එතකොට කවුද දැන් පච කියලා තිබෙන්නේ? පච කියන්නේ කවුද? ඒ අය, විපක්ෂය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද යෝජනාව ඉදිරිපත් කරපු අය දැන් මේ සභාවේත් නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් විතරයි මේ සභාවේ දැන් ඉන්නේ. ඒ තත්ත්වයටයි ඔවුන් වැටිලා තිබෙන්නේ. ඇයි ඒ? බොරු - පච - කියලා මේ පුටුවල වාඩි වෙලා ඉන්න බැහැ. ඒක නිසා එළියට යනවා; දුවනවා. ඒක තමයි මේ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. වී මිලදී ගැනීමේ යන්ත්‍රණය ගැන මීට පෙර කථා කරපු බොහෝ මන්ත්‍රීවරුන් කරුණු ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අපි මේ වසර දෙක ඇතුළේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හරහා අපේ රටේ කෘෂි කර්මාන්තය කොතැනටද ගෙන යන්න උත්සාහ කරන්නේ කියන කාරණය. අපේ නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නංවන්න ඕනෑ. ආසන්න වශයෙන් මාස් කන්නයට හෙක්ටෙයාර 850,000ක්, එහෙමත් නැත්නම් අක්කර ලක්ෂ 20කට ආසන්න ප්‍රමාණයක් අපේ ගොවියෝ වගා කරනවා. අපි විශ්වාස කරනවා, දැනට අපේ රටේ වගා කරන මේ භූමි ප්‍රමාණය රටේ සහල් අවශ්‍යතාව, වී අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් කියලා. හැබැයි, ඒ වාගේම මේකෙන් ලැබෙන අතිරික්ත නිෂ්පාදනය විකල්ප නිෂ්පාදනවලට

යොමු කරන්නේ කොහොමද කියලාත් අපි සාකච්ඡා කරමින් සිටිනවා. ඒ අනුව අපි හිතනවා, ගොවියාට වැඩි ලාභයක් ලැබෙන්න නම් ප්‍රධාන වශයෙන්ම ගොවියා තමන්ගේ කුඹුරු අක්කරයෙන්, අක්කර දෙකහමාරෙන් ලබා ගන්නා අස්වැන්න වැඩි කරන්න ඕනෑ කියලා. ඒ අනුව දැන් ලබා ගන්නා වී බුසල් 70, 80 වී බුසල් 120ට, 150ට, 200ට ගෙනෙන්නේ කොහොමද කියලා අපි දැන් සැලසුම් හදලා තිබෙනවා.

අන්න, "යාය" වැඩසටහනට අදාළව නිර්ණායක 11ක් ක්‍රියාත්මක කර ගැනීම වෙනුවෙන් ආණ්ඩුවෙනුත් තවත් පහසුකම් ලබා දෙමින්, ගොවියා කුඹුරෙන් ගන්නා වී අස්වැන්න වැඩි කරන්න අපි මැදිහත් වෙමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. දැන් මේ කෑ ගහන විපක්ෂයේ මහත්වරුන් ආණ්ඩු කරපු කාලයේ ගොවියාගේ වී කිලෝවක් කීයටද ගත්තේ? 2024දී අපි බලයට එනකොට වී කිලෝවකට දීලා තිබුණු සහතික මිල කීයද? රුපියල් 105යි. වී කිලෝවක් සඳහා රුපියල් 105ට තිබුණු සහතික මිල තමයි අපි රුපියල් 120 දක්වා වැඩි කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වැඩි කරන්නේත් විද්‍යාත්මක පදනමක් ඇතුළේ. ඉතිහාසයක් පුරාවට සමස්ත ලංකා ගොවිජන සම්මේලනය හැමදාමත් අපේ රටේ ගොවියාගේ ප්‍රශ්නය නියෝජනය කළා වාගේම ඒ ගොවියාගේ ප්‍රශ්නය වෙනුවෙන් අපි පෙනී සිටිමින් ප්‍රතිපත්ති හදලා, දැන් ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඒ නිසා අපි හැමදාමත් ගොවියා වෙනුවෙන් සටනක් කළා. අපේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමන්ලා ඇතුළු රට පුරා විසිරිලා ඉන්න අපි හැමදාමත් ගොවියා වෙනුවෙන් සටනක් කළා.

ගොවියාට වී කිලෝවක් නිෂ්පාදනය කරන්න යන පිරිවැයෙන් සියයට 30ක් ලාභයක් ලෙස සහතික මිලට එකතු කරන්න ඕනෑය කියලා අපි කියා සිටියා. ඒ නිසා නිෂ්පාදන පිරිවැය රුපියල් 80 සිට රුපියල් 95, 97 දක්වා ගණන් බැලෙනකොට, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයෙන් දළ වශයෙන් මධ්‍ය අගයකට ඇවිල්ලා, අන්න රුපියල් 120ක සහතික මිලක් දීලා තිබෙනවා. ඒ රුපියල් 120ක සහතික මිල ලබා දීම නිසා දැන් වී කිලෝවක මිල රුපියල් 100ට ඉහළින් තිබෙන්නේ. සමහර තැන්වල රුපියල් 107යි, 108යි. සමහර තැන්වල රුපියල් 105යි. ඒ අනුව මේ වනකොට අපේ රටේ ගොවි ජනතාවට යම් සාධාරණයක් ඉෂ්ට වෙලා තිබෙනවා. ඒ නිසා වර්තමාන ආණ්ඩුව ඇතුළේ වසර දෙකක් තුළ වී ගොවියා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපි ප්‍රතිපත්තිමය තීරණ ගත්තා. දැන් අපි ඒවා ක්‍රියාත්මක කරමින් සිටිනවා.

මීට පෙර කථා කරලා ගිය විපක්ෂයේ මන්ත්‍රීතුමා හැමදාමත් පාරම්බෑවේ අපි ඒ කාලයේ කරපු ඒවා ගැන කියලා. අවුරුදු 76ක් ඇතුළේ කරපු දේවල්වල ප්‍රතිඵල විධියට තමයි වී අලෙවි මණ්ඩලයේ ලොරි 17ක් තිබිච්ච එක, එක ලොරියට වට්ටලා, වී ටිකක් කිරාගන්න බැරි තැනකට පත් කරලා තිබුණේ. ඒවා තමයි ක්‍රමානුකූලව අපි මේ හදමින් තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම පරිස්සමින් තමයි අපි මේ දේවල් කරන්නේ. ලෝකයේ යුද්ධයක් තිබියදීත් ගොවි ජනතාවට වැඩි වැඩියෙන් සහන දෙමින්, දැන් මේ මාස් කන්නය වනකොට අන්න වී ගොවියාට හම්බවෙන පොහොර සහනාධාරය කුඹුරුවල අතිරේක භෝග වගා කරන ගොවි ජනතාවටත් භෝග 13කට අදාළව හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් ලබා දෙන්න ඕනෑ කරන තීරණය මේ වනකොට අරගෙන තිබෙන්නේ. මේ වනකොට කැබිනට් අනුමැතියත් ඒ සඳහා හම්බවෙලා තිබෙනවා. අපි මේ සහන දෙන්නේ ගොවියාටනේ. ඒ නිසා අපි විශ්වාසයෙන් යුක්තව මේ වසර දෙක ආවා වාගේම ගොවියා ආරක්ෂා කර ගනිමින්, ගොවියා රැක ගනිමින්, අපි අරගෙන තිබෙන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කරමින්, තව වසර දෙකක් තුනක් යනකොට ගොවියාට තිබෙන මේ ප්‍රශ්න ටික විසඳීම වෙනුවෙන් අපි අඛණ්ඩව මැදිහත් වෙමින් ඉන්නවා කියන පණිවිඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.08]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு முதலில் வணக்கத்தை தெரிவித்துக்கொள்கின்றேன்.

விவசாயம் சம்பந்தமான இன்றைய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு மட்டக்களப்பு மாவட்டம் சார்பான பல விடயங்களை வெளிப்படுத்தவேண்டி இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தின் பொருளாதாரமானது, விவசாயம், கால்நடை மற்றும் மீன்பிடியிலே மிகப் பெரியளவில் தங்கியிருக்கின்றது. இம்மாவட்டத்தில் இடம்பெறுகின்ற நெல் கொள்வனவு சம்பந்தமான பல விடயங்களைச் சுட்டிக்காட்டவேண்டி இருக்கின்றது.

அறுவடை நடைபெறுகின்றபொழுது உடனே நெல் கொள்வனவைச் செய்ய முடியாத நிலைமை இருக்கின்ற காரணத்தால், மட்டக்களப்பு மாவட்ட விவசாயிகள் அதை மிகவும் குறைந்த விலைக்கு விற்று நட்டமடைய வேண்டிய நிலையில் இருக்கிறார்கள். இந்த அரசு இது தொடர்பில் பல செயற்றிட்டங்களை முன்னெடுத்தாலும், அவற்றை உரிய காலத்துக்குள் கொண்டுசெல்ல வேண்டிய பாரிய பொறுப்பும் இருக்கின்றது. பொலன்னறுவை மாவட்டத்தை அடிப் படையாகக்கொண்டு உர மானியம், நெல் கொள்வனவு போன்ற நடவடிக்கைகள் இடம்பெறுவதால், மட்டக்களப்பு மாவட்டம் மிகப் பெரியளவில் பாதிப்பை எதிர்நோக்குகின்றது. இவற்றை எதிர்காலத்தில் மாற்றியமைக்க வேண்டிய தேவை இருக்கின்றது. நெல்லுக்கு உத்தரவாத விலை நிர்ணயிக்கப் பட்டாலும், உற்பத்திச் செலவைக் கட்டுப்படுத்த முடியாத நிலைமை இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்திலுள்ள விவசாயிகள் ஆரம்பத்தில் தனியாரிடமிருந்து உரத்தைக் கொள்வனவு செய்யவேண்டி இருக்கின்றது. ஏனெனில், அவர்களுக்கு உர மானியம் உரிய காலத்தில் கிடைப்பதில்லை. அத்துடன், கூடிய விலைக்கு உரத்தை வாங்கவேண்டியும் இருக்கின்றது.

மேலும், தொழிலாளர்களுக்கான கூலி, அறுவடைச் செலவு, இயந்திரங்களுக்கான செலவு, உழவு செய்வதற்கான செலவு என எல்லாவற்றையும் பார்க்கின்றபொழுது, இப்போதைய நெல்லின் கொள்வனவு விலையைவிட உற்பத்திச் செலவு அதிகமாக இருக்கின்றது. இதனால் விவசாயிகள் பாரிய பாதிப்புகளை எதிர்நோக்கிக்கொண்டு

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

இருக்கின்றார்கள். இந்த விடயத்தில் மிகப் பொறுப்புடன் செயற்பட்டு, நெல்லுக்கான விலையை உரிய காலத்தில் நிர்ணயித்து, அவற்றை உரிய காலத்தில் கொள்வனவு செய்தால்தான், எமது மாவட்டத்திலுள்ள விவசாயிகள் நன்மை அடைய முடியும்.

அடுத்து, எமது மாவட்டத்தில் பல நெற்களஞ்சியசாலைகள் இருக்கின்றபொழுதிலும், அவை உரிய முறையில் உரிய காலத்தில் தயார்படுத்தப்படாத காரணத்தால், வேறு கட்டிடங்களைப் பெறவேண்டிய ஓர் இக்கட்டான நிலைமை ஏற்படுகின்றது. எனவே, களஞ்சியசாலைகளில் நிரம்பியிருக் கின்ற நெல்லை உரிய முறையில் பயன்படுத்தி, அடுத்த போகத்துக்காவது தயார்படுத்த வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக்கொள்கின்றேன். உண்மையிலேயே மட்டக்களப்பு மாவட்டத்தின் விவசாய நடவடிக்கைகளுக்காக வரவு செலவுத்திட்டத்தில் பாரியளவு நிதியை ஒதுக்கீடு செய்ய வேண்டிய தேவை இருக்கின்றது.

கடந்த வருடம் கிழக்கு மாகாணத்துக்கு ஒதுக்கப்பட்ட 3,616 மில்லியன் ரூபாயில் மட்டக்களப்பு மாவட்டத்தின் நீர்ப்பாசனத்துக்காக 177 மில்லியன் ரூபாய் மட்டுமே ஒதுக்கப்பட்டுள்ளது. 40 சதவீதமான நீர்ப்பாசன வசதியைக் கொண்டுள்ள மட்டக்களப்பு மாவட்டத்துக்கு, 2027ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் பாரியளவில் நிதி ஒதுக்கீட்டைச் செய்ய வேண்டுமென கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்கின்றேன். அங்கு யுத்த காலத்துக்கு முன்னர் பாரிய குளங்கள் இருந்தன. இன்று அவை தொல்பொருள் திணைக்களம், வனவளத் திணைக்களத்தின்கீழ் சிக்குண்டு இருக்கின்றன. மத்திய அரசின்கீழ், மத்திய நீர்ப்பாசனத் திணைக்களம் இருக்கின்றது. அதேபோல், விவசாயத் திணைக்களமும் இருக்கின்றது. இவற்றின் ஊடாக இக்குளங்களைப் புனரமைப்புச் செய்வதற்காகப் பாரியளவு நிதியை ஒதுக்குவதன்மூலம்தான், மட்டக்களப்பு மாவட்டத்தில் விவசாயத்துக்குத் தேவையான நீர்ப்பாசனத் திட்டங்களை முன்னெடுக்க முடியுமெனக் கூறிக்கொள்கின்றேன்.

விவசாயத்துடன் சம்பந்தப்பட்ட இன்னுமொரு விடயத்தையும் நான் இந்த இடத்தில் சொல்லவேண்டிய தேவையிருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் பெரும்போக விவசாயத்தைச் செய்யும்போது, அங்குள்ள கால்நடைகளை மேய்ச்சல் தரைக்கு அனுப்பவேண்டிய தேவையிருக்கின்றது. ஆனால், இன்று மயிலத்தமடு - மாதவனைப் பகுதியில் நிலவும் நெருக்கடியால் விவசாயிகள் தங்களுடைய கால்நடைகளை அங்கு கொண்டுசெல்ல முடியாத துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. இந்த விடயம் மாவட்ட மட்டத்தில் பல தடவை பேசப்பட்டபொழுதும், அதற்குச் சரியான தீர்வு வழங்கப்படவில்லை. 70 வருடங் களுக்கும் மேலாக விவசாயிகள் தங்களுடைய கால்நடை களுக்கான மேய்ச்சல் தரையாக அந்த இடத்தைப் பயன்படுத்தியதால்தான், மாவட்டத்தில் பாரியளவு விவசாய நிலங்களைப் பயன்படுத்த முடிந்தது. அங்கு ஏற்பட்டுள்ள நெருக்கடியானது, எதிர்காலத்தில் மிக மோசமான விளைவுகளை ஏற்படுத்தும். பலர் இந்த இனவாத நடவடிக்கைகளை முன்நின்று நடத்துகின்றார்கள். அரசாங்கம் அவற்றை அடையாளங்கண்டு, தடுத்து நிறுத்துவதன் மூலம்தான் விவசாயத்தைப் பாதுகாக்க முடிவதோடு, சமாதானமான நல்ல நடவடிக்கைகளையும் முன்கொண்டு செல்ல முடியும்.

நான் இன்னுமொரு விடயத்தையும் இங்கு சொல்லவேண்டி இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் மிகப் பெரிய விவசாய ஆராய்ச்சி நிலையமொன்று கரடியனாறில் இருந்தது. அது யுத்த காலத்தில் அரலகன்வில என்ற இடத்துக்கு மாற்றப்பட்டது. யுத்தம் மௌனிக்கப்பட்டு 17 வருடங்கள் கடந்தும்கூட அந்த விவசாய ஆராய்ச்சி நிலையமானது அபிவிருத்தி செய்யப்படாமல் இருக்கின்றது. அந்த விவசாய ஆராய்ச்சி நிலையத்தால் மேம்படுத்தப்பட்ட மிளகாய் நாற்றானது, நாடு முழுவதும் பாரிய விளைச்சலைக் கொடுக்கக்கூடியதாக இருந்தது. எனவே, அந்த விவசாய ஆராய்ச்சி நிலையத்தைக் கட்டியெழுப்புவதன்மூலம் கிழக்கு மாகாணம் உட்பட நாடு முழுவதும் விவசாயம் சார்ந்து பாரிய அபிவிருத்தியைச் செய்ய முடியும். மண் பரிசோதனை, ஆய்வுகூட பரிசோதனை போன்றவற்றைச் செய்வதன் மூலம்தான் கிழக்கு மாகாணத்தில் பாரிய விவசாய அபிவிருத்தி யைச் செய்ய முடியும். அனர்த்தங்களாலும் நெருக்கடிகளாலும் பாதிக்கப்படுகின்ற விவசாயிகளுக்கு இந்த ஆராய்ச்சி நிலையத்தினூடாக அனுபவங்களைப் பகிரவேண்டி இருக்கின்றது.

விதை நெல் கொள்வனவை உரிய காலத்தில் ஆரம்பித்தல், உரத்தை உரிய காலத்தில் கொடுத்தல் போன்றவற்றை அரசாங்கம் மேற்கொள்ள வேண்டும். அரசாங்கமானது உரத்தைக் கொடுத்துக்கொண்டு இருக்கின்றது. ஆனால், மட்டக்களப்பு மாவட்டத்துக்கு அது காலம் பிந்தியே கிடைக்கின்றது. இதனால் விவசாயிகள் நெருக்கடியை எதிர்கொள்கின்றார்கள். மாண்புமிகு சனாதிபதி அவர்கள் உறுதியளித்ததன்படி, மயிலத்தமடு-மாதவனை பிரதேசத்தை மேய்ச்சல் தரையாகப் பிரகடனப்படுத்தினால்தான் கால்நடைகளை அந்தப் பிரதேசத்துக்குக் கொண்டுசென்று, விவசாயிகள் பெரும்போகத்தை மிகப் பாதுகாப்பாகச் செய்ய முடியும்.

பாரிய திட்டமாக இருக்கின்ற முந்தனை ஆறு திட்டமானது, பல ஆண்டுகளாக காலதாமதமாகி வருகின்றது. அந்தத் திட்டத்தை மேற்கொள்வதன்மூலம் மட்டக்களப்பு மாவட் டத்தில் 25,000 ஏக்கர் காணியில் பயிர்ச்செய்கை மேற்கொள்ள முடியும். அது நாட்டுக்கு மிகப் பெரிய உற்பத்தியைக் கொண்டுவரும். அதனை மிகச் சிறந்த முறையில் செய்வதற்கு, இப்போது கரடியனாறில் இருக்கின்ற விவசாய ஆராய்ச்சி நிலையத்தை மிக விரைவாகக் கட்டியெழுப்ப வேண்டும். அதற்காக 2027ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீட்டைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கிழக்கு மாகாணத்தின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு, குறிப்பாக எங்களுடைய மாவட்டத்தின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு அங்கு பாரியள விலான தொழிற் சாலைகள் இல்லை. நாம் பிரதானமாக நம்பியிருப்பது விவசாயப் பொருளாதாரத்தையே ஆகும். விவசாயப் பொருளாதாரமானது அனர்த்தங்களால் பாதிக் கப்படும் பொழுது மக்கள் பாரிய நெருக்கடிகளை எதிர்கொள்வார்கள்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Sir, please give me one more minute.

எனவே, நாட்டின் பொருளாதாரத்தை வலுப்படுத்த வேண்டும் என்ற சிந்தனையின் அடிப்படையில், கிழக்கு மாகாணத்தில் விவசாயத்தை வலுப்படுத்துவதற்கு எல்லா வகையிலும் ஒத்துழைக்க வேண்டுமெனவும், உங்களுடைய பாரிய பங்களிப்பைச் செய்ய வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். மயிலத்தமடு பிரச்சினையில் இனவாத செயற்பாட்டாளர்களைப் புறந்தள்ளி, சுமுகமான நிலையை ஏற்படுத்தித் தருமாறு கேட்டுக் கொள்கின்றேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් විවාදයක් සිද්ධ වන අද දවසේ ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරද්දී අඩුම තරමින් මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමිය හරි, ස්ථිර කරපු මන්ත්‍රීතුමා හරි - කවුරු හරි - විපක්ෂය පැත්තේ ඉඳීවි කියලා මම හිතුවා. අපේ මන්ත්‍රීවරු කිව්වා වාගේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගොඩක් අසත්‍ය කාරණා කියලා ඉක්මනට මේ සභාවෙන් පිට වෙලා යනවා.

මම මේ පාර්ලිමේන්තුවේදී අද දවසේ දැක්ක තවත් විශේෂ කරුණක් තිබෙනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වන අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමාත් අද කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල සම්ප්‍රදායක් තමයි, පැහිච්ච අඹ ටික ඉදවා ගන්න ඉදුණු අඹ ගෙඩියක් තියා ගන්න එක. මොකද, පැහිච්ච අඹ ගෙඩි ගොඩේ ඉදුණු අඹ ගෙඩියක් තිබ්බාම ඒ අඹ ටික ඉදෙනවා.

ඒ වාගේම කථාවක් තිබෙනවා, බොරු කියන මිනිස්සු එක්ක හිටියාම තමනුත් බොරුකාරයෙක් වෙනවා කියලා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් වගකීමක් ඇතිව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස කටයුතු කරනවා. නමුත් එතුමාගේ දෙපැත්තේ ඉන්නේ පට්ටපල් බොරු කියන අය. එක්කෙනෙක් විපක්ෂ නායකතුමා, අනෙක් කෙනා සජබ මහ ලේකම්. ඒ දෙදෙනා එකිනෙකාට දෙවැනි වෙන්නේ නැතිව බොරු කියනවා. ඒ දෙදෙනා මැද ඉන්න ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් අද බොරු ගොඩක් කියලා ගියා. එතුමා බොරු කියන දෙදෙනෙක් ළඟ වාඩි වෙලා ඉන්නවා. ඒ නිසා එතුමාත් බොරුකාරයෙක් බවට පත් වෙලා තිබෙනවා.

අද මේ විවාදය සම්බන්ධයෙන් කථා කරනවාට වඩා තව බොහෝ දේවල් විපක්ෂය පැත්තෙන් කියන්න උත්සාහ කළා. විශේෂයෙන්ම "රටට සුබද?" කියලා අහන්න පටන් ගත්තා. අපිට අහන්න තිබෙන්නේ, "ඇයි, රටට සුබ නැද්ද?" කියායි. හැබැයි, දැන් ඒගොල්ලන්ට අසුබ වෙලා තිබෙන්නේ. මෙච්චර කල් හොරකම් කරලා, වංචා කරලා, කට්ටි පැන පැන හිටපු අයව දැන් උසාවිවලට කැඳවනවා. දැන් නඩු අහන්න පටන්ගෙන තිබෙනවා. එතකොට හයයි. ජාවාරම් කරපු අයට දැන් ජාවාරම් කරන්න බැහැ. ධීවර සංස්ථාව තමන්ගේ කියලා හිතාගෙන වැඩ කරපු සමහර අයට දැන් ඒවා කරන්න බැහැ. ඒ නිසා රටට සුබයි. රටේ ජනතාව ඒ සුබ නිමිත්ත දකිමින් ඉන්නවා. ගොවි ජනතාව පිළිබඳව සාකච්ඡා කරන මේ විවාදයේදී විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් කථා කළ යුතු කරුණු ප්‍රමාණයක් කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා වාගේම අනික් ඇමතිවරුත්, මන්ත්‍රීවරුත් කිව්වා. ඒ වාගේම මේ අස්සේ side shots ගහමින් යන අයත් හිටියා. අහු වෙන වෙලාවේ හැම තැනටම ගහන්න එපායැ. අපේ සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමාත් යම් කාරණයක් දැන් කිව්වා.

අනුරාධපුරයේ ඉන්න අපේම මන්ත්‍රීවරයෙක් කිව්වා, සවි කරපු එක dryer එකක්වත් දැක්කේ නැහැ කියලා. එතුමා අනුරාධපුරයේ නැතිව ඇති, මට හිතෙන විදියට. මොකද, එතුමා ඉන්න කලාවැව ආසනයේ, තලාවේ ජය ගහට එහා පැත්තේ තිබෙන වී අලෙවි මණ්ඩලයේ ගබඩාවේ මෙට්‍රික් ටොන් 20ක් වී වේළන්න පුළුවන් dryer එකක් සවි කරලා තිබෙනවා. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ආධාර හැටියට දීපු dryer එකක් පදවිය සමුපකාරයේත් සවි කරලා තිබෙනවා. ඒ විදියට dryers ගණනාවක් පසුගිය අවුරුද්දේ සවි කළා. ඒ විතරක් නොවෙයි, අපි 2026 අවුරුද්දට විතරක් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා සමුපකාර 50කට dryers ලබා දෙන්න. දවසකට ටොන් 20ක් - කිලෝ 20,000ක් - ඒ කියන්නේ සාමාන්‍යයෙන් දවසකට ගොවියෝ පස් දෙනෙකුගේ වී වේළන්න පුළුවන් dryers 50ක් ලබා දීම සඳහා අදාළ ටෙන්ඩර් කටයුතු මේ වනකොට අවසන් කරලා තිබෙනවා. සැපයුම්කරු ඒවා සැපයුවාට පසුව නොවැම්බර් මාසයේ 15වැනි දාට කලින් ඒවා සමුපකාරවල අපි ස්ථානගත කරනවා. ඒ අනුව රුපියල් මිලියන 500ක වටිනාකමකින් යුක්ත dryers අපි සමුපකාරවල සවි කරනවා. ඊට අමතරව වී අලෙවි මණ්ඩලය හරහා මේ ආධාර ලබා දෙනවා. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබා දෙනවා. ගොවියා වෙනුවෙන් තමයි මේ වැඩ ඔක්කෝම අපි කරන්නේ. ඒ නිසා මේවා දැක්කත් නොදැක්කා වාගේ ඉන්න පුරුදු වෙච්ච විපක්ෂයක් තමයි අද අපට ඉන්නේ.

විපක්ෂයේ තවත් මන්ත්‍රීවරයෙක් කිව්වා, සින්දු කියන්න දෙන්නෙත් නැහැ නේ, මාර වැඩේ, සින්දුවක්වත් කියන්න බැහැ, මෙහෙමයි කියලා. පට්ටපල් බොරු කියනවා. ඒගොල්ලන් හිතනවා, පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා බොරු කිව්වාම ඒවා සමාජ මාධ්‍යවල පළ වනවා, ඒක තමයි ආතල් එක කියලා. සින්දුවක් කියන්න බැහැ කියලා අපි කොහේවත් කියලා නැහැ. වෙඩින් එකකදී සින්දුවක් දැම්මාම බිල ගෙවන්න කියලා කියපු තැනක් තිබෙනවා නම් අපට කියන්න. එහෙම කියන්නේ නැහැ. මොකද, එහෙම කියන්න බැහැ. එහෙම නීතියක් කොහේවත් නැහැ.

2003දී බුද්ධිමය දේපළ පනත සම්මත කළා. හොඳම hearing එකක්, පාර්ශ්වකරුවන්ගේ දායකත්වයක් නැතිව තමයි මේ පනත හදිසියේ යූඑන්පී ආණ්ඩුව හැදුවේ. ඒ පනතට අනුව බුද්ධිමය දේපළ හිමිකරුවාට තමන්ගේ දේපළ භාවිත කරන එකට, එහෙම නැත්නම් copyright එකට බුද්ධිමය දේපළ හිමිකම අයකර ගැනීම සඳහා වූ ක්‍රියාවලියකට ඉඩ දීලා තිබෙනවා. ඒක සින්දුව කියන කෙනාද, ලියන කෙනාද කියලා නැහැ. ඒ විතරක් නොවෙයි, ඕනෑම කෙනෙකුට නව සොයා ගැනීමක් ලියාපදිංචි කරලා අයිතිය තහවුරු කර ගන්න පුළුවන්. ඒක පාවිච්චි කරනවා නම් ඒ වෙනුවෙන් මුදල් ගෙවන්න ඕනෑ. ඒක හරි. එතකොට මේ බුද්ධිමය දේපළ පනත යටතේ ගීත රචකයින්ට, සංගීතඥයින්ට තමන්ගේ බුද්ධිමය දේපළ හිමිකම වෙනුවෙන් අය කිරීමක් කරන්න අයිතිය තිබෙනවා කියන එක පිළිගෙන තිබෙනවා. හැබැයි, එහෙම තිබුණා කියලා ඒ අයට කවුරුවත් කොහේදීවත් කියලා නැහැ, සින්දුවක් කියන හැම තැනකින්ම, රේඩියෝ එකේ සින්දුවක් දැම්මාම, බස් එකේ සින්දුවක් දැම්මාම මුදල් අය

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කරන්න කියලා. හැබැයි, TV station එකක් කියන්නේ ව්‍යාපාර කරන තැනක්. ඒ වාගේම radio station එකක් කියන්නෙත් ව්‍යාපාරයක් කරන තැනක්. එතැන වෙළෙඳ දැන්වීම් භාර ගන්නවා, සින්දු ප්‍රචාරය කරන්න දෙනවා. එතකොට ඒවායෙන් මුදලක් අයකර ගන්න ඔහුට අයිතියක් තිබෙනවා. ඒ වාගේම ගීතයේ අයිතිය තිබෙන්නේ කාටද කියලා මේ වනවිට සාකච්ඡාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගීතයේ අයිතිය පිළිබඳව සාකච්ඡා කිරීමටත් විශේෂ කමිටුවක් පත් කරලා තිබෙනවා. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ තිබෙනවා, expertsලාගේ council එකක්. ඒ අය හරහා, මේකට මොකක්ද කරන්නේ කියලා අපි දැන් හොයනවා. ඒ නිසා ප්‍රශ්නය ඉවර නැහැ. ඒ අස්සේ ගීත රචකයින් සහ සංගීතඥයින් එකතු වෙලා හදා ගත්ත සංගමයක් තිබෙනවා. ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඒ අයට අයිතියක් තිබෙනවා. සමාජයේ ඉන්න ඕනෑම කෙනෙකුට තමන්ගේම සංගමයක්, සංවිධානයක් පිහිටුවා ගන්න අයිතියක් තිබෙන බව අපි කවුරුත් පිළිගන්නවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමුපකාරයක් පිහිටුවන්න පුළුවන්, සමාගමක් පිහිටුවන්න පුළුවන්, සමිතියක් පිහිටුවන්න පුළුවන්, වෘත්තීය සමිතියක් පිහිටුවන්න පුළුවන්. ඒ විධියේ දේවල් තිබෙනවා. ඒගොල්ලෝ association එකක් පිහිටුවලා තිබෙනවා, ඒගොල්ලෝ කියනවා, එම association එකේ සාමාජිකයන්ගේ බුද්ධිමය දේපළ පාවිච්චි කරන අය ඒ වෙනුවෙන් ගෙවීමක් කළ යුතුයි කියලා. ගැසට් පත්‍රයක් නිකුත් කළා කියලා තමයි මෙතැනදී ප්‍රශ්නය මතු වුණේ. මේ අය පට්ටපල් බොරු කියනවා කියන්නේ මෙන්න මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රජයේ ගැසට් පත්‍රවල රජයේ නොවන නිවේදන පළ කරනවා. මේවා අද ඊයේ පටන් ගත්ත දේවල් නොවෙයි. 2026.06.05 දිනැති රජයේ ගැසට් පත්‍රය දැන් මගේ ළඟ තිබෙනවා. මෙහි "රජයේ නොවන නිවේදන" කියලා කොටසක් තිබෙනවා. ඒ අනුව, රජයේ නොවන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා. ඕනෑම කෙනෙකුට තමන්ගේ ඉඩමක් විකිණීමට අවශ්‍ය නම්, ඒ පිළිබඳවත් මේකේ දැන්වීමක් පළ කරන්න පුළුවන්. තමන්ගේ නම වෙනස් කිරීමක් තිබෙනවා නම්, ඒ පිළිබඳවත් මේකේ දැන්වීමක් පළ කරන්න පුළුවන්. ඒ කියන්නේ, ගැසට් එකට අදාළ ගාස්තුව ගෙවලා තමන්ගේ නිවේදනය පළ කරන්න පුළුවන්. මේක තමයි ඉස්සර ආණ්ඩුවේ පත්තරේ. මේක තමයි මිනිස්සුන්ට තොරතුරු දැනගැනීමට තිබුණු තැන. එතකොට, ඒකේ දාලා තිබෙනවා තමන්ගේ සංගමයේ සාමාජිකයන්ගේ බුද්ධිමය දේපළක් භාවිත කරනවා නම් ගාස්තුවක් ගෙවන්න ඕනෑ කියලා. හැබැයි, ඒගොල්ලනුත් ඕනෑ නැති වැඩක් කරලා තිබුණා. මොකද, වැසිකිළියක සින්දු දැම්මත්, කඩ සාප්පුවක සින්දු දැම්මත්, මඟුල් ගෙදරක සින්දු දැම්මත් මෙච්චර මෙච්චර ගණන් අය කරන්න ඕනෑ කියලා ඒගොල්ලන් ගණන් නියම කරලා තිබුණා. එහෙම කරන්න අයිතියක් ඒගොල්ලන්ට නැහැ.

අපට මේ සම්බන්ධව පැමිණිල්ලක් ආවා. බුද්ධිමය දේපළ කාර්යාංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරිය ඒගොල්ලන්ව ගෙන්නුවා. ගෙන්වලා කිව්වා, ඔයගොල්ලන්ට එහෙම අය කිරීම් කරන්න බැහැ කියලා. දැනට මේ සම්බන්ධව ඇති වෙලා තිබෙන ප්‍රශ්නය විසඳන්න ඕනෑ නිසා අපි එහෙම කියලා තිබෙනවා. මේක කිසිසේත් රජයේ නිවේදනයක් නොවෙයි. ඒ වාගේම බුද්ධිමය දේපළ හිමිකම අය කරගන්න පුළුවන් තමන්ගේ දෙයකට විතරයි, අනුන්ගේ දෙයකට අය කරගන්න බැහැ. හැබැයි, සංගීත සන්දර්ශනයක් පවත්වන කෙනෙක් හෝ TV එකක, රේඩියෝ එකක ඒ සින්දුවක් යන වෙලාවට තමන්ට ගෙව්වේ නැත්නම්, අන්න හිමිකරුවන්ට පුළුවන් නීතිය ඉස්සරහට ගිහිල්ලා මේක අය කරගන්න. එහෙම නැතිව මඟුල් ගෙදරක් පවත්වන්න යනකොට මේ බිල අරන් වරෙන් කියලා කියන්න කොහෙවත් නීතියක් නැහැ. ඒවා පට්ටපල් බොරු. මේ ආණ්ඩුව එහෙම කරනවා කියලා කියන්න විපක්ෂය උත්සාහ කරනවා. විපක්ෂය දැන් බොරු කීම පුරුද්දක් කරගෙන තිබෙන්නේ. බොරුවෙන්ම විතරයි ජීවත් වෙන්න හදන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන මම විශේෂයෙන් කිව්වේ, මේ අය මේ දේවල් මෙතැන කියලා යන නිසායි. අපේ විපක්ෂ නායකතුමාත් මේ ගැන කියලා ගියා. ප්‍රශ්නය තිබෙන්නේ මේගොල්ලන් ඔක්කොම කියලා යනවා නේ, ඉන්නේ නැහැ. මොකද, මේගොල්ලන් හිටියොත්, මේගොල්ලන්ට ප්‍රශ්නයක් වෙනවා.

තෙල් ගැන, පොහොර ගැන විතරක් නොවෙයි, සහල් ආනයනය ගැනත් කිව්වා. මම දැක්කා, ඉස්සරවෙලාත් මන්ත්‍රීවරයෙක් කිව්වා, "අපි සහල් ගෙනාවේ නැහැ" කියලා. අපේ රටට සහල් ආනයනය කිරීම පිළිබඳව දැනට සතියකට කලින් මම මේ පාර්ලිමේන්තුවේදී උත්තරයක් ලබා දුන්නා. අපේ රටේ සහල් නිෂ්පාදනය වැඩිවෙලා තිබෙන ආකාරයත්, සහල් ආනයනය පිළිබඳවත් ඒ අවස්ථාවේදී පැහැදිලි කළා. මම අදත් කියනවා මේක. 2015 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 286,000ක් ආනයනය කර තිබෙනවා. මොකක්ද, එතකොට තිබුණු ආණ්ඩුව? UNP ආණ්ඩුව; නැත්නම් සමගි ජන බලවේගයත් එක්ක හදපු ආණ්ඩුව. 2016 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 30යි. 2017 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 748,000යි. යහපාලන ආණ්ඩුව සහල් මෙට්‍රික් ටොන් 748,000ක් ආනයනය කර තිබෙනවා. මේ යෝජනාව ගෙනාපු කට්ටිය ගිහිල්ලා නේ. කෝ, මේවා අහන්න කවුරුත් මේ සභාවේ නැහැ. නමුත්, මම මේක කියන්න ඕනෑ.

2018 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 249,000යි; 2019 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 24යි; 2020 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 16යි; ආපසු 2021 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 147,000යි. අන්න, අර කාබනික පොහොර ප්‍රශ්නයත් එක්ක, රටේ වී නිෂ්පාදනය අඩුවීමත් එක්ක නැවත 2022 වර්ෂයේ සහල් මෙට්‍රික් ටොන් 783,000ක් ආනයනය කර තිබෙනවා. මෙහෙම වෙනවා. මේක වෙන්නේ නිකම් නොවෙයි. මේ කාල වකවානු තුළ මේගොල්ලන් සහල් ගෙන්නුවා. ඇයි ගෙන්නුවේ? රටේ වී නිෂ්පාදනය අඩුවෙලා තිබුණා. එහෙම නැත්නම් රට ඇතුළේ වී නිෂ්පාදනය අඩුවීම තුළ සහල් වෙළෙඳ පොළේ ප්‍රශ්නයක් ආවා. අපි ආණ්ඩුව භාර ගත්තේ 2024 නොවැම්බර් මාසයේ. ජනාධිපතිතුමා පත් වුණේ 2024 සැප්තැම්බර් මාසයේ. ඒ කාලයේ සහල්වල ප්‍රශ්නයක් තිබුණා. වෙළෙඳ පොළේ සහල් තිබුණේ නැහැ. රතු සහල් කිලෝවක මිල රුපියල් 300ට ගියා. ඒත් සහල් තිබුණේ නැහැ. ආනයනය කරන්නවත් රතු සහල් නැහැ. මොකද, රතු සහල් තිබෙන්නේ අපේ රටේ තමයි. ලෝකයේ අනෙක් රටවල රතු සහල් නැහැ. ඒ අවස්ථාවේ නාඩු සහල් කිලෝවක මිල රුපියල් 270ට, 280ට ගියා. වෙළෙඳ පොළේ සහල් පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. රුපියල් 210ට සහල් තිබුණේ. අන්තිමට රුපියල් 210ට නොවෙයි, 290ටත් ගන්න සහල් නැති වුණා. අපි පිට රටින් සහල් ගෙන්නුවා. අපි 2025 අවුරුද්දේ සහල් මෙට්‍රික් ටොන් 184,000ක් ගෙන්නුවා. මේ අවුරුද්දේ සහල් මෙට්‍රික් ටොන් 169,000ක් ගෙන්වලා තිබෙනවා. ඒ සහල් මෙට්‍රික් ටොන් 169,000 ගෙන්වන්න වුණේ ඇයි?

2025, 2026 වර්ෂ දෙකේ අපේ රටේ වී නිෂ්පාදනය ගත්තොත්, විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ලංකා ඉතිහාසය තුළ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ලක්ෂ 50ක් - මිලියන 5ක් - ඉක්මවූ අවස්ථා තිබෙන්නේ තුනයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ මිලියන 5 ඉක්මවූ අවස්ථා තුනෙන් දෙකක් ගැන අපි ඉතාම වුවමනාවෙන් කියන්න ඕනෑ. 2025 වර්ෂයේ වී මෙට්‍රික් ටොන් මිලියන 5.05යි. 2026 වර්ෂයේ වී මෙට්‍රික් ටොන් මිලියන 5.293යි. ඒ කියන්නේ, මේ අවුරුදු දෙක තුළ මහ කන්නයේ හෙක්ටෙයාර ලක්ෂ 8ක්, යල කන්නයේ හෙක්ටෙයාර ලක්ෂ 5ක්

වශයෙන් හෙක්ටෙයාර ලක්ෂ 13ක් අපි වගා කළා. හැබැයි, මේ වගා කරපු එක ඇතුළේ අපට ප්‍රශ්නයක් තිබුණා. ඒ මොකක්ද? රතු සහ සුදු නාඩු තමයි වැඩිපුර වගා කළේ. සියයට 85ක් වී අස්වැන්න ආවේ එතැනින්. හැබැයි, කීරි සම්බා සහ සම්බාවලට ඉල්ලුමක් තිබුණා. විශේෂයෙන් මධ්‍යම පාන්තිකයන්ගේ ආදායම වැඩිවෙලා තිබුණා. ජනතා පරිභෝජනයේ වෙනස්කම් තිබෙනවා. ඒකත් එක්ක හෝටල්වලට, සංචාරක ව්‍යාපාරයට කීරි සම්බා පාවිච්චි කළා. ඒ පාවිච්චි කිරීමත් එක්ක, කීරි සම්බා ඉල්ලුම වැඩි වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලොකු සහල් මෝල් ටික රුපියල් 400ටත් කීරි සම්බා විකුණන්න පටන්ගත්තා. අපට කිව්වා, මේ කීරි සම්බා ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කියලා. ඔන්න, එතකොට අපි ගොවියාගේ ප්‍රශ්නයට උත්තරයක් දීලා තිබෙනවා. ඒ මොකක්ද? ගොවියාට වී කිලෝවකට cost එක කීයද කිව්වොත්, උපරිම යන්නේ රුපියල් 75යි, 85යි, 95යි අතර. ඒකට සියයට 30ක් එකතු කළා. අපේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා, සුසන්ත මන්ත්‍රීතුමා, සරත් නියෝජ්‍ය ඇමතිතුමා, ලාල් කාන්ත ඇමතිතුමා ඇතුළු අපි පහුගිය කාලයේ ගොවි සංගම් එක්ක කථා කරලා කිව්වා, අඩුම ගණනේ සියයට 30ක කොටසක් ගොවියාට එකතු වෙන්න ඕනෑ කියලා. මාස හතරක පහක ගොවියාගේ වියදම. ඒ නිසා තමයි ඒකට සියයට 30ක්, 35ක් තියලා නාඩු රුපියල් 120යි, සම්බා රුපියල් 130යි, කීරි සම්බා රුපියල් 140යි කළේ. හැබැයි, වී අස්වැන්න, 2025 අවුරුද්දේ කීරි සම්බා අස්වැන්න සියයට හයයි; සම්බා අස්වැන්න සියයට පහමාරයි. 2026 මහ කන්නයේ සියයට හතයි අපට ලැබුණේ. මොකද, මහ කන්නයේ අස්වැන්නට damage එකක් වුණා, "දිට්වා" ව්‍යසනය නිසා. යල් කන්නයේ අපි සියයට 12ක කීරි සම්බා අස්වැන්නක් ගත්තා. අපි වැව්වා. නමුත් කීරි සම්බා ඉල්ලුම සියයට 20යි. ඒ නිසා කීරි සම්බා ආදේශකයක් විධියට අපට ගෙනෙන්න වුණා, කීරි පොන්නි කියන සහල් වර්ගය. අපි ආනයනය කළේ ඒ සහල් වර්ගය. කීරි පොන්නි සහ GR 11 යන සහල් වර්ග - සම්බා සහ කීරි සම්බාවලට ආදේශක - විතරයි ආනයනය කළේ. අන්න අද market එකේ රුපියල් 350ට, 400ට තිබ්බ කීරි සම්බා වෙනුවට සතොසටත් දැන් එනවා, රුපියල් 238ට කීරි සම්බා. සම්බා, නාඩු, රතු නාඩු, කැකුළු පාලන මිලට අඩුවෙන් අපට රටේ තිබෙනවා. නාඩු සහල් පාලන මිලට අඩුවෙන් රටේ තිබෙන්න එක හේතුවක් තිබෙනවා; සහල්වල අස්වැන්න වැඩියි. ඒ නිසා අපි රජයක් හැටියට තීරණය කළා, සහල්වලින් කරන අනෙකුත් නිෂ්පාදනවලටත් සහල් පාවිච්චි කරන්න ඉඩ දෙන්න. 2003දී නිකුත් කළ ගැසට් නිවේදනයක් තිබුණා, වෙනත් දේවල්වලට සහල් ගන්න බැහැ කියලා. අපි ඒ ගැසට් නිවේදනයත් අයින් කරලා කිව්වා, අනෙකුත් කර්මාන්ත සඳහා සහල් අවශ්‍යතාව තිබෙනවා නම්, පාවිච්චි කරන්න දෙන්න කියලා.

ඉතින් මේවා නිකම් අවශ්‍යතාව, එහෙම නැත්නම් ඒ වෙලාවේ තිබෙන තත්ත්වය බලලා කරපුවා නොවෙයි. එක පැත්තකින් පොහොර සහනාධාරය රුපියල් 15,000 ඉඳලා රුපියල් 30,000 දක්වා වැඩි කළා. පළමුවැනි අවුරුද්දේ රුපියල් 25,000ක් කළා. නැවත රුපියල් 5,000ක් මේ අවුරුද්දේ වැඩි කළා; රුපියල් 30,000ක් දක්වා වැඩි කළා. ඒ විතරක් නොවෙයි. පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේදී අපි තීරණයක් ගත්තා, මහ කන්නයේදී කුඹුරුවල වෙනත් භෝග වවනවා නම් ඒ අයටත් පොහොර සහනාධාරය දෙන්න. මීට කලින් තිබුණේ රුපියල් 18,000යි. අපි ඒ රුපියල් 18,000 රුපියල් 30,000ක් කරලා පොහොර සහනාධාරය දෙන්න තීරණයක් ගත්තා. නමුත් මේ කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරු, හරියට නිකම් අහස කඩා වැටුණා වාගේ කථා කරන කට්ටිය. මේ යෝජනාව ගෙනාපු කට්ටිය අඩුම ගණනේ එක සත පහක් දුන්නාද, කුඹුරුවල අනෙකුත් භෝග වගා කරන අයට? නැහැ, දුන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කන්නයට විතරක් නොවෙයි, ලබන යල කන්නයටත් ඒ විධියට වෙනත් භෝග වවනවා නම් ඒවාටත් පොහොර සහනාධාරය දෙන්න අපි තීරණය කරලායි තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. දැන් අල, ලූනු ගැන කිව්වා. මේ සමහර අය හිතාගෙන ඉන්නවා, "ඩෝං" ගාලා එක පාරට වැටෙනකොට අපට ගිහිල්ලා අල්ලා ගන්න පුළුවන් කියලා. අපි මාර්තු මාසයේ අල මිලදී ගන්න පටන් ගත්තා. රුපියල් 190ට තිබ්බ අල කිලෝව රුපියල් 260ට, 270ට ගියා. අල මාර්කට් එකට එනකොට අපි කිව්වා, right, ඔයගොල්ලන් අල ගන්න කියලා. ගොවියාට හොඳ මිලක් ලැබුණා. පහුගිය සැප්තැම්බර් මාසයේ 28වැනි දාත් දඹුල්ල මාර්කට් එකේ රුපියල් 370යි අල කිලෝව. අද වැලිමඩින් ගෙනෙන අල කිලෝව රුපියල් 180යි, 190යි, 200යි. නුවරඑළියේ අල කිලෝව රුපියල් 270යි, 280යි, 290යි. ඊළඟට ලූනු? අදත්, මේ මහ කන්නය පටන් ගන්නකොටත් ලූනු මිල පටන් ගත්තේ රුපියල් 250න්; රුපියල් 270ට යනකල් ගියා. වැස්සත් එක්ක ලූනු ගලවන එක ටිකක් වැඩි වුණා. අදත් ලූනු මිල රුපියල් 190යි, රුපියල් 180යි; රුපියල් 170ටත් ලූනු තිබෙනවා.

ඉන්දියාවෙන් ගෙනෙන ලූනුවලට ගහලා තිබෙනවා, රුපියල් 50ක බද්දක්. ගිය පාර ගහපු බද්දමයි; අඩු කළේ නැහැ. අදත් දඹුල්ලේ රුපියල් 270යි, ඉන්දියාවේ ලූනු. අපේ ලූනු තිබෙනවා, රුපියල් 200ට. ගිය කන්නයේ, ගිය අවුරුද්දේ සැප්තැම්බර්වල අපි ලූනු කිලෝව ගත්තේ රුපියල් 140ට. රජය තීරණය කරලා, රුපියල් 140ට ලූනු කිලෝව ගත්තේ. හැබැයි, දැන් රුපියල් 190ටත් ලූනු විකිණෙනවා. අල සම්බන්ධයෙන් බැලුවොත්, රුපියල් 270ට, රුපියල් 280ට, රුපියල් 290ට නුවරඑළියේ අල විකිණෙනවා. වැලිමඩ අල එනකොට යම් ප්‍රමාණයකට තේරිච්ච ඒවාත් එනවා කියලා අපට කිව්වා. නමුත් ඒ ගොවියාටත් රුපියල් 220කවත් මිලක් තිබෙනවා නම්, මේ ප්‍රශ්නය ඉවර වෙනවා. සැප්තැම්බර් 28වැනිදාත් අල තිබුණා, රුපියල් 300ට උඩින්. සතියක් ඇතුළත මිල වෙනස් වෙලා තිබෙනවා. Cabinet Paper එක මම අත්සන් කරලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. අලයි, ලූනුයි දෙකම මිලදී ගැනීමේ මධ්‍යස්ථාන සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවෙන් පටන් අරගෙන, ගොවියාගේ අලයි, ලූනුයි අපි මිලදීගෙන, සතොස හරහා, සමුපකාර හරහා විකුණන වැඩේ අපි කරලා, ගොවියාගේ මිල ස්ථාවර කරන කටයුත්ත කරනවා. නමුත් විපක්ෂය මේ කියන්නේ, එනකොටම අල්ලා ගන්න ඉන්න ඕනෑ කියලා. නැහැ. පාරිභෝගිකයාටත්, ගොවියාටත් හොඳ මිලක් හම්බ වෙනවා, මේ කටයුතු දෙකම සිදු කරද්දී.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ නිසා මේ කටයුතු දෙකම එකට සිද්ධ කරන වැඩේ තමයි අපි කරන්නේ. ගොවියාගේ අලවලට මිලක් තිබුණා. ඒක වැටෙනකොට අපි මිලදී ගන්න ලැහැස්ති කරනවා. ලූනුවලට මිලක් තිබුණා. යම් ප්‍රමාණයකට පහළට එනවා නම්, අපි ඒක නවත්වන්න ලූනු මිලදී ගන්න වැඩේ කරනවා. වී මිලදී ගැනීම කළා. මේ කන්නයේ, මේ අවුරුද්දේ විතරක් - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණ කියලා මම කථාව අවසන් කරනවා- මහ කන්නයේ රුපියල් මිලියන 11,000ක වී මිලදී ගත්තා. යල් කන්නයේ වී අලෙවි මණ්ඩලය රුපියල් මිලියන 8,500ක වී මිලදී ගත්තා. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට - මේගොල්ලන් කවදාවත් ඒ මිනිසුන්ට නැඟිටින්න එක රුපියලක් දීලා නැහැ - මාස 8ක්, පොලී නැතුව රජයේ මුදල්වලට වී ගන්න කියලා, - මෙට්‍රික් ටොන් 40,000කට ආසන්න ප්‍රමාණයක් ඒ අය වී අරගෙන

[ගරු වසන්ත සමරසිංහ මහතා]

තිබෙනවා - රුපියල් මිලියන 5,000ක් දුන්නා. ඒ කියන්නේ, මේ අවුරුද්දේ රජය වී මිල දී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයට විතරක් රුපියල් මිලියන 18,500ක් දීලා තිබෙනවා; ඊට අමතරව සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට රුපියල් මිලියන 5,000ක් දීලා තිබෙනවා. මේකට අමතරව, pledge loans යටතේ සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට රුපියල් මිලියන 7,000ක් ලබා දෙනවා. ඒ අයටත් සියයට 4ක පොලී සහනයක් ආණ්ඩුව ලබා දෙනවා. ඒ පොලී සහනය ආණ්ඩුව බැංකුවලට ගෙවනවා. එහෙම කරලා ගොවියාගේ වී මිල ස්ථාවර කරන්න රජය හැටියට ගන්න තිබෙන සියලු ක්‍රියාමාර්ග අපි ගන්නවා. නමුත්, තෙත වී ටික කුඹුරේ ඉඳන් මෝලට අරගෙන යන වැඩ පිළිවෙළක් නැති ප්‍රශ්නයට තමයි ගොවියා මුහුණ දී තිබෙන්නේ. ඒ නිසා ඒ තෙත වී ටික කුඹුරේ ඉඳන් මෝලට ගෙන යන වැඩ පිළිවෙළක් හදන්න අපි මේ වනකොට ආයෝජකයෙකු සම්බන්ධ කරගෙන යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා.

අනුරාධපුරයේ මිහින්තලේත්, අම්පාරේත් එක කන්නයකට මෙට්‍රික් ටොන් 150,000ක් ගන්න පුළුවන් දැවැන්ත වී මෝල් දෙකක් සූදානම් කරමින් තිබෙනවා. ඒ ආයෝජකයාට අවශ්‍ය ඉඩම් සඳහා දැන් අනුමැතිය දීලායි තිබෙන්නේ. ඒ අනුව, එක කන්නයකට මෙට්‍රික් ටොන් 150,000ක් ගත්තොත්, ඒ වී මෝල් දෙකට විතරක් රටේ වී නිෂ්පාදනයෙන් සියයට 15කට ආසන්න ප්‍රමාණයක් ගන්න පුළුවන්. අන්න එහෙම ගන්න පුළුවන් වන වෙලාවට සමුපකාර, ගොවි සංගම් ඇතුළු ඒ සියලුදෙනාට ගොයම් කපන යන්ත්‍ර ලබා දීලා, කුඹුරේ කපන ගොයම් ටික ලොරිවලින් කෙළින්ම මෝලට අරගෙන ආවාම, දවසකට මෙට්‍රික් ටොන් 14,000ක් වශයෙන් මේ කියන ස්ථාන දෙකේ තෙතමනය සහිත වී වේළන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදනවා. ඒ හරහා ගොවියාගේ වී මිල දී ගැනීමේ ක්‍රියාවලියත්, ගොවියාගේ ආර්ථිකය ශක්තිමත් කිරීමත් ඉතාම හොඳින් කරලා ගොවියාට වඩා යහපත් ජීවිතයක් ලබා දෙන කටයුත්ත අපේ ආණ්ඩුව සිදු කරනවා. ඒ නිසා විපක්ෂය බොරුවට කිඹුල් කඳුළු හෙළුවාට වැඩක් නැහැ. මේක ගොවියාගේ, කම්කරුවාගේ අරගළය තුළින් හදපු ආණ්ඩුවක්. ඒ ගොවියා, කම්කරුවා බලා ගන්නා කටයුත්ත අපි කරනවා කියන කාරණය ප්‍රකාශ කරමින් මම නවතිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.34ට, 2026 ඔක්තෝබර් 08වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.34க்கு, பாராளுமன்றம் 2026 ஒக்ரோபர் 08, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.34 p.m. until 9.30 a.m. on Thursday, 08th October, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## නාවික හමුදාව සහ ගුවන් හමුදාව මුහුදේ සිදු කරනු ලබන සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම්: විස්තර
## கடற்படையும் விமானப்படையும் கடலில் மேற்கொள்ளும் தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகள்: விபரம்
## NAVY AND AIR FORCE SEARCH AND RESCUE OPERATIONS CONDUCTED AT SEA: DETAILS

2407/2026

**1. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මුහුදේ සිදු කරනු ලබන සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා නාවික හමුදාව සහ ගුවන් හමුදාව අතර පවතින වර්තමාන ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) 2025 සහ 2026 වර්ෂවලදී මුහුදේ සිදු කළ සෙවීම් සහ ගලවාගැනීමේ මෙහෙයුම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉන් ගුවන් සහාය ලබා දුන් මෙහෙයුම් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මෙහෙයුම් සඳහා සාමාන්‍ය ප්‍රතිචාර කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 'දිට්වා' සුළි කුණාටුව සමයේ මුහුදු හා ගංගා ආශ්‍රිත ගලවා ගැනීම් සඳහා ගුවන් යානා යෙදවීමේදී හඳුනාගත් අඩුපාඩු සහ ඒවා නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) 2026 ජූනි මාසයේදී එක්සත් ජනපදයෙන් නාවික හමුදාවට ලැබුණු වෙරළාරක්ෂක නෞකාවට හෙලිකොප්ටර් මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව තිබේද;

(iii) එසේ නම්, එය මේ වන විට භාවිත කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடலில் மேற்கொள்ளப்படும் தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகள் தொடர்பாக கடற்படைக்கும் விமானப்படைக்கும் இடையே தற்போது காணப்படுகின்ற நடபடிமுறைகள் யாவை என்பதையும்;

(ii) 2025 மற்றும் 2026ஆம் ஆண்டுகளில் கடலில் மேற்கொள்ளப்பட்ட தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அவற்றுள் ஆகாய மார்க்கமாக உதவிகள் வழங்கப்பட்ட நடவடிக்கைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி நடவடிக்கைகளுக்கான சராசரி துலங்கல் நேரம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 'தித்வா' புயல் வீசிய காலப்பகுதியில் கடல் மற்றும் கங்கைகளை அண்மித்த பகுதிகளில் மேற்கொள்ளப்பட்ட மீட்பு நடவடிக்கை களுக்காக வானூர்திகளை பயன்படுத்தியபோது, இனங்கண்ட குறைபாடுகளும் அவற்றை நீக்குவதற்காக மேற்கொள்ளப்பட்ட நடவடிக்கை களும் யாவை என்பதையும்;

(ii) 2026 யூன் மாதத்தில் ஐக்கிய அமெரிக்கா விடமிருந்து கடற்படைக்குக் கிடைக்கப்பெற்ற கரையோரப் பாதுகாப்புக் கப்பலுக்கு உலங்கு வானூர்தி நடவடிக்கைகளை மேற்கொள்வதற் கான திறன் உள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அது இன்றளவில் பயன்படுத்தப் பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House the -

(i) current procedure in place between the Navy and the Air Force for search and rescue operations conducted at sea;

(ii) number of search and rescue operations conducted at sea in the years 2025 and 2026;

(iii) number of those operations that were provided with air support; and

(iv) average response time for the said operations?

(b) Will he also inform this House -

(i) the shortcomings identified when deploying aircraft for sea and river-based rescues during Cyclone "Ditwah", and the steps taken to rectify them;

(ii) whether the Coast Guard vessel received by the Navy from the United States in June, 2026 has the capacity to conduct helicopter operations; and

(iii) if so, whether the said capacity has been utilized so far?

(c) If not, why?

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) **ශ්‍රී ලංකා නාවික හමුදාව**

ශ්‍රී ලංකා සෙවීම් හා මුදා ගැනීම් කලාපය තුළ වාර්තාවේ සමුද්‍රීය ආපදා සහ ඒවායේ ස්වභාවය හා හදිසිභාවය අනුව වර්ගීකරණය කරනු ලබන අතර, එම ආපදා සඳහා සෙවීම් හා මුදා ගැනීම් මෙහෙයුම් සිදු කිරීමේදී සමුද්‍රීය සෙවීම් හා මුදා ගැනීම් මධ්‍යස්ථානය (MRCC Colombo) විසින් මෙහෙයුම් සම්බන්ධීකරණය කරනු ලබයි. ආපදා සඳහා සෙවීම් හා මුදා ගැනීම් SAR මෙහෙයුමක් ක්‍රියාත්මක වන අවස්ථාවකදී, MRCC Colombo මඟින් සමස්ත SAR සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරමින්, සිද්ධියට අදාළ තොරතුරු විශ්ලේෂණය කර සුදුසු නාවික යාත්‍රා, ගුවන් යානා අනතුර සිදු වූ ස්ථානයට ආසන්නව ඇති වෙළෙඳ නැව් හෝ ධීවර යාත්‍රා වැනි SAR සම්පත් තෝරා යෙදවීම සම්බන්ධීකරණය කරනු ලබයි.

සෙවුම් ඒකක තෝරා ගැනීමේදී අනතුර සිදු වූ ස්ථානය, වෙරළ තීරයේ සිට ඇති දුර, අනතුර සිදු වූ සැබෑ වේලාව සහ එය වාර්තා කළ වේලාව අතර ගත වූ කාලය, අනතුරට පත් යාත්‍රාවේ/ පුද්ගලයන්ගේ තත්ත්වය, පවතින කාලගුණික හා මුහුදු තත්ත්වයන්, යාත්‍රා කළ හැකි සම්පත්වල ස්ථානය හා ප්‍රවතිචාර කාලය, සෙවුම් ප්‍රදේශයේ ස්වභාවය සහ අනෙකුත් අදාළ කරුණු ඇතුළු සාධක ගණනාවක් සැලකිල්ලට ගනු ලබයි.

ඒ අනුව, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අවශ්‍ය මුහුදු සම්පත් යොදවා සෙවීම් හා මුදා ගැනීමේ කටයුතු සිදු කරන අතර, අවශ්‍යතාව අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් සම්පත්, ගුවන් සෙවීම් සහ බේරා ගැනීම් සහාය සඳහා යොදා ගනු ලබයි. මෙහෙයුම් අතරතුර MRCC, නාවික හමුදා මෙහෙයුම් මධ්‍යස්ථානය සහ ගුවන් හමුදා සම්බන්ධීකරණ මධ්‍යස්ථානය අතර අඛණ්ඩ තොරතුරු හුවමාරුවක් පවත්වාගෙන යමින්, සෙවුම් ප්‍රදේශ යොදවා ඇති සම්පත්, කාලගුණික තත්ත්වය, සෙවුම් ප්‍රගතිය සහ මුදා ගැනීමේ තත්ත්වය පිළිබඳව අවශ්‍ය යාවත්කාලීන කිරීම් සිදු කරනු ලබයි.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

1. මුහුදේ සිදු වන සෙවීම් සහ මුදා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධයෙන් ගුවන් හමුදාව සහ නාවික හමුදාව අතර පවතින සම්බන්ධීකරණ ක්‍රමවේදය අනුව අවශ්‍යතාව මත ගුවන් හා නාවික සම්පත් යොදා ගනිමින් ඒකාබද්ධ සෙවීම් හා මුදා ගැනීම් මෙහෙයුම් සිදු කරනු ලබයි. මෙහෙයුම් මැදිරි (Ops Rooms) සහ පාලන අධිකාරීන් විසින් මෙම ක්‍රියාවලිය සිදු කරනු ලබයි.

2. මුහුදේ යාත්‍රාවක් හෝ පුද්ගලයෙකු අනතුරට පත් වී ඇති බවට තොරතුරක් ලැබුණු විට අදාළ තොරතුර අපගේ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය මඟින් මනා ලෙස සම්බන්ධීකරණය කරමින් අදාළ පාර්ශ්ව දැනුවත් කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව නාවික සහ ගුවන් සම්පත් භාවිත කරමින් මුදා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලබයි.

3. ගුවන් හමුදාව විසින් අවශ්‍යතාව අනුව අදාළ ගුවන් නිරීක්ෂණ/ ආවේක්ෂණ මෙහෙයුම් සිදු කර ගුවන් මුදා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලබයි.

(ii) 2025 වර්ෂය තුළ සෙවීම් හා ගලවා ගැනීමේ මෙහෙයුම් 29ක් සිදු කර ඇති අතර, 2026 වර්ෂය තුළ සෙවීම් හා ගලවා ගැනීමේ මෙහෙයුම් 26ක් සිදු කර ඇත.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

(iii) **ශ්‍රී ලංකා නාවික හමුදාව**

2025 වර්ෂය තුළ ගුවන් හමුදා සහාය - 06

2026 වර්ෂය තුළ ගුවන් හමුදා සහාය - 08

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

2025 වර්ෂයේ - 20

2026 වර්ෂයේ - 12

(iv) **ශ්‍රී ලංකා නාවික හමුදාව**

ආපදා අනතුරු ඇඟවීමක් ලැබුණු පසු SAR ප්‍රතිචාරය ආරම්භ කිරීමට ගත වන කාලය, එක් එක් සිද්ධියේ ස්වභාවය හා පවතින තත්ත්වයන් අනුව වෙනස් වන බැවින් ස්ථාවර හෝ සාමාන්‍ය ප්‍රතිචාර කාලයක් ලෙස දැක්වීම ප්‍රායෝගික නොවේ. විශේෂයෙන්ම අනතුර සිදු වූ ස්ථානයේ සිට වෙරළ තීරයට ඇති දුර, අදාළ ප්‍රදේශයේ පිහිටීම, අනතුර සිදු වූ වේලාව සහ එය MRCC වෙත වාර්තා වූ වේලාව අතර ගත වූ කාලය, පවතින කාලගුණික හා මුහුදු තත්ත්වයන්, අනතුරේ ස්වභාවය සහ හදිසිභාවය, එම අවස්ථාවේදී සුදුසු නාවික යාත්‍රා, ගුවන් යානා වැනි SAR ඒකකවල පිහිටීම හා ලබා ගත හැකි බව සහ අදාළ සම්පත් සිද්ධි ස්ථානය වෙත ළඟා වීමට ගත වන කාලය වැනි කරුණු මත ප්‍රතිචාර කාලය තීරණය වේ.

එසේ වුවද, MRCC Colombo වෙත ලැබෙන සෑම ආපදා අනතුරු ඇඟවීමක් සම්බන්ධයෙන්ම පවතින තොරතුරු සහ තත්ත්වයන් කඩිනමින් ඇගැයීමට ලක් කර, සුදුසු SAR සම්පත් හඳුනාගෙන යොදවමින් හැකි ඉක්මනින් අවශ්‍ය SAR ප්‍රතිචාරය ආරම්භ කිරීමට හා සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ලබයි.

එබැවින්, එක් එක් SAR සිද්ධියේ පවතින විවිධ මෙහෙයුම් හා පාරිසරික සාධක සැලකිල්ලට නොගෙන සමස්ත ආපදා අනතුරු ඇඟවීමක් සඳහා එක් සාමාන්‍ය ප්‍රතිචාර කාලයක් ඉදිරිපත් කිරීම මඟින් සැබෑ මෙහෙයුම් තත්ත්වය නිවැරදිව නිරූපණය නොවන බැවින්, එවැනි සාමාන්‍ය ප්‍රතිචාර කාලයක් ලබා දීම සුදුසු නොවන බව සඳහන් කළ හැකිය.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

මුහුදේ සිදු කරන සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා ගත වන සාමාන්‍ය ප්‍රතිචාර කාලය විවිධ සාධක රැසක් මත රඳා පවතී. ඒවා නම්,

- මෙහෙයුම් ස්වභාවය, අනතුර සිදු වූ ස්ථානය සහ අපගේ ගුවන් යානා ස්ථානගත කර ඇති ස්ථාන අතර පවතින දුර.
- එම අවස්ථාවේ පවතින කාලගුණික තත්ත්වයන්.
- ගුවන් යානා වර්ගය සහ ශක්‍යතාවන්.
- අදාළ ස්ථානය පිහිටි ප්‍රදේශයේ (මුහුදේ) පවතින කැලඹුම් ස්වභාවය.

(ආ) (i) **ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

1. "දිට්වා" සුළි කුණාටුව මුළු දිවයිනටම බලපෑ ආපදා තත්ත්වයක් වූ බැවින් ගුවන් හමුදාව සතු වූ ගුවන් යානා ප්‍රමාණය සම්පූර්ණ බලපෑමට ලක් වූ ප්‍රදේශයන් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම.
2. එම අවස්ථාවේදී පැවැති අයහපත් කාලගුණ තත්ත්වය මධ්‍යයේ ගුවන් යානා ගුවන්ගත කිරීම / ගොඩ බෑම සහ ගුවන් මෙහෙයුම් සිදු කිරීම සඳහා ඇති වූ අපහසුතාව.
3. මිනිසුන් සහ භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂමව සිදු කිරීමට එකවර විශාල මිනිසුන් ප්‍රමාණයක් සහ විශාල භාණ්ඩ ප්‍රමාණයක් රැගෙන යා හැකි විශාල ධාරිතාවක් සහිත හෙලිකොප්ටර් යානා නොමැති වීම.
4. සෝදිසි සහ මුදා ගැනීමේදී භාවිත කරන උපකරණ ප්‍රමාණවත් ප්‍රමාණයක් ගුවන් හමුදාව සතු නොවීම.
5. රාත්‍රී මුදවා ගැනීම් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන උපකරණ නොමැතිවීම.
6. දැනට ශ්‍රී ලංකාව සතු සහ අක්‍රිය තත්ත්වයේ ඇති Mi-17 හෙලිකොප්ටර් යානා අලුත්වැඩියා කිරීමටත්, මුදා ගැනීමේ මෙහෙයුම්වලට අවශ්‍ය උපකරණ හා මෙවලම් ලබා ගැනීම සඳහාත් අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී.

**ආපදා කළමනාකරණය**

දිවයිනට බලපෑ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් දිස්ත්‍රික්ක 22ක් ආපදා තත්ත්වයන්ට ලක් වූ බැවින් ගුවන් හමුදාව සතු වූ ගුවන් යානා ප්‍රමාණය සම්පූර්ණ බලපෑමට ලක් වූ ප්‍රදේශයන් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම සහ මෙම ගුවන් යානා ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉන්දියානු සහ පාකිස්තානු ගුවන් හමුදාවන්හි සහයෝගය සහ ගුවන් යානා භාවිතයෙන් සෙවීම් සහ මුදා ගැනීමේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලදී. එම අවස්ථාවේදී පැවැති අයහපත් කාලගුණ තත්ත්වය මධ්‍යයේ ගුවන් යානා ගුවන් ගත කිරීම/ ගොඩබෑම් සහ රාත්‍රී ගුවන් මෙහෙයුම් සිදු කිරීම සඳහා අපහසුතා ඇති වීම.

එමෙන්ම දුරකථන සම්බන්ධතාවන් බිඳවැටීම හේතුවෙන් ආපදාවට ලක් වූ ජනතාවහට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (117 ඇමතුම් මැදිරිය සහ හදිසි මෙහෙයුම් මැදිරිය) සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ බව පසුව නිරීක්ෂණය විය.

දැනට ශ්‍රී ලංකාව සතු අක්‍රිය තත්ත්වයේ ඇති Mi-17 හෙලිකොප්ටර් යානා අලුත්වැඩියා කිරීමටත්, මුදා ගැනීම් මෙහෙයුම්වලට අවශ්‍ය උපකරණ හා මෙවලම් ලබා ගැනීම සඳහාත්, අයහපත් කාලගුණික තත්ත්වවලදී යොදා ගැනීම සඳහා හෙලිකොප්ටර් යානා වෙනුවට කෙටි දුර භාණ්ඩ ප්‍රවාහනය සිදු කළ හැකි ඩ්‍රෝන යානා මිල දී ගැනීම සඳහාත් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

(ii) හැකියාව ඇත.

(iii) නොමැත.

(ඇ) නෞකාවක හෙලිකොප්ටර් ගොඩබෑස්වීම හා ගුවන්ගත කිරීම ආරක්ෂිතව සිදු කිරීම සඳහා අදාළ නෞකාවේ හෙලිකොප්ටර් ගොඩබෑමේ වේදිකාව (Helicopter Deck) සහතිකකරණය ලබා තිබීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවකි. එම ඩෙක් සහතිකකරණය අදාළ ප්‍රමිතීන්ට අනුව සම්පූර්ණ කර ලබා ගත් පසු එම නෞකාව සුදුසු වර්ගයේ හෙලිකොප්ටර් යානා ගොඩබෑස්වීම හා ගුවන්ගත කිරීම සඳහා භාවිත කළ හැකිය. ඒ අනුව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශ්‍රී ලංකා නාවික නෞකා සමුද්‍රවිජය නෞකාවේ හෙලිකොප්ටර් ඩෙක් සහතිකකරණය ලබා ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණ හා අනෙකුත් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(அ) (i) **இலங்கை கடற்படை**

இலங்கை தேடுதல் மற்றும் மீட்பு வலயத்துக்குள் அறிக்கையிடப்படும் கடல்சார் அனர்த்தங்கள் மற்றும் அவற்றின் தன்மை மற்றும் அவசரத்தன்மைக்கு ஏற்ப வகைப்படுத்தப் படுவதுடன், அந்த அனர்த்தங்களுக்கான தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகளை மேற்கொள்ளும்போது, கடல்சார் தேடுதல் மற்றும் மீட்பு ஒருங்கிணைப்பு மையம்மூலம் (MRCC, Colombo) நடவடிக்கைகள் ஒருங் கிணைக்கப்படுகின்றன. அனர்த்தத்துக்கான தேடுதல் மற்றும் மீட்பு (SAR) நடவடிக்கை செயற்படுத்தப்படும் சந்தர்ப்பத்தில், MRCC Colombo ஒட்டுமொத்த SAR ஒருங்கிணைப்பு மையமாகச் செயற்பட்டு, சம்பவம் தொடர்பான தகவல்களைப் பகுப்பாய்வு செய்து, பொருத்தமான கடற்படை கப்பல்கள், விமானங்கள், அனர்த்தம் இடம்பெற்ற இடத்துக்கு அருகிலுள்ள வர்த்தகக் கப்பல்கள் அல்லது மீன்பிடிப் படகுகள் போன்ற SAR வளங்களைத் தெரிவுசெய்து பயன்படுத்துவதற் கான நடவடிக்கைகளை ஒருங்கிணைக்கிறது.

தேடுதல் அலகுகளைத் தெரிவுசெய்யும்போது, அனர்த்தம் இடம்பெற்ற இடம், கரையிலிருந்து உள்ள தூரம், அனர்த்தம் இடம்பெற்ற உண்மையான நேரத்துக்கும் அது அறிக்கையிடப்பட்ட நேரத்துக்கும் இடையில் கடந்த காலம், அனர்த்தத்துக்குள்ளான கப்பல் / நபர்களின் நிலை, நிலவும் காலநிலை மற்றும் கடல் நிலைமைகள், பயன்படுத்தக்கூடிய வளங்களின் அமைவிடம் மற்றும் பதிலளிப்பு நேரம், தேடுதல் பிரதேசத்தின் தன்மை மற்றும் ஏனைய தொடர்புடைய காரணிகள் உள்ளிட்ட பல காரணிகள் கருத்தில் கொள்ளப்படுகின்றன.

அதன்படி, இலங்கை கடற்படையால் தேவையான கடல்சார் வளங்களைப் பயன்படுத்தி தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவதுடன், தேவைக்கேற்ப இலங்கை விமானப் படையின் வான்வழி வளங்கள் வான்வழித் தேடுதல் மற்றும் மீட்பு உதவிக்காகப் பயன்படுத்தப்படுகின்றன. நடவடிக்கையின்போது MRCC, கடற்படை நடவடிக்கை மையம் மற்றும் விமானப்படை ஒருங்கிணைப்பு மையம் ஆகியவற்றுக்கிடையில் தொடர்ச்சியான தகவல் பரிமாற்றம் பேணப் பட்டு, தேடுதல் பிரதேசங்கள், பயன்படுத்தப்பட்ட வளங்கள், காலநிலை நிலைமைகள், தேடுதல் முன்னேற்றம் மற்றும் மீட்பு நிலைமை தொடர்பாக தேவையான புதுப்பிப்புகள் மேற்கொள்ளப்படுகின்றன.

**இலங்கை விமானப்படை**

1. கடலில் இடம்பெறும் தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகள் தொடர்பாக விமானப்படை மற்றும் கடற்படைக்கு இடையில் நிலவும் ஒருங்கிணைப்பு முறைமைக்கு அமைவாக, தேவைக்கேற்ப விமான மற்றும் கடற்படை வளங்களைப் பயன்படுத்தி கூட்டு தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன. நடவடிக்கை அறைகள் (Ops Rooms) மற்றும் கட்டுப்பாட்டு அதிகாரிகளினால் இந்தச் செயன்முறை மேற்கொள்ளப்படுகிறது.

2. கடலில் ஒரு கப்பல் அல்லது நபர் ஒருவர் அனர்த்தத்துக்கு உள்ளாகியுள்ளதாகத் தகவல் கிடைக்கும்போது, சம்பந்தப்பட்ட தகவல்கள் எமது பிரதான நடவடிக்கை அறைமூலம் முறையாக ஒருங்கிணைக்கப் பட்டு, சம்பந்தப்பட்ட தரப்பினருக்கு அறிவிக்கப்படுகிறது. அதன்படி கடற்படை மற்றும் விமானப்படை வளங்களைப் பயன்படுத்தி மீட்பு நடவடிக்கைகள் செயற்படுத்தப்படுகின்றன.

3. விமானப்படையால் தேவைக்கேற்ப சம்பந்தப்பட்ட வான்வழி அவதானிப்பு/ கண்காணிப்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு, வான்வழி மீட்பு நடவடிக்கைகள் செயற்படுத்தப்படுகின்றன.

(ii) 2025ஆம் ஆண்டில் தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகள் 29 மேற்கொள்ளப்பட்டுள்ளதுடன், 2026ஆம் ஆண்டில் தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகள் 26 மேற்கொள்ளப்பட்டுள்ளன.

(iii) **இலங்கை கடற்படை**

2025ஆம் ஆண்டில் விமானப்படை உதவி - 06

2026ஆம் ஆண்டில் விமானப்படை உதவி - 08

**இலங்கை விமானப்படை**

2025ஆம் ஆண்டு - 20

2026ஆம் ஆண்டு - 12

(iv) **இலங்கை கடற்படை**

அனர்த்த எச்சரிக்கை கிடைத்த பின்னர் SAR பதிலை ஆரம்பிப்பதற்கு எடுத்துக்கொள்ளப்படும் நேரம் ஒவ்வொரு சம்பவத்தின் தன்மை மற்றும் நிலவும் நிலைமைகளுக்கு ஏற்ப மாறுபடுவதால், நிலையான அல்லது பொதுவான பதிலளிப்பு நேரமொன்றாகக் குறிப்பிடுவது நடைமுறைக்கு ஏற்றதல்ல. குறிப்பாக, அனர்த்தம் இடம்பெற்ற இடத்திலிருந்து கரையோரத்துக்குள்ள தூரம், சம்பந்தப்பட்ட பிரதேசத்தின் அமைவிடம், அனர்த்தம் இடம்பெற்ற நேரத்துக்கும் அது MRCCக்கு அறிவிக்கப்பட்ட நேரத்துக்கும் இடையில் கடந்த காலம், நிலவும் காலநிலை மற்றும் கடல் நிலைமைகள், அனர்த்தத்தின் தன்மை மற்றும் அவசரத்தன்மை, அந்தச் சந்தர்ப்பத்தில் பொருத்தமான கடற்படை கப்பல்கள், விமானங்கள் போன்ற SAR

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

அலகுகளின் அமைவிடம் மற்றும் கிடைக்கக்கூடிய தன்மை, சம்பந்தப்பட்ட வளங்கள் சம்பவ இடத்தை அடைவதற்கு எடுத்துக்கொள்ளும் நேரம் போன்ற காரணிகளின் அடிப்படையில் பதிலளிப்பு நேரம் தீர்மானிக்கப்படுகிறது.

எவ்வாறாயினும், MRCC Colomboக்குக் கிடைக்கும் ஒவ்வோர் அனர்த்த எச்சரிக்கை தொடர்பாகவும் கிடைக்கப்பெறும் தகவல்கள் மற்றும் நிலைமைகளை விரைவாக மதிப்பீடு செய்து, பொருத்தமான SAR வளங்களை அடையாளங்கண்டு பயன்படுத்தி, தேவையான SAR பதிலை இயன்றளவு விரைவாக ஆரம்பித்து ஒருங்கிணைப்பதற்கான அனைத்து நடவடிக்கைகளும் மேற்கொள்ளப்படுகின்றன.

எனவே, ஒவ்வொரு SAR சம்பவத்திலும் காணப்படும் பல்வேறு செயற்பாட்டு மற்றும் சுற்றுச்சூழல் காரணிகளைக் கருத்திற் கொள்ளாமல், ஒட்டுமொத்த அனர்த்த எச்சரிக்கைகளுக்காக ஒரு பொதுவான பதிலளிப்பு நேரத்தை முன்வைப்பதன்மூலம் உண்மையான செயற்பாட்டு நிலைமையைச் சரியாகப் பிரதிபலிக்க முடியாது என்பதால், அவ்வாறான பொதுவான பதிலளிப்பு நேரத்தை வழங்குவது பொருத்தமானதல்ல எனக் குறிப்பிடலாம்.

**இலங்கை விமானப்படை**

கடலில் மேற்கொள்ளப்படும் தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகளுக்காக எடுத்துக்கொள்ளப் படும் சராசரி பதிலளிப்பு நேரம் பல்வேறு காரணிகளைச் சார்ந்துள்ளது. அவையாவன:

- நடவடிக்கையின் தன்மை, அனர்த்தம் இடம்பெற்ற இடம் மற்றும் எமது விமானங்கள் நிலைநிறுத்தப்பட்டுள்ள இடங்களுக்கிடையில் காணப்படும் தூரம்.
- அச்சந்தர்ப்பத்தில் நிலவும் காலநிலை நிலைமைகள்.
- விமானத்தின் வகை மற்றும் திறன்கள்.
- சம்பந்தப்பட்ட இடம் அமைந்துள்ள பிரதேசத்தில் (கடலில்) காணப்படும் கொந்தளிப்பின் தன்மை.

(ஆ) (i) **இலங்கை விமானப்படை**

1. 'தித்வா' சூறாவளி முழு நாட்டையும் பாதித்த அனர்த்த நிலைமையாக இருந்ததால், விமானப்படையிடம் இருந்த விமானங் களின் எண்ணிக்கை முழுமையாகப் பாதிக்கப்பட்ட பிரதேசங்களை உள்ளடக்கு வதற்கு போதுமானதாக இருக்கவில்லை.
2. அந்தச் சந்தர்ப்பத்தில் நிலவிய மோசமான காலநிலை நிலைமைகளுக்கு மத்தியில் விமானங்களைப் பறக்கவிடுதல் / தரையிறக்குதல் மற்றும் விமான நடவடிக் கைகளை மேற்கொள்வதில் ஏற்பட்ட சிரமம்.
3. பயணிகள் மற்றும் பொருட்களை திறம்படப் போக்குவரத்து செய்வதற்காக ஒரே நேரத்தில் அதிக எண்ணிக்கையிலான பயணிகளையும் அதிகளவிலான பொருட்களையும் எடுத்துச் செல்லக்கூடிய அதிக கொள்ளளவு கொண்ட ஹெலிகொப்டர்கள் இல்லாமை.
4. தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகளில் பயன்படுத்தப்படும் உபகரணங்கள் போதுமான அளவில் விமானப்படையிடம் இல்லாமை.
5. இரவு நேர மீட்பு நடவடிக்கைகளுக்குத் தேவையான உபகரணங்கள் இல்லாமை.
6. தற்போது இலங்கையிடம் உள்ள செயலிழந்த நிலையில் காணப்படும் Mi-17 ஹெலிகொப்டர் விமானங்களைப் பழுதுபார்ப்பதற்கும் மீட்பு நடவடிக்கை களுக்குத் தேவையான உபகரணங்கள் மற்றும் கருவிகளைப் பெற்றுக்கொள் வதற்கும் தேவையான கொள்வனவு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

**அனர்த்த முகாமைத்துவம்**

நாட்டை பாதித்த 'தித்வா' சூறாவளியின் காரணமாக 22 மாவட்டங்கள் அனர்த்த நிலைமைகளுக்கு உள்ளானதால், விமானப்படை யிடம் இருந்த விமானங்களின் எண்ணிக்கை முழுமையாகப் பாதிக்கப்பட்ட பிரதேசங்களை உள்ளடக்குவதற்குப் போதுமானதாக இருக்க வில்லை. இந்த விமானங்களின் எண்ணிக்கை போதுமானதாக இல்லாத காரணத்தினால், இந்திய மற்றும் பாகிஸ்தான் விமானப்படை களின் ஒத்துழைப்பையும் விமானங்களையும் பயன்படுத்தி தேடுதல் மற்றும் மீட்பு நடவடிக்கைகளை மேற்கொள்ள நடவடிக்கை எடுக்கப்பட்டது.

அந்தச் சந்தர்ப்பத்தில் நிலவிய மோசமான காலநிலை நிலைமைகளுக்கு மத்தியில் விமானங்களைப் பறக்கவிடுதல்/ தரையிறக்குதல் மற்றும் இரவு நேர விமான நடவடிக்கைகளை மேற்கொள்வதில் சிரமங்கள் ஏற்பட்டன.

அத்துடன், தொலைபேசி தொடர்புகள் துண்டிக்கப்பட்டதன் காரணமாக, அனர்த்தத் துக்கு உள்ளான மக்கள் அனர்த்த முகாமைத்துவ நிலையத்தை (117 அழைப்பு மையம் மற்றும் அவசர நடவடிக்கை அறை) தொடர்புகொள்ள முடியாத நிலை ஏற்பட்டதாக பின்னர் அவதானிக்கப்பட்டது.

தற்போது இலங்கையிடம் உள்ள செயலிழந்த நிலையில் காணப்படும் Mi-17 ஹெலிகொப்டர் களைப் பழுதுபார்ப்பதற்கும் மீட்பு நடவடிக்கை களுக்குத் தேவையான உபகரணங்கள் மற்றும் கருவிகளைப் பெற்றுக்கொள்வதற்கும், மேலும் மோசமான காலநிலை நிலைமைகளில் பயன்படுத்துவதற்காக ஹெலிகொப்டர்களுக்குப் பதிலாக குறுகிய தூரத்தில் பொருட்களைப் போக்குவரத்து செய்யக்கூடிய 'ட்ரோன்' விமானங்களை கொள்வனவு செய்வதற்கும் எதிர்காலத்தில் நடவடிக்கைகளை மேற் கொள்ளத் திட்டமிடப்பட்டுள்ளது.

(ii) திறன் உள்ளது.

(iii) இல்லை.

(இ) ஒரு கப்பலில் ஹெலிகொப்டர் தரையிறங்குவதையும் பறக்கவிடுவதையும் பாதுகாப்பாக மேற்கொள்வதற் காக, சம்பந்தப்பட்ட கப்பலில் ஹெலிகொப்டர் தரையிறங்கும் தளம் (Helicopter Deck) சான்றளிக்கப் பட்டிருப்பது அத்தியாவசிய தேவையாகும். அந்த டெக் சான்றளிப்பு சம்பந்தப்பட்ட தரநிலைகளுக்கு அமைவாக முழுமையாகப் பூர்த்தி செய்யப்பட்டு பெற்றுக்கொள்ளப்பட்ட பின்னர், அந்தக் கப்பலை பொருத்தமான வகை ஹெலிகொப்டர்களைத் தரையிறக்குவதற்கும் பறக்கவிடுவதற்கும் பயன்படுத்த முடியும். அதன்படி, இலங்கை கடற்படையின் இலங்கை கடற்படை கப்பல் சமுத்திரவிஜய கப்பலின் ஹெலிகொப்டர் டெக் சான்றளிப்பைப் பெற்றுக்கொள் வதற்குத் தேவையான பரிசோதனைகள் மற்றும் ஏனைய நடவடிக்கைகள் தற்போது மேற்கொள்ளப் பட்டு வருகின்றன.

(a) (i) **Sri Lanka Navy**

Maritime distress incidents reported within the Sri Lanka Search and Rescue Region are classified according to the nature and urgency of the incidents. The Maritime Rescue Coordination Centre, Colombo (MRCC Colombo) coordinates search and rescue operations conducted in response to such incidents. When a search and rescue (SAR) operation is initiated, the MRCC, Colombo functions as the overall SAR Coordinating Centre, analysing information relating to the incident and coordinating the selection and deployment of appropriate SAR resources, such as naval vessels, aircraft, merchant vessels or fishing vessels located in the vicinity of the incident.

In selecting Search and Rescue units, a number of factors are taken into consideration, including the location of the incident, distance from the coastline, time elapsed between the actual occurrence of the incident and the time it was reported, condition of the vessel/persons in distress, the prevailing weather and sea conditions, location and response time of available deployable resources, nature of the search area and other relevant factors.

Accordingly, the Sri Lanka Navy conducts search and rescue operations by deploying the required maritime resources, while air assets of the Sri Lanka Air Force are deployed, as necessary, to support aerial search and rescue operations. Throughout the operation, continuous information exchange is maintained among MRCC, Colombo, the Naval Operations Centre and the Air Force Coordination Centre, with necessary updates being provided on the search areas, resources deployed, prevailing weather conditions, progress of the search and the status of the rescue operation.

**Sri Lanka Air Force**

1. In accordance with the coordination mechanism existing between the Sri Lanka Air Force and the Sri Lanka Navy in relation to search and rescue operations at sea, joint search and rescue operations are conducted by deploying air and maritime assets as required. This process is coordinated through the Operations Rooms (Ops Rooms) and the respective command authorities.
2. Upon receipt of information regarding a vessel or person being in distress at sea, the relevant information is properly coordinated through the Main Operations Room, and the relevant parties are duly informed. Accordingly, rescue operations are conducted using naval and air assets.
3. The Sri Lanka Air Force conducts the relevant aerial reconnaissance/ surveillance operations as required and carries out aerial rescue operations accordingly.

(ii) A total of 29 Search and Rescue Operations were conducted during 2025, while 26 Search and Rescue Operations were conducted during 2026.

(iii) **Sri Lanka Navy**

Air Force assistance in 2025 - 06 operations

Air Force assistance in 2026 - 08 operations

**Sri Lanka Air Force**

2025 - 20 operations

2026 - 12 operations

(iv) **Sri Lanka Navy**

As the time required to initiate a search and rescue (SAR) response following receipt of a distress alert varies according to the nature of the incident and the circumstances prevailing at the time, it is not practical to specify a fixed or standard response time. In particular, the response time is determined by factors such as the distance from the location of the incident to the coastline, the geographical location of the relevant area, the time elapsed between the occurrence of the incident and its reporting to MRCC, prevailing weather and sea conditions, the nature and urgency of the incident, the location and availability of suitable SAR units such as naval vessels and aircraft at the time and the time required for the relevant resources to reach the location of the incident.

Nevertheless, in respect of every distress alert received by MRCC, Colombo, all available information and prevailing

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

circumstances are promptly assessed, and all necessary measures are taken to identify and deploy appropriate SAR resources and to initiate and coordinate the required SAR response as expeditiously as possible.

Accordingly, it may be stated that providing a single average response time for all distress alerts, without taking into consideration the varying operational and environmental factors applicable to each SAR incident, would not accurately reflect the actual operational circumstances and, therefore, it would not be appropriate to provide such a general response time.

**Sri Lanka Air Force**

The average response time for search and rescue operations conducted at sea depends on a number of factors, including the following:

- The nature of the operation, the location of the incident, and the distance between the incident location and the locations where our aircraft are stationed.
- The prevailing weather conditions at the time.
- The type and capabilities of the aircraft.
- The nature of the sea conditions and turbulence prevailing in the area where the relevant location is situated.

(b) (i) **Sri Lanka Air Force**

1. As Cyclone "Ditwah" caused disaster conditions affecting the entire Island, the number of aircraft available to the Sri Lanka Air Force was insufficient to cover all the areas affected.
2. The adverse weather conditions prevailing at the time created difficulties in the takeoff and landing of aircraft and the conduct of aerial operations.
3. The absence of high-capacity helicopters capable of transporting a large number of passengers and substantial quantities of cargo at a time, which hindered the efficient transportation of passengers and cargo.
4. The insufficient availability of equipment used for search and rescue operations within the Sri Lanka Air Force.
5. The unavailability of the equipment required for night-time rescue operations.
6. The procurement process is currently underway to repair the Mi-17 helicopters owned by Sri Lanka, which are in unserviceable condition and to procure the equipment and tools required for rescue operations.

**Disaster Management**

As 22 districts were affected by the disaster caused by Cyclone "Ditwah", the number of aircraft available to the Sri Lanka Air Force was insufficient to cover all the affected areas. Therefore, search and rescue operations were conducted with the assistance of the Indian and Pakistani Air Forces and through the use of their aircraft.

The adverse weather conditions prevailing at the time caused difficulties in the takeoff and landing of aircraft and the conduct of night-time aerial operations.

Furthermore, it was subsequently observed that due to disruptions to telephone communications, people affected by the disaster were unable to contact the Disaster Management Centre (117 Call Centre and Emergency Operations Centre).

It is planned to take necessary action in the future to repair the Mi-17 helicopters currently owned by Sri Lanka, which are in an unserviceable condition, procure the equipment and tools required for rescue operations and drones capable of transporting cargo over short distances as alternative helicopters for use during adverse weather conditions.

(ii) It is possible.

(iii) No.

(c) Certification of the helicopter deck of the relevant vessel is an essential requirement for safely carrying out helicopter landing and takeoff operations on a vessel. Upon completion and obtaining such deck certification in accordance with the relevant standards, the vessel can be used for the landing and takeoff of helicopters of suitable types. Accordingly, the necessary inspections and other activities required to obtain helicopter deck certification for "Samudravijaya" of the Sri Lanka Navy are currently being carried out.

## ශ්‍රී ලංකා නාවික හමුදාව: හෙලිකොප්ටර් ගොඩබෑමේ පහසුකම් සහිත ගැඹුරු මුහුදු යාත්‍රා

## இலங்கை கடற்படை: உலங்கு வானூர்தி தரையிறங்கும் வசதிகளைக் கொண்ட ஆழ்கடலில் பயணிக்கக்கூடிய கப்பல்கள்

SRI LANKA NAVY: DEEP-SEA VESSELS WITH HELICOPTER-LANDING FACILITIES

2408/2026

**2.** **ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව හෙලිකොප්ටර් ගොඩබෑමේ පහසුකම් සහිත ගැඹුරු මුහුදේ යාත්‍රා කළ හැකි නෞකා තිබේද;

(ii) එසේ නම්, එම නෞකාවල හෙලිකොප්ටර් ගොඩබා සුරක්ෂිත කිරීමේ (deck-lock harpoon) පද්ධති තිබේද;

(iii) නාවික හමුදාව සතුව 'නාවික ගුවන් අංශයක්' තිබේද;

(iv) නො එසේ නම්, එවැනි අංශයක් පිහිටුවීම සඳහා යෝජනාවක්, සංකල්ප පත්‍රිකාවක් හෝ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර තිබේද;

(v) එසේ නම්, එය ඉදිරිපත් කළ දිනය සහ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නාවික හමුදාව සඳහා ගුවන් නියමුවන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් නිලධාරීන් සංඛ්‍යාව, බඳවාගැනීම සිදු කළ වර්ෂය, අනුමත තනතුරු නාමය, පුහුණුව ලබා දුන් හෝ ලබා දීමට නියමිත ආයතනය සහ අනුමැතිය ලබා දුන් බලධාරීන් කවුරුන්ද;

(iii) එලෙස බඳවාගත් නිලධාරීන් විසින් වර්තමානයේ ඉටු කරනු ලබන රාජකාරි කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கடற்படைக்குச் சொந்தமாக உலங்கு வானூர்தி தரையிறங்கும் வசதிகளைக் கொண்ட ஆழ்கடலில் பயணிக்கக்கூடிய கப்பல்கள் உள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கப்பல்களில் உலங்கு வானூர்திகளைத் தரையிறக்கிப் பாதுகாப்பாக வைத்திருக்கக்கூடிய (தளப்பூட்டுக் கட்டமைப்பு) (deck-lock harpoon) கட்டமைப்புகள் உள்ளனவா என்பதையும்;

(iii) கடற்படையிடம் 'கடற்படை விமானப் பிரிவு' ஒன்று உள்ளதா என்பதையும்;

(iv) இன்றேல், அவ்வாறான பிரிவொன்றை நிறுவுவதற்கான பிரேரணை, எண்ணக்கரு பத்திரம் அல்லது அமைச்சரவைப் பத்திரமொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அது சமர்ப்பிக்கப்பட்ட திகதியும் அதன் தற்போதைய நிலையும் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடற்படைக்கு விமானிகள் ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ளனரா என்பதையும்;

(ii) ஆமெனில், ஆட்சேர்ப்புச் செய்யப்பட்ட உத்தியோகத்தர்களின் எண்ணிக்கை, ஆட்சேர்ப்புச் செய்யப்பட்ட ஆண்டு, அங்கீகரிக்கப்பட்ட பதவிப் பெயர், பயிற்சியளிக்கப்பட்ட அல்லது அளிக்கப்படவுள்ள நிறுவனம் மற்றும் அங்கீகாரமளித்த அதிகாரிகள் யாவர் என்பதையும்;

(iii) அவ்வாறு ஆட்சேர்ப்புச் செய்யப்பட்ட உத்தியோகத்தர்கள் தற்பொழுது நிறைவேற்றும் கடமைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) whether the Sri Lanka Navy possesses any deep-sea vessels with helicopter landing facility;

(ii) if so, whether the said vessels are equipped with the deck-lock harpoon systems for ensuring the protection of the landed helicopters;

(iii) whether the Sri Lanka Navy possesses a Naval Aviation Unit;

(iv) if not, whether a proposal, concept paper or Cabinet Paper has been prepared for the establishment of such a Unit; and

(v) if so, the date on which it was submitted and the present status of the same?

(b) Will he also inform this House -

(i) whether aircraft pilots have been recruited for the Sri Lanka Navy;

(ii) if so, the number of pilots who have been recruited and the year of recruitment, the approved designation of the said pilots, the institution where the training was provided or is to be provided to the said pilots, and the name of authority which granted approval for the same; and

(iii) the duties that are currently performed by the pilots who have thus been recruited?

(c) If not, why?

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව සතු අක්වෙරළ මුහුදු මුර සංචාරක නෞකා (OPVs) 08ක හෙලිකොප්ටර් යානා ගොඩබෑමේ පහසුකම් ඇත.

(ii) නෞකාවල ස්ථාපිත කර ඇති හෙලිකොප්ටර් තට්ටු මත හෙලිකොප්ටර් යානා ආරක්ෂිතව රඳවා තැබීම සඳහා අවශ්‍ය රඳවා තැබීමේ පද්ධතියක් (Helicopter Security System) සවි කර ඇත.

(iii) වර්තමානයේ නොමැත.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

(iv) නොමැත.

(v) අදාළ නොවේ.

(ආ) (i) බඳවාගෙන ඇත.

(ii) වර්ෂ 2000දී නාවික ගුවන් අංශයක් පිහිටුවීම සඳහා විශ්‍රාමික හමුදා නිලධාරින් තිදෙනෙකු ඔවුන්ගේ ගුවන් හමුදා නිලයට සමාන නාවික හමුදා නිලයන් යටතේ නාවික හමුදාවට බඳවාගෙන ඇත. එයට අමතරව ශ්‍රී ලංකා නාවික හමුදාව නිලධාරින් 4දෙනෙකු නාවික ගුවන් අංශය වෙත තෝරාගෙන පුහුණුව සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත අනුයුක්ත කර ඇති අතර, අනුරාධපුර ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේදී එම පුහුණු කටයුතු පවත්වන ලදී.

(iii) බඳවාගත් විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරින් පසුව යළි විශ්‍රාම ගොස් ඇති අතර, පුහුණුව සඳහා තෝරා ගත් නාවික හමුදා නිලධාරින් යළි ඔවුන්ගේ අංශවල රාජකාරි සඳහා අනුයුක්ත කර ඇත.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) இலங்கை கடற்படையினருக்குச் சொந்தமான கடலுக்கு அப்பாலான கடல் ரோந்து கப்பல்களில் (OPVs) 08 ஹெலிகொப்டர்களைத் தரையிறக்கும் வசதிகள் உள்ளன.

(ii) கப்பல்களில் நிறுவப்பட்டுள்ள ஹெலிகொப்டர் தளங்களில் ஹெலிகொப்டர்களைப் பாதுகாப்பாக நிறுத்திவைப்பதற்குத் தேவையான நிலைநிறுத்தும் அமைப்பு (Helicopter Securing System) பொருத்தப்பட்டுள்ளது.

(iii) தற்போது இல்லை.

(iv) இல்லை.

(v) பொருந்தாது.

(ஆ) (i) ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ளனர்.

(ii) 2000ஆம் ஆண்டில் கடற்படை விமானப் பிரிவொன்றை நிறுவுவதற்காக, ஓய்வுபெற்ற மூன்று இராணுவ அதிகாரிகள், அவர்களது விமானப் படைப் பதவிகளுக்கு இணையான கடற்படைப் பதவிகளின்கீழ் கடற்படையில் ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ளனர். அதற்கு மேலதிகமாக, இலங்கை கடற்படையைச் சேர்ந்த 04 அதிகாரிகள் கடற்படை விமானப் பிரிவுக்குத் தெரிவுசெய்யப்பட்டு, பயிற்சிக்காக இலங்கை விமானப்படைக்கு இணைக்கப்பட்டுள்ளனர். மேலும், அந்தப் பயிற்சி நடவடிக்கைகள் அநுராதபுரம் இலங்கை விமானப் படை முகாமில் நடத்தப்பட்டன.

(iii) ஆட்சேர்ப்புச் செய்யப்பட்ட ஓய்வுபெற்ற விமானப்படை அதிகாரிகள் பின்னர் மீண்டும் ஓய்வுபெற்றுள்ளதுடன், பயிற்சிக்காகத் தெரிவு செய்யப்பட்ட கடற்படை அதிகாரிகள் மீண்டும் அவர்களது பிரிவுகளில் கடமைகளுக்காக இணைக்கப்பட்டுள்ளனர்.

(இ) பொருந்தாது.

(a) (i) Eight (08) Offshore Patrol Vessels (OPVs) of the Sri Lanka Navy are equipped with helicopter-landing facilities.

(ii) A Helicopter Securing System has been installed on the helicopter decks of the vessels to safely secure and hold helicopters in position.

(iii) Not available at present.

(iv) No.

(v) Not applicable.

(b) (i) Yes, recruited.

(ii) In 2000, three retired military officers were recruited into the Sri Lanka Navy under naval ranks equivalent to their respective ranks in the Sri Lanka Air Force for the establishment of a Naval Aviation Branch. In addition, four officers of the Sri Lanka Navy were selected for the Naval Aviation Branch and attached to the Sri Lanka Air Force for training. The said training was conducted at the Sri Lanka Air Force Base, Anuradhapura.

(iii) The retired Air Force officers who had been recruited, subsequently, retired again, while the Navy officers selected for training were, subsequently, re-attached to their respective branches for duties.

(c) Not applicable.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.